
# දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය



# බෞද්ධ සංස්කෘතිය

දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය.

# බෞද්ධ සංස්කෘතිය

ප්‍රධානාචාර්ය
ශ්‍රී ධම්මාරාම දහම් පාසල
පියසඳවෙහෙර
දෙල්ගහවත්ත,
පන්නිපිටිය.

ප්‍රකාශනය


බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව

2010

පළමු වන මුද්‍රණය - 1991
දෙ වන මුද්‍රණය - 1999
තෙ වන මුද්‍රණය - 2000
සිව් වන මුද්‍රණය - 2001
පස් වන මුද්‍රණය - 2002
සය වන මුද්‍රණය - 2003
සත් වන මුද්‍රණය - 2004
අට වන මුද්‍රණය - 2005
නව වන මුද්‍රණය - 2006
දස වන මුද්‍රණය - 2007
එකොළොස් වන මුද්‍රණය - 2009
දොළොස් වන මුද්‍රණය - 2009

සියලු හිමිකම් ඇවිරිණි.

**සෘජු පිටපත් කිරීම සහ මුද්‍රණය:**
රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව
පානළුව, පාදුක්ක.



# ශ්‍රී ලංකා ජනාධිපති
## இலங்கை சனாதிபதி
## President of Sri Lanka

### අතිගරු ජනාධිපතිතුමාගේ පණිවිඩය

විනය ගරුක සමාජයක් උදෙසා ගුණවත් පුරවැසියන් බිහි කිරීමට නම් මිනිසා භෞතික වශයෙන් පමණක් නොව අධ්‍යාත්මික වශයෙන් ද ගොඩ නැගීම සඳහා ඔහුට ශ්‍රද්ධාව මෙන්ම ප්‍රඥාව ද ලබා දිය යුතුය. ඒ සඳහා මාපිය, දූ දරු, අඹුසැමි, ගුරු සිසු, සේව්‍ය සේවක, පාලක පාලිත, ආදි සියලු සබඳතා යහපත් සහ ඵලදායී බවට පත් කර වෛරය තුරන් කිරීම මගේ අරමුණයි.

සියලු ආගම්වලට අයත් දරුවන් ඔවුනොවුන්ගේ ආගම්වලට අනුකූල වූ ධාර්මික අධ්‍යාපනයක් ලබනවා දැකීම මාගේ අභිලාෂයයි. 'විද්‍යා දදාති විනයං' යන බුදු වදනට අනුව බැලුව ද අධ්‍යාපනය තුළින් විනය ගරුක සමාජයක් ඇති කළ හැකිය. රටක දැහැමි සංවර්ධනය උදෙසා විනය මූලික වෙයි. 'දහම් දිවයින' නමින් ඈත අතීතයේ දී හැඳින්වුණු අප රට අපරාධ රැල්ලකින් වෙළී යාමට හේතු වූයේ මෙම විනය අප ජන සමාජයෙන් ඈත්වීම යැයි මාගේ හැඟීමයි.

එදා පන්සල මුල් කර ගෙන ලැබූ අධ්‍යාපන ක්‍රමය වෙනස් වීම මෙම විපර්යාසයන්ට මුල් විය. එබැවින් මෙපමණකින් වත් අප රට තුළ සාමය, සමාදානය, සදාචාරය සහ සාරධර්ම සුරැකී තිබෙන්නේ දහම් අධ්‍යාපන ක්‍රමය නිසයි.

එනිසා එම අධ්‍යාපන ක්‍රමය නංවාලීම සඳහා අප රජය මහත් වෙහෙසක් හා කැපවීමක් කරනු ලබයි. එහි ප්‍රතිඵලය ලබා ගැනීමට නම් සියලු බෞද්ධ දරුවන් කැප විය යුතු අතර, එය ලබා දීම සඳහා දෙමව්පියන් මෙන්ම ස්වේච්ඡා දහම් පාසල් ගුරු භවතුන් ද උනන්දු විය යුතුය.

පාසල් පංති විෂය සමගාමීව අලුතෙන් දහම් පාසල් පෙළ පොත් විෂය නිර්දේශයන් ද සැකසී තිබීම තුළින් තරඟකාරී අධ්‍යාපන රටාවකට නැඹුරුව සිටින දරුවන් තුළ 'දහම් පාසල් අධ්‍යාපනය' රුචිකත්වය වඩවන තැනක් වීමට ඉඩ ඇත.

යහපත් රටක් සෑදීම සඳහා ගුණවත් දරුවකු බිහි කිරීමේ අරමුණින් බෞද්ධ දහම් පාසල් උදෙසා නොමිලේ ලබා දෙනු ලබන මෙම පොත පරිශීලනය තුළින් එම අරමුණ ඉටු කරනු ලබන ගුණ නැණ බලෙන් යුත් දරුවකු බිහි වේවා! යි ප්‍රාර්ථනය කරමි.

2006 මැයි මස 26 වන දින

**මහින්ද රාජපක්ෂ**
ජනාධිපති

උපදේශක සංස්කාරක

**චන්දිම විජේබණ්ඩාර**

බී. ඒ. ගෞරව (ලංකා) පී. එච්. ඩී. (ලැන්කැස්ටර්)
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පාළි හා බෞද්ධ අධ්‍යයන අංශයේ
ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය

ලේඛක

**සෙනෙවිරත්න මහලේකම්**

බී. ඒ., ගෞරව (ලන්ඩන්) එම්. ඒ. (විද්‍යාලංකාර)
අධ්‍යාපන ඩිප්ලෝමා (විද්‍යෝදය), ද්විතීක පුහුණු i පෙළ

චිත්‍ර

**පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ අනුග්‍රහයෙනි.**

# පටුන

## I කොටස - බෞද්ධ සිරිත් විරිත්

පරිච්ඡේද


1. බෞද්ධ සිරිත් විරිත්වල පදනම

2. පැවිදි ජීවිතය ආශ්‍රිත සිරිත් විරිත්

2.1 පැවිදි බිමට ඇතුල්වීමේ චාරිත්‍ර හා උපසම්පද චාරිත්‍ර

2.2 දෛනික පැවිදි චාරිත්‍ර 1

2.3 සිවුපසය පරිභෝග පිළිබඳ පොදු සිරිත් 1

2.4 සිවුරු හැඳීම හා පෙරවීම හා ගිහියන්ගේ ඇඳුම් භාවිතය පිළිබඳ සිරිත් 1

2.5 දත් වැළඳීම පිළිබඳ සික පද, ආහාර ගැනීමේ ගිහි සිරිත් විරිත් 1

2.6 සේනාසන පරිභෝගය පිළිබඳ සිරිත් විරිත් 2

2.7 ගිලානෝපස්ථානය පිළිබඳ සිරිත් විරිත් 2

2.8 ගුරු ශිෂ්‍ය සම්බන්ධය පැවැත්වීම පිළිබඳ සිරිත් විරිත් 2

2.9 ආගන්තුක සත්කාරය පිළිබඳ සිරිත් විරිත් 3

3. ගිහි ජීවිතයේ සිරිත් විරිත්

3.1 දරුකොත්පත්තිය හා කුමාර කාලය පිළිබඳ සිරිත් විරිත් 4

3.2 ආවාහ විවාහ චාරිත්‍ර 4

3.3 පවුලේ සාමාජිකයන් අතර සම්බන්ධකම් පැවැත්වීම පිළිබඳ සිරිත් 5

3.4 ධනය ඉපැයීම හා රැකියාව සම්බන්ධ සිරිත් විරිත් 6

3.5 අවමංගල සිරිත් විරිත් 7

4. ශාසනික කටයුතු හෙවත් පිංකම් පිළිබඳ සිරිත් විරිත් 7

4.1 සාංඝික දානය පිළිබඳ සිරිත් 7

4.2 ධර්මදානය-දහම් දෙසීම හා ධර්ම ශ්‍රවණය පිළිබඳ සිරිත් විරිත් 8

4.3 කඨින දානය පිළිබඳ සිරිත් 8

4.4 උපෝසථ ශීල සමාදානය පිළිබඳ සිරිත් 8

4.5 බෞද්ධ ශාන්ති කර්ම-පිරිත් දේශනය හා සම්බන්ධ සිරිත් බෝධි පූජාව හා සම්බන්ධ සිරිත් 9

4.6 ධර්මයාත්‍රා හෙවත් වන්දනා ගමන් පිළිබඳ සිරිත් විරිත් 10

5. උත්සව හා සම්බන්ධ සිරිත් විරිත් 122

5.1 සිංහල අලුත් අවුරුද්ද පිළිබඳ සිරිත් විරිත් 122
5.2 වෙසක් උත්සවය පිළිබඳ සිරිත් විරිත් 125
5.3 පෙරහැර පැවැත්වීම පිළිබඳ සිරිත් විරිත් 125
5.4 නේත්‍ර ප්‍රතිෂ්ඨාපන මංගල්‍යය හා සම්බන්ධ චාරිත්‍ර 136

6. බෞද්ධ පාලකයින්ගේ සිරිත් විරිත් 139

6.1 ආදි බෞද්ධ පාලකයින්ගේ සිරිත් 139
6.2 අශෝක රජ සිරිත් 144
6.3 සිංහල බෞද්ධ රජ සිරිත් සමහරක් 146

## II කොටස - ශ්‍රී ලංකාවේ බෞද්ධ කලා ශිල්ප

7. බුදු දහම හා කලා ශිල්ප 154

8. බෞද්ධ ගෘහ නිර්මාණ ශිල්පය 157

8.1 දාගැබ් වහන්සේ හෙවත් චෛත්‍යය 157
8.2 චේතිය ඝර 168
8.3 බෝධි ඝර 175
8.4 පටිමා ඝර 177
8.5 වෙනත් විවිධ බෞද්ධ ගොඩනැගිලි 190

9. බෞද්ධ මූර්ති කලාව 197

9.1 බුදු පිළිමය 197
9.2 බෝධි සත්ව ප්‍රතිමා 213

10. බෞද්ධ කැටයම් කලාව 217

10.1 පැරණි විහාර දොරටුවක අඞ්ග 217
10.2 චෛත්‍ය වාහල්කඩ කැටයම් 229

11. බෞද්ධ චිත්‍ර කලාව 234

11.1 අනුරාධපුර යුගයේ බිතු සිතුවම් 234
11.2 පොළොන්නරු යුගයේ බිතු සිතුවම් 237
11.3 මහනුවර යුගයේ බිතු සිතුවම් 242
11.4 නූතන යුගයේ බිතු සිතුවම් 251

12. බෞද්ධ සිංහල සාහිත්‍යය. 255

12.1 සිංහල සාහිත්‍යයේ වස්තු විෂය 255
12.2 ජාතක පොත 258
12.3 පූජාවලිය 263
12.4 සද්ධර්ම රත්නාවලිය 270
12.5 බුදුගුණ අලංකාරය 275
12.6 තුන්සරණය 282

## III කොටස - ලෝක බෞද්ධ සංස්කෘතිය

13. බුරුමයේ බුදු දහම 288

13.1 ශාසන ඉතිහාසය - පුරාතන යුගය 288
13.2 ශාසන ඉතිහාසය - මධ්‍යතන යුගය 291
13.3 ශාසන ඉතිහාසය - නූතන යුගය 296
13.4 බුරුම ජනයා කෙරෙහි බුදු දහමේ බලපෑම 299

14. තායිලන්තයේ බුදු දහම 303

14.1 ශාසන ඉතිහාසය 303
14.2 ලංකා - තායි සබඳකම් 305
14.3 සංඝ සංවිධානය හා පැවිදි ජීවිතය 310
14.4 බෞද්ධ ගිහි ජීවිතය 316
14.5 ආගමික උත්සව, අධ්‍යාපනය හා කලා ශිල්ප 318

15. චීනයේ බුදු දහම 327

15.1 චීනයට බුදු දහම පැමිණීම හා ආරම්භක යුගය 327
15.2 චීනයේ බුදු දහම තහවුරුවීමේ යුගය 329
15.3 චීන බුදු දහම දේශීය බවට පත්වීමේ යුගය 335
15.4 චීනයේ බෞද්ධ නිකායයෝ 334
15.5 බුදු දහම චීන සංස්කෘතිය කෙරෙහි කළ බලපෑම 340

16. ජපානයේ බුදු දහම 344

16.1 ජපානයට බුදු දහම පැමිණීම 344
16.2 ජපානයේ බුදු දහම තහවුරුවීමේ යුගය 345
16.3 බුදු දහම පොදුජන අවශ්‍යතාවලට සකස්වීම හා ජපන් බෞද්ධ සම්ප්‍රදායයෝ 350
16.4 බුදු දහම පිරිහීමට පත්වීම 354
16.5 බුදු දහමෙන් ජපානයට ඇති වූ බලපෑම 356

බෞද්ධ සංස්කෘතිය

# තේමා

I කොටස - බෞද්ධ සිරිත් විරිත්

II කොටස - ශ්‍රී ලංකාවේ බෞද්ධ කලා ශිල්ප

III කොටස - ලෝක බෞද්ධ සංස්කෘතිය

---

## I – කොටස

## බෞද්ධ සිරිත් විරිත්

# 1. පාඨම

# බෞද්ධ සිරිත් විරිත්වල පදනම

සංසාරය හෙවත් ජාති, ජරා, ව්‍යාධි හා මරණ යන චක්‍රය හරිහැටි තේරුම් ගෙන එයින් මිදීමට කටයුතු කිරීමෙන් විමුක්තිය ලබා ගැනීම බෞද්ධයාගේ අවසාන අරමුණ යි.

ලෝකස්වභාවය නැතහොත් ජීවිතයේ යථා ස්වභාවය මිනිසාට හරිහැටි තේරුම් ගැනීමට නොහැකි වී ඇත්තේ ඔහු රාග, ද්වේෂ, මෝහ යන කෙලෙස්වලින් සමන්විත නූලෙන් වියන ලද දැලකින් පටලැවී ගැටගැසී සිටින බැවිනි.

වරක් දෙවියෙක් බුදුරජාණන් වහන්සේ වෙත අවුත් ''ඇතුළතත් දැලකි, පිටතත් දැලකි, ලෝ වැසි මිනිස්සු මේ දැලෙහි පැටලී සිටිති. ස්වාමීනි, ගෞතමයන් වහන්ස, මේ දැල ලිහිය හැක්කේ කාට ද''යි ප්‍රශ්න කළේ ය. එවිට බුදුරජාණන් වහන්සේ ''සීලයෙහි පිහිටා, සිත හා ප්‍රඥාව දියුණු කරන බුද්ධිමත් තැනැත්තේ, එනම් අප්‍රමාද වූ, ප්‍රඥා සම්පන්න වූ භික්ෂුව මේ දැල ලිහන්නේ ය''යි වදාළ සේක.

## නිවන් මග හා ශීලය

බුදුරජාණන් වහන්සේගේ ඉහත සඳහන් ප්‍රකාශයෙන් පැහැදිලි වන්නේ බෞද්ධයාගේ අවසාන අරමුණ වන විමුක්ති සුවය ලබා ගැනීම සඳහා කවද හෝ ගොඩනැඟීමට බලාපොරොත්තුවන ප්‍රඥා ප්‍රාසාදයේ අත්තිවාරම ශීලය බව යි. එහි දෙවන පියවර සමාධිය වන අතර තුන්වන පියවර ප්‍රඥාව යි. බෞද්ධ ගිහියා හෝ පැවිද්ද හෝ විමුක්තිය ලබා ගැනීම සඳහා ගමන් කළ යුතු මධ්‍යම ප්‍රතිපද මාර්ගය ද මේ අනුව සකස් වූයේ වෙයි. බෞද්ධයා පළමුකොට නිවැරදි වචනය (සම්මා වාචා) නිවැරදි ක්‍රියාව (සම්මා කම්මන්ත), නිවැරදි ජීවිතය (සම්මා ආජීව) යන අංගයන්ගෙන් යුක්ත ජීවත්වීමේ මාර්ගයක් සකස් කර ගනියි. මේ චර්‍යා පද්ධතිය ශීලය යි. බෞද්ධ ගිහියා විසින් නිත්‍ය වශයෙන් රැකිය යුතු යයි බලාපොරොත්තු වන පංච ශීලය ආරක්ෂා කිරීමෙන් ම ආර්ය මාර්ගයේ සම්මා වාචා, සම්මා කම්මන්ත, හා සම්මා ආජීව යන අංගත්‍රය සම්පූර්ණ වෙයි.

ඉක්බිති නිවැරදි උත්සාහය (සම්මා වායාම), නිවැරදි සිහිය (සම්මා සති) හා නිවැරදි සමාධිය (සම්මා සමාධි) මගින් සිත දියුණු කරන ඔහු හරි දැකීමට හෙවත් සම්‍යක් දර්ශනයට (සම්මා දිට්ඨි) පොහොසත් වෙයි. අන්තිමේ දී ඒ මගින් සම්‍යක් සංකල්පය (සම්මා සංකප්ප)

නම් වූ උසස්තම ප්‍රඥාව ලබයි. මේ ජීවිතය නමැති දැලෙන් හෙවත් සසර බැම්වලින් මිදී විමුක්තිය ලබාගන්නා ආකාරය යි.

බෞද්ධ ඉගැන්වීම් අනුව ජීවිතයේ අවසාන ඵලය වන නිවන හෙවත් විමුක්තිය ලබා ගැනීම සඳහා එක් එක් පුද්ගලයා විසින් අනුගමනය කර පුහුණු කරනු ලබන සදාචාරාත්මක වැඩ පිළිවෙළ ශීලය යි. වෙනත් වචන වලින් කියතොත් ශීලය යනු සංවරය යි. නැතහොත් හික්මීම යි.

### හිරි ඔතප්.

ශීලය හෙවත් හික්මීමට හේතු භූතවන ධර්මතා දෙකක් නම් හිරිය සහ ඔත්තප්පය යි. පව් කිරීමට ඇති ලජ්ජාව හිරිය යි. පව් කිරීමට ඇති බිය ඔත්තප්පය යි. තම ශාස්තෘවරයාගේ උසස් ගුණය, තම දෙමාපියන්ගේ වැදගත්කම, තම ගුරුවරයාගේ ගරු කටයුතුබව ආදිය තමාගේ නුවණින් ම සලකා බලා, වැරදි වැඩ කළ හොත් ඒ උතුමන්ටත් තමාටත් මදිකමක් සේ සිතා කෙනෙකු වැරදි වැඩවලින් වළකින්නේ හිරිය හෙවත් පවට ඇති ලජ්ජාව නිසා ය. මේ ලජ්ජාව බාහිර බලපෑමක් නිසා නොව කෙනෙකුගේ අභ්‍යන්තරයෙන් ම පැන නගින්නකි. පව් කිරීමට ඇති බිය ද හතරාකාර යි. තමා කළ පව් සිහිවීමෙන් තමාගෙන් ම දෙස් නැගී තමාට පසුතැවිලි වන්නට වේ යයි ඇති වන බිය එකකි. එය අත්තානුවාද භය නමින් හැඳින් වේ. තමාට අනුන්ගෙන් දෙස් නැගෙතැයි ඇති වන භය පරානුවාද භය නමින් හැඳින් වේ. වැරදි වැඩක් කිරීමෙන් තමන්ට දඬුවම් ලබන්නට සිදුවෙතැ යි ඇතිවන බිය දණ්ඩ භයයි. මේ පව් කිරීමෙන් අපාගත වීමට සිදුවෙතැ යි ඇතිවන බිය දුග්ගති භය නමින් හැඳින් වේ. මෙ කියන ලද කරුණු අනුව පව් කිරීමට බිය හෙවත් ඔත්තප්පය වැඩි වශයෙන් ඇති වන්නේ බාහිර බලපෑම් නිසා ය. හිරි - ඔතප් දෙක ලෝක පාලක ධර්ම වශයෙනුත්, දේවධර්ම වශයෙනුත් හැඳින්වෙන්නේ සදාචාර ලෝකයේ පැවැත්ම ඒ මත රඳනා නිස යි. මේ අනුව කෙනෙකුගේ හික්මීම හෙවත් ශීලය කෙරෙහි පදනම් වන්නේ හිරි - ඔතප් දෙක යි.

### චාරිත්‍ර ශීල හා වාරිත්‍ර ශීල.

හික්මීම හෙවත් ශීලයෙහි අංශ දෙකකි. යහපත් හැසිරීම්වල නිරතවීම හෙවත් පිරිය යුතු ගුණධර්ම පිරීම නමැති චාරිත්‍ර ශීලය එක් අංශයකි. වැරදි හැසිරීම්වලින් බැහැරවීම හෙවත් ඉවත් කළයුතු ධර්ම වැරීම නමැති වාරිත්‍ර ශීලය අනෙක් අංශය යි. බෞද්ධ සිරිත් විරිත් ගොඩනැගී ඇත්තේ මේ චාරිත්‍ර ශීලය හා වාරිත්‍ර ශීලය පදනම් කරගෙන ය. ශීලයට හේතුවන්නේ ලජ්ජා - භය දෙක බැවින් මිනිසුන් සිරිත් විරිත් රකින්නේ ලජ්ජාව සහ භය නිසා බව ද පැහැදිලි ය.

## ශීලයේ ප්‍රභේද

ගිහියන් සහ පැවිද්දන් සඳහා වූ ශීලය පුද්ගල ප්‍රභේදය අනුව පහත සඳහන් අයුරින් කොටස් කළ හැකි ය.

1. උපසම්පද භික්ෂු භික්ෂුණීන් සඳහා වූ ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය.
2. සාමණේර – සාමණේරියන් සඳහා වූ දස ශීලය.
3. ගිහියන් සඳහා වූ පංච ශීලය සහ අෂ්ඨාංග ශීලය යනුවෙනි.

මෙ කවරාකාර ශීලයකින් වුව ද බලාපොරොත්තු වන්නේ චාරිත්‍ර හා වාරිත්‍ර මගින් යහපත් හැසිරීමක් ඇති කිරීම ය.

ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය, ආජීව පාරිශුද්ධ ශීලය, ඉන්ද්‍රිය සංවර ශීලය හා ප්‍රත්‍ය සන්නිශ්‍රිත ශීලය යනුවෙන් සාම්ප්‍රදයික වශයෙන් ශීලය තවත් ආකාරයකට කොටස් හතරකට බෙදෙයි. මෙ කවර ශීලයක වුවත් අන්තර්ගතය ලුහුඬින් විමසා බැලීමෙන් ඒවායේ චාරිත්‍ර හා වාරිත්‍ර අඩංගුවන අයුරු පැහැදිලි වෙයි.

## ප්‍රාතිමෝක්ෂ සංවර ශීලය.

උපසපන් භික්ෂු භික්ෂුණීන් සඳහා වූ ප්‍රාතිමෝක්ෂ සංවර ශීලයට බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කරන ලද සියලුම ශික්ෂාපද ඇතුළත් වන බැවින් අනෙක් කවර ශීලයක් වුව ද එහි ඇතුළත් වන බව ද කිව යුතු ය.

තමා වසන පෙදෙස පිරිසිදු කර ගැනීම, රෝගීන්ට, මහල්ලන්ට, සිල්වතුන්ට උපස්ථාන කිරීම, ගුරුවරුන්ට, වැඩිහිටියන්ට, දාගැබ් හා බෝධීන් වහන්සේලාට වැඳුම් පිදුම් කිරීම, රජ, මැති වෙසහනන් හා මිථ්‍යාදෘෂ්ඨිකයින් ඇසුරු නොකිරීම, විනෝදස්වාදය සඳහා දර්ශන බැලීමෙන් වැළකීම, ධර්මය ඉගෙනීම හා පිළිපැදීම, ඇඳුමෙහි පැළඳුමෙහි හා හැසිරීමෙහි සංවර වීම ප්‍රාතිමෝක්ෂ සංවර ශීලයෙහි ඇතුළත් චාරිත්‍ර ශීල වලින් සමහරකි. දස අකුසලින් වැළකීම වාරිත්‍ර ශීලයට ඇතුළත් ය.

## ඉන්ද්‍රිය සංවර ශීලය.

මනස ද සමඟින් පංචෙන්ද්‍රියයන් සංවර කර ගැනීම මෙයට ඇතුළත් වෙයි. ලෝභ, දෝස, මෝහ යන තුන් දෙසින් ඇස, කන, නාසය, දිව, ශරීරය සහ මනස වැරැද්දට වැටීමට ඉඩ නො දී රැක ගැනීම ඉන්ද්‍රිය සංවර ශීලය යි.

**ආජීව පාරිශුද්ධ ශීලය**

මෙයින් අදහස් කරන්නේ ධාර්මික ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය පාරිශුද්ධ තත්ත්වය රැකීම යි. ප්‍රාණඝාතයෙන් වැළකීම, සොරකමින් වැළකීම, කාමයෙහි වරදවා හැසිරීමෙන් වැළකීම, මුසාවාදයෙන් වැළකීම, කේලාම් කීමෙන් වැළකීම, පරුෂ වචනයෙන් වැළකීම හා තම ශීලය පිළිබඳ රැවටිලි කථා කීමෙන් වැළකීම ආජීව පාරිශුද්ධ ශීලයට ඇතුළත් ය.

**ප්‍රත්‍ය සන්නිශ්‍රිත ශීලය.**

චීවර (සිවුරු), පිණ්ඩපාත (ආහාරපාන), සේනාසන (වාසස්ථාන) ගිලාන පච්චය (ගිලන්පස හෙවත් බෙහෙත්හේත්) යන සිවුපසය පිළිබඳව ලෝභ, ද්වේෂ, මෝහ සිතුවිලි ඇතිකර නොගැනීම හෙවත් ප්‍රත්‍යවේක්ෂාකර පිළිගැනීම හා වැළඳීම ප්‍රත්‍ය සන්නිශ්‍රිත ශීලයට ඇතුළත් වෙයි.

ඉහත ලුහුඩින් දක්වා ඇති ශීලයෙහි ගිහි පැවිදි කවුරුනුත් විසින් දෛනික ජීවිතයේ දී අනුගමනය කළ යුතු සිරිත් විරිත් ඇතුළත් ය.

**සිරිත් විරිත්වල අභිමතාර්ථ.**

සිරිත් විරිත් රැකීමේ අභිමතාර්ථ කවරේ ද? බුදුරජාණන් වහන්සේ විසින් සිය ශ්‍රාවකයන් සඳහා ශික්ෂාපද පැනවීමේදී අරමුණු හෙවත් අභිමතාර්ථ දහයක් දක්වා ඇත. මේවා සිරිත් විරිත්වල ද අභිමතාර්ථ වශයෙන් ද සැලකිය හැකි ය. ඒවා ලුහුඩින් මෙසේ ය.

1. සංඝයාගේ යහපත් බව සඳහා ය. (සංඝ සුට්ඨුතාය)

2. සංඝයාගේ පහසුව සඳහා ය. (සංඝ ඵාසුතාය)

3. නොහික්මුණු පුද්ගලයන්ට නිග්‍රහ කිරීම පිණිසය (දුම්මංකූනං පුග්ගලානං නිග්ගහාය)

4. ශික්ෂාකාමී භික්ෂූන්ගේ පහසු විහරණය සඳහා ය. (පෙසලානං භික්ඛූනං ඵාසු විහාරාය.)

5. මෙලොව දී ඇති වන ආශ්‍රවයන්ගෙන් ආරක්ෂාවීම පිණිස ය. (දිට්ඨ ධම්මිකානං ආසවානං සංවරාය.)

6. පරලොව දී ඇති විය හැකි ආශ්‍රව දුරු කිරීම පිණිස ය. (සම්පරායිකානං ආසවානං පටිඝාතාය)

7. නොපැහැදුනුවන්ගේ පැහැදීම ඇතිවීම පිණිස ය. (අප්පසන්නානං පසාදය.)

8. පැහැදුණු අයගේ පැහැදීම තවත් වැඩි දියුණුවීම පිණිස ය. (පසන්නානං භීය්‍යෝ භාවාය)

9. සද්ධර්මය බොහෝ කලක් පැවැත්ම සඳහා ය. (සද්ධම්ම ඨිතියා)

10. හික්මීමට අනුබලයක්වීම සඳහා ය. (විනයානුග්ගහාය)

ඉහත සඳහන් කරුණු බුදුරජාණන් වහන්සේ විසින් සංඝයා වහන්සේ අරමුණුකොට දේශනා කරනු ලැබුවත්, සංඝයා යන්න සමාජය වශයෙන් අර්ථ කථනය කළ කල්හි එම අරමුණු පොදුවේ පැවිදි සමාජය මෙන් ම ගිහි සමාජය වෙත ද බෙහෙවින් ගැළපෙන බව කිව යුතු ය.

ඉහත සඳහන් කළ අභිමතාර්ථයන් සැලකිල්ලට ගත් කල සිරිත් විරිත් වලින් ඉටු කර ගැනීමට බලාපොරොත්තු වන අරමුණු ගොඩවල් තුනක් වශයෙන් සංක්ෂිප්ත කර දැක්විය හැකි ය. එනම්,

1. පුද්ගලයාගේ අභ්‍යන්තර ශික්ෂණය ඇති කිරීම.

2. දුටුවන් පහදවන බාහිර ඇවතුම් පැවතුම් ඇති කිරීම, හා

3. සමාජයේ සාමූහික පැවැත්ම පහසු කිරීම යනුවෙනි.

**ගිහි පැවිදි වෙනස.**

බෞද්ධ සිරිත් විරිත්වල පදනම වශයෙන් මෙතෙක් අපගේ සැලකිල්ල වැඩි වශයෙන් යොමු වූයේ පැවිදි විනය කෙරෙහි ය. බෞද්ධ ගිහියාගේ ද පැවැත්ම සඳහා පැවිදි චාරිත්‍ර ම යොදා ගැනුමේ යුක්ති සහගත භාවය ද මෙහි දී සලකා බැලීම වටී.

බෞද්ධයාගේ අවසාන අරමුණ වන නිවන් අවබෝධය සඳහා ගිහි පැවිදි දෙපිරිස ම ගමන් කරන්නේ මධ්‍යම ප්‍රතිපදාව නමැති එකම සදාචාර මාර්ගයේ ය. වෙනසකට ඇත්තේ පැවිද්දාගේ ගමන ගිහියාගේ ගමනට වඩා වේගවත් වීම යි. පැවිද්දාගේ ගමන හංසයාගේ ගමනටත් ගිහියාගේ ගමන මොණරාගේ ගමනටත් ධර්මයෙහි උපමා කර ඇත. ගිහි ජීවිතයේ ඇති අති විශාල කාර්යභාරය ගිහියාගේ නිර්වාණ අවබෝධ ගමන පමාකර යි. මොණරාට ඔහුගේ අලංකාර පිල්බර වේගවත් ගමනට බාධකයක් වන්නාක් මෙනි.

විමුක්තිය සොයා සංසාරයේ සැරිසරණ ගිහියෝ ඉතා බර බඩු, උපකරණ පොදි බැඳ, කර තබා ගෙන යන්නෝ ය. එහෙත් අල්පේච්ඡ ජීවිතයක් ගත කරන පැවිද්දාගේ ගමන් මල්ල ඉතා ම සැහැල්ලු ය. ගෙන යන බඩු මල්ලේ බඩු අඩු වූ තරමට ගමන වේගවත් කර ගත හැකි ය.

''එම්බා භික්ෂුව, ඔරුව හිස් කරනු. එය හිස් කළ විට (මෝක්ෂය කරා) වේගයෙන් ගමන් කළ හැකි වෙයි.'' (සිඤ්ච භික්ඛු ඉමං නාවං· සිත්තා තේ ලහුමෙස්සති.) යන ධම්මපද ගාථාවෙන් ද අදහස් කරන්නේ මෙය යි. ධ.ප. 369

පැවිද්ද මෙන් ම ගිහියාත් ඔහුගේ ගමන් මල්ලේ බර හැකි තරම් දුරට අඩුකර ගන්නේ නම් ඔහුට ද නිවන් අවබෝධය යම්කිසි පමණ-කින් වේගවත් කරගත හැකි වෙයි. අල්පේච්ඡ ජීවිතය ගමන් බර අඩුකර ගැනීමේ මාර්ගය යි. පැරණි ගිහියෝ ''අපිත් රහතුන් අනුගමනය කරමු.''යි පොහෝ දිනයන්හි පෙහෙවස් සමාදන් වූහ. එබැවින් පැවිදි පක්ෂය සඳහා දේශිත සිල්, ආචාර ධර්ම, චාරිත්‍ර වාරිත්‍ර ආදිය ද එක ම නිවන් මාර්ගයේ ගමන් කරන ගිහියාට ද ප්‍රයෝජනවත් වන බව අමුතුවෙන් කිව යුතු නොවේ. බෞද්ධ සිරිත් විරිත් කෙරෙහි ඒවායින් ලැබී ඇති ආභාසය ද ඉමහත් ය.

''වත් සම්පූර්ණ නොකරන්නේ ශීලය සම්පූර්ණ නො කෙරේ. ශීල ශුද්ධිය නොලබන්නේ සිතේ සමාධිය නොලබයි. වික්ෂිප්ත සිත් ඇත්තේ ධර්මය නො දකී. ධර්මය නො දක්නේ දුකින් නො මිදේ.''

(විනය විනිච්ඡය වත්තක්ඛන්ධක)

—:0:—

## 2. පාඩම

# පැවිදි ජීවිතය ආශ්‍රිත සිරිත් විරිත්

බෞද්ධ භික්ෂූන් වහන්සේත්, බෞද්ධ ගිහියාත් එක ම අරමුණ ඉටුකර ගැනීම සඳහා එක ම සදචාර මාර්ගයක ගමන් කරන දෙපිරිසක් බව යට දක්වන ලදී. භික්ෂූන් වහන්සේ වැඩි වේගයකින් පෙරටුව යද්දී ගිහියෝ උන් වහන්සේලා අනුගමනය කරමින් තම තමනට හැකි වේගයෙන් පසුව යෙති. ගිහියා ආදර්ශයට ගන්නේ පැවිදි ජීවිතය බැවින් මෙහි දී පළමු කොට පැවිදි ජීවිතය ආශ්‍රිත සිරිත් විරිත් විමසා බැලීම වටී. එසේ ම පැවිදි ජීවිතයේ චාරිත්‍ර වාරිත්‍ර වලට අනුරූපව ගිහි ජීවිතයේ සිරිත් විරිත් ගොඩනැඟී ඇති අවස්ථා කවරේදැයි විමසා බැලීම ද ඉදිරියේ දී සිදු කෙරේ. එබැවින් මෙම පරිච්ඡෙදයේ දී පැවිදි චාරිත්‍ර වාරිත්‍ර වලින් ආභාසය ලැබූ ගිහි සිරිත් විරිත් ද ඉඩ ලැබෙන පරිදි සාකච්ඡාවට භාජනය කරනු ලැබේ.

**බෞද්ධ භික්ෂුව.**

පැවිදි සිරිත් විරිත් කවරේද යි විමසීමට පළමු බෞද්ධ භික්ෂුව යනු කවුරු දැයි හඳුනාගැනීම වටී. සසර කෙටිකර ගැනීමේ හෙවත් නිවන් අවබෝධ කර ගැනීමේ පරම චේතනාව පිට ගිහි ජීවිතයේ සියලු ම සම්බන්ධකම් හැර බුදුරජාණන් වහන්සේ විසින් අනුදත විදළ බ්‍රහ්මචාරී ජීවිතයක් ගත කිරීමට බුදු සසුන් ගත වූ තැනැත්තා භික්ෂුව වශයෙන් හැඳින්විය හැකි ය. ගිහි ජීවිතය බාධා සහිත බැවිනුත්, කෙලෙස්වලට විවෘත බැවිනුත් වැඩි වේගයකින් නිවන් අවබෝධ කරගැනීම කැමති වන්නෝ පැවදි බිම අගය කරති. පැවිද්දෙහි අවස්ථා දෙකකි. ''පබ්බජ්ජා'' හෙවත් සසුනට ගතවීම පළමුවන අවස්ථාව යි. ''උපසම්පදා'' හෙවත් සංඝ ශාසනයෙහි පූර්ණ සාමාජිකයකුගේ තත්ත්වයට පත් කරන අධිශීල ලාභය දෙවෙනි අවස්ථාව යි. මේ අවස්ථා දෙක ම කෙනකුට ලබාගත හැක්කේ පැවිදි ජීවිතය හික්මවන විනයෙහි දැක්වෙන නීති රීතිවලට එකඟ ව ය. එසේ ම උත්සවාකාරයෙන් හා භක්ත්‍යාදරයෙන් යුතු ව කෙනකු මේ තත්ත්වයට පත් කිරීමේ දී අනුගමනය කරනු ලබන විශේෂ චාරිත්‍ර වාරිත්‍ර ද ඇත්තේ ය.

### 2.1 පැවිදි බිමට ඇතුළත්වීමේ හා උපසම්පදා චාරිත්‍ර.

**පැවිදි බිමට ඇතුළත් වීමේ චාරිත්‍ර.**

දෙමව්පියන්ගේ අනුමතිය ලද සත් අවුරුදු විය ඉක්ම වූ පිරිමි දරුවකුට පැවිදි බිමට ඇතුළත් විය හැකි ය. එහෙත් විරූපී පුද්ගලයන්ට

සහ සසුනට ඇතුලුවීමට ඉඩක් නැත. දරුවකු ශාසනයට පූජා කිරීමට ලැබීම ඉතා උසස් පින්කමක් වශයෙන් ද සලකනු ලැබේ. බුද්ධ ශාසනයේ නෑයෙකු විය හැක්කේ ද දරුවකු පැවිදි කරවීමෙන් බව බෞද්ධයන්ගේ පිළිගැනීම යි.

පැවිද්ද අපේක්ෂා කරනු ලබන දරුවා රජකුමරුවකු පරිද්දෙන් සරසා පැවිදි කරනු ලබන විහාරයට ගෙන යනු ලැබේ. අභිනිෂ්ක්‍රමණය කරනු ලබන ගිහි ජීවිතයේ සමෘද්ධිය හා ලාභ ප්‍රයෝජනය සංකේතවත් කිරීමත්, සිදුහත් කුමරුන්ගේ මහාභිනිෂ්ක්‍රමණය සිහිගැන්වීමත් මෙම චාරිත්‍රයෙන් නිරූපණය වේ. පන්සලේ දී රැස්ව සිටින භික්ෂූන් වහන්සේ වෙත ඉදිරිපත් කරනු ලබන මේ දරුවාගේ හිස මුඩු කිරීම හෙවත් භණ්ඩු කර්මය කිරීමට උපාධ්‍යායයන් වහන්සේ හෝ වෙනත් භික්ෂුවක් විසින් මහා සංඝයා වෙත ඉල්ලීමක් කරනු ලැබේ. මහා සංඝයාගේ අනුමතිය ලැබීමෙන් පසු ගුරුවරයා විසින් ම හෝ ගුරුවරයාගේ නියමයෙන් වෙන කෙනකු විසින් හෝ දරුවාගේ හිස මුඩු කරනු ලැබේ. මුල් කෙස් රොද දරුවාගේ අතට දී තච පංචක භාවනා කර්මස්ථානය කියා දීම ද සිරිතකි. තච පංචකය නම් කෙස්, ලොම්, නිය, දත්, සම යන පස යි. මේ එක එකක් පිළිකුල් සහිත බව සිත් හි කාවැදීමක් ඇතිව වටහා දීම මෙයින්. බලාපොරොත්තු වේ. ඉක්බිති හොඳින් කුණු උලා නාවනු ලබන දරුවා සුදුවතින් හා උතුරු සළුවෙන් සරසනු ලැබේ. අනතුරුව දෙමව්පියන්ගේ පා වැඳ සමුගන්නා දරුවා උපාධ්‍යායයන් වහන්සේ ඇතුළු රැස්ව සිටින සංඝයා වහන්සේට ද වැඳ නමස්කාර කරයි. ඉක්බිති අටපිරිකර ඇතිව මෙම කුල දරුවා උපාධ්‍යායයන් වහන්සේ ළඟ උක්කුටුකයෙන් හිඳ පහත සඳහන් අරුත් ඇති පාලි වාක්‍යයන් කියමින් පැවිද්ද ඉල්වයි.

''අවසරයි ස්වාමීනි, මම පැවිද්ද ඉල්ලමි.''

දෙවෙනි වරටත්, තෙවෙනි වරටත් මෙසේ ම පැවිද්ද ඉල්වයි.

''සියලු දුක් නිවීම වූ නිර්වාණය සාක්ෂාත් කරනු පිණිස අනුකම්පා කොට මෙම සිවුරු ගෙන මා පැවිදි කරනු මැනවි'' යනුවෙන් නැවත තෙවරක් කිය යි.

තුන්වෙනි වරට ද, ''සියලු දුක් නිවීම වූ නිර්වාණය සාක්ෂාත් කරනු පිණිස අනුකම්පා කොට මේ සිවුරු ගෙන මා පැවිදි කරනු මැනවි'' යනුවෙන් තෙවරක් කියා පැවිද්ද ඉල්වයි.

මෙසේ තෙවරක් පැවිද්ද ඉල් වූ පසු පැවිද්ද බලාපොරොත්තුවන කුමරුවාට සිවුරු පෙරවීම කරනු ලැබේ. සිවුරු හඳිද්දී, පොරවද්දී චීවර ප්‍රත්‍යවේක්ෂාව කළ යුතු යි. ''මේ සිවුරු හඳින්නේ පොරවන්නේ ශීතල වළකාලනු පිණිස ය. උෂ්ණය වළකාලනු පිණිස ය. මැසි මදුරු

පීඩා වළකාලනු පිණිස ය.'' ආදී වශයෙන් සිහිකිරීමට පැවිදිවන තැනැත්තා නොදන්නේ නම් ගුරුවරයා විසින් එය කියා දෙමින් සිවුරු හැඳවීම පෙරවීම කළ යුතු ය.

මෙසේ සිවුරු දරූ සාමණේරයන් වහන්සේ හෙවත් නවක භික්ෂූන් වහන්සේ රැස්ව සිටි භික්ෂූන් වහන්සේ වැඳ ආචාර්යවරයන් වහන්සේ වෙත උක්කුටුකයෙන් හිඳ පහත සඳහන් වාක්‍යය (පාලියෙන්) තෙවරක් කියමින් පැවිදි දස ශීලය ඉල්වයි.

''අවසර ස්වාමීනි, තිසරණ සහිත පැවිදි දසසිල් ඉල්ලා සිටිමි. මා කෙරෙහි අනුග්‍රහ කොට මට සිල් දෙනු මැනවි.''

මෙය පිළිගන්නා ආචාර්යයන් වහන්සේ සාමණේරයන් තිසරණ සහිත පැවිදි දසශීලයෙහි පිහිටවයි. පාලියෙන් කියවනු ලබන දස ශික්ෂා පදයන්ගේ සිංහල අරුත් පහත දක් වේ.

ප්‍රධානාචාර්ය
ශ්‍රී ධම්මාරාම දහම් පාසල
පියසඳවෙහෙර
දෙල්ගහවත්ත,
පසයාල.

1. ප්‍රාණවධයෙන් දුරුවීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.
2. නොදුන් දෙය ගැනීමෙන් වෙන්වීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.
3. අබ්‍රහ්ම චර්යාවෙන් වෙන්වීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.
4. මුසාවාදයෙන් වෙන්වීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.
5. මත්පැනින් වෙන්වීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.
6. අකාලයේ ආහාර ගැනීමෙන් වෙන්වීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.
7. නාට්‍ය, ගීත, වාදන හා විසුළු දැකුම්වලින් වෙන්වීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.
8. මල ගඳ විලවුන් දැරීමෙන් වෙන්වීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.
9. උස් අසුන් මහ අසුන් පිළිගැනීමෙන් වෙන්වීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.
10. රන්, රිදී, මසු, කහවණු පිළිගැනීමෙන් වෙන්වීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

මෙම පැවිදි දසසිල් සමාදන් වීමෙන් පසුව සාමණේරයන් වහන්සේ කෙනකු වශයෙන් පැවිදි වීමේ කාර්යය අවසන් වෙයි.

සාමණේර ජීවිතයෙන් බලාපොරොත්තු වන්නේ ධර්මයෙහි මනා පළපුරුද්දක් ඇති කර ගැනීම හා ගිහියන්ගේ ප්‍රයෝජනය සඳහා පැවිද්දකු විසින් ඉටු කළ යුතු බණ කීම වැනි අනෙකුත් ආගමික චාරිත්‍ර ධර්ම පුහුණු කර ගැනීම ය. විනය කර්මයක් කිරීම සඳහා සාමණේර නම සුදුස්සෙක් නොවෙ යි.

**උපසම්පද චාරිත්‍ර.**

සාමණේරයන් වහන්සේ නමකට සංඝ සමාජයේ පූර්ණ සාමාජිකත්වය ලැබෙන්නේ උපසම්පදව ලැබීමෙන් පසු ය. විසිවසක් සම්පූර්ණ වූ සාමණේර නමක් උපසම්පදව ලැබීමට සුදුසු වෙයි. මෙය උපසම්පද අපේක්ෂකයා අයත් වන නිකායේ උපසම්පන්න භික්ෂූන් මධ්‍යයේ කෙරෙන ඉතා ම උසස් පෙළේ විනය කර්මයකි. මෙය කරනු ලබන්නේ විශේෂ සීමාවක මහත් ගෞරවයෙනි. මේ විශේෂ සීමා දෙවර්ගයකි. විහාර භූමියක සකස් කර ගනු ලබන ''විහාර සීමාව'' එක් වර්ගයකි. ගඟක් ඇතුළත හෝ දියෙන් වට වූ ස්ථානයක සකස් කර ගනු ලබන ''උදකුක්ඛේප'' සීමාව අනෙක් වර්ගය යි. උපසම්පද විනය කර්මයකට සහභාගි වන්නේ උපසම්පද භික්ෂූන් හා උපසම්පද අපේක්ෂකයන් පමණි.

උපසම්පද අපේක්ෂකයා සුදු වතින් හා සළුවෙන් සැරසී අටපිරිකර සහිතව සංඝයා වෙත පැමිණ එම සංඝයා අතුරෙන් ජ්‍යෙෂ්ඨ තෙර නමකට තම උපාධ්‍යායන් වහන්සේ වශයෙන් කටයුතු කරන ලෙස ඉල්ලා සිටී. මෙය උපාධ්‍යාය ගහණ නමින් හැඳින්වෙය. ඇරයුම පිළිගනනා උපාධ්‍යායයන් වහන්සේ මෙම උපසම්පද කරමය අවසන් වනතුරු ම හඳුන්වනු ලබන්නේ තිස්ස නමිනි. උපසම්පද අපේක්ෂකයා හැඳින්වෙන්නේ නාග නමිනි.

ඉක්බිති, ''කම්මාචරිය'' නමින් හැඳින්වෙන භික්ෂුවක් නාග ට උපදෙස් දීම සඳහා මහා සංඝයාගෙන් අවසර පතයි. එම අවසරය ලද පසු නාග මහා සංඝයාගෙන් ඉවත් කොට, අටපිරිකර හඳුන්වා දී, සංඝයා ඉදිරියේ අන්තරායික ධර්ම නමැති ප්‍රශ්නවලට පිළිතුරු දෙන ආකාරය කම්මාචරිය විසින් කියා දෙනු ලබයි. ''අන්තරායිකධර්ම'' නමැති ප්‍රශ්නවලට ඇතුළත් වන්නේ උපසම්පද අපේක්ෂකයාගේ සෞඛ්‍යය විමසීම පිළිබඳව අසන ප්‍රශ්නත් ඔහු සමාජ බැඳීම් හා වගකීම් වලින් යුක්ත කෙනෙක් ද යි විමසා බැලීමට අසනු ලබන ප්‍රශ්නත් ය.

නැවත වරක් නාග මහා සංඝයා වෙත කැඳවනු ලැබේ. නාග චාරිත්‍රානුකූලව මහා සංඝයාගේ පා වැඳ ඇඳිලි බැඳ උක්කුටුකයෙන් හිඳ ''ස්වාමීනි, සංඝයාගෙන් උපසම්පදව ඉල්ලමි. අනුකම්පා කොට මා සාමණේර භාවයෙන් මුදවා.'' යනුවෙන් තෙවරක් අයැද සිටියි. ඉක්බිති කම්මාචාරීන් වහන්සේ නාගගෙන් අන්තරායික ධර්ම පිළිබඳ ප්‍රශ්න ඇසීමට මහා සංඝයාගෙන් අවසර ලබා ගෙන එම ප්‍රශ්න විචාරයි.

නාගගේ පිළිතුරුවලින් මහා සංඝයා සෑහීමට පත්වුවහොත් උපසම්පද කර්මයට අනුමතිය ලැබෙයි.

ඉක්බිති මහා සංඝයා වහන්සේ විසින් ''මේ නම ඇති උපාධ්‍යායයන් වහන්සේව අනුයුක්ත ව මේ නම ඇති තැනැත්තේ උපසම්පද කරන ලද්දේ ය.'' යන කර්ම වාක්‍යය කියවන ලදුව උපසම්පද කර්මය අවසන් වෙයි. උපසම්පදව ලැබූ භික්ෂුව විනය කර්මවලට සහභාගීවීමට සුදුසුකම ලබයි. උපසම්පන්න භික්ෂුවක් කෙරෙහි බලපාන ආචාර ධර්ම පද්ධතිය භික්ෂු ප්‍රාතිමොක්ෂය නමින් හැඳින්වෙයි. ථෙරවාද භික්ෂු ප්‍රාතිමොක්ෂයෙ ශික්ෂාපද 227කි.

## 2.2 දෛනික පැවිදි චාරිත්‍ර.

විවිධ සමාජ සංස්ථාවක් හා සසඳා බලන විට කාලයට අනුරූපව ඉතා ම අඩුවෙන් වෙනස් වී ඇති සමාජ සංස්ථාවක් ලෙස ථෙරවාද සංඝ සමාජය සැලකිය හැකි ය. මේ වනවිට සංඝ සමාජය වසර දෙදහස් පන්සියයක ආයුෂයක් පසුකර සිටී. එහෙත් මේ දීර්ඝ කාලය තුළ සම්මත භික්ෂු පැවැත්මේ යම්කිසි වෙනසක් සිදුවී ඇත්තම් ඒ ඉතා ස්වල්ප වශයෙනි. මෙසේ සංඝ සමාජය ඉතා අඩු පරිවර්තනයකට භාජනය වීමට හේතු වී ඇත්තේ භික්ෂුව එක ම පරමාදර්ශී ගුරුවරයකු අනුගමනය කිරීම යි. මේ පරමාදර්ශී ගුරුවරයා නම් බුදුරජාණන් වහන්සේ විසින් දේශිත ධර්ම විනය යි. භික්ෂූන් වහන්සේ විසින් ආදර්ශයට ගැනීම සඳහා නිතර ම තෝරා ගත්තේ පැරණි රහතන් වහන්සේගේ ජීවිතය යි. මේ ස්වභාවය නිසා ආරාම ජීවිතයේ වැඩි වෙනසක් සිදු වී නොමැත.

ආදර්ශමත් භික්ෂුවගේ දවසේ ජීවිතය ගෙවෙනුයේ පහත සඳහන් චාරිත්‍රානුකූල පිළිවෙළට ය.

හිරු නැගෙන්නට පළමු භික්ෂුව අවදි වෙයි. ඉක්බිති සතර ආරක්ෂා භාවනාවෙන් : එනම් බුද්ධානුස්සති භාවනාව, මෛත්‍රී භාවනාව, අසුභ කම්මට්ඨාන භාවනාව හා මරණානුස්සති භාවනාව යන මින් එකක් වඩමින් උන් වහන්සේ ස්වල්ප වේලාවක් කල් ගෙවති. මීළඟට බොහෝ විට උන් වහන්සේ අතින් කෙරෙන්නේ පාන්දරින් ම බෝමලුව හා සෙසු තැන් අතුපතුගා පවිත්‍ර කිරීම යි. ඉක්බිති දැහැටි වළඳා මුණ කට සෝද මනාව සිවුරු හැඳ පොරවා, චෛත්‍යය හා බෝධීන්වහන්සේ වඳිති. උදෑසන බුද්ධ පූජාව පවත්වති. උදෑසන හීල්දනය වළඳන්නේ මින් පසුව ය. හීල්දනය පන්සලේ පිළියෙල නොවන්නේ නම් ඒ සඳහා පිණ්ඩපාතය කොට ගෙනැවිත් වැළඳීම චාරිත්‍රය යි. පැරණි භාවනානුයෝගී භික්ෂූන් වහන්සේලා පෙරවරුවේ එක් වරක් පමණක් පිඩු පිණිස වැඩි බව පෙනේ. පිඩු සිඟා වඩිනා

වේලාව ඉනතුරු උන් වහන්සේලා සමවත් සුවයෙන් කල් ගෙවූහ. වර්තමානයේ දී හීල්දනය හා දවල් දනය වශයෙන් පෙරවරුවේ දෙවරක් වළඳන බැවින් පෙරවරුවේ දෙවරක් පිණ්ඩපාතයේ වැඩිය යුතු වන්නේ ය.

දවල් දනයට වේලාව පැමිණෙන තුරු කළයුතු කටයුතු අතර අභ්‍යන්තර පාරිශුද්ධිය හා බාහිර පාරිශුද්ධිය පිළිබඳ කටයුතු මුල්තැනක් ගනී. භික්ෂුවක් තම කෙස් හා නිය පමණට වඩා දික්වීමට ඉඩ දිය යුතු නැත. විනයට අනුව පිළිපැදිය යුතු චාරිත්‍රය නම් (හිස කෙස්) දැඟුලක් දික්වීමට ප්‍රථම හෝ දෙමසක් ගත වන්නට ප්‍රථමයෙන් හිස් කෙස් බෑමයි. කලට වේලාවට ස්නානය කරමින් ශරීරය ද පිරිසිදු කරගත යුතු වේ. සිවුරු හරිසැටි මසා, සෝද, පඬු පොවා ගත යුතු අතර, පිරිසිදුවට ද තබාගත යුතු වේ. එසේ ම තමාගේ ලැගුම් ගෙය ද පවිත්‍ර කොට පිළිවෙළකට තබා ගැනීම ද හොඳ චාරිත්‍රයකි. අවශ්‍ය විටෙක විරේක බෙහෙත් ආදිය පාවිච්චි කිරීමෙන් නීරෝගී භාවය තහවුරු කර ගැනීම ද වැදගත් කොට සලකනු ලැබේ.

ශ්‍රමණ සාරූප්‍ය වන පරිද්දෙන් හිස් රැවුල් බාන, මනා ලෙස සිවුරු හැඳ පොරවා සංවර ඉරියව් පවත්වන භික්ෂුව දකින ගිහියන්ගේ ශ්‍රද්ධාව වැඩිවෙයි. එය මනා ගිහි පැවිදි සම්බන්ධතාවට ද හේතු වෙයි. මිනුෂ්‍ය ඝාතනය කොට දික්විජය කළ අශෝක වැනි නරපතියකු ධර්ම-විජයෙන් මහා ධර්ම රාජ්‍යයක් ගොඩ නැඟූ බෞද්ධ චක්‍රවර්ති රාජයකු බවට පත්වීමට හේතු වූයේ සුන්දර සංවර ගමනකින් මඟ මඟ වැඩි සත් හැවිරිදි නිග්‍රෝධ සාමණේරයන් වහන්සේගේ දර්ශනය යි.

පෙර වරුවේ ස්නාන කටයුතු ආදිය අවසන් කළ භික්ෂූන් වහන්සේ සැදැහැවතකුගේ ආරාධිත දනයක් නොමැති නම් පිඬු පිණිස හැසිර යැපෙන පමණට ආහාර ලද පසු ආරාමයට පැමිණෙයි. ඉක්බිති සැදැහැ-වතුන් පැමිණ සිටියත් නැතත් බුද්ධ පූජාව පවත්වයි. සමහර පන්සල්-වල බුද්ධ පූජාවට සම්බන්ධ කොට බෙර වැයීම, සක්පිඹීම්, වැනි ශබ්ද පූජාවක් පැවැත්වීම ද සිරිතකි. ඝණ්ඨාව නාද කිරීම ද මෙයට සම්බ-න්ධ ය. සාමාන්‍යයෙන් ගම්බද ගැමියන් දවසේ වේලාව පිළිබඳ හැඟීමක් ඇතිකර ගන්නේ ද මෙයිනි.

දවල් දනයෙන් පසුව පස්වරුවේ වැඩි කොටසක් භික්ෂූන් වහන්සේ විසින් ගෙවනු ලබන්නේ ධර්ම ශාස්ත්‍රීය ඉගැන්වීම් කටයුතුවලට ය. සාමණේරයන් වහන්සේලා පිරිවෙන් වලට හෝ පෞද්ගලික පැවිදි ආචාර්යවරයන් වෙතු හෝ ගොස් ධර්ම ශාස්ත්‍රය හදරති. දිවා විවේක-යෙන් පසුව මලුපෙත් ඇමදීම ආදියක් ඇතොත් ඒවා අවසන් කොට ශ්‍රද්ධාවෙන් යුතුව සූත්‍ර සජ්ඣායනය කිරීම ඇතැම් පැරණි භික්ෂූන්ගේ සිරිත විය. පුරාණයේ දී මේ භක්ති ගායනයන්ගේ මිහිරට භික්ෂුණීහු ද, සෙස්සෝ ද වාඩි වී සවන් දුන්හ. සජ්ඣායනා අවසානයේ වැඩිමහල්

තෙරුන් වහන්සේ නමක විසින් ධර්ම දේශනයක් පැවැත්වීම ද එකල සිරිත විය. දේශනයෙන් පසු ගැටළු නැන් සාකච්ඡාවට භාජනය කරන ලදී. මේ සිරිත් පැවතියේ ආරාමයක සන්ධ්‍යා කාලයේදී ය.

ධර්ම දේශනා පැවැත්වීමට විශේෂ පුහුණුවක් භික්ෂුවට ආරාමයේ දී ලැබිණ. ආරාමයේ වැඩ පිළිවෙළ අනුව තමන්ගේ වාරය පැමිණි විට බණ කිව යුතු විය. සාමාන්‍යයෙන් සතර පෝයට ම ආරාමවල ධර්ම දේශනා පැවැත්වීම සිරිත විය. දවසේ වැඩ කටයුතු අවසන් වූ විට සන්ධ්‍යාවේ දී ගැමියෝ ද ධර්මශ්‍රවණයට ආරාමයට පැමිණියහ. අදත් බොහෝ ගම්බද පළාත්වල අඩු තරමේ ප්‍රධාන පෝය දිනවල වත් මේ සිරිත් පැවැත්වේ.

සන්ධ්‍යාවේ දී විහාරයට පැමිණෙන උපාසක උපාසිකාවන් පංච ශීලයෙහි පිහිටුවා මල් පහන් පූජා හෝ බුද්ධ පූජා වැඩ සටහන් මෙහෙයවීම ද භික්ෂුවගේ කාර්යයට ඇතුළත් ය. පොහෝ දිනවල මෙම වැඩ සටහන් විශේෂත්වයක් ගනී. සාමාන්‍යයෙන් කවර දිනක දී වුවත් ආරාමයේ භික්ෂූන් වහන්සේලා එකතුව කළුවර වැටීගෙන එද්දී බෝ මැඩ හා දගැබ වටා පහන් දල්වා මල් පහන් ගිලන්පස පූජා කොට වන්දනාවේ යෙදී ස්වල්ප වේලාවක් හෝ භාවනාවේ යෙදීම ද සිරිතකි.

ආරාමයේ දී පැවිදි සාමාජිකයන් අතර අනුගමනය කළ යුතු වතාවත් ද ඇත. ඒ පිළිබඳව ඉදිරියේ දී සාකච්ඡා කෙරේ.

දවසේ වැඩ කටයුතු අවසානයේ දී ආචාර්යවරයන් හා වැඩි මහල් භික්ෂූන් වැඳ සමාකර ගැනීම ද භික්ෂුව ගේ වැදගත් චාරිත්‍රයකි. දවසක දී කෙරෙන මෙබඳු චාරිත්‍රානුකූල කටයුතුවලට අතිරේකව එදිනෙද ඉදිරිපත් කරනු ලබන ගිහි අවශ්‍යතා සපුරාලීමට ද භික්ෂූන් වහන්සේට සිදු වේ.

## 2.3 සිවුපස පරිභෝගය පිළිබඳ පොදු සිරිත්.

චීවර (ඇඳුම්), පිණ්ඩපාත (ආහාර), සේනාසන (ගෙවල් දොරවල්) හා ගිලානප්‍රත්‍ය (බෙහෙත්හේත්) යන සිවුපසය ජීවත්වීම සඳහා වුවමනා කරන මූලික අවශ්‍යතා ය. ගිහියා මේ සිවුපසය ලබාගන්නේ ගොවිතැන් වෙළහෙළදාම් ආදිය කොට ධනය උපයා ගැනීමෙනි. එහෙත් භික්ෂුවකට එසේ කිරීමට අවසරයක් නැත. භික්ෂුව ජීවත්විය යුත්තේ සැදැහැවතුන් දෙන සිවුපසයෙනි. ''මේ භික්ෂූන් වහන්සේලා සිල්වත්හු ය. ගුණවත්හු ය. පූජා ලැබීමට සුදුස්සෝ ය.'' යන කල්පනාවෙන් සැදැහැවත්තු තමන් දහදිය මහන්සියෙන් උපයාගත් දෙයක් භික්ෂූන් වහන්සේලාට දෙති. එබැවින් භික්ෂූන් වහන්සේලා විසින් සිල්වතුනට සුදුසු පරිද්දෙන් සිවුපසය පරිභෝග කළ යුතුවෙයි.

මිනිසුනට ප්‍රයෝජනවත් වන ආහාරපාන වස්ත්‍රාදිය තෘෂ්ණා, මාන, ඊර්ෂ්‍යාදී කෙලෙසුනට වස්තුහු වෙති. සිල්වතුන් විසින් සිවුරු ආදී සිවුපසය පරිභෝග කළයුත්තේ කෙලෙස්වලට භාජනය නොවන පරිද්දෙනි. ''මේ සිවුර ලස්සනය, හොඳය'' කියා සිතීමෙන් තෘෂ්ණාව උපදී. මෙ තරම් හොඳ සිවුරක් ලැබෙන මා කොතරම් වාසනාවන්තයෙක් ද කියා සිතුවොත් එතැන ඇතිවන්නේ මානයකි. අන්‍යයන්ට එවැනි සිවුරු ලැබෙනවාට අකමැත්තක් ඇති වුව හොත් එහි දී ඇතිවන්නේ ඊර්ෂ්‍යාවකි. තමාගේ සිවුරට හානියක් වුනොත් එහි දී කෝපයක් ඇති විය හැකි ය. මේ අන්දමින් තෘෂ්ණා, මාන, ඊර්ෂ්‍යා, කෝප ආදී කෙලෙස් ඇති නොවන පරිද්දෙන් සිවුරු ආදී සිවුපසය පරිභෝග කිරීමේ පිළිවෙත හඳුන්වන්නේ ප්‍රත්‍යවේක්ෂා කිරීම යනුවෙනි.

**ප්‍රත්‍යවේක්ෂා කිරීම**.

''මා මෙ සිවුරු පරිභෝග කරන්නේ ශීතල නැති කර ගැනීමට හා උෂ්ණය වළක්වා ගැනීමට ය. අව්වෙන් සුළඟින් ආරක්ෂාවීමට හා මැසි මදුරු පත්තෑ,' ගෝනුසු ආදීන්ගෙන් වන පීඩා වළක්වා ගැනීමට ය. නො වැසුවහොත් ලජ්ජාව නැතිවන ශරීරාවයවයන් වසාගනු පිණිස ය.'' ආදී වශයෙන් සිවුරු භාර ගැනීමෙ දීත්, සිවුරු පරිභෝගයේ දීත් මෙනෙහි කරන්නේ නම් ඒ සිවුරු පිළිබඳ ප්‍රත්‍යවේක්ෂාවයි.

මේ අන්දමින් ම ''මා මේ ආහාරය වළඳන්නේ විනෝදය පිණිස නොවේ. ලස්සන වීම පිණිසත් නොවේ. මා මේ අහර වළඳන්නේ සාගිනි දුරුකර ජීවිතය පවත්වා ගැනීම සඳහා ය. බුදු සස්නේ පිළිවෙත් පිරීම සඳහා ය'' ආදී වශයෙන් දන් පිළිගැනීමේ දීත්, වැළඳීමේදීත් මෙනෙහි කිරීම ආහාර ප්‍රත්‍යවේක්ෂාවයි.

''මා මේ සෙනසුන පරිභෝග කරන්නේ ශීත දුරුකර ගැනීම පිණිස ය. උෂ්ණ දුරුකර ගැනීම පිණිස ය. අව් වැසි සුළංවලින් බේරීම සඳහා ය. මැසි මදුරු හා සර්පාදීන්ගෙන් බේරීම සඳහා ය. සිත එක් අරමුණක තබා ගෙන වාසය කිරීමට පහසු වීම සඳහා ය.'' ආදී වශයෙන් මෙනෙහි කර සෙනසුන් පිළිගැනීම සේනාසන ප්‍රත්‍යවේක්ෂාවයි.

''මා මේ ගිලන්පස වළඳන්නේ මාගේ ශරීරයේ ඇති රෝගයන් හා වේදනාවන් දුරුකර ගැනීම සඳහා ය'' යනුවෙන් මෙනෙහි කර ගිලන්පස පිළිගැනීම හා වැළඳීම ගිලන්පස ප්‍රත්‍යවේක්ෂාව යි.

මේ අයුරින් ප්‍රත්‍යවේක්ෂා කර සිවුපසය පිළිගැනීම හා වැළඳීම භික්ෂුවගේ සිරිත ය. මෙසේ ප්‍රත්‍යවේක්ෂා කිරීමෙන් සිවුපසය වැළඳීම එම සිවුපසය දෙන්නවුනට මහත්ඵල මහත් ආනිශංස වීමට ද හේතු වෙ යි.

සිවුපසය ප්‍රත්‍යවේක්ෂාකර පිළිගැනීමේ මේ පිළිවෙත නිසා වඩා හොඳ සිවුපසය ලැබෙන විට ඒවා කෙරෙහි ගිජු නොවීමට පෙළඹවීමක් ඇති නොවන්නා සේ ම ප්‍රණීත නොවන නො සෑහෙන සිවුපසය ලද අවස්ථාවල දී අසතුට, කණස්සල්ල හා කළකිරීම ආදී තත්ත්වයක් ඇති නොවීමට ද හේතු වෙයි. එබැවින් සිවුපසය ප්‍රත්‍යවේක්ෂා කිරීමේ පිළිවෙතින් ලද දෙයින් සතුටුවීමට මහ පෙන්වීමක් ද කරයි.

ගිහියෝ භික්ෂූන් වහන්සේලා මෙන් එදිනෙදට ජීවත්වන්නෝ නොවෙති. දරු පවුල් රකින ඔවුහු අනාගතය සඳහා ද රැස්කරන්නෝ ය. ධාර්මික කාමභෝගී ජීවිතයක් ගතකිරීම ගිහියා පිළිබඳව සැලකූ විට වරදක් නොවේ.

එබැවින් දිනපතා ජීවිතයේ දී භික්ෂූන් වහන්සේලා සෙයින් ඔවුන් ප්‍රත්‍යවේක්ෂාකර සිවුපසය භාවිත නොකළත් ඔවුනට ද එයින් ගතහැකි ආදර්ශයක් ඇත්තේ ය. ''මා මේ භුක්ති විඳින දෙය මා ධාර්මිකව උපයා ගත් දෙයකි''යි ගිහියාට ද ප්‍රත්‍යවේක්ෂා කළ හැකි නම් එහි ඇති සදාචාරාත්මක වටිනාකම ඉමහත් ය. එසේ ම ලද දෙයින් සතුටු වන අල්පේච්ඡ ජීවිතය ගිහි – පැවිදි කාටත් එක සේ අගී. තව ද ගිහියා ද පෙහෙවස් සමාදන් වූ විට දී, භික්ෂූන් වහන්සේලා සෙයින් ආහාර ප්‍රත්‍යවේක්ෂාකර වැළඳීමේ චාරිත්‍රය පුරයි.

භික්ෂූන් වහන්සේලා සම්බන්ධ සිරිත් රාශියක් ම සිවුපසය පරිභෝග කිරීම පිළිබඳව වෙයි. සිවුරු පෙරවීම, දන් වැළඳීම ආදී කාර්යයන්හි දී පැවතිය යුතු ආකාරය පිළිබඳව මහ පෙන්වන සේඛියා නමින් හැඳින්වෙන ශික්ෂාපද පන්සැත්තෑවක් භික්ෂු විනයෙහි ඇතුළත් ය. එසේ ම වත් පිරිමත් පැවිදි ශීලයේ එක් අඞ්ගයකි. ආගන්තුක වත, ආවාසික වත, සේනාසන වත ආදී වශයෙන් පැවිදිවත් 14කි. මේ සියල්ලේ ම ඇතුළත් වන්නේ පැවිදි සිරිත් ය. සෞඛ්‍ය සම්පන්න ආචාරශීලී ජීවිතයක් ගත කිරීමට බලාපොරොත්තු වන බෞද්ධ ගිහියන්ගේ සිරිත් විරිත් රාශියකට ම පැවිදි චාරිත්‍රවල ආභාසය ලැබී ඇති අයුරු පැහැදිලි ව දකින හැකි ය.

## 2.4 සිවුරු හැඳීම හා පෙරවීම.

බුදුරජාණන් වහන්සේ විසින් සිවුපසයේ මුල් තැන දී ඇත්තේ සිවුරට ය. පිණ්ඩපාතය හෙවත් ආහාරයට ලැබී ඇත්තේ දෙවෙනි තැන යි. ගිහි සමාජයේ මූලික අවශ්‍යතා සඳහන් වන්නේ ආහාර, ඇඳුම් පැළඳුම්, ගෙවල් දොරවල්, බෙහෙත් හේත් යන අනුපිළිවෙළට ය. මිනිසා සමාජ සත්ත්වයෙකි. ශීලාචාර මිනිසා ආහාර සපයා ගැනීමට සමාජයට නැත්නම් එළිමහනකට යා යුතු ය. ඒ සඳහා ඔහුට මුලින් ම අවශ්‍ය වනුයේ ඇඳුමයි. භික්ෂූන් වහන්සේ යැපෙන්නේ ද පිණ්ඩපාත-

යෙනි. ඒ සඳහා උන් වහන්සේ සමාජයට යා යුතු ය. එබැවින් බුදු-රජාණන් වහන්සේ විසින් චීවරයට මුල්තැන දීම සදචාරාත්මක මෙන් ම බුද්ධිමත් නිගමනයකි.

භික්ෂුවගේ සිවුරු කට්ටලයට තුන් සිවුරක් ඇතුළත් ය. අන්තරවාසක, උත්තරාසඞ්ග හා ශඞ්ඝාටිය වශයෙන් හැඳින්වෙන මේ තුන සාමාන්‍ය ව්‍යවහාරයේ හඳුන්වනු ලබන්නේ අඳනය, තනිපට සිවුර හා දෙපට සිවුර යන නම් වලිනි. අඳනය හා තනිපට සිවුර සාමාන්‍යයෙන් පන්සලේ භාවිතය සඳහා ය. විහාරයෙන් පිට යන කල්හි දෙපට සිවුර භාවිත වෙයි.

සිවුරු හැඳීම හා පෙරවීම පිළිබඳව බුදු සස්නේ මනා සැලකිල්ලක් දක්වනු ලැබේ. මේ පිළිබඳව සේඛියා සිකපද හතරක් පණවා ඇත්තේ ය.

පරිමණ්ඩලාකාරව සිවුර (අඳනය) හැඳිය යුතු ය යනු පළමුවන් ශික්ෂාපදය යි. තැන් තැන් වලින් උස්පහත්ව නො සිටිනා ලෙස එක මට්ටමකට අඳනය හැඳිය යුතු බව ඉන් අදහස් කෙරේ. අඳනය හැඳිය යුත්තේ උඩින් නාභිය පටන් පහතින් දෙදණ මඩල වැසෙන පරිද්දෙනි. දණහිසින් පහත කෙණ්ඩා ප්‍රදේශයේ අඟල් අටක්වත් අඳනයෙන් වැසීම අවශ්‍ය ය. කෙණ්ඩා දික් වේ නම් හෝ වසා ගතයුතු වන කැළැල් ආදියක් පාදවල තිබේ නම් හෝ ඒවා වැසෙන සේ අඟල් 8කටත් වඩා පහත් කොට අඳනය ඇඳීම සුදුසු ය.

පොරවන සිවුර ද (තනිපට සිවුර) පරිමණ්ඩලාකාරව පෙරවිය යුතු ය යනු දෙවෙනි සික පදය යි. සිවුර පෙර වූ කල්හි එහි යටිකොන් දෙක එකිනෙකට උස් පහත් නො වී එක මට්ටමට සිටින සේ සිවුරේ යටිපැත්තේ වාටිය සෑම තැනකින් ම ඒ කොන්වල මට්ටමට සිටින පරිදි පෙරවීම පරිමණ්ඩලාකාර සිවුරු පෙරවීම නම් වෙයි. මෙසේ පොරවන ලද සිවුර සිටින්නේ අඳනයට අඟල් හතරක් ඉහළිනි. සිවුර හොඳින් පොරවා ගත් පසු කොන් පහළ බැස පරිමණ්ඩලය නැති වූ බව දැනගත් කල්හි සකස් කොට නැවත පොරවා ගත යුතු ය.

විහාරයෙන් පිටව යන විට මනා කොට සිවුරෙන් කය වසා ගන ගමනෙහි යා යුතු ය යනු තුන්වෙනි සික පදය යි. මේ සඳහා යොද ගන්නේ දෙපට සිවුරයි. සිවුර මනා කොට පොරවා ගණ්ඨය දමා ගැනීම මෙහි දී බලාපොරොත්තු වේ. මෙසේ මනා කොට සිවුර පෙර වූ කල්හි ශරීරයෙන් විවෘතව තිබෙන්නේ බෙල්ලෙන් ඉහළ හිසත්, වළලුකර පටන් දෑතත්, කෙණ්ඩයෙන් පහළ පාදයනුත් ය.

හතරවන සික පදයේ අදහස මනාකොට සිවුරෙන් කය වසා ගෙන ගමෙහි හිඳිය යුතුය යනු යි. උරහිස් අත් ආදිය විවෘත කර ගෙන ගමෙහි නොහිඳිය යුතු ය යනු මෙහි අදහස යි.

අඳනය හැඳ පටියක් බැඳීම ද බුදු රජුන් විසින් අනුදන තිබේ. ''පටියක් නොබැඳ ගම් වැදීම නොකළ යුතු ය. අමතක වී ගියේ නම් සිහි වූ තැනක දී බැඳ ගත යුතුය''යි වදරා තිබේ. අංසකඩය ද බොහෝ පැවිද්දන්ගේ පරිෂ්කාරයකි. එය බැනියමක් හෙවත් කංචුකයක් වශයෙන් නොව පොරොනා පරිෂ්කාරයක් වශයෙන් සකස් කර ගත යුතු වේ.

සිවුරු හැඳීම, පෙරවීම පිළිබඳව කොයිතරම් දුරට සැලකිල්ලක් දක්වා තිබේ ද යි ඉහත සඳහන් සික පදවලින් පැහැදිලි වේ. ඇඳුමෙහි විනීතබව, ක්‍රමවත්බව, වාම්බව, යන ලක්ෂණ කෙරෙහි විශේෂයෙන් සැලකිල්ල දක්වා ඇති අයුරු මෙහි දී සිතා ගත හැකි ය.

මනා කොට විනීතව සිවුරු හැඳ පොරවා සිටින භික්ෂුවකගේ දර්ශනය නොපැහැදුනුවන්ගේ පැහැදීම සඳහාත්, පැහැදුනුවන්ගේ එම පැහැදීම වැඩිවීම සඳහාත් හේතු වෙයි. මනුෂ්‍ය ඝාතනය කොට දික්විජය කළ අශෝක වැනි චණ්ඩ රජකු ධර්මවිජය කළ සක්විති රජකු බවට පරිවර්තනය වූයේ මනා ලෙස සිවුරු හැඳ පොරවා සන්සුන්ව මහ මඟ වැඩි සත් හැවිරිදි නිග්‍රෝධ සාමණේරයන් වහන්සේගේ දර්ශනය නිසා බව මීට පළමු ද සඳහන් කරන ලදී.

භික්ෂුවකගේ ඇඳුමෙහි අඩුපාඩුවක් දුටු කල එය පෙන්වා දීම ද ඕනෑ ම තරාතිරමක භික්ෂුවකගේ චාරිත්‍රය වෙයි.

දවසක් සැරියුත් මහතෙරුන් හැඳ සිටි අඳනයෙහි කොනක් එල්ලෙමින් තිබුණු දුටු කුඩා සාමණේර නමක් ''ස්වාමීනි, නුඹ වහන්සේගේ අඳනයේ කොණක් එල්ලෙන්නේ ය''යි කීය. එවිට සැරියුත් මහ තෙරණුවෝ කිසි කථාවක් නැතිව පරිමණ්ඩල සික පදය අනුව අඳනය ඇඳ ඒ කුඩා නම වෙත පැමිණ ඇඳිලි බැඳ ''දැන් හොඳද''යි කියමින් ''එදවස ම පැවිදි සත් හැවිරිදි සාමණේර නමක් වුව ද මට අනුශාසනය කෙළේ නම් මම එය මුදුනෙන් පිළිගනිමි''යි වදළහ. ඕනෑම තත්ත්වයේ කෙනෙකුගෙන් ලැබෙන යහපත් අවවාදය උතුමන් පිළිගන්නා බව මෙන්ම සිවුරු පෙරවීම කෙරෙහි භික්ෂූන් වහන්සේලා කොයිතරම් සැලකිලිමත් වන්නේ ද යි මෙම සිද්ධියෙන් පැහැදිලි වේ.

සිවුරු පවිත්‍රව තබා ගැනීම පිළිබඳව ද භික්ෂුවට කුඩා කල සිට පුහුණුවක් ලැබේ. ගෝලයෝ ආචාර්යවරුන්ගේ තෙත සිවුරු අව්වේ ලා වියලා නමා තබති. භික්ෂුවකට විනයෙන් ඉඩ ලැබී ඇත්තේ සිවුරු තුනක් ළඟ තබා ගැනීමට පමණි. මේ අනුව අනවශ්‍ය අන්දමින් සිවුරු ගොඩ ගසා ගැනීම ද භික්ෂුවගේ සිරිතක් නොවේ.

**ගිහියන්ගේ ඇඳුම් භාවිතය පිළිබඳ සිරිත්.**

පැවිදි පක්ෂයෙන් ආදර්ශ ලබාගන්නා බෞද්ධ ගිහියාගේ ඇඳුම්, භාවිතය පිළිබඳව ඊළඟට විමසා බලමු. බෞද්ධ ගිහියෝ ද ගෙදර දී

වැඩ කටයුතු සඳහා ගැලපෙන විවිධ ඇඳුම් අඳිතත් ගෙදරින් පිටට යද්දී විනීත වාම ඇඳුම් ඇඳ ගෙන යති. ගැහැණු පිරිමි කවුරුත් උතුරු සළුවකින් සැරසී බැහැරට ගිය බව පැරණි පොත පතේ සඳහන් ය. විශේෂයෙන් කාන්තාවන්ගේ විනීත බව රැකෙන අන්දමින් ඇඳුම් ඇඳීම ගැන පුරාණයේ සිට ම සැලැකිලිමත් වූ බව පෙනේ.

''පෙකණිය නොදක් වා
සළු ඇඳ බොලට දක් වා
නො පව තන සක් වා
සිනා නොමසෙත් දසත් දක් වා''

යනුවෙන් කාව්‍ය ශේඛරයෙහි පියෙකු දියණියකට දුන් අවවාදයෙහි ඇඳුමෙන් ආවරණය වියයුතු ශරීරාඞ්ග අවධාරණය කෙරෙයි.

නො කියා සිය හිමි ට
නැතිව ද උතුරු සළු ප ට
ගමන් ඉක්මන් කො ට
නො යන් තුඹ වසන ගෙන් පිටත ට

උතුරු සළුව නො මැතිව ගෙයින් පිට යාම අශීලාචාර බව පෙන්වන ලක්ෂණයක් විය. උතුරු සළුව, වෙනුවට වර්තමානයට ගැලපෙන්නේ උඩුකය වැසෙන සංවර ඇඳුමකි.

බෞද්ධයෝ උත්සවවල දී වැඩි වශයෙන් සුදු හෝ ලා පාට ඇඳුම් භාවිත කරති. පෙර දී උඩරට බෞද්ධ මනාලියන් සැරසුණේ සුදු ඇඳුමෙනි. අදත් ආගමික කටයුතුවලට, අවමංගල කටයුතුවලට, විශේෂ උත්සවවලට බෞද්ධයන් සහභාගී වන්නේ සුදු ඇඳුමෙනි.

අප අගය කරන සාර ධර්මයන්ට අනුකූල ව අපේ ඇඳුම් පැළඳුම් සකස් විය යුතු වේ. කෙනකුට ඇඳුම් කට්ටල රාශියක් නොමැතිවාට ගෙදර දොරේ භාවිතයටත්, රැකියාව සඳහාත්, විශේෂ අවස්ථාවක් සඳහාත්, ඇඳුම් කට්ටල 5ක් පමණ තබා ගැනීමෙන් කටයුතු කරගත හැකි වෙයි. ගෙදරදී ඇඳීමට ඇඳුම් කට්ටල දෙකකුත්, රැකියාවට පාසලට ඇඳීමට ඇඳුම් කට්ටල දෙකකුත්, විශේෂ උත්සවයක් සඳහා ඇඳුම් කට්ටල එකකුත් වශයෙනි. භික්ෂුවකට ඇත්තේ තුන් සිවුර පමණකි.

මෙසේ සකස් කර ගන්නා ඇඳුම තම ආර්ථික තත්ත්වයට ගැලපෙන ලෙස මිසක් මුදල් නාස්තියක් එයින් නොසිදුවීමට වග බලා ගත යුතු ය. ඇඳුමක සාමාන්‍යයෙන් වාම් බව, ක්‍රමවත් බව, විනීත බව, ලස්සන බව යන ලක්ෂණ තිබිය යුතු ය. මෙසේ සකස් කර ගන්නා ඇඳුම භාවිතයේ දී ඇති කර ගන්නා පුරුදු ද වැදගත් ය.

ඇඳුම අපිරිසිදු වූ විගස එය සෝදා වේලා ගැනීම වැදගත් ය. නිතර පවිත්‍ර ඇඳුම් ඇඳීම සිරිතක් කොට ගත යුතු ය. සෞඛ්‍යයට හා සදාචාර ධර්මයන්ට එකග වන්නේ ඇඳුමේ වටිනාකම නොව ඇඳුමේ පවිත්‍රතාව යි. රැකියාවල යෙදෙන අය ඇඳුම් පවිත්‍ර කර ගැනීමට සතියේ දවසක ඒ සඳහා වෙලාවක් වෙන්කර තබාගැනීම සුදුසු ය.

ගමනක් ගොස් ආ විට දහදියෙන් තෙත් වූ ඇඳුම් අව්වේ දමා වේලා ගැනීම පුරුද්දක් කර ගැනීම සුදුසු ය. තෙත රෙදි කිසිවිටෙක ගුලි ගසා නොතබා ලණුවක් ඇද එහි වැනීමෙන්, වැඩිකලක් ලස්සනට පාවිච්චි කළ හැකි වන්නේ ය. එසේ ම තෙත ඇඳුම් දොරවල් උඩ, ඇඳ වියලි හෝ පුටු ඇඳි මත වැනීමෙන් වැළකිය යුතු ය.

කිලුටු ඇඳුම් දැමීමට වෙනම කූඩයක් හෝ භාජනයක් වෙන්කර තබා ගැනීම ප්‍රයෝජනවත් වේ.

## 2.5 දන් වැළඳීම පිළිබඳ සික පද.

දන් වැළඳීම සඳහා භික්ෂූන් වහන්සේලා වෙනුවෙන් පණවා වදාළ සේඛියා සික පද තිසකි. ඒවා සංක්ෂිප්ත ව මෙසේ ය.

සිහියෙන් යුතුව ආහාර පිළිගත යුතු ය. තමා වළඳන්නාවූත්, නොවළඳන්නාවූත් සැම දෙයම බෙදන තරමක් බෙදීමට ඉඩ නො දිය යුතු ය. පාත්‍රයට යොමු කළ සිත් ඇතිව ආහාර පිළිගත යුතු ය. ආහාර බෙදද්දී නොසැලකිල්ලෙන් වට පිට බැලීම නුසුදුසු ය. පාත්‍රයේ ගැට්යේ යට මට්ටමට ආහාර පිළිගත යුතු ය. බතට සෑහෙන පමණට සූප පිළිගත යුතු ය. සිහියෙන් හා සැලකිල්ලෙන් ආහාර වැළඳිය යුතු ය. පාත්‍රයට යොමු කළ සිත් ඇතිව ආහාර වැළඳිය යුතු ය. ආහාර බඳුනෙහි තැනින් තැන නො වළඳා පිළිවෙළින් කොනක සිට වැළඳීම ආරම්භ කළ යුතු ය. බඳුනෙහි මුදුනෙන් ආහාර අනා වැළඳීම ද නොකළ යුතු ය. ව්‍යඤ්ජන ආදිය වැඩියෙන් ලබා ගන්නා අටියෙන් බෙදූ ඒවා බතින් නො වැසිය යුතු ය. ගිලනකු නො වේ නම් පිට අයගෙන් බත් හෝ ව්‍යඤ්ජන ඉල්ලීම ද නුසුදුසු ය. අවමන් කරන අදහසින් අනුන්ගේ පාත්‍රය දෙස නොබැලිය යුතු ය. අඩුවක් ඇතිනම් දීම හෝ දෙවීම පිණිස බැලීම වරදක් නොවේ. බත් පිඩු මහත් කොට සාද නො වැළඳිය යුතුය. බත් පිඩු රවුම් කොට තනා වැළඳිය යුතු ය. බත් පිඩු මුව ළඟට ගන්නට කලින් කට ඇරීම සුදුසු නැත. වළඳනා කළ සම්පූර්ණ අතම කට තුළට නො දැමිය යුතු ය. ආහාර කටට වීසි නොකළ යුතු ය. මුව තුළ ආහාර තබා ගෙන කථා නො කළ යුතු ය. බත් පිඩ කටින් කඩා ගෙන කෑම ද නුසුදුසු ය. වඳුරන් මෙන් ආහාර හක්කේ තබා ගෙන නොවැළඳිය යුතු ය. වළඳද්දී අත ගසා දැමීමෙන්, බත් හුළ

විසුරුවීමෙන් වැළකිය යුතු ය. දිව එළියට දමා වැළඳීම නුසුදුසු ය. තලු ගසා ආහාර නො වැළඳිය යුතු ය. "සුරු සුරු" හඬ නංවමින් ආහාර නො වැළඳිය යුතු ය. වළඳද්දී අත ලෙවකෑම අප්‍රිය දර්ශනයකි. ඇඟිලිවලින් පාත්‍රය සූරා වැළඳීම ද නුසුදුසු ය. වළඳද්දී තොල් ලෙවකෑම ද අප්‍රිය දර්ශනයකි. ඉඳුල් තැවරුණු අතින් පැන් බඳුන් ආදිය නො ඇල්ලිය යුතු යි. බත් හුළු සහිත පාත්‍ර සේදූ වතුර බිම නො දැමිය යුතු ය. වතුර, බත්, කටු, ලෙලි ආදිය වළඳන තැන දැමීමෙන් අපිරිසිදු නො කළ යුතු ය. වළඳන තැන කෑරීම, සොටු සිරීම නො කළ යුතු ය. භාජනවල හැඳි ගැටෙන ශබ්ද ඇති කරවමින් ආහාර ගැනීම ද නුසුදුසු ය. පමණ දැන ආහාර වැළඳිය යුතු ය.

ඉහත සඳහන් කළ දන් වැළඳීම පිළිබඳ ශික්ෂාපද සම්පිණ්ඩනය කළහොත් ආහාර ගැනීම පිළිබඳව ප්‍රධාන ආචාර ධර්ම කීපයක් මතුකර ගත හැකි ය.

1. ආහාර අපතේ නො යන පරිද්දෙන් පිළිගත යුතුය, වැළඳීම කළ යුතු ය.

2. ආහාරයෙහි පමණ දැන වැළඳීම කළ යුතු ය.

3. එකට ආහාර ගන්නා අය තුළ පිළිකුලක් ඇති නොවන පරිද්දෙන් ආහාර ගත යුතු ය.

4. බලා ඉන්නා අය තුළ ද අප්‍රසන්නතාවයක් ඇති නොවන පරිද්දෙන් ආහාර ගත යුතු ය.

5. ආහාර ගැනීමේ දී ආහාර ගන්නා ස්ථානයේ පවිත්‍රතාවයත් තම තමන්ගේ ඇඳුම් පැළඳුම් වල පවිත්‍රතාවයත් රැක ගත යුතු ය.

**ආහාර ගැනීමේ ගිහි සිරිත්**

ආහාර ගැනීම පිළිබඳ ඉහත සඳහන් භික්ෂු චාරිත්‍ර සියල්ල ගිහියනට ගැලපේ. එසේ ම බෞද්ධ ගිහියා විසින් ඒවා අනුගමනය කරනු ලැබේ. ගිහියන්ගේ වේවා පැවිද්දන්ගේ වේවා ආහාර ගැනීම සමාජ කාර්යයකි. සිරිත් විරිත් වෙසෙසින් අවශ්‍ය වන්නේ සමාජ කාර්යයන් සඳහා ය. පවුලේ සියලු දෙනා ම එකවර එකතු වී ආහාර ගන්නේ නම් ඉතා මැනවි.

කෑම ගැනීමට ප්‍රථම අත කට සෝද ගැනීම සිංහල බෞද්ධයන්ගේ සිරිතකි. කෑමට ආරාධනය කරන්නේ වතුර පිළිගැන්වීමෙනි. කෑම මෙසේ දී පවා වැඩිහිටියන්ට සැලකීම බෞද්ධ සිරිතයි. ආච්චිලා සීයලා ආදීන් සිටින්නේ නම් ඔවුන්ට පළමුවෙන් ආහාර පිළිගැන්වීම කරනු ලැබේ. එසේ ම කුඩා දරුවන් සිටින්නේ නම් ඔවුන්ට සැලකීම ද

සිරිතකි. අමුත්තන් සිටින්නේ නම් ඔවුන්ට සංග්‍රහ කිරීම ද පළමුවෙන් කරනු ලැබේ. පළමුවෙන් තමන්ට බෙද ගැනීම බෞද්ධ සිරිතක් නො වේ. ආහාර තමනට සෑහෙන පරිදි බේද ගැනීමටත්, කෙනෙකු බෙදන්නේ නම් අතිරික්ත වන පරිදි නොගැනීමටත් සිත තබා ගත යුතු ය. කෙනෙකු බෙදද්දී තමනට අනවශ්‍ය නම් පිඟානට උඩින් පිටි අල්ල ඇල්ලීම සිරිතකි. මෙය බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ සිරිතකි. කෙනෙකු බෙදද්දී තමනට අනවශ්‍ය නම් පාත්‍රයට උඩින් පිටි අල්ල දක්වීම උන් වහන්සේලාගේ සිරිත යි. මෙසේ කිරීමෙන් ආහාර නාස්තිය වළකී. සියලු දෙනා ම එකවර කෑම ගැනීම ආරම්භ කිරීම බෞද්ධ සිරිත යි.

කෑමට ගිජු නොවී පමණ දැන කෑම ගැනීම ඉතා උසස් බෞද්ධ සිරිතකි. භෝජනයෙහි මාත්‍රඥතාව (භෝජනයේ මිණුම හෙවත් පමණ) බුදුරජාණන් වහන්සේ විසින් පසළොස් චරණ ගුණ ධර්මවලින් එකක් ලෙස හඳුන්වා තිබේ.

උන් වහන්සේ භෝජනයේ මිම්ම හඳුන්වා දී ඇත්තේ මෙසේ ය. ''නිවන් ලබනු රිසි පැවිද්ද විසින් සම්පූර්ණයෙන් කුස පිරී තද නො වන පරිදි බඩට අල්ලන ප්‍රමාණයෙන් බත් පිඩු හතරක් පහක් අඩු කොට වළඳා පැන් පානය කළ යුතු ය. එසේ වැළඳීමෙන් ඉරියව් පැවැත්වීමේ පහසුවත් නීරෝග භාවයත් ඇති වන්නේ ය.''

(''චත්තාරො පඤ්ච ආලොපෙ - අභුත්වා උදකං පිවෙ
අලං ඵාසු විහාරාය - පහිතත්තස්ස භික්ඛුනො'')

කෑමට ඇති ගිජුකම නිසා බොහෝ දෙනකු කරදරයේ වැටෙන බව බුදුරදුන් විසින් දැක තිබීම නිසා ''භෝජනයේ පමණ දැන ගැනීම'' පිළිබඳව උන් වහන්සේ නොයෙක් අවස්ථාවල දී දේශනා කොට තිබේ. මාරයාට මැඩලීමට හෙවත් පරාජය කිරීමට නො හැකිවන පුද්ගලයකු තුළ තිබෙන ගුණ ධර්මයක් වශයෙන් ද ආහාරයේ පමණ දැන ගැනීම (භොජනම්හි ච මත්තඤ්ඤුං) බුදුරජාණන් වහන්සේ විසින් ධම්මපදයේ යමක වග්ගයේ දී පෙන්වා දී තිබේ.

පමණ දැන කෑම ගැනීමෙන් ඉරියව් පැවැත්වීමේ පහසුවත්, නීරෝගී භාවයත් ඇතිවන්නේ ය.

එකට කෑම ගන්නා අය තුළ පිළිකුලක් ඇති වන පරිද්දෙන් හැසිරීම බෞද්ධ චාරිත්‍රවලට එකඟ නොවේ. කෑම කන අවස්ථාවේ කැස්සක් කිවිසුමක් පහළවන ලකුණු දැනුනොත් කෑම මේසයෙන් ඉවතට ගොස් ඒ දේ කළ යුත්තේ අන්‍යයන් තුළ පිළිකුල ඇතිවීම වැළැක්වීමට ය. තලු ගැසීම, සුරු සුරු ගා ශබ්ද කිරීම ආදිය ද තව කෙනෙකුට පිළිකුල දැනවීමට හේතුවිය හැකි ය. එසේ ම එබඳු දර්ශන පිටින් බලා ඉන්නා අය තුළ ද අප්‍රසන්නතාවයක් ඇති කරයි.



2. ර.මු.නී.ස. 090669

කෑම බෙද ගැනීමේදී ද අන්‍යයන්ට කරදරයක් නොවිය යුතු ය. කෑම මේසය අපිරිසිදුවන අන්දමින් ඉතිරිවන කටු රොඩු ආදිය මේසය මත හෝ බිම දැමීම ද හොඳ සිරිතක් නො වේ. එසේ වුවහොත් පසුව කෑමට එන්නන්ට ඒ ස්ථානය පිළිකුල් දනවීමට හේතු වෙයි.

ඉඳුල් අත් වලින් හැඳි, වතුර භාජන ඇල්ලීමෙන් ද තව කෙනකු තුළ පිළිකුල ඇති වේ. වතුර බොන භාජන, වීදුරු ආදිය එක් එක් පුද්ගලයාට වෙන් වෙන්ව තබා ඇති අවස්ථාවල දී ඒවා මාරු නො වන සේ කටයුතු කිරීම ද හොඳ සිරිතකි. කෑම මේසයේ දී තමන්ගේ ඇඳුම් පැළඳුම් මෙන් ම අන්‍යයන්ගේ ඇඳුම් පැළඳුම් ද අපිරිසිදු නොවන පරිද්දෙන් කටයුතු කිරීම වැදගත් බෞද්ධ සිරිතකි. භොජන සඞ්ග්‍රහයක දී නම් එක් එක් පිඟාන වෙනුවෙන් තබා ඇති අත්පිස්නාව ඔඩොක්කුවේ එලා ගැනීම හොඳ බෞද්ධ සිරිතකි. භික්ෂූන් වහන්සේලාත් දන් වැළඳීමට ප්‍රථම ලේන්සුවක් වැනි හතරැස් රෙදි කඩක් ඔඩොක්කුවේ එලා ගනී. එයින් යම් යම් දේවල් වැටී ඇඳුම අපිරිසිදු වීම වළකී.

කෑම මේසයක දී සියලු දෙනම කෑම කා අවසන් වනතුරු අත සේදීම හෝ අසුනෙන් නැගිටීම කරනු නො ලැබේ. එයද භික්ෂූන් වහන්සේලාගෙන් ලද උසස් බෞද්ධ චාරිත්‍රයකි.

## 2.6 සෙනාසන පරිභෝගය පිළිබඳ සිරිත් විරිත්.

''ආරෝග්‍යා පරමා ලාභා'' යනුවෙන් වදාළ බුදුරජාණන් වහන්සේ නිරෝගීකම උතුම් ලාභයක් කොට සැලකූ සේක.

රෝගී බවට බොහෝ විට හේතු වන්නේ පවිත්‍රතාවය පිළිබඳ නො සැලකිලිමත් බවය. පුද්ගලයකුගේ අභ්‍යන්තර පවිත්‍රතාවය මෙන්ම බාහිර පවිත්‍රතාවය ද බුදු දහමෙහි දී ඉතා අගය කොට සලකනු ලැබේ. ආරාම ජීවිතයේ සියලු අවස්ථාවල දී පිරිසිදුකම රැකෙන පරිද්දෙන් කටයුතු කිරීමට බුදුරජාණන් වහන්සේ උපදෙස් දුන්හ. සෙනසුන පවත්වා ගන්නා අයුරු, වැසිකිළි භාවිතය, බොජුන් හළ හා ආහාර ගන්නා අයුරු, ගිලනුන්ට උවටැන් කිරීම ආදිය පිළිබඳව උන් වහන්සේ විසින් දෙන ලද උපදෙස් වලින් පෞද්ගලික සෞඛ්‍ය කෙරෙහි බුදු සසුනෙහි දක්වන සැලකිල්ල කොතරම් දැ යි පැහැදිලි වේ.

**සෙනාසන වත.**

යම්කිසි විහාරයක වසන භික්ෂුව විසින් පන්සල හෙවත් ආරාමය පවත්වා ගැනීම යදහා පැවැත්විය යුතු පිළිවෙත මෙයින් අදහස් කෙරේ. සේනාසනයෙහි තුණු කසළ වැඩිවී නම් එහි ඇති ඇඳ පුටු පඩික්කම් බුමුතුරුණු ආදිය, ඒවා පළමු තුබූ තැන් ලකුණු කර පිටතට ගෙන අව්වේ වියළා ධූලි ඉවත් කොට පවිත්‍ර කටයුතු වෙයි. සෙනාසනය

හමදනා කල මකුළු දැල් ආදිය ඉවත් කොට පළමුව උඩ (පියස්ස) පිසද ඉක්බිති බිත්ති හැමද පසු ව බිම හැමදිය යුතු වෙයි. ගෙබිම ධූලි වැඩිනම් වතුර ඉස ධූලි නොනැගෙන සේ හැමදිය යුතු වෙයි. කුණු කසළ ප්‍රමාණය වැඩිනම් පළමුව අතින් ගෙන, ඉක්බිති ඉළපතෙන් අතු ගා පුරවාගෙන කුණු කසළ ඉවත් කළ යුතු තැනට ගෙන ගොස් දමා අත් සෝද ගත යුතු යි. ඉක්බිති බුමුතුරුණු ආදිය අතුරා පළමු තිබූ පිළිවෙළින් ඇඳ පුටු ආදී අසුන් පැනවිය යුත්තේ ය. ධූලි සහිත වාතය එන දිශාවල දෙර ජනෙල් වැසිය යුත්තේ ය. ඒ ඒ වෙලාවට සුදුසු පරිදි කවුළු හැරීම හා වැසීම කළ යුතු ය. විහාරය විවෘත වන පරිදි නිතර ම කවුළු හැර තැබීම නො කළ යුතු ය. මිදුල් හැමද කසළ ද ඉවත් කළ යුතු ය. සෑ මලු, බෝමලු, ප්‍රතිමා ගෘහ පිරිසිදු කර තැබිය යුතු ය. බොන පැන් පරිභෝග පැන් තැබිය යුතු ය.

ආරාම මලු පෙත් අතුපතු ගෑම ඉතා වැදගත් කටයුත්තක් කොට සලකන ලදී. මොහොතකට පෙර තමන් අතුපතු ගෑ මිදුල දෙස බලා සිටීමෙන් ලත් ප්‍රීතියෙන් ඇතැම් භික්ෂූන් නිර්වාණය පවා අවබෝධ කරගත් බව සමන්ත පාසාදිකාවේ සඳහන් ය. උදෑසන අවදිවන භික්ෂූන් වහන්සේලා මලුපෙත් ඇමදීමෙන් ආරාමය පවිත්‍රව තබා ගන්නවා පමණක් නොව උන් වහන්සේලාගේ ශරීරයට එයින් සෑහෙන ව්‍යායාමයක් ද ලබා ගනිති. ආරාම ජීවිතයේ දී පැවිදි ජීවිතයට ඇතුළත්වන නවක සාමණේරයන් වහන්සේලාට උන් වහන්සේලාගේ ආචාර්ය වත් පිළිවෙත්වලට මෙම පවිත්‍ර කටයුතු ඇතුළත් කිරීම නිසා පැවිදි ජීවිතයේ මුල සිට ම ඒ සඳහා පුහුණුවක් ලැබේ.

ආගන්තුක භික්ෂුවක් ආරාමයට පැමිණියේ වී නමුත් එහි සෙනසුනක් ලද කල්හි පළමුවෙන් කළ යුතු ව ඇත්තේ එය කලින් අතිකකු විසූ තැනක් ද නොවිසූ තැනක් ද යි විමසා බැලීම ය. අතිකකු නො විසූ තැනක් නම් පරීක්ෂා කොට එයට ඇතුළු විය යුතු ය. එසේ කළ යුත්තේ ස්ථානය ආරක්ෂා සහිත තැනක් ද යන්න දැනගැනීමට ය.

ඉක්බිති කළ යුත්තේ ස්ථානය ඇමද පිරිසිදු කිරීමයි. අවට මිදුල්වල කසළ ඇති නම් ඒවා ද ඉවත් කළ යුතු ය. වැසිකිළිය අපවිත්‍ර නම් ඇම ද පිරිසිදු කළ යුතු ය.

**ගිහියාට ආදර්ශයක්.**

බෞද්ධ භික්ෂූන් වහන්සේලා මෙසේ ආරාම පවත්වාගෙන යාම ගිහියාට ආදර්ශයක් විය. පන්සලට පැමිණෙන ගිහියාට එහි මනා ලෙස අමදිනු ලැබූ පන්සල් මිදුල, බෝමලුව, සෑ මලුව දක්නට ලැබේ. බොහෝ අවස්ථාවල මිදුල් සහ සෑ මලු ඉදලෙන් ඇමද ඇත්තේ ලස්සන රටාවක් ගොඩනැගෙන සේ ක්‍රමවත් පරිද්දෙනි. එබැවින් අමදිනු

ලැබූ මීදුලෙහි පවිත්‍රත්වය සමඟ සුන්දරත්වයකුත් දකින්නට හැකිවෙයි. පන්සල වටේ, මලුව වටේ ලස්සනට වවා ඇති මල් ගස් ද ගිහියාගේ ඇසට ලක් වේ. සුදු හුණෙන් බැබළෙන පන්සල් ගොඩනැගිලිවල බිත්ති ආදියත් ඔහුගේ සිත් ගනී. පන්සල පවිත්‍රය. චාම්ය, බෞද්ධ ගිහියා පන්සලේ බාහිර දර්ශනයෙන් ලබා ගන්නා ආස්වාදය ඔහුගේ නිවසෙන් පිළිබිඹු කරයි. තවමත් ගම්බද බෞද්ධ ගෙවල්වල දක්නට ලැබෙන සුදු හුණු ගෑ බිත්ති, ගොම මැටි ගෑ ගෙබිම්, රටාවකට අමදින ලද මීදුල මල්ගස් ටිකක් වවා අලංකාර කළ වටාපිටාව ගමේ පන්සලෙන් ලැබුණු ආභාසය යි.

පාත්‍ර සිවුරු නිතර නිතර සෝද වියළා තබා ගැනීම භික්ෂූන් වහන්සේගේ සිරිත ය. උන් වහන්සේ මුල සිට ම ස්වකීය ශිෂ්‍යයාට පා සිවුරු සෝද පවිත්‍රව තබා ගැනීමට මග පෙන්වයි. ශිෂ්‍යයා ගුරුවත් පිරිමක් වශයෙන් ආචාර්යවරයා වැළඳූ පාත්‍ර භාජනාදිය සෝද තැන්පත් කරයි. ආචාර්යවරයාගේ සිවුරු තෙත නම් වියළා නමා තැන්පත් කර තබයි. පැන් භාජනය පුරවා වසා තබයි. ආරාමයේ භාණ්ඩ තබා ගැනීමේ ක්‍රමයක් හා ඒ ඒ දේවලට නිසි තැනක් ද ඇත. මෙයින් ද ගිහියාට උපදෙස් ගත හැකි ය.

ආරාමයට ඇතුල් වන භික්ෂූන් වහන්සේ පාවහන් ගලවා පිටත තැබීම සිරිතකි. මෙය පවිත්‍රතාවයට අදළ වැදගත් සිරිතකි. පාවහන් පිටින් ගෙතුළට ගියහොත් පාවහන්වල යටි පැත්තේ දූවටී ඇති විෂ-බීජාදිය ද ගෙතුළට යැවෙයි. පාවහන් ගලවා දෙපය සෝද ගෙන ඇතුළුවීමත් සිරිති.

භික්ෂූන් වහන්සේගේ මේ සිරිත බෞද්ධ ගිහියෝ ද අනුගමනය කරති. විහාර පන්සල වලට කොහොමත් පාවහන් පිටින් බෞද්ධයෝ ඇතුල් නොවෙති. ගෙවල්වලට ඇතුල්වීමේ දී ද මේ සිරිත අනුගම-නය කරනු ලැබේ. විශේෂයෙන් පිට අයගේ ගෙවලට ඇතුල්වීමේ දී මේ බෞද්ධ සිරිත අනුගමනය කිරීම ඒ අයගේ සෞඛ්‍ය කෙරෙහි දක්වන සැලකිල්ලකි.

**ගමික වත.**

යම්කිසි සෙනසුනක වාසය කොට එයින් පිටවව යන තැනැත්තා විසින් පිළිපැදිය යුතු වත ගමික වත යි. භික්ෂූන් වහන්සේලාගේ ගමික වත ගිහියාට ද වැදගත් ආදර්ශයක් සපයයි. යම්කිසි සෙනසුනක වැස පිටවව යන පැවිද්ද එහි බඩු මුට්ටු ආදිය විනාශ වන පරිද්දෙන් නොසලකා හැර දමා නොයයි. කාමරයේ කුණු කසළ ඉවත්කොට මැනවින් පවිත්‍ර කර දොර, ජනෙල් වසා යතුර ආවාසයේ සුදුස්සකුට භාර දෙයි. ආවාසය තෙමෙනවා නම් තමාට සෙවිළි කළ හැකි නම් එසේ කළ යුතු යි. නැතිනම් එහි බඩුමුට්ටු නොතෙමෙන අයුරු තැන්පත් කළ යුතු ය.

බෞද්ධ චාරිත්‍ර අගය කරන ගිහියන් තුළ ද මේ සිරිත දකිය හැකි ය. තමා ලැගුම් ගත් තැන පවිත්‍ර කොට බඩු බාහිරාදිය තිබූ පරිදි නිසි ලෙස තැබීම අවශ්‍ය ය. වන්දනා ගමන්වල දී මේ සිරිත නිසි ලෙස පිළිපදින බෞද්ධයන් දක්නට ලැබේ. ලැගුම් ගත් විශ්‍රාම ශාලාව හෝ අම්බලම හෝ වේවා එහි ලිප් බැන්දේ නම් ලිප් කඩා, ලිග්ගල් තිබිය යුතු තැන තබා, අළු අස් කොට මැනවින් අතුගා, යම්කිසි පොදු භාණ්ඩයක් තිබේ නම් ආරක්ෂා සහිතව තබා යාම හොඳ බෞද්ධ සිරිතකි. එක් අතකින් එය තමන්ට පිහිට වූ ස්ථානයට කරන කළගුණ සැලකීමකි. තමන් වහන්සේට බුද්ධත්වය ලබා ගැනීමට පිහිට වූ අචේතනික බෝධීන් වහන්සේට සතියක් අනිමිස ලෝචන පූජාවෙන් පුදකොට බුදුරජාණන් වහන්සේ අපට මේ ආදර්ශය දුන්සේක.

ස්ථානය පවිත්‍රව නිසි පරිදි තබා යාම නැවතත් එතැන ලැගුම් ගැනීමට එන පිරිසට කරන සැලකිල්ලකි.

**වැසිකිළි වත.**

නිතරම වැඩිමහල්ලාට මුල්තැන දෙන බුදු සස්නේ එ සිරිතට පටහැනි ව කටයුතු කරන්නේ වැසිකිළියට, කෙසිකිළියට හා නාන තොටට පිවිසීමේ දී පමණි. මේ ස්ථාන තුනට පැමිණි පිළිවෙළට ඇතුල් විය හැකි ය. වැසිකිළියට එන තැනැත්තේ ඇතුළෙහි කිසිවකු ඇති නැති බව දැනගැනීමට පිට සිට කැරීම කරයි. ඇතුළත කෙනෙකු සිටීනම් පිටත ඉන්නා අයට ඒ බව දැනගැනීමට ප්‍රතිචාර වශයෙන් කැරීම කළ යුතු වෙයි.

සිවුර දැමීමට ඇති වැලෙහි හෝ දඬුවෙහි සිවුර දමා වැසිකිළියට පිවිසිය යුතු ය. පාදුකාව උඩට පැමිණෙන තුරු අඳනය නො එසවිය යුතු ය. ශබ්ද නැගෙන සේ තතනමින් වර්චස් කිරීම නුසුදුසුය. එසේම දැහැටි ආදිය සපමින් වර්චස් නො කළ යුතු ය. වර්චස් කරන තැනින් බැහැර වර්චස් නො කළ යුතුවාක් මෙන් ඉන් පිටත මුත්‍රා ද නො කළ යුතු ය. පෙර මේ කාර්ය දෙකට ස්ථාන දෙකක් තිබිණ. මුත්‍ර කරන තැන කෙළ නොගැසිය යුතු ය. ශබ්ද නැගෙන සේ සේදීම ද නොකළ යුතු ය. පාදුකාව මත ම සිට අඳනය පහත දමා ඉන් පිටතට යා යුතු ය. සේදීමට ගත් වතුර බඳුනෙහි ඉතිරි කර නොතැබිය යුතු ය. වැසිකිළියෙහි වතුර අවසන් වී නම් තැබිය යුතු ය. වැසිකිළිය අපවිත්‍ර වී ඇති නම් එය සෝදා පවිත්‍ර කිරීම ද යුතුකමකි. ජලය නොමැති නම් අන් ක්‍රමයකින් පවිත්‍ර කළ යුතු ය. තමා නිසා වැසිකිළිය අපවිත්‍ර වුවහොත් වෙන කෙනෙකුට එය පවිත්‍ර කිරීමට ඉඩ නොතබා තමා විසින් ම පවිත්‍ර කිරීම යුතුකමයි. වැසිකිළියෙහි හා ඉන් පිටත කසළ, ඇතොත් ඇමද පවිත්‍ර කිරීම ද කළ යුතු වෙයි.

බුදුරජාණන් වහන්සේගේ වැසිකිළි භාවිතය පිළිබඳ මෙම උපදේශ සෞඛ්‍යය පවත්වා ගැනීම සඳහා කොතරම් අගේ ද?

වැසිකිළි චාරිත්‍රයක් කඩකිරීම නිසා බුද්ධකාලයේ දී පවා භික්ෂූන් අතර ආරවුලක් ඇති වූ බව කොසඹෑ නුවර වහන්දෑගේ සිද්ධියෙන් පැහැදිලි වේ.

ධර්මධර භික්ෂුවක් වැසිකිළියට ගොස් සේදීමට ගත් වතුර බඳුනෙහි පැන් ටිකක් ඉතිරි කර ඒම නිසා විනයධර භික්ෂූහු ඔහුට දෙස් නැඟූහ.

මෙ නිසා විනයධර ධර්මධර භික්ෂූන් අතර ඇති වූ කලහය කෙළවරකට නොපැමිණියෙන් බුදුරජාණන් වහන්සේට කොසඹෑ නුවර අත්හැර පාරිලෙය්‍ය වනයට යාමට ද සිදු විය.

වැසිකිළි භාවිතය පිළිබඳ මෙම චාරිත්‍ර ගිහි පැවිදි භෙදයක් නොමැතිව දෙපක්ෂයට ම එකසේ සුදුසු ය. මළ මූත්‍ර මගින් බෝවෙන රෝග ව්‍යාප්ත වීමට හේතු වී ඇත්තේ වැසිකිළි භාවිතයේ නොසැලකිල්ල නිසයි. අන් අයෙකු අපවිත්‍ර කර ඇති වැසිකිළිය පවිත්‍ර කිරීම කෙනකු-ගේ නිහතමානීබවේ ලක්ෂණයක් ද වෙයි.

වැසිකිළියට පිවිසීමට ප්‍රථම උගුර පෑදීමේ සන්නිවේදන මාධ්‍යය ද වටිනා චාරිත්‍රයකි. දෙරවල්, බිත්ති ආදියෙන් ආවරණය වූ කාමරයකට හෝ එබඳු තැනකට ඇතුළුවීමට පෙර එතුළ සිටින්නාට දැනගැනීමට යම්කිසි සංඥවක් කිරීම උසස් බෞද්ධ චාරිත්‍රයකි.

## 2.7 ගිලානෝපස්ථානය පිළිබඳ සිරිත් විරිත්.

ගිලනුන්ට උපස්ථාන කිරීම බෞද්ධයකුගේ උසස් චාරිත්‍ර ධර්මයක් මෙන් ම එය උසස් සමාජ සේවයක් ද වන්නේ ය. බුදුරජාණන් වහන්සේ තමන් වහන්සේ විසින් ම ගිලානෝපස්ථානයේ යෙදී භික්-ෂූන්ට ආදර්ශය දී, හැම භික්ෂුවකට ම ගිලානෝපස්ථානයේ යෙදීමට අනුදැන වදාළ සේක.

එක් දිනක් අනඳ හිමියන් සමඟ භික්ෂූන් වහන්සේලාගේ සෙනසුන් බලා ඇවිදින බුදුරජාණන් වහන්සේට රෝගී වූ භික්ෂුවක් හමු විය. රෝගී භික්ෂුව උදරාබාධයකින් පෙළෙන බවත්, තමනට උපස්ථායකයකු නැති බවත් පැවසී ය. බුදුරජාණන් වහන්සේ අනඳ හිමියන් ලවා දිය ගෙන්වා ගත් සේක. ඉක්බිති රෝගාතුර භික්ෂුව ඉවතට ගෙන බුදුරජුන් පැන් වත්කරද්දී අනඳ හිමියෝ රෝගියා පිරිසිදු කළහ. අනතුරුව සිවුරු හඳවා බුදුරජාණන් වහන්සේ රෝගියාගේ හිස පසින් ද, අනඳ හිමියෝ පය පසින් ද ගෙන රෝගියා ඇඳෙහි තැබූහ. ඉක්බිති විහාරයට ගිය බුදුරජාණන් වහන්සේ අසවල් සෙනසුනෙහි වසන ගිලන් භික්ෂුවට

උපස්ථායක කෙනකු ඇත්දැයි භික්ෂූන්ගෙන් විචාළ සේක. භික්ෂූහු ''නැතැ''යි පිළිතුරු දුන්හ. ''එසේ නම් කුමක් නිසා භික්ෂූහු ඒ මහණහුට උපස්ථාන නොකරත්ද''යි බුදුහු විචාළහ. ''ස්වාමීනි, ඒ භික්ෂුව අන්‍ය භික්ෂූන්ට උපස්ථාන නොකරන්නෙකි.''යි භික්ෂූහු වදාළහ.

''මහණෙනි, තුඹලාට උපස්ථාන කරන මවක් හෝ පියෙක් නැත. මහණෙනි, තෙපි ඔවුනොවුන්ට උපස්ථාන නො කරන්නාහු නම්, කවරෙක් තොපට උපස්ථාන කෙරෙත් ද? මහණෙනි, මාගේ අවවාදය පිළිගැනීම් වශයෙන් යමෙක් මා හට උපස්ථාන කරන්නේ ද හේ ගිලනාට උපස්ථාන කරන්නේ ය. මහණෙනි, රෝගී භික්ෂුවට ආචාර්ය-වරයෙක් උපාධ්‍යායවරයෙක් වේ නම් ඔහු විසින් දිවිහිමියෙන් රෝගියාට උවටැන් කළ යුතු ය. රෝගියා ගේ සුවය ගැන බලාපොරොත්තු විය යුතු ය. ඉදින් ශිෂ්‍යයකු හෝ අන්තේවාසිකයකු ඇත්නම් ඔහු විසින් දිවි හිමියෙන් උපස්ථාන කළ යුතු ය. රෝගියාගේ සුවය බලාපොරොත්තු විය යුතු ය. යම් රෝගියකුට ඒ කිසිවකු නැත්නම් ඒ භික්ෂුවට සංඝයා විසින් උපස්ථාන කළ යුතු ය.''යි බුදුරජාණන් වහන්සේ වදාළ සේක. ''යම්කිසි විහාරයකට පැමිණෙන ආගන්තුක භික්ෂුවකට හෝ ශිෂ්‍යාදීන් නැති භික්ෂුවකට අසනීපයක් වුවහොත් සංඝයා විසින් ඔහුට උපස්ථාන කළ යුතු ය. රෝගීන් ද උපස්ථානයට පහසුවන සේ හැසිරිය යුතු ය.''යි බුදුන් වහන්සේ තවදුරටත් වදාළ සේක.

මෙහිදී බුදුරජාණන් වහන්සේ උපස්ථායකයා තුළ තිබිය යුතු ගුණාංග පහක් ද, ගිලනා තුළ තිබිය යුතු ගුණාංග පහක් ද වදාළ හ.

## උපස්ථායකයා තුළ තිබිය යුතු ගුණාංග

1. දක්ෂ උපස්ථායකයා ගිලනාට හිත බෙහෙත් පිළියෙල කර දෙයි.

2. හිත අහිත ආහාර පාන දැන, හිත බොජුන් සපයයි. අහිතකර බොජුන් ඉවත් කරයි.

3. ලාභ ප්‍රයෝජන අපේක්ෂාවෙන් නොව මෙත් කුළුණෙන් උවටැන් කරයි.

4. මළ - මුත්‍ර ආදිය ඉවත් කිරීමේ දී පිළිකුල් නූපදවයි.

5. වරින් වර ගිලනාගේ හිත සැනසෙන පරිදි උපදෙස් දෙයි.

## උපස්ථානයට යෝග්‍ය ගිලනා

1. සැප වූ ආහාර පාන ගනියි.

2. සැප වූ ආහාර පානාදියෙහි පමණ දනියි.

3. නියමිත වේලාවට බෙහෙත් පාවිච්චි කරයි.

4. උපස්ථායකයාට තමාගේ අසනීප තොරතුරු නො සඟවා දක්වයි.

5. ධෛර්යය උපදවා රෝගය ඉවසයි.

බුදුරදුන් විසින් 'ඉතා මා හැඟි'යි අගය කළ ගිලානෝපස්ථානය භික්ෂු සමාජය තුළ මැනවින් වැඩී ගියේ ය. එසේ ම එය ගිහි බෞද්ධ යන් අතර ද මැනවින් ප්‍රචලිත විය.

**බෞද්ධ රජවරුන්ගේ සෞඛ්‍ය සේවා.**

සෞඛ්‍ය සේවාවන් සඳහා මහත් උනන්දුවක් දක්වූ ධර්මාශෝක අධිරාජයා මිනිසුන්ට පමණක් නොව සතුන්ට ද ආරෝග්‍යශාලා පිහිට විය. එසේ ම එතුමා බෙහෙත් පැළෑටි සැම තැනම රෝපණය කෙළේය. බෙහෙත් වර්ග තැන්පත් කර තැබීමට ද එතුමා කටයුතු සැලැස්වීය. එකල රජවරුන් අසරණයන්ට නොමිලේ බෙහෙත් දුන් අතර වෙදකම් කළ වෛද්‍යවරුන්ට ගම් බිම් ආදිය ප්‍රදානය කළ බව ද සඳහන් ය.

සමහර ඉඩකඩම් බෙහෙත් ද්‍රව්‍ය ආදිය වැවීම පිණිස වෙන් කරන ලද බව ද සඳහන් ය.

ලෙඩුන්ට සාත්තු කරනු පිණිස ආරෝග්‍යශාලා පිහිටුවා පවත්වා ගෙන යාම බෞද්ධ සිංහල රජුන්ගේ ද සිරිත විය. ඉතා දක්ෂ වෛද්‍ය-වරයකුව ප්‍රසිද්ධව සිටි බුද්ධදාස රජ (337 - 365) ලක්දිව මුළුල්ලේ සැම ගම් දහයකට ම වෛද්‍යවරයෙකු බැගින් පත් කොට ගමක් ගමක් පාසා වෙදහල් කරවූ බව වංශකථාවල ද සඳහන් ය. පිළුන්, ගැබිණි මවුවරුන්, අන්ධයන් සහ රෝගීන් සඳහා ආරෝග්‍යශාලා සහ දානශාලා කරවූ තවත් රජෙක් නම් I උපතිස්ස (365 - 406) ය. උදය රජතුමා (797 - 801) පොළොන්නරුවේ සහ පදවියේ ආරෝග්‍යශාලා කරවා ඒවායේ නඩත්තුව සඳහා ගම් ප්‍රදානය කළ බව ද කියනු ලැබේ. V කාශ්‍යප (914 - 923) රජතුමා ද, වසංගත රෝගීන්ට සාත්තු කිරීම පිණිස අනුරාධපුර නගරයේ ආරෝග්‍යශාලා තනවා නගරයේ ඒ ඒ පෙදෙස්වල වෙදහල් පිහිටු විය.

IV කාශ්‍යප (898 - 914) IV මහින්ද (956 - 972) යන රජවරු ද සෞඛ්‍ය සේවා කටයුතු කළ අය වශයෙන් චූලවංශයේ සඳහන් ය. ආරෝග්‍යශාලාවල නඩත්තුව සඳහා කළ පවරාදීම් සෙල්ලිපිවල සඳහන් ය. සමහර ආරෝග්‍යශාලා නටබුන් ද දැන් හඳුනා ගෙන තිබේ. බුදු දහමින් ලැබුණු ආභාසය නිසා බෞද්ධ රාජ්‍යවල සෞඛ්‍ය සේවය වැදගත් සුභ-සාධක කටයුත්තක් වූ බව මෙයින් පැහැදිලිය.

කළ සංකල්පය නම් ගුරු – ගෝල දෙපක්ෂය අතර පිය පුතු සංකල්පය ඉපදවීම යි.

''මහණෙනි, උපාධ්‍යාය තෙමේ සද්ධි විහාරිකයා කෙරෙහි මේ තෙමේ මාගේ පුතුය යන සිත උපදවන්නේ ය. සද්ධි විහාරික තෙමේ උපාධ්‍යායක කෙරෙහි මේ තෙමේ මාගේ පියා යන සිත උපදවන්නේ ය.'' මේ බුදුරජාණන් වහන්සේ විසින් ''මහාවග්ගපාලියේ'' දී පිය – පුතු සංකල්පය ඉදිරිපත් කළ අයුරු යි.

ආරාම අධ්‍යාපනයේ දී ගුරුවරයා හැඳින්වීමට ''උපාධ්‍යාය'' යන වචනයත්, ''ආචාරිය'' යන වචනයත් යෙදේ. ශිෂ්‍යයා හැඳින්වීමට යෙදෙන්නේ ''සද්ධි විහාරික'' යන වචනයත්, ''අන්තේවාසික'' යන වචනයත් ය.

පිය-පුතු සංකල්පය යනු කුමක් දැයි ඉතා සරල භාෂාවෙන් කියතොත් ගුරුවරයා විසින් තම ගෝලයා පුත්‍රයා ලෙස සැලකිය යුතු ය, ගෝලයා විසින් තම ගුරුවරයා තමාගේ පියා ලෙස සැලකිය යුතු ය යනු ය. පියෙකුත් පුතකුත් අතර ඇති සම්බන්ධය ගුරුවරයාත් ශිෂ්‍යයාත් අතර ඇති වන්නේ නම් එය ඉතා විශිෂ්ට සම්බන්ධයක් බව අමුතුවෙන් කිව යුතු නොවේ.

බුදුරජාණන් වහන්සේ මේ සංකල්පය ක්‍රියාත්මක කිරීමට සුදුසු උපදෙස් ද දුන්හ.

ආරාම අධ්‍යාපනයේ දී ගෝලයා සඳහා භාවිතා කරන පද ''සද්ධි විහාරික'' හා ''අන්තේවාසික'' බව මුලින් සඳහන් කරන ලදී. මේ වචන දෙකේ ම අදහස ''ළඟ හැසිරෙන්නා'' හෙවත් ''ළඟ වසන්නා'' යනු යි. ආරාම අධ්‍යාපනය නේවාසික අධ්‍යාපනයකි. එහිදී ශිෂ්‍යයා නිතර ම වාසය කරන්නේ ගුරුවරයා ඇසුරේ ය.

**උපාධ්‍යාය වත හෙවත් ශිෂ්‍යයා විසින් ගුරුවරයා කෙරෙහි පැවතිය යුතු අන්දම.**

පුතකු පියකුට සලකන අයුරින් අලුයම පිබිදුනු වේලාවේ පටන් රාත්‍රී නින්දට යන තුරු ශිෂ්‍යයා විසින් ගුරුවරයා කෙරෙහි පැවැත්විය යුතු ආචාර ධර්ම මහාවග්ග පාලියේ මහා ඛන්ධකයේ සඳහන් ව ඇත. ඒවා ලුහුඬින් මෙසේ ය.

කලින් අවදිවන ශිෂ්‍යයා ගුරුවරයාගේ රුචිය අනුව දැහැටි හා මුව දෝනා පැන් පිළිගන්වයි. ඉක්බිති ගුරුවරයා වසන විහාරය, මිදුල හා වැසිකිළිය ද ඇමද පිරිසිදු කරයි. කැඳ බත් ආදී යමක් ඇතොත් ගුරුකුමාට පිළිගන්වා වළඳා අවසානයේ දී භාජන සෝද තැන්පත් කරයි.

වැළඳූ තැන ද පවිත්‍ර කොට ආසන පිළියෙල කොට තබයි. ඉක්බිති ගුරුවරයා පිඩු පිණිස ගමට යනු රිසි වී නම් පා සිවුරු පිළිගන්වා, ගුරුවරයා තමාගේ පැමිණීමක් බලාපොරොත්තු වන්නේ නම් සිවුරු හැඳ පොරවා, පාත්‍රය ගෙන පසු පසින් ගමන් කරයි. පිඩු සිඟා ගත් පසු තමා පළමුවෙන් පැමිණ පා සිවුරු තබා පෙර මඟට ගොස් ගුරුවරයාගේ පා සිවුරු පිළිගනියි. ඉක්බිති ගුරුවරයාට පා සේදීම පිණිස පැන් තබා, අසුන් පනවා ගුරුවරයා වාඩි වූ කල්හි පැන් හා ආහාර පිළිගන්වයි. ගුරුවරයා වළඳා අවසන් කළ විට පාත්‍ර ආදී භාජන සෝද තබා තමාත් ආහාර වළඳයි. කාලය ඉක්මෙන්නට ළංව තිබේ නම් ගුරුතුමාට පැන් හා ආහාර පිළිගන්වා තමාත් වළඳා ඊට පසු ගුරුවරයාගේ වත් සපුරයි.

තවද ගුරුවරයාගේ සිවුරු තමා තබයි. සිවුරු තෙත් වී නම් වියළා තමා තබයි. ගුරුවරයා බැහැර ගොස් එන සෑම වේලාවක ම පෙර මඟට ගොස් පා සිවුරු පිළිගනියි. පැන් තබා ගිලන්පස ඇත්නම් පිළිගන්වයි.

ගුරුවරයා ස්නානය කරනු කැමති නම් උණු පැන් හෝ සිහිල් පැන් සපය යි. ගුරුවරයා පිටතට ගොස් නාන්නේ නම් අවශ්‍ය උපකරණ එහි ගෙන යයි. ගුරුවරයා කැමති වන්නේ නම් නෑවීම හා ඇඟ ඉලීම ද කරයි. ස්නානය කොට අවසන් වූ පසු ගුරුවරයාගේ ජල සාටක ආදී උපකරණ විහාරයට ගෙනැවිත් තබයි.

ගුරුවරයාගේ සිවුරු සේදීමට ඇත්නම් සෝද වියළා තබයි. සිවුරු පඬු පෙවීමට ඇත්නම් එය ද කරයි. නැතහොත් ගුරුවරයාට ඒ සඳහා උදව් වෙයි. මෙතෙක් සඳහන් කෙළේ ගුරුවරයාගේ පෞද්ගලික ජීවිතය හා සම්බන්ධ කටයුතු සඳහා ශිෂ්‍යයා උදව් වෙන අයුරු යි.

මේ හැර ගුරුවරයා කෙරෙහි පැවැත්විය යුතු විශේෂ ආචාර ධර්ම කීපයක් ද වෙයි.

ගුරුවරයා කථා කරන කල්හි. එය නිමවන්නට කලින් අතරට කථා නොහෙළිය යුතු ය. එයේ ම ගුරුවරයා යම්කිසි කථාවක් කරන විට එයට අතුරු කථා නො කිය යුතු ය. එහෙත් වරද සහිත කථාවක් කරන්නේ නම් එය වැළැක්විය යුතු ය. එහෙත් ගුරුවරයාගේ වරදක් දැක නිහඬව සිටීම ද බෞද්ධ ගුරු ශිෂ්‍ය සම්බන්ධයට නො ගැළපේ. ගුරුවරයා වෙත කරුණාවෙන් ගුරුවරයාගේ සිත නොරිදෙන සේ එය පෙන්වා දිය යුතු යි. එ් විතරක් නොවේ. ගුරුවරයාට ශාසනයේ යම් කලකිරීමක් වුවහොත් ගුරුවරයාගේ පදිංචිය වෙනස් කර වෙන තැනකට ගෙන යා යුතු යි. මෙවැනි දෙයක් තමාට කළ නොහැකි නම් ශිෂ්‍යයා කළ යුත්තේ තම ගුරුවරයාගේ හිතවතුන්ට ඒ බව පවසා සුදුසු

ක්‍රියා මාර්ගයක් ගැනීම ය. මෙසේ ගුරුවරයා කෙරෙහි දයාවෙන් කටයුතු කිරීමෙන් ගුරුවරයා මෙන් ම මෙය දකින වෙනත් අයත් ශිෂ්‍යයා කෙරෙහි පැහැදෙති.

ගුරුවරයාගෙන් අවසර නො ගෙන උන් වහන්සේට අහිතවත් පුද්ගලයන්ට පාත්‍ර සිවුරු කිසිවක් නොදිය යුතු යි. ඔවුන් දෙන දෙයක් පිළිනොගත යුතු යි. ඔවුනට වත් නොකළ යුතු යි. ගුරුවරයාගේ අවසර නොගෙන පිටත නොයා යුතු යි. ගුරුවරයා රෝගාතුර වුවහොත් දිවි හිමියෙන් උවටැන් කළ යුතු ය. ගුරුවරයාට ගෝලයන් වැඩි ගණනාවක් උවටැන් කිරීමට සිටින්නේ නම් වත් බෙදගෙන කළ යුතු ය.

**සද්ධි විහාරික වත හෙවත් ගුරුවරයා ශිෂ්‍යයා කෙරෙහි පැවතිය යුතු අන්දම**

ගුරු ශිෂ්‍යයා සම්බන්ධ පිය පුතු සංකල්පය තහවුරු වීමට නම් ගුරුවරයා විසින් ද ශිෂ්‍යයාට ගරු සැලකිලි දැක්විය යුතු ය.

ස්වකීය ශිෂ්‍යයා ගිලන් වුවහොත් ගුරුවරයා විසින් ශිෂ්‍යයා තමන් වහන්සේට කළ සියලු ම වත් පිළිවෙත් පෙරළා ශිෂ්‍යයා වෙනුවෙන් ද කළ යුතු ය. මේ අනුව ගුරුවරයා කලින් අවදි වී ශිෂ්‍යයාට දැහැටි දිය යුතු ය. මුව දෝනා දිය සැපයිය යුතු ය. අසුන් පැනවිය යුතු ය. මේ ආදී වශයෙන් දවසේ අවසානය දක්වා සියලු වතාවත් ශිෂ්‍යයාට දැක්විය යුතු ය. ශිෂ්‍යයා ගිලන් නම් මේ වැඩ පිළිවෙළ ශිෂ්‍යයාගේ ගිලන් බව මගහැරෙන තුරු ගුරුතුමා විසින් කළ යුතු වේ. මෙසේ කිරීමෙන් ශිෂ්‍යයා තුළ ගුරුවරයා කෙරෙහි පිය සෙනෙහස ඇතිවනු නිසැක ය.

ගුරුවරයා විසින් ශිෂ්‍යයාට පාත්‍ර සිවුරු ආදියෙන් අඩුපාඩුකම් තිබේ දැ යි සොයා බැලිය යුතු ය. ශිෂ්‍යයාට අඩුපාඩුකම් තිබේ නම් ආචාර්යවරයා සම්පූර්ණ කළ යුතු වෙයි. තමන් වෙත නොමැති නම් ඒවා ලබාදීමට උත්සාහ කළ යුතු යි.

මේ අන්දමින් ශිෂ්‍යයාගේ සියලුම කායික අවශ්‍යතා සපුරන ගමන් ඔහුගේ බුද්ධිමය වර්ධනයට හා සදචාර වර්ධනයට අවශ්‍ය දෑ ගුරුවරයා විසින් සපුරා ඉටු කළ යුතු වෙයි.

ශිෂ්‍යයාට ධර්ම විනය පාඩම් කරවීමෙන් ද, ඒවායේ අර්ථ අදහස් කියා දීමෙන් ද, වරද කළ කල්හි අවවාද කිරීමෙන් ද, අනුග්‍රහ කළ යුතු ය.

ශිෂ්‍යයාට බුදු සසුන ගැන හෝ පැවිද්ද ගැන හෝ කලකිරීමක් ඇති වුවහොත් කරුණු පහදා දීමෙන් එය දුරු කළ යුතු ය. තමා එයට නො සමත් නම් අනිකකු ලවා හෝ එය කළ යුතු වෙයි.

ශිෂ්‍යයාට යම්කිසි කරුණක් ගැන සැකයක් ඇති වුවහොත් එය දුරු කළ යුතු ය. ඉදින් අතවැසියාට යම්කිසි දෘෂ්ටියක් ඇති වුවහොත් එය මහ හැරවීමට ඔහුට දහම් දෙසිය යුතු වේ.

මේ හැරෙන්නට සිවුරු කැපීම, මැසීම, පඩු පෙවීම, සේදීම යනාදිය කරන හැටි කියා දී එම කටයුතුවල කුසලතාවක් ශිෂ්‍යයාට ලැබෙන පරිද්දෙන් ආචාර්යතුමා කටයුතු කළ යුතු යි.

ආචාර්යවරයා හා ශිෂ්‍යයා අතර යම්කිසි මත භේදයක්. ඇතිවන්නට ගියහොත් දෙදෙනාගේ ම නිදහස රැකෙන පරිද්දෙන් ඇත්විය යුතු වේ. මේ බඳු අවස්ථාවක දී විශේෂ බලයක් ආචාර්යතුමාට තිබීම සාධාරණ ය.

මනාව නොපවතින ශිෂ්‍යයා පළවා හරින්නට ආචාර්යවරයාට බලය තිබේ. තමා හා සහයෝගයෙන් කටයුතු නොකරන, තමා දෙන අවවාද අනුශාසනා පිළි නොපදින අවිනීත ගෝලයා ආරාමයෙන් බැහැර කළ යුතු ය. මේ වරප්‍රසාද ආචාර්යවරයාට ලැබී ඇත්තේ ශිෂ්‍යයා මනාව හික්මවා ගැනීමට පහසුවීමට මිසක් අත්තනෝමතිකව කටයුතු කිරීමට නොවේ. ගුරුවරයා කෙරෙහි අධික ප්‍රේමයක් ඇති, අධික ලජ්ජාවක් ඇති, අධික මෛත්‍රියක් ඇති, අධික ගෞරවයක් ඇති ශිෂ්‍යයකු අරමින් බැහැර කිරීම බරපතල වරදක් බව සැලකිය යුතු ය.

මේ අන්දමින් ගුරු - ශිෂ්‍යයන් එකිනෙකා කෙරෙහි පිය පුතු ආකල්පයෙන් යුතුව කටයුතු කරන්නේ නම් මනා ගුරු ශිෂ්‍ය සම්බන්ධයක් ඇතිවන බව අමුතුවෙන් කිවයුතු නො වේ. ආරාම අධ්‍යාපනයේ දී ක්‍රියාත්මක වූ ඉහත සඳහන් උපාධ්‍යාය (ගුරු) වත් හා සද්ධි විහාරික (ශිෂ්‍ය) වත්වල ඇති ආචාර විද්‍යාත්මක වටිනාකම කෙතෙක් දැ යි මෙයින් වැටහෙනවා ඇත.

**ගිහි ගුරු ශිෂ්‍ය සම්බන්ධය.**

ඉහත සඳහන් වූයේ ආශ්‍රම ජීවිතයේ දී පැවිදි ගුරුවරයකුත්, පැවිදි ශිෂ්‍යයකුත් අතර පැවැත්විය යුතු පිළිවෙත ය. බෞද්ධ අධ්‍යාපනයේ දී පැවිදි ගුරු ශිෂ්‍ය සම්බන්ධයේත් ගිහි ගුරු - ශිෂ්‍ය සම්බන්ධයේත් විශේෂ වෙනසක් නොමැති බව පැහැදිලි වන්නේ බුදුරජාණන් වහන්සේ විසින් සිඟාලෝවාද සූත්‍රයේ දී සිඟාල ගෘහපතියා වෙනුවෙන් ගිහියන් සඳහා දේශිත ගුරු - ශිෂ්‍ය ඇවතුම් පැවතුම් විමසා බැලීමේ දී ය. සිඟාලෝවාද සූත්‍රයේ දී විස්තර කෙරුණ ෂඩ්විධ සමාජ සම්බන්ධතා අතර ගුරු - ශිෂ්‍ය සම්බන්ධය සමාන වන්නේ දක්ෂිණ දිශාව නැමදීමට යි. ගුරුවරයා දක්ෂිණ දිශාවට සමකරනුයේ ඔහු පූජාර්හ වන බැවින් හෙවත් ගුරු පූජා ලැබීමට සුදුස්සකු වන බැවින් ය.

ගුරුවරයා ශිෂ්‍යයාගෙන් පූජා ලැබීමට නම් ඊට ගැළපෙන විශේෂ හැසිරීම් රටාවක් ගුරුවරයා තුළ තිබිය යුතු ය. ගුරුවරයා තමා සතු

දැනුම වර්යාවෙන් පෙන්වන්නකු විය යුතු ය. "ඔවා දෙනු පරහට – තමා සම්මතෙති පිහිටා සිට" යන උපදේශය පිළිපදින්නකු විය යුතුය. "අත්තානමේව පඨමං පතිරූපෙ නිවේසයේ" යන බුදු වදනින් කියන්නේත් එය ම ය. මෙබඳු පැවැත්මක් ඇති ගුරුවරයකු කෙරෙහි ශිෂ්‍යයා ගෞරව සම්ප්‍රයුක්ත වීම ස්වාභාවික ය.

සිඟාලෝවාද සූත්‍රයේ දී ශිෂ්‍යයා විසින් ගුරුවරයා කෙරෙහි පැවැත්විය යුතු යුතුකම් පහක් බුදුන් වහන්සේ විසින් නිර්දේශිත ය.

(අ) ගුරුහු දක හුනස්නෙන් නැගිටීම වැනි ආචාර පැවැත්වීම.

(ආ) ගුරුවරයාට උපස්ථාන කිරීම.

(ඇ) අවවාද ආදියට ඇහුම්කන් දීම.

(ඈ) වතාවත් කිරීම.

(ඉ) සකසා සිප් සතර ඉගෙනීම.

මේ උපදේශ පරීක්ෂා කිරීමෙන් පෙනී යනුයේ ඒවා ආරාම ශිෂ්‍යයන් සඳහා දුන් උපදෙස්වල සම්පිණ්ඩනයක් බව ය. මෙයින් අපට පැහැදිලි වන්නේ ගුරු – ශිෂ්‍ය සම්බන්ධකම් පැවැත්වීමේ දී ගිහි – පැවිදි භේදය එතරම් බලනොපාන බව ය.

ඉගැන්වීම වාණිජමය ස්වරූපයක් ගත් මේ කාලයේ දී මෙන් නොව පුරාණයේ දී ගුරුවරයාගේ ප්‍රසාදයට ලක්වන සේ ශිෂ්‍යයා හැසිරීම අත්‍යාවශ්‍ය විය. මුලින් සඳහන් කළ කරුණු පහම ශිෂ්‍යයා විසින් ඉටු කිරීම ගුරුවරයාගේ ප්‍රසාදය ඇතිවීමට හේතු වේ.

මෙහි දී ගුරුවරයාගේ වචනයට, අවවාද ආදියට ඇහුන්කන් දීම යනුවෙන් අදහස් කෙළේ ගුරුවරයා කියන දෙය එලෙසින් ම පිළිගැනීම නොවේ. ගුරුවරයා කියන දේ වුව ද විචාර බුද්ධියෙන් යුතුව පිළිගැනීමෙ අයිතිය ශිෂ්‍යයාට ඇති බව බුදුරජාණන් වහන්සේ විසින් පෙන්වා දී තිබේ. තමාට යමක් සත්‍යය යි නිවැරදි යයි නො වැටහෙන්නේ නම්, එය ගුරු ගෞරවය නිසා කිසි විටෙකත් භාර නො ගන්නා ලෙස බුදුරජුන් කාලාමයන්ට උපදෙස් දුන් බව කාලාම සූත්‍රයේ සඳහන් ය. යම්කිසි තීරණයක් ගැනීමේ දී නිවහල් ව නිදහස් ව විමසා බලා තීරණ ගැනීම බුදු දහම අගය කරයි. වරක් නිගණ්ඨනාථපුත්තගේ ප්‍රධාන දයකයා වූ උපාලි ගෘහපතියා බුදුරජුන් වෙත ගොස් වැද, වාද කොට පැහැදී, තමා බුදු සමය වැළඳ ගැනීමට කැමති බව ප්‍රකාශ කළේ ය. එබඳු අවස්ථාවකත් බුදුරජුන් ප්‍රකාශ කෙළේ "ගෘහපතිය, ඔබ වැනි වගකිව යුතු පුද්ගලයින් හදිසියේ මෙසේ තීරණ ගැනීම නුසුදුසු ය. තවදුරටත් විමසා බලා තීරණයක් ගන්න." යනුවෙනි.

බුදුරජාණන් වහන්සේ විසින් අගය කළ වාද විවාද කොට නිදහසේ තීරණ ගැනීමේ බෞද්ධ චින්තන ක්‍රමය දීර්ඝකාලීන බෞද්ධ අධ්‍යාපන ක්‍රමය තුළ නිතර ම ක්‍රියාත්මක වූ බව පෙනෙන්නට තිබේ.

තම ගුරු හාමුදුරුවන්ගේ මතයට එකඟ නොවී යම්කිසි කරුණක් ගැන තමාගේ මතය බිය සැක නැතිව ඉදිරිපත් කිරීමට ශිෂ්‍යයාට නිදහස තිබුණේ ය. ශිෂ්‍යයාගේ මතය පිළිගැනීම මදිකමක් යයි නො සිතා, ශිෂ්‍ය මතය හරි බව පෙනේ නම් එය පිළිගැනීමට ගුරු හාමුදුරු-වරු මැළි නො වූහ.

අනුරාධපුර යුගයේ විසූ ත්‍රිපිටක චූල්ලසුම්ම ස්ථවිරයෝත්, ත්‍රිපිටක චූල්ලනාග ස්ථවිරයෝත් ත්‍රිපිටකයේ විශාරදයෝ වූහ. ත්‍රිපිටක චූල්ල-සුම්ම ස්ථවිරයෝ ත්‍රිපිටක චූල්ලනාග ස්ථවිරයන්ගේ ගුරු හාමුදුරුවෝ වූහ. වරක් සතිපට්ඨාන සූත්‍රයේ "ඒකායනමග්ග" ගැන මේ දෙදෙනා අතර මතභේදයක් ඇති විය. අන්තිමේ දී ශිෂ්‍යයාගේ මතය හරි බව චූල්ලසුම්ම ගුරු හාමුදුරුවන්ට ඒත්තු ගියේ ය. චූල්ලනාග ස්ථවිරයන් ධර්මදේශනා කරන අවස්ථාවක දී පිරිස ඉදිරිපිට දී ම චූල්ලසුම්ම ස්ථවිරයෝ ශිෂ්‍යයාගේ මතය නිවැරදි බව පිළිගත්හ.

මෙයින් පෙනෙන කාරණා කීපයක් නම් නිදහස් අදහස් ප්‍රකාශනයට පැරණි අධ්‍යාපනයේ ඉඩකඩ තිබූ බව පමණක් නොව, නිවැරදි නම් ගෝලයාගේ අදහස වුව පිළිගැනීමට ගුරුවරයා සූදානම්ව සිටි බවත් මෙන් ම ආචාර්යවරයා ප්‍රසිද්ධියේ ම ශිෂ්‍යයාට ප්‍රශංසා කිරීමේ සිරිත තිබූ බවත් ය.

සිඟාලෝවාද සූත්‍රයෙහි එන පරිදි ගුරුවරයා විසින් ශිෂ්‍යයා කෙරෙහි පිළිපැදිය යුතු ආකාර පහකි.

(අ) මනා සේ හික්මවීම.

(ආ) කරුණාවෙන් ඉගැන්වීම.

(ඇ) තමා උගත් සිප් සතර ශිෂ්‍යයනට නො සඟවා කියා දීම.

(ඈ) ශිෂ්‍යයා හිතමිතුරන්ට හඳුන්වා දීම හා

(ඉ) ශිෂ්‍යයා උවදුරුවලින් රැකගැනීම ඒ පහයි.

මෙහිදී ද පෙනෙන කාරණයක් නම් පැවිදි ගුරුවරයාගේ කාර්යයේත් ගිහි ගුරුවරයාගේ කාර්යයේත් වෙනසක් නොමැති බව ය. ශිෂ්‍යයාට ශිල්ප ශාස්ත්‍ර ඉගැන්වීමටත් වඩා වැදගත් කොට සලකන ලද්දේ ශිෂ්‍යයාගේ සදාචාර වර්ධනය බව එම කාරණය මුලින් ම සඳහන් කිරී-මෙන් සිතා ගත හැකි ය. මෙයින් අදහස් වන තවත් කාරණයක් නම්

භික්ෂූන් වහන්සේ මෙන් ම ගිහියාත් මුල් තැන දිය යුත්තේ ශීලයට බව ය.

ගුරු මුෂ්ටි ඉතිරිකර නොගෙන සියල්ල ඉගැන්වීම බෞද්ධ ගුරුවරයාගේ ස්වභාව ය යි. පරිනිර්වාණ මංචකයේ දී බුදුරජාණන් වහන්සේ ද තමා ගුරුමුෂ්ටි කිසිවක් ඉතිරිකර ගෙන නොමැති බවත්, තවත් අසා දැනගත යුතු දෙයක් ඇත් නම් ප්‍රශ්න කරන ලෙසත් දැන් වූ බව සඳහන් ය.

ශිෂ්‍යයා හිත මිතුරන්ට අඳුන්වා දීම යන්නෙන් අදහස් කෙළේ ඔහුට සමාජයේ යම්කිසි තත්ත්වයක් ලබා දීමයි. එසේම ප්‍රසිද්ධියේ ප්‍රශංසා කිරීම ද මේ හා සම්බන්ධ වූවකි. මෙය බොහෝ දුරට නූතන අධ්‍යාපනඥයින් පෙන්වා දෙන ''පිළිගැනීම'' නමැති මානසික අවශ්‍යතාව සපුරාලීමකි. ශිෂ්‍යයා උවදුරුවලින් රැකගැනීම නිසා සිදුවන්නේ ගුරුවරයා ළඟ ශිෂ්‍යයාගේ සුරක්ෂිතභාවය තහවුරු වීමයි.

මේ අයුරින් සිඟාලෝවාද සූත්‍රයේ දී ගිහියන් සඳහා දේශිත ගුරු - ගෝල ඇවතුම් පැවතුම් ද මනා ගුරු - ගෝල සම්බන්ධයන් තහවුරු කිරීම නිමිත්තෙන් බුදුරජාණන් වහන්සේ විසින් ඉදිරිපත් කළ බව සිතා ගත හැකි ය. බුදුරජුන් අනුමත කළ මේ ගුරුගෝල ඇවතුම් පැවතුම් බෞද්ධ ගුරු - ශිෂ්‍යයන්ගේ චාරිත්‍ර බවට පත් විය.

**ගුරු ගෝල සම්බන්ධය පිළිබඳව සාහිත්‍යයෙන් උදාහරණ:**

පැරණි බහුශ්‍රැත ගුරුවරුන්ගේ විශේෂ ලක්ෂණයක් වූයේ නිහතමානී වීමයි. පහත දැක්වෙන්නේ විසුද්ධිමග්ගයෙන් උදාහරණයකි.

රුහුණේ තුලාධාර පබ්බත වාසි ධම්මරක්ඛිත ස්ථවිරයෝ සුප්‍රසිද්ධ පඬිවරයෙකි. මහා විහාරයෙන් පැමිණි ත්‍රිපිටක චූලාභය තෙරුන්ට උන් වහන්සේ ධර්මය ඉගැන්වූහ. උගන්වා අවසානයේ දී තම ශිෂ්‍යයාගේ පා මුල පැදුරක හිඳගත් ධම්මරක්ඛිත ස්ථවිරයෝ ශිෂ්‍යයාගෙන් කමටහන් ඉල්ලා සිටියා හු ය. එවිට ''ඇයි, ස්වාමීනි, මා ඔබ වහන්සේගෙන් ධර්මය ඉගෙන ගත් කෙනෙක් නො වේ ද? ඔබ වහන්සේ නොදන්නා කවර දෙයක් මා දන්නේ ද?'' කියා ශිෂ්‍යයා කී විට, ''එහෙත් යහළුව, ප්‍රතිවේධ මාර්ගය ඊට වඩා සම්පූර්ණයෙන් ම වෙනස් දෙයකැ''යි ගුරු හාමුදුරුවෝ වදාළහ. ගෝල හාමුදුරුවන් දුන් කමටහනින් ගුරු හාමුදුරුවන් රහත් වූ බව කියති.

මේ කථාවෙන් පැහැදිලි වන කරුණු කීපයකි. ගෝලයාට වුවත් තමන් නොදන්නා බව පැවසීමට පැරණි ගුරුවරුන් නිහතමානී වූ බව එක් කරුණකි. කොයිතරම් බහුශ්‍රැතයකු වුවත් නිතර ම ඉගෙනීමට සූදානම් වීම තවත් ලක්ෂණයකි. ගුරු ගෝල කවුරුත් තම තමන් දන්නා දේ බෙදා ගැනීමට සූදානම් ව සිටීම තව එකකි.

සද්ධර්ම රත්නාවලියෙහි නාගසේන වස්තුවෙහි එන ඡේදයක් පහත දැක්වේ. එයින් කියැවෙන්නේ රෝහණ මහතෙරුන් වහන්සේ විසින් නාගසේන සාමණේරයන් අස්සගුප්ත මහතෙරුන් වෙත වස් විසීම සඳහා යවනු ලැබූ අවස්ථාවයි.

''නාගසේන සාමණේරයන් වහන්සේ .... පා සිවුරු හැර ගෙන වත්තනිය නම් වෙහෙරට ගොසින් අස්සගුප්ත මහතෙරුන් වහන්සේ වැඳගෙන එක්ත්පසව සිටි සේක. එසේ සිට උපාධ්‍යායයන් වහන්සේ වැඳ එවූ නියාවත්, සුවදුක් විචාරා එවූ නියාවත් කී සේක. ඔබත් ඒ අසා රෝහණ මහ තෙරුන් වහන්සේගේ සුවදුක් විචාරා ''කුමක් නිසා මුඹ එවූ දැ'යි විචාළ සේක. නුඹ වහන්සේ ළඟ වස් වසන්නට යයි කී කල්හි ''යහපත වසව''යි නො වදරා ''තෙපි කිනම්මු'' දැ යි නම විචාළ සේක් ''නාගසේන නම්'' කී කල්හි උපාධ්‍යායන් වහන්සේගේ නම්ත් විචාළ මනා බැවින් ''තොපගේ උපාධ්‍යායයෝ කිනම්හු දැ''යි විචාළ සේක.

උන් වහන්සේ සම්මුඛයෙහි නොවන හෙයින් 'රෝහණ මහතෙරුන් වහන්සේ ය'යි කී සේක. ඉතින් වරදවා අවු නමුත් ''අපි කිනම්මෝ දැ'යි තමන් වහන්සේගේ නම විචාළ සේක. ගුරුන් වහන්සේගේ නම සම්මුඛයෙහි සිට කීම ආචාර නො වන හෙයින්, ''ඔබගේ නම අප කියන්නේ කිම් ද? අපගේ උපාධ්‍යායයන් වහන්සේ දන්නා සේකැ''යි කී සේක. ''යහපත, .... පා සිවුරු හැර ගෙන තබාලන්ට කිසි කෙනෙකුත් ළඟ නැති හෙයින් තෙපි ම තැන්පත් කොට තබව''යි වදළ සේක. උන්වහන්සේ පා සිවුරු තැන්පත් කොට තබාලා ඊ සැතපී ගෙන දෙවන දවස් උදෑසන ම ගෙයත් මලුවත් ඇමද පියා දැහැටි පැන් ගෙනවුත් තබාලූ සේක. ......''

ඉහත සඳහන් ඡේදයෙහි සඳහන් වැදගත් කාරණයක් නම් ගුරු ගෞරවය නිසා ගුරුවරයා ඉදිරිපිට ගුරුවරයාගේ නම කීම සිරිතක් නො වන බව ය. එසේ ම නවක සාමණේරයන් වහන්සේ කෙනකු වුව ද අලුත් ආචාර්යවරයා වෙත පැමිණි ගමන් ම ගුරුවත් සැපැයීම ආරම්භ කරන බව මෙයින් පැහැදිලි වෙයි. අස්සගුත්ත හාමුදුරුවෝ වස් විසීමට පැමිණි නවකයාට ''යහපත වසව' යි කියා ඒ සඳහා එක්වර ම නො පිළිගත්හ. ඉන්පසු ආචාර්යවරයා කෙළේ නවක ගෝලයා පිරික්සීම යි. එය කෙළේ මෙසේ ය.

නවක ශිෂ්‍යයා ඇමදි මලුව අස්සගුත්ත තෙරණුවෝ නැවත ඇමද, ඔහු තැබූ දැහැටි පැන් ඉවත දමා, වෙනත් දැහැටි පැන් වැළඳූ හ. එහෙත් නාගසේන සාමණේරයෝ මේ ගැන වචනයක්වත් කථා නො කළහ. නමුත් දිනපතා ම මලු ඇමදීම හා දැහැටි පැන් තිබීම ඈතුළු ගුරුවත් කළහ. අස්සගුත්ත තෙරණුවෝ ද නැවත මලු අමදිමින් නාග-

සේන සාමණේරයන් තැබූ දූහැටි හා පැන් ඉවත ලීමත් කළහ. මෙපරිද්දෙන් සතියක් ගිය තැන අස්සගුත්ත හාමුදුරුවෝ නවක ශිෂ්‍යයා අවවාද ඉවසන කෙනකු වශයෙන් හඳුනා ගෙන සිය අරමෙහි වස් විසීමට අවසර දුන්හ. මෙයින් පෙනෙන එක කාරණයක් නම් ආචාර්යවරුන් ගෝලයන් බාර ගත්තේ පරීක්ෂණයක් කිරීමෙන් පසුව බව ය.

**ගුරු ගෙදර.**

"ගුරු ගෙදර" නමින් ගිහි ගුරුවරයකු විසින් පවත්වා ගෙන ආ පාසල් ද නේවාසික ආයතන විය. ගිහි සිසුන් ද පැවිදි සිසුන් මෙන් ම ගුරුවරයාට ඇප උපස්ථාන කිරීමත්, ගුරුවරයාගේ ගෙදර දොරේ වැඩ කටයුතු කරදීමත් කළ යුතු විය. මෙරට පැවැත්තේ ද දඹදිව තක්සලා නුවර දිසාපාමොක් ආචාරීන්ගේ ගුරු ගෙදර පැවති ගුරු – ශිෂ්‍ය සම්බන්ධය ම ය.

පහත දැක්වෙන්නේ සේනක කුමරු දිසාපාමොක් ආචාරීන්ගේ ගුරු ගෙදර ඉගෙනීම කළ අයුරු දැක්වෙන, කාව්‍යශේඛරයේ කවි කීපයකි.

එදවස් පටන් කොට
ඔහු ගෙයි පළමු නැගි සිට
මීසක් කී තැන කට
නොයේ නොසිටී නොරිසි ලෙස කට

අත් පා මෙහෙවරි න්
දවසැර ගුරුන් හසරි න්
දුන් උන් අවසරි න්
පසුව සැතපේ සැමට අදරි න්

ගුරු සිත නොරිඳ වා
වේලාව නොවරද වා
බැති පෙම් උපද වා
අකුරු උගනී කුමරු සොඳ වා

සිරි රහල් හිමියන් කෝට්ටෙ යුගයේ දී ද ගුරු ගෙවල ඉගෙන ගත්තා මෙබඳු ශිෂ්‍යයන් දකින්නට ඇතැයි සිතිය හැක.

ගුත්තිල කාව්‍යයේ ද තේමාව වී ඇත්තේ බෞද්ධ ගුරු – ශිෂ්‍ය සම්බන්ධය පිළිබඳ අදහසකි. තම ගුරුවරයා අභිබවා ගොස් සටන් වැදීම කෙළෙහි ගුණ සලකන බෞද්ධ ශිෂ්‍යයකුගේ යුතුකම නොවන අතර එවන් ශිෂ්‍යයකු සමඟ සටන් වැදීම බෞද්ධ ගුරුවරයෙකුට තරම් නොවන බව ද එම කාව්‍යය කියා පායි. එසේ ම ශිෂ්‍යයකු වශයෙන්

භාරගත් විට ගුරු මුෂ්ටි නොතබා උගැන්වීම බෞද්ධ ගුරුවරයකුගේ සිරිත බවත්, නුවණැස පාදා ලූ ගුරුවරයා කෙරෙහි කිසිම තැකීමක් නොකොට සඳචාර ධර්මවලට පටහැනිව ක්‍රියා කරන ශිෂ්‍යයා පිරිහෙන බවත් එම කාව්‍යයෙන් තවදුරටත් කියන්නේ ය.

## 2.9 ආගන්තුක සත්කාරය පිළිබඳ සිරිත්

ආගන්තුක සත්කාරයට පැරණි ඉන්දීය සමාජයේ උසස් තැනක් හිමි විය. පැවිදි සමාජයේ ද ආගන්තුක සත්කාරයට හිමිවන්නේ උසස් තැනකි. පැවිදි ජීවිතය ආදර්ශයට ගන්නා බෞද්ධ ගිහි සමාජයේ ද ආගන්තුක සත්කාරයට උසස් තැනක් හිමි වේ. ආගන්තුකයා නම් අන්‍ය තැනක සිට පැමිණි තැනැත්තා ය. පැවිදි අරමකට එන ආගන්තුකයා පිට පන්සලක වසන භික්ෂූන් වහන්සේ ය. ගිහි ගෙදරකට එන ඇත එපිට සිටින නෑදැයන්, හිතමිතුරන් හා අසල් වැසියන් ආගන්තුකයන් ය. ගිහි බෞද්ධයන් ද පැවිද්දන්ගේ ආගන්තුක සත්කාරය ආදර්ශයට ගෙන ඇති බැවින් මෙහි දී පළමුවෙන් පැවිදි සමාජය තුළ පවත්නා ආගන්තුක සත්කාරය පිළිබඳ සිරිත් විරිත් විමසා බලමු.

**ආගන්තුක වත**.

වැඩිමහලු ආගන්තුක භික්ෂුවක් එනු දුටු ආවාසික භික්ෂුව පෙරමගට ගමන් කොට පා සිවුරු පිළිගෙන සුදුසු තැන්වල තබයි. ඉක්බිති අසුන් පනවා පා දෙවීමට, මුව දෙවීමට පැන් එළවයි. ආගන්තුක භික්ෂුවට වඩා ආවාසික භික්ෂුව වැඩිමහලු නම් ආගන්තුක භික්ෂුව ආවාසික භික්ෂුවට වඳියි. ආගන්තුක භික්ෂුව වැඩිමහලු නම් පවන් සැලීම් ආදියෙන් වෙහෙස නිවා ගැනීමට උදව් වෙයි. ඉක්බිති දැහැත්, ගිලන්පස ඇති නම් පිළිගන්වනු ලැබේ. නැතිනම් බීමට පැන් වත් පිළිගන්වනු ලැබේ. ඉක්බිති සෙනස්න පිළිබඳ අවබෝධයක් එනම් වැසිකිළි කෙසිකිළි ඇති තැන්, පැන් ඇති තැන් ආදිය පිළිබඳව ආගන්තුක භික්ෂුවට දැනුම් දිය යුතු වේ. සැහෙන වේලාවකට නැවතීමට පැමිණි අයකු නම් සෙනසුනක් ද පැවරිය යුතු ය. ආවාසික භික්ෂුව වැඩිමහල්ලෙකු නම් අසුනෙහි හිඳගෙන ම ඉහත කී තොරතුරු කියන්නේ ය.

ආගන්තුක භික්ෂුව විසින් ද ඉටු කළ යුතු වත් ඇත. අරමට පිවිසීමේ දී පාවහන් ඉවත්කර, කුඩ අකුළා, හිස වසා පොරවා ඇති නම් ඒ ආවරණ ඉවත් කර සන්සුන්ව අරමට ඇතුළු විය යුතු ය. වැඩිමහලු ආවාසික භික්ෂූන්ට අභිවාදනය කොට සෙනසුන් ආදිය ලද කල්හි, සෙනසුන අනිකකු නොවිසූ තැනක් නම් පරීක්ෂා කොට ඇතුළු විය යුතු ය. ආවාසිකයා වෙන වැඩක යෙදී සිටියේ නම් ඒ වැඩේ නවත්වා ආගන්තුක සත්කාර කළ යුතු ය.

**ගිහි ආගන්තුක සත්කාර.**

ගිහි ආගන්තුක සත්කාරවලත් පැවිදි ආගන්තුක සත්කාරවලත් කිවයුතු තරම් වෙනසක් නොමැත. දුරබැහැර නෑදැයන් හෝ හිතවතුන් ගෙදරට එනු දුටු විට ගෙහිමියා හෝ ගෘහණිය හෝ ඒ දෙදෙනා ම හෝ සිනාමුසු මුහුණින් පෙරමගට ගොස් පිළිගැනීම සිංහල බෞද්ධ සිරිත යි. ගෙදරට එන්නේ නෑදෑ හිතවතුන් නම්, දෙමාපියන් නොමැති වුනත් දරුවෝ වුව ද මේ කාර්යය කරති. අමුත්තන් ගෙන එන බරක් ඇතොත් එය ද භාරගෙන අමුත්තන් බරෙන් නිදහස් කිරීම ද සිරිත ය.

නිවසට පිවිසෙද්දී අමුත්තන් විසින් කුඩ හකුළා හිස් වැසුම් ඉවත් කර පාවහන් ඉවත් කිරීම ද බෞද්ධ සිරිතකි. වර්තමානයේ නම් සමහරු පා වහන් ඉවත් නොකරති. ආචාර සමාචාර කිරීමෙන් පසු අමුත්තන්ට අසුන් පැවරේ.

**ආචාර සමාචාර විධි.**

බෞද්ධයන් අතර ආචාර සමාචාර විධි කීපයක් පැවැත් වේ. සමානයන් අතර පැවැත්වෙන ආචාර කිරීමේ විධිය නම් ඍජුව සිට ළමැද ඇඳිලි බැඳීම යි. නැතහොත් දෙ අත් ඔසවා ඇඳිලි බැඳීම යි. දෙමව්පියන්ට හා වැඩිහිටි නෑයන්ට දරු මට්ටමේ අය ආචාර කරන්නේ නමස්කාර කිරීමෙනි. මෙය පසඟ පිහිටුවා වැඳීමක් හෝ උක්කුටකයෙන් හිඳ කරන වැඳීමක් හෝ විය හැකි ය. දරුවෝ බොහෝ විට දෙමවුපියන්ගේ, ගුරුවරුන්ගේ දෙපා සිඹ හෝ, දෙපා මත නළල තබා හෝ වැඳීමෙන් ආචාර කරති.

ආචාර කිරීමේ දී ඊට පිළිතුරු වශයෙන් සමාචාර කිරීම ද වැදගත් ය. ඇඳිලි බැඳීමෙන් සමානයන්ට ආචාර කිරීමේ දී වැඩි වශයෙන් භාවිත වන්නේ ''ආයුබෝවන්'' කීමයි. ආචාරය ලබන්නා ද එසේ ම ඇඳිලි බැඳීමෙන් ''ආයුබෝවන්'' කියා සමාචාර කිරීම සිරිත ය. දරුවන් හෝ එබඳු අය විසින් දෙපා නැමඳ ආචාර කරනු ලබන වැඩිහිටි බෞද්ධයෝ ''තුණුරුවන්ගේ පිහිටයි'' හෝ ''තෙරුවන් සරණයි'' හෝ කියා වඳින්නා ගේ හිස අත ගා සමාචාර කරති. කවර මට්ටමේ බෞද්ධයින්ට වුව ද ආචාර කිරීමේ දී හෝ දවසේ ප්‍රථම වරට හමුවීමේ දී හෝ ''තෙරුවන් සරණයි'' යනුවෙන් ආශිංසනය කිරීම ඉතා ම ගැළපෙන්නකි. එසේ කිරීමේ දී ''තෙරුවන් සරණයි'' කියා සමාචාර කිරීම හෝ ආශිංසනය කිරීම ද කළ යුතු ය. ආචාර කිරීමක දී සමාචාර නො කළහොත් එය ආචාර කළ තැනැත්තාට කළ නිග්‍රහයක් සේ සැලකේ. හරසර සහිතව පිළිගත යුතු අවස්ථාවක දී බුලත් අතක දුම්කොළයක් තබා දීමෙන් කරන ආචාර ක්‍රමය ද සිංහල බෞද්ධයන් අතර පවතී. ඇඳිලි බැඳීමෙන් හෝ වැඳීමෙන් ආචාර කිරීමේ සිරිත හමුවීමේ දී ත් වෙන්වීමේ දීත් යන අවස්ථා දෙකේ දී ම බෞද්ධයෝ භාවිත කරති.

**ආගන්තුකයන්ට සංග්‍රහ.**

ඇතින් පැමිණෙන ආගන්තුකයන්ට මූණ කට සෝද ගැනීමට වතුර සැපයීම බෞද්ධ ගිහියන් ගේ සිරිත ය. එසේ ම වැසිකිළි ආදිය තිබෙන තැන් ද දනුම් දෙනු ලැබේ. ගෙදරට පැමිණෙන අමුත්තන්නට පළමුවෙන් ම සංග්‍රහ කරන්නේ බුලතිනි. අසල්වැසි කවුරු ගෙට ගොඩ වැදුණත් බුලත් තට්ටුව පිරිනැමීම සිංහල බෞද්ධ සිරිත ය. ඈතින් පැමිණි අමුත්තන්ට කැවිලි, සහිතව තේ පැණින් හෝ සිසිල් බීමෙන් හැකි ඉක්මණින් සංග්‍රහ කිරීමට සිංහලයෝ යුහුසුලු වෙති. අමුත්තන්ට උපරිම මට්ටමෙන් සංග්‍රහ කොට ආස්වාදයක් ලැබීම බෞද්ධයන්ගේ සිරිත ය. සාමාන්‍ය දිනවල පිඟානට බෙද, අතේ පිඟාන තබා ගෙන කෑම කන ගෙවල්වල පවා, සුදු දමූ මේසයකට කෑම ඇර අමුත්තන්ට සංග්‍රහ කිරීම බොහෝ බෞද්ධ ගෙවල්වල පවත්නා සිරිත ය. කෑම මේසයේ දී සියලු දෙනා ම වාඩි වූ පසු ආහාර ගැනීම ආරම්භ කිරීමත් සියලු දෙනා ම කෑම කා අවසන් වන තුරු අත නො සේදීමත් බෞද්ධ සිරිත ය. මෙය ද භික්ෂූන් හන්සේලා අනුගමනය කිරීමකි.

වැඩිහිටියන් ළඟින් යන විට හෝ ළඟට ආ විට අසුනෙන් නැගිටීම ද බෞද්ධ සිරිතකි. එසේ ම වැඩිහිටියකු සමඟ හෝ ගෞරව කළ යුත්තකු සමඟ හෝ කථා කරන විට හිස්වැස්ම අතට ගැනීම හෝ කරේ ඇති සලුව අතට ගැනීම තවමත් වැඩි වශයෙන් ගම්බද බෞද්ධයන් අතර දක්නට ලැබෙන්නකි.

**වැඩිදුර කියවීමට.**

(1) සාමණේර බණ දහම් පොත.

(2) වල්පොල රාහුල හිමි – පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය. (8 පරිච්ඡේදය)

(3) ඊ. ඩබ්. අදිකාරම් මයා – පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය. (8 පරිච්ඡේදය)

## 3. පාඩම

# ගිහි ජීවිතයේ සිරිත් විරිත්

සිංහලයන්ගේ වර්තමාන සිරිත් විරිත් ගොඩ නැගී ඇත්තේ පැරණි ඉන්දීය වෛදික සිරිත් විරිත්, ලංකාවේ ආදී වැසියන්ගේ සිරිත් විරිත් හා බෞද්ධ සිරිත් විරිත් පදනම් කරගෙන ය. පසුකාලයේ දී ද්‍රවිඩ, පෘතුගීසි, ලන්දේසි හා ඉංග්‍රීසි සිරිත් විරිත් ද යම්කිසි ප්‍රමාණයකට මේවාට මිශ්‍රවී තිබේ.

සිංහල බෞද්ධයන් අතර පවතින ගබ්පෙරහැර, නාමකරණය ආදී ජීවිතයේ මුල් අවස්ථා පිළිබඳ සිරිත් විරිත් ආදියත් විවාහ චාරිත්‍ර හා අවමඟුල් සිරිත් විරිත් ආදියත් ඒ හා සම්බන්ධ වෛදික සිරිත් විරිත් තරම් සංකීර්ණ නොවේ. බොහෝ සිරිත් විරිත් වල ප්‍රධාන ලක්ෂණයක් නම් ඒවා ශුභ මුහුර්තයකට ඇරඹීම යි. තෙරුවන්ගේ ආශීර්වාදය ලබා ගැනීමත් මෙම සිරිත්වලට එකතු කිරීමෙන් ඒවාට බෞද්ධ මුහුණුවරක් දී තිබෙන බව පෙනේ.

## 3:1 දරුකෝත්පත්තිය හා කුමාර කාලය හා සම්බන්ධ සිරිත් විරිත්.

### ගබ්පෙරහැර දීම

මවකගේ කුසයේ දරුවකු සුවසේ වැඩීම සඳහා ගබ්පෙරහැර දිය යුතු ය යන පැරණි ඉන්දියානු සිරිත එක්තරා සරල ස්වරූපයකින් සිංහල බෞද්ධයන් තුළ ද දැකිය හැකි ය. ගබ්පෙරහැරට බෙහෙවින් ඇතුළත් වූයේ කුස ඔත් දරුවාගේ වැඩීමට අවශ්‍ය ආහාරපාන මවට සැපයීමත්, අධික වෙහෙසවීම, බලවත් ශබ්ද ඇසීම, බියගෙන දෙන හදිසි ආරංචි ඇසීම හා මධුර ආහාර අධිකව ගැනීම ආදියෙන් ඇය වළක්වා ගැනීමත් ය. ප්‍රිය දේ බලන්නට දීම, මිහිරි දේ අසන්නට දීම වැනි ඇය කැමති දේ සපයා දීමත් මෙයට ඇතුළත් ය.

"උයින් උන්ට ඇඹුල් අධික දෙය හැරීම, ලුණු අධික දෙය හැරීම, ඉතා හුණු දෙය හැරීම, ඉතා සිහිල් දෙය හැරීමය යනාදී වූ ගබ්පෙරහැර දුන්හ." මේ කාන්තාවකට දුන් ගබ්පෙරහැර සද්ධර්ම රත්නාවලියේ විස්තර වූ අයුරු යි. කටුක ආහාර හා උෂ්ණ ආහාර වැළකීමත්, කුස-පුරා බත් නො කෑමත්, මුහුණින් හා වම් ඇලයෙන් නොසැතපීමත්, දකුණු ඇළයෙන් සැතපීමත් දස මසක් මුලුල්ලෙහි අනුගමනය කිරීමෙන් ගැබ පිරිමැසූ බවක් පූජාවලියෙහි එයි.

මෙකල බෞද්ධ ගැබිණි මාතාවක් තුළ දක්නට ලැබෙන සිරිතක් නම් නිතර මල් පහන් පූජා කොට තෙරුවන් නැමදීම යි. කුස ඔත් දරුවාටත්, මවටත් සෙත් පතා බෝධි පූජා පැවැත්වීමත් සිරිති. භික්ෂූන් වහන්සේ ලවා තුන් වරුවක්, පස් වරුවක්, හා සත් වරුවක් ආදී වශයෙන් පිරිත් දේශනා කරවා ගැනීම ද බෞද්ධයන් අතර දක්නට ලැබේ. මෙම පිරිත් දේශනාවල අවසාන දිනයේ දී අංගුලිමාල පිරිත දේශනා කරවාගනු ලබන්නේ විශේෂයෙන් එම පිරිත ගැබිණි මාතාවන්ට ආශිර්වාද කරන පිරිතක් වශයෙන් පුරාණයේ සිට ම පිළිගෙන ඇති බැවිනි.

**දෙළදුක්.**

''දෙළ දුක්'' නමින් හඳුන්වනු ලබන, ගැබිණි මාතාවන්ට ඇතිවන ආශාවන් තෘප්ත කිරිම ද සිංහල බෞද්ධ සිරිතකි. සාහිත්‍යයේ පැරණි මාතාවන්ට ඇති වූ දෙළ දුක් ගැන අසන්නට ලැබේ. විදුර ජාතකයේ සඳහන් නා රජිනකට ඇති වූ දෙළ දුක නම් විදුර පණ්ඩිතයන්ගේ හදවත කැමට ඇති වූ ආශාවයි. ගැමුණු කුමරු කුසයෙහි සිටිද්දී විහාර මහා දේවියම සිතුනේ සැටරියන් දිග මීවදයක් භික්ෂූන් වළඳවා භික්ෂූන් ගේ අන්තයේ සිට වළඳන්නට ය. වනවාසික තිස්සයන් බඩේ සිටිය දී මවට සිතුනේ සැරියුත් හිමිපාණන් ඇතුළු 500ක් වහන්සේලා ගෙයි වඩා හිඳුවා, තනි කිරෙන් පිසූ කිරිබතක් දන් දී, තමනුත් කසා පිළි ඇඳ, අසුන් කෙළවරේ සිට රන් තලියෙන් ඒ ඉඳුල් කිරිබත් වළඳන්නට බව ධම්මපදට්ඨ කථාවේ සඳහන් ය.

දෙළ සංසිඳුවීම නො කළහොත් දරුගැබ වියලී නැසී යන්නට ඉඩ ඇත යන විශ්වාසය නිසා ගැබිණි මව්වරුන්ගේ දෙළ දුක් සපුරාලීම ද සිංහල බෞද්ධ සිරිතකි.

**උපන් දින මඟුල.**

ජාත කර්මය හෙවත් උපන් දින මඟුලෙහි සිරිත් විරිත් සියල්ල දැන් බොහෝ දුරට අභාවයට යන බව පෙනේ.. දරුවන් බොහෝ සෙයින් දැන් උපත ලබන්නේ ආරෝග්‍යශාලාවේ ය.

පුරාණයේ දී දරු ප්‍රසූතිය සිදු කරන ලද්දේ ඇතුල් ගේ සකස් කරනු ලබන ''තිඹිරිගෙය'' නම් කාමරයක ය. එය පිරිසිදු කොට කහකුඩු හා අබ කුඩු ඉසිනු ලැබේ. උපන් බිළිදා ඖෂධ දියෙන් නාවා ප්‍රථම ආහාරය වශයෙන් රත්කිරි පොවනු ලැබේ. රත්කිරි සාදගන්නේ තන කිරට රන් සුනු මිශ්‍ර කිරීමෙන් හෝ කිරෙහි රන් මුද්දක් බහාලීමෙනි: උපන් දරුවාගේ ජන්ම පත්‍රය සාද ගැනීම සඳහා උපන් වේලාව පැහැදිලිව ලකුණුකර ගැනීම අතපසු නොකරන සිරිතකි.

**නම් තැබීම.**

සිංහල බෞද්ධයන් තුළ මේ පිළිබඳව විශේෂ චාරිත්‍ර ඇති බවක් නො පෙනේ. උපත් නැකත, ලග්නය හෝ උපත් දිනය යන මෙයින් එකකට සිහෙන අකුරක් මුලට තබා අර්ථවත් නමක් යෙදීම සාමාන්‍ය සිරිතයි. පෙර සමහර කෙනෙක් මේ සඳහා භික්ෂූන් වහන්සේලාගේ උපදෙස් ද ලබාගත් හ.

ලක්දිව විදේශීය ආධිපත්‍යයට යටත්ව තිබුණු කාලයේ දී මෙරට සමහර අය විදේශීය නම්වලට ඇල්මක් දැක්වූහ. අතීතයේ දී බෞද්ධයෝ ආගම ධර්මය පිළිබඳ ශ්‍රද්ධාව පිළිබිඹු කරන නම් තෝරා ගත්හ. බුද්ධදාස, ධර්මදාස, සංඝදාස, සංඝබෝධි, සංඝතිස්ස, ධර්මරත්න, ධර්මසේන, ධර්මප්‍රිය, බෝධිපාල, බෝධිදාස, බෝධිරත්න ආදී නම් පිරිමින් සඳහා එදත් අදත් තෝරා ගෙන ඇති බව පෙනේ.

බෝධි, සංඝා යන නම් පැරණි කුමාරිකාවන්ට ද තබා ඇති බව ඉතිහාසයේ පෙනේ. ලක්දිවට නිදහස ලැබීමෙන් පසුව ඇතිවූ ජාතික ප්‍රබෝධය නිසා සාහිත්‍යයේ එන බෞද්ධ හා සිංහල නම් දරුවන්ට තැබීම දැන් බෞද්ධයන් සිරිතක් කර ගෙන ඇති බව පෙනේ.

**දොරට වැඩුම.**

බිළිඳකු ඉපදී ටික දවසකින්, ඔහු හෝ ඇය නාවා ශුභ දිනයක විහාරයකට හෝ දේවාලයකට ගෙන යාම බෞද්ධයන්ගේ සිරිත යි. මහනුවර ආසන්නයේ බෞද්ධයෝ දරුවා දළදා මාලිගාවට ගෙන ගොස් දළදා හිමියන් ඉදිරිපිට බිම හොවති. මෙසේ ප්‍රසිද්ධ දාගැබ, මහ බෝ පිළිම ඉදිරියේ දරුවා හොවා ත්‍රිවිධ රත්නයට පූජා කිරීම බොහෝ බෞද්ධයන් ගේ සිරිත ය. තවද කැවුම් කිරි බතින් බුද්ධ පූජා, දේව පූජා පැවැත්වීමත් මහා සංඝයාට කැවුම් කිරිබත් පූජා කිරීමත් සමහර පෙදෙස් වල සිරිත ය. මේ අවස්ථාවේ දී බිළිඳාගේ අතේ වදකහ කැලි දෙකක් බැඳීම ද සමහර පෙදෙස්වල සිරිතකි. ඌව පළාතේ දොරට වැඩීම කරන්නේ බිහිවී තුන් මසකිනි.

**කන් විදීම.**

සිංහලයන් අතර මෙය දැන් උත්සවයක් වශයෙන් නොකෙරේ. මෙකල ගැහැණු ළමයෙකුගේ කන් විද ගැනීම බොහෝ විට කරනුයේ දෙස්තර මහතකු ලවා ය. මොණරාගල ප්‍රදේශයේ දරුවා විහාරයකට කැඳවා ගෙන ගොස් දෙඩම් කටුවකින් කන් විදීම කරනු ලැබේ. තවත් සමහර පෙදෙස් වල කන් පෙත්ත යටින් දෙහි ගෙඩියක් තබා පැහිරි කටුවකින් කන විද කහ නූල් පටක් අමුණනු ලැබේ. ඉක්බිති ටික දවසකින් කන් සිදුර පැහීම වැළැක්වීමට කරපිංචා නැටි කැබෙල්ලක් සිදුරේ තැබීම සිරිතකි.

**බත් කැවීම.**

මෙය ද කරන්නේ සුභ මොහොතකට ය. බිම කළාලයක් හෝ සුදු රෙද්දක් එළා ඒ මත නෙළුම් කොළ හෝ කෙසෙල් කොළ තබා ඊ මත කෑම වර්ග, මිල මුදල්, රන් ආභරණ තබනු ලැබේ. පොල්තෙල් පහනක් දැල්වීම ද අනිවාර්යයෙන් ම කෙරේ. නැකත් වේලාවට දරුවාට කැමති දෙයක් ගන්නට ඉඩ හරිනු ලැබේ. මෙහි දී දරුවා ගේ මාමා කෙනකු විසින් දරුවාට කිරිබත් පිඩක් කවා ඔහුගේ ඉණ පස්ලෝ හවඩියක් බැඳීම ද සිරිති. මේ වෙනුවෙන් පන්සලට දනයක් දීම ද සිරිතකි.

**කෙස් කැපීම.**

මෙය ද සුභ මොහොතින් කෙරෙතත්, මෙකල විශේෂ චාරිත්‍ර දක්-නට නො ලැබේ. සද්ධර්ම රත්නාවලියෙහි විස්තරවන කුමාරයකු ගේ ඉහත සඳහන් මඟුල් පිළිබඳ සිරිතක් පහත දැක්වේ.

''උපන් මඟුල් කරන දවස් ඒ කුමාරයන් උදැසන ම නාවා පියා සරහා ලා ශ්‍රී යහනෙහි ලක්ෂයක් වටිනා පළසක් මොළකොට අතුරාලා වැද හොවාලූ ය. මෙසේ කුමාරයන්ට නම් තබන මඟුලත් කොටලා, නැවත බත් කවන මඟුලේ ද, කන් විදිනා මඟුලේ ද පිළිහඳවන මඟුලේ ද කුඹ තබනා මඟුලේ ද. . . **පන්සියක් දෙනා වහන්සේට කිරිබත් ම දුන්න.**''

මෙම මඟුල්වල දී භික්ෂු සංඝයාට කිරිබත් දන්දීම පුරාණයේ සිරිතක් වූ බව මෙයින් පෙනේ. උත්සව අවස්ථාවල දී කිරිබත් පිළියෙල කිරීම ඈත අතීතයේ සිට ම මේ දක්වා සිංහල බෞද්ධයන් අතර දක්නට ලැබෙන සිරිතකි. සිදුහත් බෝධිසත්වයන් වහන්සේ බුද්ධත්වය ලැබීමට පළමුව වැළඳුවේත් සුජාතාව විසින් පිළිගැන් වූ කිරිබතක් ය.

**ජන්ම දින උත්සවය.**

උත්පත්තියෙන් පසු සෑම සංවත්සරයක දී ම ජන්ම දින උත්සව-යක් පැවැත්වීම බොහෝ දෙනෙකුගේ ම සිරිතකි. දන්දීම, පිරිත් කීම, හා විහාරවල පූජා පැවැත්වීම මේ හා සම්බන්ධව කෙරෙන ආගමික කටයුතු යි. නෑදෑ හිතවතුන්ට සංග්‍රහ කිරීම ද සිරිත ය. ඉන්දියාවේ හා ලංකාවේ සමහර රජවරු ජන්මෝත්සව සඳහා ''තුලාභාර දන'' පැවැත්වූහ. එනම් තමන්ගේ බරට රන් රිදී හෝ කාසි හෝ වෙනත් ද්‍රව්‍ය දන්දීමයි. 3වන දප්පුල, 1වන සේන, 2වන සේන, උදය, 4වන සේන, මහා විජයබාහු, 1වන මහා පැරකුම්බා යන රජවරු, ''තුලාභාර දන'' පැවැත් වූ අය වෙති.

අත පොත් තැබීම.

පුරාණයේ දී ගමේ පන්සලේ භික්ෂූන් වහන්සේ ම ගුරුවරයා වූ හෙයින් මුලින් ම දරුවන්ට අකුරු කියවන ලද්දේත් උන්වහන්සේ විසිනි. අකුරු කියවන වයසේ දී දරුවා නහවා පිරිසිදු ඇඳුම් අන්දවා බුලත් හුරුළු හා ගුරු පඩුරු රැගෙන භික්ෂූන් වහන්සේ වෙත පැවරූ විට උන් වහන්සේ මංගල නැකතින් අකුරු කියවූහ. සමහර අවස්ථාවලදී අකුරු කියවීමට ගුරු ගෙදරට යැවීම ද සිරිත විය. අද මෙන් ම පෙරත් අකුරු කරණය සඳහා දරුවන් යොමු කරවන ලද්දේ වයස අවුරුදු පහක් වූ විට ය. ඉගෙනීම සම්බන්ධ සිරිත් විරිත් 'ගුරු ශිෂ්‍ය සම්බන්ධය' යටතේ එයි.

## 3.2 ආවාහ-විවාහ චාරිත්‍ර.

තරුණයකුට පිටතින් තරුණියක ගෙනවිත් සරණ කර දීම ආවාහ නමින් ද, තරුණියක පිට තරුණයකුට සරණකර දීම විවාහ නමින් ද හැඳින් වේ. ආවාහ – විවාහ නමැති මේ ස්ත්‍රී පුරුෂ සම්බන්ධයට, ඈත අතීතයේ සිට ම ඉන්දීය සමාජයේ නීති රීති තිබූ බව පෙනේ. මේ සිරිත් රාශියක් යම් යම් වෙනස්කම් ඇතිව වර්තමාන අපේ සමාජයේ ද දක්නට ලැබේ. ආගමික කටයුතුවලට පුතකු ලබා ගැනීම, පරම්පරාව ගෙන යාම හා රති සැප විඳීම විවාහයේ පරමාර්ථය බව වේද සාහිත්‍යයේ දැක්වේ. මේ පිළිබඳ අදහස් විවිධ ය. 'කාන්තාව ජීවිතයෙන් අර්ධයකි. මිනිහෙක් භාර්‍යාවක් පාවා ගන්නා තුරු, සම්පූර්ණ මිනිසෙක් නොවේ. අවිවාහකයා සමාජයට වැඩදයක නොවේ, යන අදහස් මෙකල ද සමාජය තුළ පවතී. අවිවාහකයා වගකීමක් නොදරන බැවින් සාමාන්‍ය ගැමි සමාජයේ වුව ද පිළිගැනීම අඩු ය.

සැම බුදුවරයකු ම බුද්ධත්වය ලැබීමට පළමු විවාහ ජීවිතයට ඇතුළු ව පුතකු ලබා තිබීම පැරණි ඉන්දීය සමාජයේ අදහස්වලට එකඟවීමක් බව පෙනේ.

සුදුසුකම්.

ගුණවත් උගත් තරුණයා ආවාහයක් කර ගැනීමට සුදුසු ය යනු සාමාන්‍ය මතය යි. එහෙත් කුලය, රූ සපුව, ධනය යන මේවාද සැලකිලි ලැබී, ශිල්ප ශාස්ත්‍ර නොදැනීම පිරිමියකුට ආවාහයක් කර ගැනීම සඳහා සුදුසුකමක් නොවූ බව ද පෙනේ. සිදුහත් කුමරු ශිල්ප දක්වන තුරු ඔහුට මනාලියක තෝරා ගැනීම සඳහා සිය දූවරුන් සරසා එවීමට ශාක්‍ය රජ දරුවෝ අකමැති වූහ. ජාතකට්ඨ කථාවේ එන කථාවක එක් බමුණකු ගේ දූවරු සතර දෙනෙක් පිරිමි සතර දෙනකු පැතූහ. ඉන් එකෙක් රූපත් ය. එකෙක් වැඩිහිටි ය. එකෙක් වංශවත් ය, එකෙක් සිල්වත් ය, දූවරුන් දීය යුත්තේ කෙබඳු කෙනකුට දැ'යි බමුණා බුදු

රදුන්ගෙන් විමසී ය. බුදු රදුන් කියා සිටියේ ''රූපත් කමත් හොඳයි, වැඩිහිටි කමත් හොඳයි, කුලවත් කමත් නිසරු නො වේ, එහෙත් අපට නම් වැදගත් වන්නේ සිල්වත් කම ය.'' යනුවෙනි.

මනාලියකගේ සුදුසුකම් වශයෙන් රූපලාවන්‍ය ය, නැණවත්කම, හොඳ ගති ගුණ, පිරිසිදු චරිතය හා සෞම්‍යය පෙර සිට ම උසස් කොට සැලකූ බව පෙනේ. හොඳ බෞද්ධයෝ නම් අදත් විවාහාභිමුඛ දෙදෙනා ගේ හොඳ ගතිගුණ හා යහපත් චරිතයට මුල් තැනක් දෙති.

සම වයස් හෝ ඉතා අඩු වයස් පරතරයක් ඇති ගැහැණු පිරිමි විවාහ ජීවිතයට ඇතුළත් වීම සුදුසු ය යනු බෞද්ධ සමාජයේ ඇති අදහස යි. සිදුහත් කුමරු හා යසෝදරාවන් විවාහ ජීවියට ඇතුළත් වූයේ දෙදෙනා ම සොළොස් වයසේ දී ය.

යෞවනය පසු කළ කෙනකු ළා බාල කතක් ආවාහ කරගැනීම පිරිහීමට හේතුවක් වන බව —

''අතීත යොබ්බනො පො සෝ – ආනේති තිම්බරුත්ථනිං
තස්සා ඉස්සා නසුපති – තං පරාභවතො මුඛං.''

යන ගාථාවෙන් බුදුරජාණන් වහන්සේ විසින් දේශනා කර ඇත්තේ පරාභව සූත්‍රයේ ය.

**ඥාති විවාහ.**

ඇවැස්ස නෑනා හා ඇවැස්ස මස්සිනා අතර විවාහය සිංහල බෞද්ධ සමාජයේ නොයෙක් විට දක්නට ලැබේ. ''කිඹුලවත් නුවර හිඳිනා රජ දරුවෝ මාගේ මලුන් හෙයින් තොපගේ මයිලෝ ය. උන්ගේ දූ ඇත්නම් තොපට බිසෝ කරවයි, කීවු ය.'' යන සද්ධර්ම රත්නාවලි පාඨයෙන් මෙ සිරිත පෙර සිට ම පැවති බව පෙනේ. සහෝදරයන් දෙදෙනෙකුගේ දරුවන් අතර, හා සහෝදරියන් දෙදෙනෙකුගේ දරුවන් අතර ආවාහ විවාහ සිදුවීම සිංහල බෞද්ධ චාරිත්‍රවලට එකඟ නො වේ. පැරණි බෞද්ධ සාහිත්‍යයේ නම් අතරින් පතර සහෝදර සහෝදරියන් අතර විශේෂ හේතූන් නිසා සිදු වූ ආවාහ විවාහ දක්නට ලැබේ.

**දෑවැද.**

විවාහයක් තීරණය කිරීමේ දී අතීතයේ කෙසේ වුවත් මෙම වාණිජ යුගයේ දී බොහෝ දෙනකුගේ සැලකිල්ලට භාජන වී ඇත්තේ දයාදය යි. වෛදික සමාජයේ නම් වැඩි වශයෙන් දයාද දී ඇත්තේ මනාලයා හෝ මනාලයාගේ පියා විසින් මනාලියගේ දෙමවුපියන්ට ය. බෞද්ධ සාහිත්‍ය යේ ද එබඳු සිරිත් දක්නට ලැබේ. කුස රජු පභාවතිය ලබා ගත්තේ රන්රුවක් ඇගේ දෙමාපියනට තුටු පඬුරක් වශයෙන් යැවීමෙනි. මනාලි-

යගේ පියා මනාලයාට දැවැද්ද දුන් අවස්ථා ද ඇත. කොසොල් රජු බිම්සර රජුට දුව දුන්නේ 'කාශී' නමැති ගමක් සමග ය. ධනඤ්ජය සිටාණන් විශාඛාව දීග දුන්නේ මසුරන් හා වෙනත් භාණ්ඩ ගැල් 500 බැගින් හා ගවයන් 60,000ක් සමග යයි කියා තිබේ. එහෙත් මෙබඳු දැවැදි දීම සාමාන්‍ය ජනයා අතර තිබුණේ දැයි කිය නොහැකි ය.

දැවැද්ද මෙකලත් බොහෝ විට දක්නට ලැබෙන්නේ පොහොසත් හා උගත් යයි කියන සමාජයේ ය. ගුණ දහම් අගයන බෞද්ධ සමාජයට දැවැද්ද එතරම් ගැලපෙන දෙයක් සේ නො පෙනේ. දෙමව්පියන් සතු ඉඩ කඩම් හා ධනය දරුවන්ට බෙදදීම නම් බෞද්ධ සිරිතකි. එහෙත් ඒ දෙන්නේ විවාහ ගනු දෙනුවක් වශයෙන් නොවේ. විවාහයෙන් පසුව දෙමවුපියන්ගෙන් ලැබෙන තෑගි වශයෙනි. කෙසේ නමුත්, මෙකල දැවැද්ද දෙන්නේ මනාලියගේ දෙමවුපියන් විසින් මනාලයාට ය.

දැවැද්ද දෙන්නේ නම් මංගල දිනයේ දී ම යුවතිපතීන් පෝරුවෙන් බැස්ස අවස්ථාවේ දී ම දීම මෙකල ලංකාවේ සමහර පෙදෙස්වල සිරිත ය.

**තීරණ ගැනීම.**

සිංහල බෞද්ධයන් අතර ද විවාහ පිළිබඳ තීරණ ගන්නේ වැඩි වශයෙන් දෙමව්පියන් විසිනි. හින්දූන් අතර මෙන් මනාලියගෙන් නො විමසා මෙය සිදු නො කෙරේ. මනාල – මනාලියන්ගේ අදහස් විමසීම අද මෙරට පවත්නා සුලභ සිරිතකි. පුතකුගේ හෝ දියණියකගේ විවාහ මඟුල ඔහු හෝ ඇය රුචි කරන පරිද්දෙන් සුදුසු ලෙස කරදීම තමන්ගේ බලවත් යුතුකමක් සේ බෞද්ධ දෙමවුපියෝ කල්පනා කරති. තීරණ ගැනීමට ප්‍රථම මනාලයාගේ දෙමව්පියන් හා මනාලයා මනාලියගේ නිවසට ගොස් ආදර සැලකුම් ලැබීමත් එසේම මනාලියගේ දෙමාපියන් හා වැඩිහිටියන් මනාලයාගේ ගෙදරට ගොස් ආදර සැලකුම් ලැබීමත් මෙකල සිරිත ය.

එසේ ම මනාලයාගේ හා මනාලියගේ කේන්ද්‍ර කොපි (හඳහන්) පරීක්ෂා කර බලා ඒවාත් ගැළපේ නම් දෙපක්ෂයේ වැඩිහිටියෝ එකතුවී සුබ නැකත් වේලාවක් බලවා මංගල දිනය තීරණය කරති.

ඉක්බිති විවාහාපේක්ෂක දෙදෙනාගේ නම් ප්‍රදේශයේ විවාහ ලේකම් වරයාගේ කාර්යාලයේ ලියාපදිංචි කරනු ලැබේ. මෙම ලියාපදිංචියෙන් දින 14කට පසු හා තෙමසකට පෙර විවාහය ඉටු කිරීම නීත්‍යානුකූල අවශ්‍යතාවකි.

**මංගල චාරිත්‍ර.**

දනට අප රට ක්‍රියාත්මක වන මංගල චාරිත්‍ර පැරණි ඉන්දීය හින්දූ චාරිත්‍රවලින් ශේෂ වූ ඒවා වෙයි. පුරාණයේ දී හින්දූන්ගේ විවාහ මංගල

කටයුතුවලට හින්දු පූජකයෝ ද සහභාගී වූහ. බෞද්ධ විවා මඟුල්වලට භික්ෂූන් වහන්සේ සහභාගී වූ බවක් නො පෙනේ. එබැවින් විවාහ චාරිත්‍රවල දී සිංහලයන් භාවිතා කොට ඇත්තේත් ඔවුන් ගේ ආදි මුතුන් මිත්තන් භාවිත කළ ඉන්දියානු සිරිත් විරිත් ම ය. පසු කාලයේ දී මෙම හින්දු මංගල සිරිත් විරිත්වලට ද්‍රවිඩ මංගල සිරිත් විරිත් හා බටහිර මංගල සිරිත් විරිත් ද මිශ්‍ර වී ඇති බව පෙනේ. එබැවින් දැනට බෞද්ධයින් අතර භාවිත වන මංගල සිරිත් විරිත්වල බෞද්ධ ලක්ෂණය සොයා ගැනීම දුෂ්කර ය.

එහෙත් සිංහල බෞද්ධයන් විවා මඟුල් උත්සව දිනයට ආසන්න පළමු දිනයක දී මහා සංඝයා වහන්සේ නිවසට වැඩමවා මංගල දානයක් දීමට පිළියෙල කර ගැනීම අපරට බොහෝ පෙදෙස් වල දක්නට ලැබෙන්නකි. මෙහි දී දානය අවසානයේ දී නව දිවියට පා තබන යුවළ වෙනුවෙන් භික්ෂූන් වහන්සේලා සෙත් පිරිත් දේශනයක් පවත්වා ආසිරි පතති.

පහත විස්තර වන්නේ මංගල දිනයේ දී කෙරෙන චාරිත්‍රයන් සංක්ෂිප්ත වශයෙනි.

**මනාලයා පැමිණේ.**

මනාල මහතා සහ ඔහුගේ නෑ පිරිස සුබ මොහොතින් නිවසින් පිට ව මනාලියගේ නිවෙස වෙත පැමිණෙති. මනාලියගේ දෙමවුපියෝ හෝ වැඩිහිටි නෑ යුවලක් පෙර මඟට ගොස් ඔවුන් පිළිගනිති.

ඉක්බිති එලන ලද පාවාඩ පිටින් මනාලයා හා දෙවෙනි මනාලයා වශයෙන් පැමිණෙන ඔහුගේ යහළුවාත් ඒ පසු පසින් නෑදැයෝත් නිවසෙහි දොරටුව ළඟට පැමිණෙති. එහි දී මනාලියගේ බාල සොහොයුරෙක් මනාලයාගේ පා දොවයි. එවේලෙහි පා දෙවන්නාට තෑගි වශයෙන් ගල්බැඳි මුද්දක් මනාලයා වතුර බේසමට දමයි. පාවාඩ එලූ රජකයාට ද මනාලයා හෝ ඔහුගේ පක්ෂය වෙනුවෙන් මුදලක් තෑගි දීම ද සිරිති. මනාලයාගේ පක්ෂයේ වැඩිහිටි නෑයෙක් මෙහි දී මනාලියගේ පියාට බුලත් හුරුල්ලක් දීම ද සිරිතකි. සමහර පළාත්වල මේ බුලත් හුරුල්ලේ ඇති බුලත් කොළ ගණන මනාලයා ගේ පක්ෂයෙන් එදින මංගල උත්සවයට පැමිණෙන නෑදැයන්ගේ ගණනට සමාන වෙයි.

**පෝරුවේ චාරිත්‍ර.**

පෝරුවේ චාරිත්‍ර මංගල දිනයේ කෙරෙන වැදගත්ම චාරිත්‍රයි. මඟුල් පෝරුව සාමාන්‍යයෙන් අඩි 4 x 3ක් පමණ වූ, අඟල් හත අටක් උස මිටි වේදිකාවකි. පුරාණයේ දී මෙය කොහොඹ ලෑලි වලින් සෑදීම

සිරිත වුවත් මෙකල කුමන වර්ගයේ හෝ ලෑලි වලින් කරනු ලැබේ. මඟුල් පෝරුව කලාකරුවකු ලවා හැකිතරම් විචිත්‍ර අන්දමින් අලංකාර කිරීම ද වැදගත් අංගයක් ලෙස සලකනු ලැබේ. මඟුල් පෝරුව මත පැදුරු එළා සුදු රෙද්දක් අතුරා ඒ මත ලෙලි අරින ලද පොල් ගෙඩියක් හා හාල් සේරු දෙකක් තබා රිදී කාසි විසිරවනු ලැබේ. උඩරට සමහර පෙදෙස්වල පෝරුව මත මෝල් ගහක් ද තබනු ලැබේ. මඟුල් පෝරුව පිළියෙල කරන්නේ පිරිත් මණ්ඩපය මෙන් ඉදිරිපස සැගෙනහිරට මුහුණලා ය. පෝරුවේ කොන් හතරේ පහන් දල්වීමට පුන්කලස් හතරක් ද තබනු ලැබේ.

සුභ මොහොතින් මනාලයා වම් පසිනුත්, මනාලිය දකුණු පසිනුත් පෝරුවට නංවනු ලැබේ. මනාලිය පෝරුවට නංවන්නේ මනාලියගේ මාමා කෙනකු විසිනි. මනාලයා පෝරුවට නංවන්නේ මනාලයාගේ පියා හෝ වැඩිහිටි නෑයකු විසිනි. ඉක්බිති වැඩිහිටි නෑයකු හෝ පෝරුවේ චාරිත්‍ර පිළිබඳ ප්‍රවීණයකු විසින් චාරිත්‍රානුකූල ස්තෝත්‍ර හා අෂ්ටක කියනු ලැබේ. අනතුරුව මනාලියගේ මාමා විසින් මනාලයාගේ වම් අතේ සුළඟිල්ලත් මනාලියගේ දකුණු අතේ සුළඟිල්ලත් සේද හුයකින් හෝ රන් කෙන්දකින් බැඳ කෙණ්ඩියකින් අත පැන් වත් කරනු ලැබේ. අනතුරුව මනාලයා මනාලියට තැලි පිළි පළඳවයි. මුදු මාරු කිරීම සිදු වන්නේ ද මෙහි දී ය.

මනාලයා විසින් මනාලියගේ මෑණියන්ට සුදු රෙදි යාර 10ක් පරිත්‍යාග කිරීම ද සිරිතකි. මනාලියගේ පැත්තෙන් ද මනාලයාට තෑගි බෝග දීම ද සමහර පෙදෙස්වල සිරිතකි.

මනාල යුවළ මංගල පෝරුවේ සිටිද්දී කන්‍යාවන් විසින් ජයමංගල ගාථා කියා ආශීර්වාද කිරීම ද අනිවාර්යයෙන් කෙරෙන සිරිතකි. මෙහි දී පැහැදිලිව පෙනෙන බෞද්ධාගමික එකම සිරිත මෙයයි. අනතුරුව නව යුවළ දෙමවුපියන් ඇතුළු වැඩිහිටි ඥාතීන්ට බුලත් හුරුලු දීමෙන් පසු ව පෝරුවෙන් බැසීමට නියමිත සුබ මොහොතේ දී අතිනත් ගෙන පෝරුවෙන් බසිති. මෙවිට ම චාරිත්‍රයක් වශයෙන් පොල් ගෙඩියක් දෙපලු කිරීම ද සිරිතක් වශයෙන් කෙරේ. පොල් ගෙඩිය සමව දෙකට බිඳී පොල් බෑ උඩුකුරුව සිටියේ නම් විවාහය ඉතා සාර්ථක වේ යයි විශ්වාස කරනු ලැබේ.

ඉක්බිති මංගල කිරිබත නව යුවළට හා නෑයන්ට දෙති. මංගල කිරිබත මනාලයා මනාලියටත්, මනාලිය මනාලයාටත් කැවීම සිරිතකි. මෙකල කිරිබතේ තැන ගෙන ඇත්තේ කේක් ය.

ඉක්බිති බත බුලතින් කාටත් සංග්‍රහ කෙරේ. මනාලිය මනාලයා විසින් දෙන ලද සාරියෙන් සැරසේ. මනාලිය කැඳවා ගෙන යාමට

නියමිත සුබ මොහොතට කලින් මනාල යුවළ දෙමාපියන්ගේ දෙපා වැඳ අවසර ගනිති. එසේ ම සියලු ම වැඩිහිටි නෑයන්ටත් වැඳ අවසර ගැනීම සිරිත ය.

**මනාලියට ඔවා බස්.**

දීග යන දුවට පියා හෝ වැඩිහිටියකු විසින් ගිහි ජීවිතයේ පැවතිය යුතු අන්දම පිළිබඳ ව මෙහි දී අවවාද දීම ද පෙර සිට පැවත එන සිරිතකි. බමුණු පියකු විසින් දීග යන සිය දියණියට දෙන අවවාදයක් කාව්‍ය ශේඛරයේ එන්නේ ය. එහි එන එක් කවක් මෙසේ ය.

''නොකියා සිය හිමි ට
නැතිව ද උතුරු සළු පට
ගමන් ඉක්මන් කොට
නොයන් නුඹ වසන ගෙන් පිටතට''

පැරණි බෞද්ධ සාහිත්‍යයෙහි ද මෙවැනි අවවාද දක්නට ලැබේ. එහි දී අවවාද දී ඇත්තේ පාණිග්‍රහණයට (අතගැනීමට) පෙරාතුව ය.

''සෙට දවසෙහි මාගේ දියණිය ස්වාමි කුලය කරා යන්නී ය.'යි ධනඤ්ජය සිටුතුමා ස්වකීය දියණිය වූ විශාඛාවන් ළඟට කැඳවා ''ආදරණිය දියණියෙනි, ස්වාමි කුලයෙහි වසන්නිය විසින් මෙසේ හැසිරිය යුතුය'යි ඇයට අවවාද දසයක් දුන්නේ ය. මේ අවවාද එබඳු අවස්ථාවක කවර දියණියකටත් ගැළපෙන පොදු උපදේශයෝ ය. ප්‍රහේලිකා ස්වරූපයෙන් ඇති ඒ අවවාද දසය මෙසේ ය.

(1) ඇතුළත ගින්න පිටතට නො දිය යුතු ය.

(2) පිටත ගින්න ඇතුළට නොගත යුතු ය.

(3) දෙන්නහුට ම දිය දියුතු ය.

(4) නොදෙන්නහුට නො දිය යුතු ය.

(5) දෙන්නහුට ද නො දෙන්නහුට ද දිය යුතු ය.

(6) සුවසේ හිඳ ගත යුතු ය.

(7) සුවසේ අනුභව කළ යුතු ය.

(8) සුවසේ නිඳ ගත යුතු ය.

(9) ගින්න පිදිය යුතු ය.

(10) ගෘහ දේවතාවා වැඳිය යුතු ය.

අනේපිඩු සිටුතුමා වූල සුභද්‍රාවන්ට දුන්නේත් මේ අවවාද දසයම යි.

උග්ග නම් තැනැත්තකු විසින් දීග යන තම දූවරුන්ට බුදු රදුන් ලවා ද අවවාද කරවූ අවස්ථාවක් අංගුත්තර නිකායේ එන්නේ ය. එම අවවාදයට ඇතුළත් වූයේ —

1. සැමට පළමු උදෙන් ම නැගිටිය යුතු ය. (පුබ්බුට්ඨායිනී)

2. සියල්ල සොයා බලා සැමට පසුව නින්දට යා යුතු ය. (පච්ඡානිපාතිනී)

3. කරන කියන හැම එකක් ම හිමියාගේ අනුමතියෙන් ම සිදු කළ යුතු යි. (කිංකාර පටිස්සාවිනී.)

4. හිමියාගේ සිත් ගන්නා ලෙස හැසිරිය යුතු ය. (මනාපචාරිණී)

5. ප්‍රිය මනාප තෙපුල් බිණිය යුතු ය. (පියවාදිනී) යනු යි.

වර්තමානයේ දී දීග යන දියණියට බොහෝ විට අවවාද දෙන්නේ පියා නොව පවුලේ බහුශ්‍රැත වැඩිහිටි නෑයෙකි.

අවසානයේ දී මනාලයාගේ පිරිස තමනට ලැබුණු සංග්‍රහ ආදියට මනාලියගේ දෙමාපියන් ඇතුළු නෑදෑ පිරිසට ස්තුති කොට පිටවීමට නියමිත සුබමොහොතින් නව යුවළ කැඳවා ගෙන ගම් බලා යති.

## 3.3 පවුලේ සාමාජිකයන් අතර සම්බන්ධකම් පැවැත්වීම පිළිබඳ සිරිත් විරිත්.

පවුල සමාජයේ කුඩා ම ඒකකය යි. එහි කේන්ද්‍රය වනුයේ අඹු සැමි දෙදෙනා ය. පවුලේ ඊළඟ වැදගත් සාමාජිකයන් දරුවන් ය. පවුල් ජීවිතයට ඇතුළත් වීම යනු ගෘහ ජීවිතයට ඇතුළත් වීමයි. ගෘහය වශයෙන් අදහස් කෙළේ ගෙය නො ව ගෘහණිය යි. ගෙය නමැති ගොඩනැගිල්ලක අවශ්‍යතාවය ඇති වූයේ ගෘහණිය නිසා ය. බිරියට වඩා නෑයකු හෝ සහායකයකු හෝ නැතැයි ආදී ආර්‍ය සමාජයේ සලකන ලදී. සැමියකු හා බිරියකගේ අන්‍යොන්‍ය සම්බන්ධයෙන් ධර්ම, අර්ථ, කාම යන ත්‍රිවිධ සම්පත් විඳිය හැකි බව පැරණි ඉන්දීය සමාජය පිළිගෙන තිබුණි. විවාහ වී පුතකු ඇති නො කොළොත් ඔහු පරපුරට ණය කාරයකු ලෙස සලකන ලදී. පසුකාලීන බෞද්ධ සමාජය ද මෙය පිළිගන්නා ලදී. පැවිද්දකු නො වේ නම් අවිවාහකයකු වගකිව යුතු පුද්ගලයකු වශයෙන් නොපිළිගැනීම මෙකල සමාජයේ ද සිරිත ය.

සැමියා බිරිඳ කෙරෙහිත්, බිරිඳ සැමියා කෙරෙහිත් පවතින අයුරින් පවුල නමැති සමාජයේ පැවැත්ම තහවුරු වේ. ඒ පවුලේ දරුවන්ගේ සුරක්ෂිත භාවය රැකෙන්නේ ද අඹු සැමි සම්බන්ධය මත ය.

**භාර්යාව කෙරෙහි සැමියකුගේ යුතුකම් හා සිරිත් විරිත්.**

බුදුරජාණන් වහන්සේ විසින් සිඟාලෝවාද සූත්‍රයේ දී සැමියකුගෙන් බිරියකට ඉටුවිය යුතු යුතුකම් පහක් පෙන්වන ලද්දේ ය. බිරියට බුහුමන් කිරීම, අවමන් නොකිරීම, පරඹුවන් සේවනය නො කිරීම, ගෘහ සංවිධානය පැවරීම හා බිරියට ඇඳුම් පැළඳුම් සපයාදීම ඒ යුතුකම් පසයි. මේවා එද පටන් බෞද්ධ සැමියකුගේ චාරිත්‍ර බවට පත්වී තිබේ.

බිරියට ගරු බුහුමන් දක්වා ප්‍රිය වචනයෙන් කථා කිරීම අගය කරන බෞද්ධ සැමියා ඇය ඉතාම කැමති වන අයුරින් ඇයට ආමන්ත්‍රණය කරයි. ''සොඳුර'' යනුවෙන් ඇමතීම සාහත්‍ය පොත්වල එන සැටියි. ''අපේ මැණිකේ'' ''අපේ හාමිනේ'' යනුවෙන් බිරිඳට සැමියන් විසින් අමතන හැටි ගම්බද සමාජයේ තවමත් දැකිය හැකි ය. බිරිඳගේ නමින් හෝ ආදරයෙන් ඇමතීමට හඳගත් කෙටි නමකින් හෝ ඇමතීම ද වර්තමාන සමාජයේ බෙහෙවින් දක්නට ලැබේ. විවිධ කටයුතුවල දී බිරිඳගේ අදහස් උදහස් විමසා බැලීම ද ඇයට බුහුමන් කිරීමකි.

අඹු සැමියන් අතර පළු බස ඇති වුවහොත් එම පවුලේ ප්‍රීතිය නැතිව යයි. යහපත් සැමියෙක් කිසි විටෙකත් බිරිඳ ගෙළා දක්න අයුරින් අවමන් කොට කථා නො කරයි. බිරියගේ අඩුපාඩුවක් දුටුවත් පය සුදුසු වේලාවක ඉතා ආදරයෙන් පෙන්වා දෙයි. මේ සිරිත රකින සැමියෝ ස්වකීය බිරිය තම දරුවන් ඉදිරියේදිවත්, ඥාතීන් ඉදිරියේදිවත් අමුත්තන් ඉදිරියේදිවත් හාස්‍යයට ලක් නොකරති.

එසේම යහපත් සැමියකුගේ සිරිත නම් කිසි විටෙකත් අන්‍ය ස්ත්‍රීන් හා වැරදි සම්බන්ධකම් නොපැවැත්වීම යි. වෙනත් අයගේ භාර්‍යාවන් තම භාර්යාවන් හා සම තත්ත්වයේ ලා සැලකීම බෞද්ධ සැමියකුගේ සිරිත නොවේ. ඔහු හිතන්නේ තම එකම හිතවතිය තම බිරිය බව ය.

යමෙක් ස්වකීය අඹුවගෙන් තුටු නොවී පරඹුවන් හා වෛශ්‍යාවන් කරා යන්නේ නම් ඔහු පිරිහීමට පත්වන බව බුදුරජාණන් වහන්සේ පරාභව සූත්‍රයේ දී පෙන්වා දෙයි. එසේ ම ව්‍යග්ගපජ්ජ සූත්‍රයේ දීත් සිඟාලෝවාද සූත්‍රයේ දීත් පරස්ත්‍රීන් සේවනය භෝග විනාශ මුඛයක් වශයෙන් පෙන්නුම් කරන උන් වහන්සේ මේ කාරණය නිතර නිතර මතක් කරන්නට ඇත්තේ පවුල නැමති ආයතනය කාම මිථ්‍යාචාරය මත සම්පූර්ණයෙන් බිඳ වැටෙන බැවින් විය යුතු ය.

ස්වකීය භාර්යාවටත්, දරුවන්ටත් ආහාර පාන සපයා දීම වැදගත් කොට සලකන සැමියා තමන් සපයන මිල මුදල් ඇයට පවරා දී ගෙදර දොරේ වියහියදම් කිරීම ඇයට බාර දෙයි. මේ වගකීම් භාරදීම භාර්යාව



3. ර.මු.නී.ස. 090669

අගය කිරීමක් වන බැවින් අඹුසැමි හිතවත්කම හා විශ්වාසය තහවුරු වීමට හේතු වෙයි. භාර්යාවගේ ලෙඩට දුකට විශේෂ සැලකිල්ලෙන් බෙහෙත් හේත් සපයා දී කටයුතු කිරීම බෞද්ධ සිරිත් අගයන සැමි-යකුගේ සිරිත යි.

කාන්තාවන් ලස්සන ඇඳුමින් පැළඳුමින් සැරසීමට කැමැත්තක් දක්වන බැවින් භාර්යාවට හැකි පමණින් වස්ත්‍රාභරණ සපයා දීමට බොදු සිරිත් අගයන සැමියෝ අමතක නො කරති.

සිංහල බෞද්ධයන් මෙ සිරිත් පවත්වා ගෙන ආ බව 13 වන සියවසේ ලියැවුණු ''පූජාවලිය'' නැමැති ධර්ම ග්‍රන්ථයේ එන පහත සඳහන් පාඨයෙන් ද පෙනෙයි.

''...කල්‍යාණ වූ පුරුෂයන් විසින් ස්ත්‍රීන්ට කළ මනා වූ ආදර සහිත වූ තෙපුල් කීම ය, ස්වදරාවන් හැර පරදරාවන් කෙරෙහි සත්ත (ඇලුම්) නොවීම ය. භෝජන සංවිධානයෙහි ස්ත්‍රීන් ම නායක කොට තැබීම ය. කලින් කලට තරම් වූ වස්ත්‍රාභරණ සපයා දීමය යන මේ පඤ්චස්ථාන සංග්‍රහයෙන්.....''

බෞද්ධ සිරිත් අගයන ගෘහපතියකු හෝ සැමියකු විසින් පිළිපැදීමට සුදුසු චාරිත්‍ර ධර්ම හයක් බුදුරජාණන් වහන්සේ විසින් සිඟාලෝවාද සූත්‍රයේ දී පෙන්වා දී ඇත්තේ ය. බුදුරජාණන් වහන්සේ විසින් වස්තු විනාශයට හේතුවන කරුණු වශයෙන් පෙන්වා දී ඇති, පවුල් විනාශයට හේතු භූත වන ඒ කරුණු මෙසේ ය.

(1) මත්වීමෙන් පමාවට හේතු වූ රහමෙරෙහි යෙදීම.

(2) අවේලාවන් හී වීථිමාර්ග ආදියෙහි හැසිරීම.

(3) ගී නැටුම් දැකීමෙහි ඇලීම.

(4) දූ කෙළියෙහි යෙදීම.

(5) පාප මිත්‍ර සේවනය හා

(6) අලසකමින් කල් ගෙවීම යනු ඒ කරුණු හයයි.

මේ සියල්ල යහපත් බිරිඳකට අවමන් කළ හැකි අයුරුයි. බිරිඳත් නිතරම සැමියා සමඟ කල් ගත කිරීමට කැමති වෙයි. එහෙත් මත් පැනෙහි යෙදෙන, අවේලාවන්හි වීථි සංචාරයෙහි යෙදෙන, දූ කෙළියෙහි යෙදෙන, පාප මිතුරන් ඇසුරු කරන තැනැත්තා ස්වකීය කාලය ගෙවන්නේ නිවෙසින් පිට ය. එබඳු තැනත්තකු නිවසට පැමිණෙන්නේ බිරිඳට හා දරුවන්ට දුක් වේදනා පැමිණ වීමට ය. ඇතැම් විට බිරිඳට වස්ත්‍රාභරණයෙන් සැලකීම වෙනුවට ඇගේ කණකර ආභරණ පවා පැහැර ගෙන ගොස් දූ කෙළියෙහි, රහමෙර පානයෙහි හෝ පාප මිත්‍ර ඇසුරෙහි

යයදෙයි. මෙබඳු දුසිරිතින් වැළකීම බෞද්ධ සිරිත් අගයන සැමියෝ පෙර සිට ම අගය කළහ.

**බිරිඳගේ පැවැත්ම හා සිරිත් විරිත්.**

ගෘහ ජීවිතය පිළිබඳ සිංහල බෞද්ධයන් අතර පවත්නා බොහෝ සිරිත් විරිත් පැරණි හින්දු ආර්‍ය සමාජයේ පැවති සිරිත් වලට වඩා වෙනස් වන්නේ බොහෝ ස්වල්ප වශයෙනි. විශේෂයෙන් පැරණි ඉන්දියානු කාන්තාවකගේ ඇවතුම් පැවතුම් හා සිරිත් විරිත් වැඩි හරියක් වසර දෙදහස් පන්සියයකටත් වැඩි කාලයක් බෞද්ධ සිංහල කාන්තාවන් තුළ ද අඛණ්ඩ ව පැවතීගෙන ඇවිත් තිබෙන අයුරු මෙම සිරිත් විරිත් වල ඉතිහාසය සොයන විට පෙනී යයි.

වෛදික සාහිත්‍ය ග්‍රන්ථයන්හි දක්නට ලැබෙන ගෘහණියකගේ යුතුකම් හා ඇවතුම් සමහරක් මෙසේ ය.

ගෙදර බඩු බාහිරාදිය නිසි තැන තබා ගෙදර දොර මනා ලෙස පවත්වා ගැනීම, අධික වියදම් නො කිරීම, කඩිසරව කටයුතු කිරීම, සිනාමුසු මුහුණින් සිටීම, හිමියාගේ සිතැඟි පරිදි කටයුතු කිරීම, මනා පැවැත්ම හා ඉන්ද්‍රිය දමනයෙන් යුක්ත වීම, සැමියාට හා ඔහුගේ නෑයන්ට හරසර දැක්වීම, හිමියාගේ නෑදෑයන්ට පරිභව නොකිරීම, හිමියාගෙන් හෝ වැඩිහිටියන්ගෙන් නො අසා ගෙයින් පිටත නොයාම උතුරු සළුව නොමැතිව ගෙයින් පිටත නො යාම, ඉක්මන් ගමනින් නොයාම, නාභිය නො දැක්වීම, පය ඇස්වටය වැසෙනසේ සළුව ඇඳීම, ළැම විවෘතව තබා නොගැනීම, අතින් හෝ සළුවෙන් මුඛය නොවසා තදින් සිනා නොවීම හොඳ බිරියකගේ යුතුකම් ය.

''නියම බිරිඳ හිමියාට සහ වැඩිහිටියන්ට කලින් උදෙන් පිබිදෙයි. ආහාර ගන්නේ ඔවුන්ට පසුව ය. නිදාගන්නේ ඔවුන්ට වඩා මිටි අසුන්වල ය. . . .''

''මත්පැන් බීම, නරක මිනිසුන් හා ආශ්‍රය, හිමියා හැර බැහැරව සිටීම, ත්‍රර්ථයන්හි හෝ වෙනත ඔබ මොබ හැසිරීම, දවල් නිදීම, බිරියන් විසින් නොකළ යුතු පරිහානිකර කරුණු පසක් වශයෙන් ද වෛදික ග්‍රන්ථයන් හි පෙන්වා දී ඇත්තේ ය.

ඉහත සඳහන් චාරිත්‍ර ධර්මයන් ගම්බද බෞද්ධ සිංහල කාන්තාවන් තුළ තවමත් දක්නට ලැබේ. මුලින් සඳහන් කරන ලද ගෘහනියකගේ පැවතුම් හා චාරිත්‍ර වාරිත්‍ර ආදිය පහත සඳහන් අන්දමින් ශීර්ෂ පහකට ගොණුකළ හැකි ය.

(1) ගෙදොර දොර කටයුතු සංවිධානය.

(2) හිමියාට හා ඔහුගේ නෑදෑයින්ට සැලකීම.

(3) විනීත ප්‍රියමනාප ඉරියව් පැවැත්වීම.

(4) විනීත ඇඳුම් පැළඳුම් භාවිත ය.

(5) හිතුමතයේ නිවසින් බැහැරව නොයාම.

බුදුරජාණන් වහන්සේ විසින් ද සිඟාලෝවාද සූත්‍රයේ දී යහපත් බිරියක විසින් සැමියා කෙරෙහි පැවතිය යුතු ආකාර පහක් පෙන්වා දී ඇත්තේ ය.

(1) ගෙදෙර දෙර වැඩකටයුතු මනාව කිරීම.

(2) ස්වාමියාගේ පරිවාර ජනයාට මනාකොට සංග්‍රහ කිරීම.

(3) පර පුරුෂයන් සේවනය නොකිරීම.

(4) සැමියාගේ වස්තුව ආරක්ෂා කර දීම.

(5) ගේ දෙර කටයුතු අනලස් ව කිරීම. යනු ඒ පසයි.

පවත්නා හොඳ සිරිත් අනුමත කිරීම බුදුරජාණන් වහන්සේගේ සිරිත විය. එබැවින් මුලින් සඳහන් කළ ඉන්දු ආර්‍ය සමාජය අගය කළ කාන්තා පැවතුම් රාශියක් ම බුදුරජාණන් වහන්සේ විසින් අනුමත කරන ලදී.

එබැවින් පෙර සිටම ගෙදර දෙර මැනවින් සංවිධානය කිරීම බෞද්ධ ගෙදරක ස්වාමිදූවගේ කාර්ය වූ බව පෙනේ. කුඩා පැල්පතක් වුවත් පවිත්‍ර ව තබා ගැනීම ඇගේ සිරිත විය. ගෙබිම පවිත්‍ර කර ගත්තේ ගොම මැටි ගැමෙනි.

''සඳ සිකුරු දව සේ
ගොමින් පිරිබඩ ලන්න නිව සේ''

සඳුද හා සිකුරාද ගෙබිම ගොමගෑම ගෘහණියගේ සිරිතක් වූ බව පෙනේ. අත්‍යාවශ්‍ය බෙහෙත් ද්‍රව්‍ය හා මල් ආදිය ගේ අවට වවා ගැනීමද ඇගේ කාරියක් වූ බව

''ඉඟුරු දුරු ඇ යුතු
මල්ගොමු හා වවා වතු
ගව මී තබා නතු
දසුන් පිළිවිස බලව ඇති නතු''

යන කවසේකර පැදිය කියයි. සැමියා උපයන මුදල් නිසි ලෙස පරිහරණය කරමින් ගෙදර කෑම බීම පිළියෙල කිරීමත්, ගෙදර ලස්සනට පිළිවෙළට තබා ගැනීමත් ඇ සතු ප්‍රධාන වගකීම ය.

''බත් කන කල නැදි මයිලනුත් සමණනුත් බත් කවාලා තවත් බත් ලද්දවුන් නොලද්දවුන් විචාරා එයිත් පිරිමසාලා පසුව තමා වැද හිඳ කතොත් සුවසේ කැම නම් වෙයි.'' යන සද්ධර්ම රත්නාවලී පාඨයෙන් පෙනෙන්නේ සියල්ලට පසුව ආහාර ගැනීම ගෘහණියන්ගේ සිරිත බව ය. රාත්‍රි නින්දට යාම ද අනුන් ගැන සොයා බලා පසුව යෑම ස්වාමි දූවකගේ යුතු කම විය.

''බත කාලා හැම දෙනාට පෙරාතු හැඳට නැගිලා වැද ගත යුතු නො වේ. නැදි මයිලන්ටත් සමණන්ටත් කළ මනා සිරිත් කොටලා තමා පසුව වැදහොත යුතු ය.'' යනු ද සද්ධර්ම රත්නාවලී පාඨ යි.

ගෙදරට එන අමුත්තන් සතුටු මුහුණින් පිළිගැනීම ද ඇගේ සිරිත ය. අමුත්තන්ට සංග්‍රහ කිරීමේ දී මුල්තැන ගන්නේ ගෘහණිය යි.

කාන්තාවන් විනීත ඇඳුම් පැළඳුම් ගැන විශේෂ සැලකිල්ලක් දැක්විය යුතු බව,

පෙකනිය නො දක් වා
සළු ඇඳ බොලට දක් වා
නොපා තන සක් වා
සිනා නොමසෙන් දසන් දක් වා

යන කාව්‍ය ශේඛරයේ එන කවෙන් ද පෙන්නුම් කරයි. සිය ගත මැනවින් වැසෙන අන්දමින් විනීත ලෙස ඇඳුම් ඇඳීම බෞද්ධ කුල කාන්තාවන්ගේ සිරිත ය. එසේ ම සම්පූර්ණ ඇඳුමෙන් තොරව ගෙයින් පිට යාම ඇගේ සිරිත නොවේ.

''දෙරකඩ රැක සිටු ම
උයන්වතුවල ඇවිදු ම''

ආදී වශයෙන් තනිව කෙරෙන සංචාරයන් බෞද්ධ කාන්තාවකට නොගැළපේ. ස්වාමියාගෙන් තොරව නෑදැයකුගේ ගෙදරක වුවත් වැඩි දවසක් සිටීම බෞද්ධ ස්වාමිදූවකගේ සිරිතක් නොවේ. බෞද්ධ කාන්තාවකගේ ඉතාම වැදගත් චාරිත්‍රය නම් පතිවත රැකීම යි.

''නුවණැති වූත්, සිල්වත් වූත්, නැදි මයිලන් දෙවි කොට සලකන්නාවූත්, පතිවත රක්නා ස්ත්‍රිය උතුම් ය. එවන් තැනැත්තියකගේ පුතෙක් රටක් වුවත් පාලනය කරයි.'' යනුවෙන් බුදුරජාණන් වහන්සේ වරක් කොසොල් රජ්ජුරුවන්ට වදළහ. හොඳ බිරිඳක තුළ තිබිය යුතු විශිෂ්ට ගුණ හතරක් බුදු රජුන්ගේ ඒ කියමනේ ඇතුළත් ය. නුවණැති වීම සහජ ලක්ෂණයකි. එහෙත් සිල්වත්කම, නැදිමයිලන් දෙවි කොට සැළකීම හා පතිවත රැකීම බෞද්ධ කාන්තාවක විසින් පුරුදු පුහුණු කළ යුතු චාරිත්‍ර ධර්ම වෙයි.

පතිවත රැකීම විවාහක කාන්තාවක තුළ තිබිය යුතු උසස් ම ගුණය ලෙස පෙර සිට ම බෞද්ධ සමාජය විසින් සලකන ලද බව පෙනේ. ජාතක කථා රාශියක් ම මේ ගුණාංගයේ ඇති වැදගත්කම පහද දෙයි. පතිවතෙහි ගුප්ත බලයක් ඇති බවට ද විශ්වාසයකි. පතිවත රැකි කිඳුරියකගේ බලයෙන් සක්දෙව් රජුගේ පඬුපුල් අස්න හුණු වූ චග සඳ කිඳුරු ද වෙහි විස්තර වෙයි. සක්දෙව් රජ විසින් මිනිස් ලොවට පැමිණ මරණයට පත් කිඳුරාට ජීවිතය ලබා දෙන්නේ කිඳුරියගේ පතිවත බලයේ අනුසසිනි. මෑත අතීතයේ ඉතා ජනප්‍රිය වූ ජන කාව්‍ය දෙකක් නම් යසෝදරා වත හා පත්තිනි හෑල්ලයි. ඒවා ජනප්‍රිය වීමට හේතුවක් නම් සිංහල බෞද්ධ සමාජය කාන්තාවකගේ මේ චාරිත්‍රය ඉතා අගය-කොට සැලකීමයි.

බෞද්ධ සාහිත්‍යයේ සඳහන් භාර්යාවෝ සත් දෙනෙකි. වධක භාර්යා, චෞර භාර්යා, ස්වාමි භාර්යා, මාතෘ භාර්යා, භගිනි භාර්යා, සඛී භාර්යා, හා දසි භාර්යා යනු ඒ සත් දෙනයි.

දුෂ්ටවූත්, අනුකම්පා රහිත වූත්, පරපුරුෂයන් කෙරෙහි ඇලුණු සිතින් තම හිමියා පහත් කොට සිතන්නාවූත්, හිමියාගේ ධනය පර-පුරුෂයන් කෙරෙහි වැය කරන්නාවූත් තැනැත්තිය වධක භාර්යාව යි. හිමියා සපයන ධනය සොරකම් කොට තමනට රිසි පරිද්දෙන් වැය කරන තැනැත්ති චෞර භාර්යාවයි. කිසි වැඩක් නොකොට අලසව කමින් බොමින් සිටිමින් හිමියා ඇතුළු ගෙවැස්සනට අධිපතිකම් කරන්නී ස්වාමි භාර්යාව ය. මෙකියන ලද වධක භාර්යාව හෝ චෞර භාර්යා-වක් හෝ ස්වාමි භාර්යාවක් හෝ වීමෙන් වැළකීම බෞද්ධ ගෘහණියක-ගේ සිරිත යි.

දරුවකු රකින මවක මෙන් තම හිමියා ආදරයෙන් රැක බලා ගනිමින්, ඔහු විසින් සපයන දෑ නාස්ති නොකර ආරක්ෂා කරන්නී මාතෘ භාර්යාව යි. ස්වකීය වැඩිමහල් සහෝදරයා කෙරෙහි මෙන් ලජ්ජා භය ඇතිව හිමියාට ගෞරව සහිතව කීකරුව වසන්නී භගිනි භාර්යාව යි. සඛී භාර්යාව නම් තමාගේ ගුණවත් ස්වාමියා ඉටු මිතුරකු ලෙස දකින පතිව්‍රතාවෙන් යුත් තැනැත්තිය යි. හිමියා කෙරෙහි ම ඇලීම ඔහුගේ බැණුම් දෙඩුම් පවා නොකිපි ඉවසන, මෙහෙකාරියක මෙන් හිමියාට සේවය කරන තැනැත්ත් දසි භාර්යාව යි. මෙකියන ලද මාතෘ භාරියා-වක හෝ භගිනි භාර්යාවක හෝ සඛී භාර්යාවක හෝ දසී භාර්යාවක ලෙස කටයුතු කිරීම බෞද්ධ ගෘහණියකගේ සිරිතයි.

පිරිමියා මෙන් ම ගැහැණියට ද සම අයිතිවාසිකම් ඇති නූතන සමාජයේ බිරිඳකගේ භූමිකාව වෙනස් වී ඇති බව ද කිව යුතු ය. බොහෝ බිරියෝ අද සැමියා මෙන් ම ධන සැපයීමේ යෙදී සිටිති. මෙකල බොහෝ අවස්ථාවල දී සැමියාත්, බිරිඳත් ගෙදර දෙරේ වැඩ

කටයුතු සමසේ බෙදා ගෙන ඉටු කරනු දක්නට ලැබේ. එසේ වුව ද පවුල නමැති සංස්ථාව ඉදිරියටත් පවත්වා ගෙන යාමට නම් අඹු සැමියන් අතර හිතවත්කමත් විශ්වාසයත් නොනැසී රැකෙන චාරිත්‍ර ධර්ම අවශ්‍ය වෙයි.

**දරුවන් කෙරෙහි දෙමාපියන්ගේ පැවැත්ම හා සිරිත් විරිත්.**

පවුල් ජීවිතයට ඇතුළත් වූ අඹුසැමියෝ වැඩිකල් නොගොස් ම දරුවන් ලබා දෙ මව්පියන් බවට පත් වෙති. පවුලක තවත් සාමාජිකයන් සිටිය හැකි වුව ද දෙමාපියන් හා ඉතා සමීප වන්නෝ දූ දරුවෝ ය. සමාජයක පැවැත්ම ඇති වන්නේ මව්පිය දූ දරුවන් අතර ඇති සම්බන්ධතාවය උඩ ය. පවුලක අඹු සැමියන් වශයෙන් රඟපාන භූමිකාව හැරුණු විට තවත් භූමිකා දෙකක් ඔවුනට ප්‍රධාන වශයෙන් රඟපෑමට සිදුවෙයි. එකක් තම දරුවන් වෙත දෙමවුපියන් වශයෙන් රඟපාන භූමිකාව යි. අනෙක ඔවුන් ගේ දෙමව්පියන් වෙත දරුවන් වශයෙන් රඟපාන භූමිකාව යි. මෙසේ අඹුසැමියන් වශයෙන් සිටිමින් දෙමවුපියන් වශයෙනුත්, දරුවන් වශයෙනුත් එකවිට රඟපාන මෙම භූමිකාවන් නිසා පරම්පරා තුනක් එකට සම්බන්ධ වෙයි. සමාජයේ අඛණ්ඩ පැවතුම ඇති වන්නේ දෙමාපිය දූ දරු සම්බන්ධය නිසා බව මෙයින් පැහැදිලි ය.

දෙමව්පියන් දරුවන් හදා වඩා ගන්නේ සතර බඹ විහරණ පෙරදැරි කරගෙන ය. දරුවකු මව් කුස පිළිසිඳ ගත් අවස්ථාවේ සිට දෙමව්පියන් තුළ දරුවා කෙරෙහි සෙනෙහසක් හෙවත් මිත්‍රත්වයක් ඇති වේ. මෙම මිත්‍රත්වයෙන් යුක්තව හෙවත් මෛත්‍රියෙන් යුක්තව දරුවා රැක බලා ගැනීම ප්‍රථම බඹ විහරණය වන ''මෙත්තා'' අනුව කටයුතු කිරීමයි. ඉපදී කිසිවක් කර කියා ගත නොහැකි දරුවාගේ අසරණකම දකින දෙමව්පියන් තුළ කරුණාව පහළ වෙයි. ඒ දෙවන බඹ විහරණය වන කරුණාවයි. මෙසේ දෙමාපියන්ගේ මෛත්‍රිය කරුණාව යටතේ හැදෙන වැඩෙන දරුවා ක්‍රමයෙන් නොයෙක් දස්කම් පෙන්වන්නට පටන් ගනියි. දරුවාගේ දස්කම් හා සම්පත දකින දෙමාපියන් තුළ මුදිතාව පහළවෙයි. මේ තුන්වන බඹ විහරණය යි. හැදුණු වැඩුණු දරුවා දෙමාපියන් සිත් ගන්නා දේත්, එසේ ම සිත් නොගන්නා දේත් කරයි. සිත් නොගන්නා දේ කෙරෙහි උරණ නොවී මැදහත් සිතින් කටයුතු කගන දෙමව්පියන් තුළ උපදින්නේ උපේක්ඛාව නමැති සතරවන බඹවිහරණය යි. මෙසේ දරුවන් හදා වඩා ගන්නා දෙමාපියන් අනුගමනය කරන්නේ මහ බඹුගේ ශ්‍රේෂ්ඨ හැසිරීම වන බඹ සිරිත යි.

සිඟාලෝවාද සූත්‍රයේ දී දෙමව්පියන් උපමාකර ඇත්තේ පෙර දිගට ය. පෙර දිගින් නැගෙන සූර්යයා ලොව ඇති සියලු ම සචේතනික අචේතනික වස්තූන්ට ජීවය ලබා දෙයි. එපරිද්දෙන් දෙමව්පියෝ ද

මනා කොට දරුවන් හැදීමෙන් වැඩීමෙන් ඔවුනට ජීව බලය දී සමාජය පවත්වා ගෙන යාමට උදව වෙති. මේ කාරියේ දී දෙමව්පියන් දරුවන් කෙරෙහි කරුණු පහකින් යුතුකම ඉටු කළ යුතු බව සිඟාලෝවාද සූත්‍රය පෙන්වා දෙයි. එහි සඳහන් පරිදි බෞද්ධ දෙමව්පියෝ සිය දරුවන්

1. පාපයෙන් වළක්වති,

2. යහපතෙහි පිහිටුවති,

3. ශිල්ප ශාස්ත්‍ර උගන්වති,

4. සුදුසු කල්හි ආවාහ විවාහ කර දෙති,

5. තම දයාද පවරා දෙති.

ඉහත සඳහන් දෙ මව්පිය චාරිත්‍ර ගොඩවල් දෙකකට වෙන් කළ හැකි ය. එනම් කුඩා කාලයේ දී දරුවන් හැදිය යුතු පිළිවෙළ (අංක 1 – 3) හා තරුණ කාලයේ දී ඔවුන් වෙත යුතුකම් ඉටු කළ යුතු ආකාරය අංක (4 – 5) යනුවෙනි.

ආහාර ඇඳුම් පැළඳුම් සැපයීමේ දී පවා දෙමව්පියෝ දරුවන්ට මිහිරිතම දේ සපයා දීමට වෑයම් කරති. තමන් කුසගින්නේ සිටිමින් හෝ දරුවන්ට සැපයීම දෙමව්පියන්ගේ සිරිත ය. ගමනක් බිමනක් ගොස් ගෙදර එන විට දරුවනට ඔවුන් කැමති කිසිවක් ගෙදර ගෙන ඒම දෙ මව්පියන්ගේ සිරිත ය. "මිහිරි දෙයක් ලදින් භාගයක් අනුභව කොට ලා භාගයක් හිණ තබාගෙන අවුත් දෙන කෙනකු මෙන්" යනු-වෙන් සද්ධර්ම රත්නාවලියෙහි ඇති යෙදුමෙන් පෙනෙන්නේ මඟුල් ගෙයක් හෝ නෑදෑ ගෙදරකට ගියවිට ලැබෙන දෙයකින් කොටසක් ඉතිරි කර ගෙන ගෙනවුත් දරුවනට හා ගෙදර ඇත්තවුනට දීම පෙර සිට පැවත එන දෙ මව්පියන්ගේ සිරිතක් බව ය. අද ද බෞද්ධ දෙමව්-පියන් තුළ මෙසිරිත දක්නට ලැබේ.

ආහාර ඇඳුම් පැළඳුම් දී දරුවන් වැඩෙන්නට සැළැස්වීම පමණකින් දෙමව්පිය කාරිය අවසන් නොවේ. දරුවන්ගේ චරිත වර්ධනය කෙරෙ-හිත් බුද්ධි වර්ධනය ඇතුළු ශිල්ප පුහුණුවක් කෙරෙහි ත් දෙමව්පියන් සැලකිලිමත් විය යුතු ය. පාපයෙන් වැළැක්වීම හා යහපතෙහි පිහිටුවීම යන්නෙන් අදහස් කරන්නේ චරිත වර්ධනය යි.

"පස් පව්" ඉවත් කළ යුතු වැරදි ලෙස බෞද්ධ ලෝකයා අතර සම්මත වී ඇත. එසේ ම සතර අගතියෙන් (ඡන්ද, දෝස, භය, මෝහ) ඇත් වී කටයුතු කිරීම ද බෞද්ධයන් විසින් අපේක්ෂිත ය. එබැවින් ස්වකීය දරුවන් පස්පවින් හා සතර අගතියෙන් ඉවත් කොට දස කුසල්

ආදියෙහි හෙවත් සමාජ සම්මත යහපත් පැවැත්මෙහි යෙදවීම බෞද්ධ දෙ මව්පියන්ගේ සිරිත යි. දරුවකු ලොකු මහත් වී අනාගතයේ දී උසස් ජීවිතයක් ගෙන යනවා දකීමට දෙ මව්පියෝ බලාපොරොත්තු වෙති. මේ සඳහා අධ්‍යාපනයක් හා ශිල්ප පුහුණුවක් අවශ්‍ය ය. ඒ සඳහා කටයුතු සැලැස්වීම දෙ මව්පියන්ගේ වැදගත් ම යුතු කම යි. විශේෂයෙන් ධාර්මික යයි සැලකෙන රැකියාවක් තෝරා ගැනීමට හැකි වන අන්දමින් ශිල්ප පුහුණුවක් දරුවාට ලබා ගැනීමට සැලැස්වීම බෞද්ධ මව්පියන්ගේ යුතුකමකි. පුරාණයේ දී නම් පියාගේ ශිල්පය පුතා මැනවින්, පියා යටතේ ම ඉගෙන ගත්තේ ය.

ජීවත්වීමට අවශ්‍ය මූලික කුසලතා හා මූලික සිරිත් විරිත් දරුවන් ඉගෙන ගත්තේ ද දෙ මව්පියන්ගෙනි. මේ නිසා දෙ මව්පියන්ට පූර්වාචාර්යයෝ යයි ද කියති.

දරුවන් සුදුසු වයසට පත් කල්හි ඔවුනට සුදුසු ආවාහ - විවාහ කර දීම ද විශේෂයෙන් පෙරදිග රටවල දෙ මව්පියන්ගේ සිරිත ය. බෞද්ධ දෙ මව්පියෝ මේ සඳහා විශේෂ සැලකිල්ලක් දක්වති. ස්වකීය වැඩිහිටි දරුවන් සාර්ථක විවාහ ජීවිතවලට ඇතුළත් වී සිටිනු දකින තුරු බෞද්ධ දෙ මව්පියෝ දරුවන් කෙරෙහි කළයුතු යුතුකම් සම්පූර්ණ කළ බවක් නො පිළිගනිති.

එසේ ම මෙහි දී දෙ මව්පියන් අදූරදර්ශී පිළිවෙත් අනුගමනය කළ හොත් කුඩා කල සිට දෙ මාපිය දූ දරුවන් අතර වැඩී ගෙන ආ සම්බන්ධතාව දෙදරා යන අවස්ථා ද දක්නට ලැබේ. බෞද්ධ සම්ප්‍රදය ජීවිතය අවසානය දක්වා ම දෙ මාපිය දූ දරු සම්බන්ධතාව පවත්වා ගෙන යාම බැවින් මෙහි දී ද සැලකිලිමත් වීම විශේෂයෙන් අවශ්‍යයි.

තමන් උපයා ගත් ධනයෙන් ඉතිරි වී ඇති යමක් ඇතොත් දරුවන්ට ඒවා දයාද වශයෙන් බෙදා දී දරුවන් ගේ ආර්ථික ජිවිතයට උදව් කිරීම ද දෙමව්පියන්ගේ සිරිත ය. සමහර බෞද්ධ දෙමව්පියයෝ දරුවන්ට දයාදයක් දීම යුතුකමක් වශයෙන් සලකා කල්තියාම අර පරිස්සමෙන් කටයුතු කර යමක් ඉතුරු කිරීමට උත්සාහ කරති. දයාද දීමේදී සමාණාත්මතා ගුණයෙන් යුක්තව කටයුතු කොට සාධාරණව දරුවන් අතර බෙදා දීම යුතුකම් යි. එසේ නො වුවහොත් දරුවන් අතර අසමගිකම් ඇති වීමටත්, දෙ මව්පියන් කෙරෙහි විශ්වාසය අඩු වීමටත් හේතු වේ. ඥතිත්වය රැකෙන්නේ විශ්වාසය මත ය. ''විස්වාසා පරමා ඤාති'' යනු ධම්ම පදයකි. දෙ මව්පියන් සිය යුතුකම් ඉටු කරන්නේ ය යන හැඟීම දරුවන් තුළ ඇතිවිය යුතු ය. දෙ මව්පියන්ගේ බසට දරුවන් අවනත වන්නේ එවිට ය. එසේ වූ කල දරුවන්ගේ අභිවෘද්ධිය ද ඇතිවේ. දෙමාපියන්ගේ අනාගත ආරක්ෂාව ද සහතික වේ.

පවුලක පියා මරණාසන්න වූ විට වැඩිමහල් පුත්‍රයා ළඟට කැඳවා පවුලේ වැඩ කටයුතු පිළිබඳ වගකීම ඔහුට පැවරීම ද බොහෝ විට කෙරෙන සිරිතකි. මෙ බඳු අවස්ථාවල උදාහරණ සාහිත්‍යයෙන් ද හමුවේ. සද්ධර්මාලංකාරයේ සරණ ස්ථවිර වස්තුවේ හමුවන මෙ බඳු අවස්ථාවක් පහත දැක්වේ.

''ඉක්බිති ඒ දරු දෙදෙනා බාල අවස්ථාවෙහි ම තුමු දෙදෙන කාලක්‍රියා කරන්නාහු තමන් මරණාසන්නයෙහි වැඩිමහලු පුතණුවන් සමීපයට කැඳවා, ''එම්බා දරුවෙනි, තොප නිසි ස්ථානාන්තරයක සලස්වාලිය නුහුණුවම්හ. එබැවින් අපගේ මේ ගෙහි යම් සැපතෙක් ඇත්නම් ඒ සියල්ල ම තෙපි ම ඇරගන්ව; තොප ගේ බාල නැහැණියන් වැඩියෝග්‍ය වූ කල සියලු අභිවෘද්ධියට පමුණුවා සැපතෙහි පිහිටුවා ලීම ද තොපට භාරය'' යි කියා බාල නැගණියන් අතගෙන වැඩිමහලු පුතණුවන් අතට පාවා දී තුමු දෙදෙන කාලක්‍රියා කළහ.'' සද්ධර්මාලංකාරයේ ජයම්පතිකා වස්තුවෙහි ද මෙ බඳු අවස්ථාවක් දැක් වේ.

''සඞ්ග නම් එක් අමාත්‍යයෙක් දියණි කෙනෙකුන් හා එකම පුතණු කෙනෙකුන් ලදින් ඒ පුතණුවන්ට තමන් ගේ නමින් ම සඞ්ග අමාත්‍යයයි නම් තබා මහත් වූ ශ්‍රී සම්පතින් යුක්ත ව වාසය කොට තමා මරණාසන්නයෙහි දරු දෙදෙනා තමා සමීපයට කැඳවා සඞ්ග අමාත්‍ය නම් වූ බාල පුතණුවන් අත ගෙන වැඩිමහලු දියණියන් අතට පාවා දී ''තොපගේ මළණුවන් වැඩිගත් කල නොනසා තබා දී ලව''යි කියා. . .''

පවුලේ වැඩිමහලු පුත්‍රයාට හෝ දියණියට අවසාන මොහොතේ වගකීම් පැවරීමේ මේ සිරිත තවමත් බෞද්ධයන් අතර දක්නට ලැබේ. දෙ මව්පියන් ජීවත්ව නොසිටී නම් තමන්ගේ බාල සොහොයුරු සොහොයුරියන්ගේ ආවාහ – විවාහ මඟුල් වගකීම් ආදිය පවුලේ වැඩිමහල් සොහොයුරා භාරගෙන ඉටු කර දීම තවමත් බෞද්ධයන් අතර දක්නට ලැබෙන සිරිතකි. වැඩිමහල් සොහොයුරු සොහොයුරියන්ට දෙමව්පියන්ට මෙන් ගෞරව කිරීම ද බෞද්ධයන් අතර දක්නට ලැබෙන සිරිතකි.

**දෙමව්පියන් කෙරෙහි දරුවන්ගේ පැවැත්ම හා සිරිත් විරිත්.**

සතර බ්‍රහ්ම විහරණයෙන් යුතුව දරුවන් හදා වඩා ගන්නා දෙමව්පියන් තරම් තවත් වටිනා කෙනකුන් බෞද්ධ දරුවන්ට නො මැත. බෞද්ධයන්ගේ සාමාන්‍ය ව්‍යවහාරයේ දෙමව්පියන් හඳුන්වන්නේ ''ගෙදර බුදුන්'' නමිනි. මෙයින් හැඟෙන්නේ බුදුවරුන් කෙරෙහි පවතින අයුරින් දෙ මව්පියන් කෙරෙහි ද පැවතිය යුතු බව ය. දරුවන්ගේ මුල්ම ගුරුවරුන් ද දෙ මව්පියන් වන බැවින් දෙ මව්පියෝ ''පූර්වාචාර්ය වරයෝ'' යන නමින් ද හැඳින්වෙති. එසේ නම් දක්ෂිණාර්හ වන ගුරු-

වරුන් කෙරෙහි පිළිපදින අයුරින් ද දෙ මව්පියන් කෙරෙහි දරුවන් පිළිපැදිය යුතු ය.

දරුවෝ කුඩා කාලයේ දී දෙමව්පියන් ගෙන් යැපෙන්නන් වශයෙන් වෙසෙති. වයසට ගිය විට දෙ මව්පියෝ දරුවන්ගෙන් යැපෙති. මේ අවස්ථා දෙකෙහි දරුවන් දෙ මව්පියන් කෙරෙහි කළ යුතු සිරිත්වල යම් යම් වෙනස්කම් ද ඇත්තේ ය.

දෙ මව්පියන්ගේ අවවාද පිළිගැනීම හැදෙන වැඩෙන දරුවන්ගේ සිරිත ය. දෙමව්පියන් දරුවනට කිසිවිටෙකත් අහිතක් නොසිතන බැවින් ප්‍රශ්නයෙන් තොරව දෙ මව්පියන්ගේ අවවාද පිළිගැනීම බෞද්ධ දරුවන්ගේ සිරිත ය. කුඩා කාලයේ දී දෙ මව්පියනට කරන සැලකිල්ල නම් දෙ මව්පියන්ගේ අවවාද පිළිගැනීම යි.

වැඩිහිටියන් වී ජීවිතයේ වගකීම් භාරගන්නා තුරු ම, දෙ මව්පිය ආරක්ෂාව යටතේ වෙසෙන දරු දැරියන් හෝ තරුණ තරුණියන් විසින් දෙ මව්පියන්ගේ අනුදැනීමක් හෝ අනුමැතියක් නොමැතිව තීරණ ගනු ලැබීම බෞද්ධ සිරිතක් නො වේ. මේ සඳහා හොඳ උදාහරණයක් සද්ධර්මාලංකාරයේ කිංචි සඞ්ගා කථාවෙන් දැක්වෙ යි. මේ කථාව ලංකාවේ රුහුණු රට පසුබිම් කරගත්තකි.

වරක් ශක්‍රයා ලස්සන තරුණයකුගේ වෙසක් ගෙන මහ මග උන් රූපත් තරුණියකට විවාහ යෝජනාවක් ඉදිරිපත් කරයි. එම යෝජනාවට තරුණිය දුන් පිළිතුර දෙ මව්පියන් යටතේ හැදුන වැඩුණ බෞද්ධ තරුණියකගේ ආකල්පය පිළිබිඹු කරයි.

''එබස් අසා කුමාරිකාවෝ ''ස්වාමීනි, නුඹ වහන්සේ කීයේ කාරණමය; මේ ලෝකයෙහි පුරුෂාභරණයක් නැති ස්ත්‍රී ජනයෝ කෙනෙක් ආභරණ පැළඳ ගෙන සිටියාහු වී නමුත් නො හොබනාවූ ම ය. යම් ස්ත්‍රියකට ගෙහිමි පුරුෂයකු නැත්නම් වැන්දඹු තැනැත්තී ය'යි නින්ද බෙණෙති; එසේ වූ වැන්දඹු තැනැත්තී සියලු දුකට භාජන වන්නී ය. එසේ වී නමුත් මාගේ මවු පිය දෙදෙන තමන්' එන තෙක් මා මෙතැන සිටින්ට අවවාද කොට ගියාහු ය. දෙ මව්පියෝ නම් දරුවන්ට වැඩි කැමැත්තෝ ය. එසේ වූ දෙමව්පියන්ගේ බස් නොගිවිස සිතුවක් කළ දරු කෙනෙක් ඇත්නම් එසේ වූ නොකීකරු දරුවෝ මෙලොව නො යෙක් ව්‍යසනයට පැමිණ පරලොව දුගතියට පැමිණෙති. ඉදින් මාගේ මව්පිය දෙදෙනා තොප කෙරෙහි ඉන්ට කිවූ නම් ඉදිමි' එසේ අනු නොදන්නාහු වී නම් තොප හා සමඟ නො වෙසෙමි'යි කීහ.''

තරුණයකුට හෝ තරුණියකට තමන්ගේ අභිමතය අනුව කටයුතු කිරීමට බෞද්ධ සම්ප්‍රදාය යටතේ ඉඩක් නැතැයි යමෙක් සිතන්නේ නම් ඒ වැරදි ය. දෙ මව්පියන්ට කරුණු පහද දී ඔවුන්ගේ ආශීර්වාදය ද

ඇතිව කටයුතු කිරීම බෞද්ධ සිරිතක් බවය, මෙහි දී අවධාරණය කරනුයේ.

ඉගෙන ගන්නා කාලයේ දී හොඳින් ඉගෙනීම කටයුතු කිරීම ද දෙ මව්පියන්ට කරන සැලකිල්ලකි. දෙ මව්පියෝ දරුවන් හොඳින් ඉගෙන ගනු දකින්නට කැමති වෙති. දෙ මව්පියන් සතුටු කිරීම දරුවන්ගේ යුතුකමයි.

බෞද්ධ දරුවෝ උදේ පාසල් යන්නට ප්‍රථම දෙ මව්පියන්ට වැඳ නමස්කාර කරති. එසේ ම රාත්‍රියේ නින්දට යාමට ප්‍රථම ද දෙමව්පියනට වැඳ නමස්කාර කිරීම බෞද්ධ දරුවන්ගේ සිරිත ය.

ඈත ගමනක් බිමනක් යන විට හෝ දවස් කීපයකට හෝ ගෙදරින් පිටව යද්දී දෙ මව්පියන් වැඳ ඔවුන්ගේ ආශීර්වාදය ලබා ගැනීම පෙර සිට ම එන හොඳ සිරිතකි. කුඩා සේනක කුමරු ශිල්ප ඉගෙනීමට යාමට ප්‍රථම දෙමව්පියන් නැමදි බව කාව්‍යශේඛරයේ කියන්නේ මෙසේ ය.

දෙ මවුපිය සිනෙ හැ ති
වඳිනුව පා පියුම් පෙ ති
එකුමරු නැමී ග ති
ඔවුන් කඳුලෙන් පිට තෙමී ගති

දෙ මවුපියන්ගේ සතුටු කඳුලින් කුමරාගේ පිට තෙමීම කුමරා ලද ආශීර්වාදයකි. එබඳු අවස්ථාවක දී ''මාගේ පුතාට තුණුරුවන් සරණයි'' හෝ ''මගේ දුවට තුණුරුවන් සරණයි'' ආදී වශයෙන් සෙත් පැතීම දෙ මව්පියන්ගේ සිරිතයි.

සිංහල අවුරුදු දිනයේ දී බුලත් අතක් දී දෙමව්පියන් වැඳ සමාකර ගැනීමට කුඩා කල සිටම බෞද්ධ දරුවෝ පුරුදු පුහුණු වෙති.

දෙ මවුපියන් ළඟට ආ විට වාඩි වී සිටින අසුනෙන් නැඟී සිටීම ද බෞද්ධ දරුවන් ගේ සිරිතකි. දෙ මව්පියන් හිට ගෙන සිටිද්දී අසනීපයක් හෝ යම්කිසි විශේෂ අවස්ථාවක් නො වේ නම් වාඩි වී සිටීම හොඳ සිරිතක් නොවේ.

විවේක වේලාවල දී දෙ මව්පියන්ගේ වැඩ කටයුතුවලට තමනට හැකි අයුරින් උදව් වීම ද බෞද්ධ දරුවන්ගේ සිරිත ය. බොහෝ විට ගැහැණු දරුවෝ මවට උදව් වෙති. පිරිමි දරුවෝ පියාට උදව් වෙති.

දෙ මව්පියන්ගේ ද අඩු පාඩු හා වැරදි තිබිය හැකි ය. ශිල්ප ශාස්ත්‍ර ඉගෙන ගෙන හොඳ නරක මැනවින් අවබෝධ වන කාලය වන විට දරුවන්ට දෙ මවුපියන්ගේ වැරදි හා අධර්ම හැසිරීම පෙනෙන්නට

පුළුවන. එබඳු අවස්ථාවල දී ආදරයෙන් හා කරුණාවෙන් දෙ මවුපියන් ගේ හිත් නො රිදවා වැරදි පෙන්වා දීම දරුවන් විසින් කළ යුතු ය.

''මහණෙනි, යම් කිසි කෙනෙක් ශ්‍රද්ධාව නැති දෙ මව්පියන් ශ්‍රද්ධා සම්පත්තියෙහි පිහිටුවත් ද එයම මව්පියන්ට කළ අධික තරමේ (ඉහළ මට්ටමේ) උපකාරයක් වන්නේ ය.''යි බුදුරජාණන් වහන්සේ විසින් ප්‍රකාශ කොට ඇත්තේත් මේ අදහසම යි.

වැඩිහිටි දෙ මව්පියන් කෙරෙහි දරුවන් පැවතිය යුතු ආකාර පහක් බුදුරජාණන් වහන්සේ විසින් සිඟාල සිටු පුත්‍රයාට පෙන්වා දෙන ලදී.

1. මව්පියන් පෝෂණය කිරීම.

2. මව්පියන්ගේ කටයුතු ඉටු කිරීම.

3. කුලවංශය රැකීම.

4. මාපියන්ගෙන් ලැබෙන දයාද ආරක්ෂා කිරීම.

5. මව්පියන් මළ කල්හි ඔවුන්ට පිං පෙත් පැමිණවීම.

දරුවන් විසින් දෙ මව්පියන් වෙත ඉටු කළ යුතු චාරිත්‍ර පහකි ඒ.

මව්පියන් පෝෂණය කිරීමේ වැදගත්කම බුදුරජාණන් වහන්සේ නොයෙක් විට ප්‍රකාශ කළහ. එය මංගල කාරණයක් බව (මාතා පිතු උපට්ඨානං - එතං මඞ්ගල මුත්තමං) මංගල සූත්‍රයේ දී වදාළහ. මව්පිය උපස්ථානයේ වැදගත්කම පෙන්වන ජාතක කථා රාශියකි. බුදුරජාණන් වහන්සේ බුද්ධත්වය ලැබීමෙන් පසු ද තම දෙ මව්පියන්ට සැලකීමට අමතක නො කළහ. තමන්ගේ මෑණියන්ව සිටි මහාමායා දෙව්පුතුට දහම් දෙසීමට බුදුරජාණන් වහන්සේ අමතක නො කළහ. සුද්ධෝදන රජතුමා රහත්වන තැනට කටයුතු සැළසූ බුදුරජාණන් වහන්සේ තමා කුඩා කාලයේ දී හදා වඩා ගත් සුළු මෑණියන් වූ මහා ප්‍රජාපතී ගෝතමියට ද රහත්වීම දක්වා උදව් කොට ඇය වෙනුවෙන් මෙහෙණි සස්න ද ආරම්භ කළ සේක.

කෑම්, බීම්, ඇඳුම්, පැළඳුම් සපයා තමන් හදා වඩා ගත් දෙ මව්-පියන් වයසට ගිය කල, ඒ ඇත්තන්ට ද කෑම බීම ඇඳුම් පැළඳුම් දී රැක බලා ගැනීම බෞද්ධ සිරිතයි.

දෙ මව්පියන් නහවා ඇඳුම් ආදිය පවිත්‍ර කර දීම බෞද්ධයෝ කැමැත්තෙන්ම ඉටු කරති. බුදුරජාණන් වහන්සේ විසින් භික්ෂූන් වහන්සේට පවා තමන්ගේ ගිහි දෙමව්පියන්ට උපස්ථාන කිරීම අනුදැන වදරා තිබේ.

''මව්පියන් කෙරෙහි, උපාධ්‍යායයන් කෙරෙහි මෙන් පිළිපැදිය යුතු ය. ඉදින් ඔවුහු රාජ්‍යයෙහි පිහිටියාහු නමුදු පුත්‍රයාගෙන් උපස්ථානය බලාපොරොත්තු වෙත් නම් උපස්ථාන කළ යුතු ම ය. ඔවුන්ට බෙහෙත් නොමැති නම් තමන්ට අයිති බෙහෙත ඔවුනට දිය යුතු ය. තමාට නැති නම් පිඩු සිඟීමෙන් හෝ සොයා ගෙන දිය යුතු ය. . . .''

වයසට ගිය මවත් පියාත් පෝෂණය නොකරන තැනැත්තේ වසලයෙක්ය'යි

(''යො මාතරංවා පිතරංවා – ජින්නකං ගත යොබ්බනං
පහුසන්තො න හරති – තං ජඤ්ඤා වසලො ඉති)

බුදුරජාණන් වහන්සේ වසල සූත්‍රයේ දී වදාළ සේක.

වයසක දෙ මව්පියෝ දරුවන් මගින් තම අවශ්‍යතා ඉටු කර ගැනීමට කැමති වෙති. ජීවිතයේ අවසාන කාලයේ දී පින් දහම් හි යෙදීමට කැමති වන දෙ මව්පියන්ට ඒ පහසුකම් සලසා දීම දරුවන්ගේ යුතුකම ය.

බටහිර සම්ප්‍රදාය අනුගමනය කරන සමහරු දෙ මව්පියන් අඩංග-සම්පූර්ණ සැප පහසුකම් ඇති වැඩිහිටි නිවාසයකට ඇතුළත් කර පෝෂ-ණය කිරීමට බලාපොරොත්තු වෙති. එහෙත් එයින් දෙමාපියන් හුදකලා අසරණ තත්ත්වයකට පත්වෙන බව ඔවුනට නො පෙනේ. පොඩි දරුවන්ට දෙමාපියන්ගේ ආදරය යම්සේ අවශ්‍ය වේ ද වයසක දෙ මව්පියන්ට දරුවන්ගේ ආදරය ද එලෙස ම අවශ්‍ය වෙයි. එබැවින් සිය නිවසේ දෙ මව්පියන් රඳවා ගෙන, ඔවුන්ට මෘදු මොළොක් වචන-යෙන් සලකා ඔවුන් පෝෂණය කිරීම පැරණි බෞද්ධයන්ගේ සිරිත විය.

ගුණ ධර්ම අගය කරන දරුමල්ලන් හඳ වඩා ගැනීමෙන් කුල වංශය දියුණු කිරීම ද දෙ මව්පියන්ට කරන සැලකිල්ලකි. දෙ මව්පියන් ගේ හෝ කුල පරම්පරාවේ තිබූ ශ්‍රේෂ්ඨ ගති ගුණ නොනසා ඉදිරියට පවත්වා ගෙන යාම ද බෞද්ධයන් ගේ සිරිත ය. එය දෙ මව්පියන්ට කරන ගෞරවයකි. ධර්මපාල ජාතකයෙහි එන ධර්මපාල පවුලෙහි ඇත්තෝ පරම්පරාවෙන් පරම්පරාවට ඔවුන්ගේ ආදි මුතුන් මිත්තන් රැක ගෙන ආ පස් පවින් වෙන්වීම ආදී ගුණධර්ම ඉදිරියට ම රැක ගෙන ආහ. මේ අයුරින් කුලවංශය රැකීම උසස් බෞද්ධ සිරිතකි.

මව් පියන්ගේ අඩුපාඩු තිබුණත් ඔවුන් පරිභවයට ලක්කිරීම බෞද්ධ යන්ගේ සිරිතක් නොවේ.

මව්පියන් මළ පසු පින් දහම් කොට මව්පියන්ට පිං පෙත් පැමිණ-වීම දරුවන්ගේ යුතුකමකි. මව්පියන්ගේ මරණයෙන් තුන් දිනක් ගත වූ තැන, සත් දිනක් ගත වූ තැන, තෙමසක් ගත වූ තැන, හා වර්ෂයක්

ගත වූ තැන ආදී වශයෙන් ද ඉන් පසුව වාර්ෂිකව ද දන්දීම් ආදී පින්දහම් කොට මවුපියන්ට පිං පැමිණවීම නොකඩවා ම පවත්වා ගෙන එන බෞද්ධ සිරිතකි.

## 3.4 ධනය ඉපැයීම හා රැකියාව සම්බන්ධ සිරිත් විරිත්.

අඹුදරුවන් රැකීමට ඇති ගිහියාට ධනය අවශ්‍ය ය. එසේම භික්ෂූන් වහන්සේට සිවුපසයෙන් සඬග්‍රහ කිරීම ද ගිහියා සතු යුතුකමකි. මේ සඳහා ද ඔහුට ධනය අවශ්‍ය ය. සිඟාලෝවාද සූත්‍රයේ දී ගිහියාගේ ධනයේ ස්වභාවය විස්තර කරන බුදුරජාණන් වහන්සේ ''මල නොතලා රොන් ගෙන යන්නා වූ බඹරකු මෙන් අනුන් නොපෙළා දැහැමින් රැස් කෙරෙන ධනය, වේයන් විසින් බඳිනු ලබන තුඹසක් මෙන් ක්‍රමයෙන් අභිවෘද්ධියට පැමිණේ. මෙසේ ධනය රැස් කර ගන්නා තැනැත්තා ගිහිගෙයි- වාසය කිරීමට සුදුසුය.'' යනුවෙන් වදාළහ. මේ නිසා පුරාණයේ සිට ම, අනුන් තලා පෙළා ධනය රැස් නොකිරීම බෞද්ධයාගේ සිරිත විය. බෞද්ධ පාලකයන් පවා අයබදු රැස් කෙළේ මෙ පරිද්දෙන් බව බුදු ගුණ අලංකාරයේ ලිච්ඡවී රාජ වර්ණනාවේ එන මේ කවෙන් පෙනෙයි.

''රොන් අරගෙන සෙමින්
යන බිඟු ලෙසින් කුසුමින්
ලොවට දුක් නො දෙමින්
ගනිති අය පඬුරු පෙර නියමින්''

ධාර්මික යයි සම්මත රැකියාවක යෙදීමෙන් දැතේ ශක්තියෙන් දහදිය හෙලීමෙන් උපයන ධනය ම ධාර්මික ධනයක් ලෙස බුදුරජාණන් වහන්සේ වදාළහ. මෙහි දී බෞද්ධයාගේ දැහැමි රැකියාව වූයේ කුමක් ද? බෞද්ධයා නිති පන්සිල් රකින්නෙකි. යම්කිසි රැකියාවක් හෝ ශිල්පයක් පංචශීල ප්‍රතිපත්තියට පටහැනි නොවේ නම් එය බෞද්ධයාට ධාර්මික රැකියාවකි. එබැවින් ප්‍රාණඝාතය, අදත්තාදානය, කාමමිථ්‍යාචාරය, මුසාවාදය හා මත්පැන් සහ මත්ද්‍රව්‍ය භාවිතය කිසියම් ආකාරයකින් සම්බන්ධවන රැකියාවක් තෝරා ගැනීම බෞද්ධයන් ගේ සිරිත නොවේ. පස් පවින් වැළකී ජීවත්වීමට නම් යම්කිසි ශිල්පයක් උගත යුතු ය. ශිල්පයක් දැනගැනීම මංගල කාරණයක් බව ද බුදුරජාණන් වහන්සේ මංගල සූත්‍රයේ දී වදාරා තිබේ.

බුද්ධකාලීන සමාජයේ තිබූ රැකියා අතරින්, කෘෂිකර්මය, පශු පාලනය, වෙළඳාම හා රාජ්‍ය සේවය ධාර්මික රැකියා වශයෙන් බුදුරජුන් විසින් පිළිගෙන තිබේ. අවුරුදු 2500ක් පමණ වූ දීර්ඝ ඉතිහාසය තුළ කෘෂිකර්මය සිංහල බෞද්ධයන්ගේ ප්‍රධාන රැකියාව වී ඇත්තේ බුදු දහමේ බලපෑම නිසා විය යුතු ය.

බුදුරජාණන් වහන්සේගේ නෑදෑයන් වූ ශාක්‍යයෝ ද අග්‍රගණ්‍යයේ ගොවියෝ වූහ. සුද්ධෝදන රජු සහ ඔහුගේ සහෝදරයන් වූ අමිතෝදන ධෝතෝදන, ශුක්ලෝදන ආදීන්ගේ නම් කෙළවර වන්නේ "ඕදන" යන්නෙනි. ඕදන යනු බත් ය. මේ පිරිස බත් ප්‍රධාන ආහාරය කොට-ගත් වී ගොවියන් වූ බව නිසැක ය. බුද්ධකාලයටත් පෙර සිට ම වී ගොවිතැන් කටයුතු උත්සවාකාරයෙන් පැවැත්වීම සිරිතක් ව තිබූ බව පෙනේ. සුදෙවුන් රජතුමා හා ඇමැතියන් නගුල් අතට ගෙන කුඹු-රට බැස සී සෑම කළ වප් මඟුල් දිනයක දී කුඩා සිදුහත් කුමරුන් රැගෙන රජගෙදර කිරි මව්වරුන් පවා එම උත්සවය නැරඹීමට ගිය බව බුද්ධ චරිතයේ සඳහන් ය.

ලක්දිව පැරණි රජදරුවන් හා පොහොසත් ගොවියන් වප් මඟුල් උත්සව පැවැත් වූ බව අපේ පොත පතෙහි සඳහන් ය. ලංකාවේ මූහෙළ නම් නුවරක පවත්වනු ලැබූ වප් මඟුල් උත්සවයක් සද්ධර්මා-ලංකාරයෙහි විස්තර වන්නේ මෙසේ ය.

"මහත් වූ වප් මඟුලෙක් විය. නො යෙක් සියගණනක් මනුෂ්‍යයෝ කර්මාන්තයේ නියුක්ත වූවාහු සර්වාංගයෙන් ධවල වූ සුදු ගොණුන් කසා නාවා කර බොලු ආභරණ පළඳවා, අංවල රන් රිදී කුප්පි බහා පය රන්රසු බැඳ සර්වාලංකාරයෙන් සරහා නගුල් වියදඬු ආදියෙහි යොද සියලු මනුෂ්‍යයෝ තම තමන්ගේ විභවානුරූප පරිද්දෙන් නොයෙක් කන බොන දෑ සපයා කමින් බොමින් සර්වාභරණයෙන් සැරහී සමහරෙක් සාති. සමහරෙක් වපුරති, ගෙවල ස්ත්‍රී ජනයෝ ද එපරිද්දෙන් ම වස්ත්‍රාභරණාලංකාරයෙන් ම සැරහී මහත් වූ උත්සව-යෙන් වපුරති."

මෙයින් වප් මඟුල ගැහැණු පිරිමි සිය ගණන් සහභාගී වූ විශාල උත්සවයක් බව පෙනේ. මිනිසුන් කමින් බොමින් මහත් සන්තෝෂ-යෙන් වැඩෙහි යෙදුණු උත්සවයකි. වප්මඟුල් පැවැත්වීම මෙ කල ද කෙරෙන සිරිතකි.

සිංහලයන්ගේ කෘෂිකාර්මික කටයුතු "අත්තම් ක්‍රමයට" කිරීම සිරිතකි. ගමේ සියලුම ගොවියන් එකතු වී එක් ගොවියකු ගේ වැඩ කොටස කරදීම අත්තම් ක්‍රමය යි. මෙසේ එක් එක් දිනයේ දී ගොවියෝ එක් එක්කෙනාගේ කුඹුරුවල වැඩ කරති. අන්‍යොන්‍ය සහයෝගයෙන් වැඩ කිරීම අත්තම් ක්‍රමය යි. කුඹුර අයිති ගොවියා තම කුඹුරෙහි වැඩ කරන ගොවියන්ට බතින් බුලතින් සංග්‍රහ කිරීම සිරිත ය. ගෙවිලියෝ මුත්තෙට්ටුව (ආහාර පාන) ගෙන කුඹුරට යෙති. කුඹුරේ දී කෙසෙල් කොළ එලූ අතුල්පත්වලට හෝ නෙලුම් කොළවලට මුත්තෙට්ටුව බෙද සංග්‍රහ කිරීම සිරිත ය.

කුඹුරුවල පැළ සිටවීම හෝ වල් නෙලීම කරනුයේ ද උත්සවාකාර යෙනි. උඩරට පෙදෙස්වල පැළ සිටවීම හා වල් නෙලීම කරන්නේ කාන්තාවන් විසින් අත්තම් ක්‍රමයට ය. එසේ ම උඩරට පෙදෙස්වල නෙලුම් කවි කියමින් පැළ සිටවීම විශේෂ චාරිත්‍රයකි. ''ඔසේ'' නමින් දිගට අදිමින් ගායනය කරනු ලබන නෙලුම් කවිවලින් දේශීය ගායන ක්‍රමයක් පිළිබිඹු වෙයි. නෙලුම් කවි වශයෙන් වැඩි වශයෙන් ම භාවිත කෙරෙන්නේ වෙස්සන්තර ජාතකයේ හා යසෝදරාවතෙහි එන පදයන් ය.

කුඹුරු ගොවිතැන පිළිබඳව විවිධ චාරිත්‍ර ඇත්තේ ය. ගොයම් පැළ මීයන්ගෙන් බේරා ගැනීමටත්, කුඹුරු කිරි වදින කාලයේ මැස්සන්-ගෙන් බේරාගැනීමටත් දේවාල්වල යාතිකා කරවනු ලැබූ පුවක්මල් ගෙනවුත් කුඹුරේ තැන් තැන්වල එල්වීම ගැමියන්ගේ සිරිත ය.

අස්වනු රැස් කරන කාලයේ දී සමහර පෙදෙස්වල ගොයම් කපන්-නේත් බෙර ගැසීම් ආදිය කොට උත්සව සහිතව ය. ගොයම් පාගන කමතේ විශේෂ සිරිත් ඇත්තේ ය. ගැමිබද ගොවියෝ ගොයම් පාගන කමත පූජනීය ස්ථානයක් ලෙස සලකති. ගොයම් කරල් කමතේ තැන්-පත් කිරීමට ප්‍රථම කමත මැද හක්ගෙඩියක් තැබීම සමහර පෙදෙස්වල කෙරෙන සිරිතකි. ගොයම් පෑගීම මැනක් වන තුරු ම කර-වනු ලැබුවේ මීහරකුන්ගෙනි. අසල්වැසි ගොවියෝ අත්තම් ක්‍රමයට කමතේ වැඩට සහාය වෙති. ගොවියා බතින් බුලතින් ඒ අයට සඞ්ග්‍රහ කරයි. කමතේ දී භාවිතය සඳහා විශේෂ භාෂා ව්‍යවහාරයක් ඇත. එය කමත් භාෂාව නමින් හැඳින් වේ. කමතේ දී එම භාෂාව භාවිතා කිරීම ගොවි-යන්ගේ සිරිත යි. බැත (වී), අම්බරුවෝ (මීහරක්) මැඩුවන් (ගොයම් ගස් හෝ පිදුරු.) ගොම්පස්ස (ගොම) සහ කොටා බානවා (කනවා) යනු කමත් භාෂාවෙන් වචන කීපයකි.

අස්වැන්න ගෙන ඊමේ විශේෂ උත්සවයක් මහනුවර යුගයේ දී පැවැත්විණ. එය හැඳින් වූයේ අලුත් සහල් මංගල්‍යය නමිනි. මේ උත්සවය සඳහා ජ්‍යොතිශ්ශාස්ත්‍රඥයන් විසින් නැකැත් දෙකක් බලන ලද්දේ ය. එකක් අලුත් සහල් ගෙට ගෙන ඒම සඳහා ය. අනෙක අලුත් සහල් වලින් බත පිසීම සඳහා ය. උත්සවය පැවැත්වුණේ ජනවාරි මාසයේ ය.

දළදා මාලිගාවටත්, දේවාලවලටත්, රජ මාලිගාවටත් විහාර ගම් වලින්, දේවාල ගම්වලින් හා ගබඩා ගම්වලින් ලැබිය යුතු වී මහනුවර මහමලුවට පළමුවෙන් ගෙනෙන ලදී. මේ වී ගෙනෙන විට අදිකාරම්වරු හා රදළවරු පෙර ගමන් කොට මහ මලුවේ දී මුණ ගැසෙති. වී කරල් මැටි කළවලින් ද, වී පිරිසිදු මලුවලින් ද ගෙනෙන ලද බව කියනු ලැබේ. දළදා මාලිගාවේ වී ඇතුළ පිටින් ද, දේවාල හා රජ මාලිගාවේ

වී මිනිසුන් විසින් කත්වලින් ද ගෙනෙන ලදී. නියමිත නැකැත් වේලාව ආ විට මහ මලුවෙන් වී යැවිය යුතු ස්ථානවලට යවන ලද්දේ ය. මෙයින් දින කිපයකට පසුව එන නැකැත් දිනයේ දී අලුත් සහල් බත පිස අනුභව කරන ලද්දේ ය. මේ ක්‍රමයට දිසාවල මිනිසුන් ද අස්වැන්න ගෙට ගෙන ආහ.

මුල් අස්වැන්නෙන් පළමුකොට බුද්ධ පූජාව පැවැත්වීමත්, මහා සංඝයාට දන් දීමත්, පුරාණයේ සිට ම බෞද්ධයන් ගේ සිරිතකි. එය සාහිත්‍ය පොත්වල සඳහන් වන්නේ අග්‍රශෂ්‍ය දනය හෙවත් අගහස් බත නමිනි. ගසක් පළමුවරට පල දරූ විට එයින් කොටසක් පන්සලට පූජා කිරීම ද බෞද්ධ සිරිතකි.

ගොවිතැන උසස් ම රැකියාව වශයෙන් බෞද්ධයන් පිළිගන්නා ලදී. නිශ්ශංකමල්ල රජතුමා ද මේ බව ප්‍රකාශ කරන ලදී. ගොවිතැනක් කළත්, නොකළත් රැකියාව කුමක් ද යි විමසූ විට ''ගොවිතැන'' යයි පිළිතුරු දීම සමහර සිංහලයන්ගෙ සිරිතකි.

වෙළඳාම ද බෞද්ධයන්ගේ රැකියාවකි. එය ධාර්මික රැකියා ගණයේ ඇතුළත් වුවත් එය වැරදි රැකියාවක් බවට පත්වීම පහසු ය. එබැවින් බුදුරජාණන් වහන්සේ විසින් වෙළඳාම පහක් බෞද්ධයනට අකැප බව පෙන්වා දුන් සේක. වස විෂ වර්ග වෙළඳාම, සත්ව ඝාතනයට හේතු වන අවි ආයුධ වෙළඳාම, මස් වෙළඳාම, මිනිසුන් ඇතුළු සත්ව වෙළඳාම හා මත් ද්‍රව්‍ය වෙළඳාම ඒ පහයි. මෙ හැරෙන්නට වැරදි මිනුම් එනම් හොර තරාදි, හොර පඩි, වැරදි මීටර කෝදු, හා ද්‍රව මනින වැරදි මිම්වලින් බෞද්ධයා වැළකිය යුතු ය.

පැරණි රජවරුන් ධාර්මිකව වෙළඳාම කිරීම සඳහා ව්‍යවස්ථා පනවා තිබූ බව 10 වන සියවසට අයත් බදුලු සෙල් ලිපියෙන් පෙනෙයි. පොහොය දින වෙළඳාම් කිරීම් ද තහනම් විය. මේ සිරිත කඩ කළ අයගෙන් පහන් පූජාවට තෙල් බද්දක් අය කරන ලදී. පොහොය දින අතීතයේ සිට ම බෞද්ධයනගේ නිවාඩු දිනය යි. සතර පොහොය ම ගොවිතැන් කටයුතුවල නොයෙදීම ද බෞද්ධ සිරිත යි.

වෙළඳ ව්‍යාපාරයක් ආරම්භ කරන විට නියමිත ස්ථානයේ සුළුවෙන් හෝ පිරිතක් කියවා දනයක් දීම බොහෝ බෞද්ධයන්ගේ සිරිතකි. සුබ මොහොතින් ආරම්භ කිරීමත් සිරිතකි. මූල් අලෙවිය කිරීම සඳහා සුදුස්සෙකුට ආරාධනය කිරීම තවත් සිරිතකි.

බොහෝ වාණිජ හා කර්මාන්ත ව්‍යාපාර කරන අය තම ව්‍යාපාරයේ දියුණුව පතා වාර්ෂික ව පිරිත් පිංකම් ආදිය කොට සංඝයා වහන්සේලා සඳහා දානමය පිංකම් පැවැත්වීම ද සිරිතක් වශයෙන් කර ගෙන යති.

කෘෂිකාර්මික වැඩවලට උදව්වක් වශයෙන් හා කිරි, දී, ගිතෙල් ආදිය සඳහාත් බෞද්ධයන් පෙර සිට ම සතුන් ඇති කිරීම ද කළ බව පෙනේ. මස් පිණිස සතුන් ඇති කිරීම බෞද්ධ සිරිත නොවේ. කෘෂිකාර්මික කටයුතු හා ගැල් ඇදීම සඳහා සතුන් ඇති කරන බෞද්ධ-යෝ එම සතුන්ට කරුණාවෙන් හා දයාවෙන් සලකති. සතුන් නාවා කවා පෙවීමට ඔවුහු අමතක නොකරති. කිරි එළදෙනක පැටව් ගැසූ විට පළමුවෙන් කිරි වේලක් පන්සලට පූජා කිරීම බෞද්ධයන්ගේ සිරිත යි. සමහරු මුලින් දෙවා ගන්නා කිරෙන් බෝධි මූලය නාවති.

## 3.5 බෞද්ධ අවමංගල සිරිත් විරිත්.

**මරණයට පෙර සිරිත්.**

ජීවිතයේ අවසාන කාලයේ දී වැඩි වශයෙන් පින් දහම් කිරීම බෞද්ධයන්ගේ සිරිතයි. ජීවිතයේ අවසන් කාලයේ සිටින්නවුන් මෙවන භික්ෂූන් වහන්සේලා නිතර නිතර ගෙන්වා අවවාද අනුශාසනා ආදිය කරවීමට ද බොහෝ බෞද්ධයෝ අමතක නොකරති. ජීවත්ව ඉන්දෙද්-දී ම දානමය පිංකම් කොට ඔවුන් ලවා අටපිරිකර පූජා කරවීම ද නිතර දක්නට ලැබෙන සිරිතකි. අටපිරිකර පූජාවෙන් මතු බුදු කෙනෙකුන් ඉදිරියේ එහි භික්ෂු ප්‍රව්‍රජ්‍යාවෙන් සසුන්ගත වීමේ පිනක් ලැබේය යනු බෞද්ධ විශ්වාසය යි.

**පිං පොත කියැවීම.**

පිං පොතක් පවත්වා ගෙන යාම පැරණි බෞද්ධයන්ගේ චාරිත්‍රයකි. එදිනෙද කරන පිංකම් මේ පොතේ සටහන් කරනු ලැබේ. විවේක අවස්ථාවල දි, අසනීප අවස්ථාවල දී තමාගේ පිං පොත කියැවීමෙන් පිං පොත හිමියාට සතුටක් ලබා ගැනීමට හැකි වේ.

කලින් කළ හොඳ වැඩ නැවත නැවත සිහිකර සතුටුවීමට ලැබීමත් එක්තරා කුසලයකි. මරණාසන්න මොහොතේ දී දුටුගැමුණු රජ්ජුරුවන්-ගේ පිං පොත ගෙන්වා රජු ඉදිරියේ කියවූ බව ප්‍රසිද්ධ කාරණයකි.

සාමාන්‍යයෙන් මරණාසන්න අවස්ථාවේ දී සිහිකල්පනාව තිබේ නම් පිං පොත කියැවීම ප්‍රයෝජනවත් ය. පිං පොත නොමැති වුවත් මරණාසන්න පුද්ගලයා ජීවත්ව සිටි කාලයේ දී කළ කුසල් දහම් මතක් කර දීම ඥානවන්ත බෞද්ධයන් විසින් සිරිතක් කර ගෙන ඇත.

**මළ ගෙදරක සාමාන්‍ය සිරිත්.**

කෙනෙකු මළ පසු මළ සිරුර උඩුකුරුව තබා දෙ අත් නාභිය මත තබා දෙපසට නො විහිදෙන සේ ලංකර මහපට ඇඟිලි එක්කර රෙදි-

පටියකින් බඳිනු ලැබේ. මුඛය හා ඇස් වැසෙන සේ සකසා පිළියෙල කොට පිරිමියෙකුගේ නම් රවුල කපා, සුදු ඇඳුමකින් සරසා, එසේ ම සැරසූ ඇඳක හිස බටහිර දෙසට හරවා තබනු ලැබේ. මළ මිනියට ඉහළින් සුදු වියනක් බැඳීම ද සිරිත ය.

මළ සිරුරේ හිස බටහිරට හරවන්නේ මක් නිසා දැයි හරිහැටි පැහැදිලි නැත. දවසේ ජීවිතය අවසන් වන්නේ හිරු අවරට යාමෙනි. මරණයත් මිනිස් දිවියේ අවසානය යි. බුදුරජාණන් වහන්සේ බුද්ධත්වය ලැබූයේ නැගෙනහිර බලා ගෙන ය. උන් වහන්සේ පිරිනිවන් පෑවේ උතුරට හිස ලා බටහිර දෙස බලා ගෙන බව බුද්ධ චරිතයේ සඳහන් ය.

බෞද්ධ මළ ගෙදරක ඉදිරිපිටත්, මළ ගෙදරට හැරෙන මංසන්ධි-යෙත් සුදු කොඩියක් දෙකක් එල්වීම සිරිත ය. මළ ගෙදරට එන අයට වාඩි වීමට තබන පුටුවලට සුදු ඇතිරිලි යෙදීම ද සිරිත ය. මළ ගෙදරට එන්නන්ට බුලතින්, දුම් වැටියෙන් හා සිසිල් බීමෙන් සංග්‍රහ කිරීම ද මෙකල සිරිත ය.

මෘත ශරීරය පිළිබඳ අවසන් කටයුතු අවසන් වන තෙක් ගිනි නො දැල්වීමත්, ආහාර නො පිසීමත් බෞද්ධ මළ ගෙදරවල පෙර සිට පැවත එන සිරිත ය. ඒ දින කීපය තුළ මළ ගෙදර වැස්සන්ට ආහාර පානයෙන් සංග්‍රහ කරන්නේ අසල් වැසියන් ය. මළ ගෙදර අය සමඟ තිබුණු පැරණි අමනාපකම් අත්හැර දමා, ඔවුන් දුකට පත් මේ වේලාවේ දී නැවත හිතවත් වීම ද බෞද්ධයන් අතර බොහෝ විට දක්නට ලැබෙන සිරිතකි.

අඟහරුවාද හා සිකුරාද දිනවල සිංහලයෝ අවමඟුල් උත්සව නො ගනිති. භූමදානය හා ආදාහනය යන දෙසිරිතම මෙකල කෙරේ. භූමදාන යට හෝ ආදාහනයට පෙර මළ මිනිය පෙට්ටියක තැන්පත් කිරීම මෙකල සිරිත ය.

එහෙත් පුරාණයේ දී රෙදි කඩක ඔතා මළ මිනිය දැවීමට හෝ වළ ලෑමට ගෙන ගිය බව පෙනේ. මළ කඳ නිකම්ම විසි කරනු ලැබූ තැන් අමු සොහොන නමින් හැඳින් විණ. සද්ධර්මරත්නාවලියෙහි මහා-කාල වස්තුවෙහි එන මිනියක් දැවීමේ විස්තරය අනුව දැවෙන මළ සිරුර එකල කාටත් දැක ගත හැකි විය.

"..... ගිනි දැල් වැද වැද ගත් තැන් කබර ඇති ගෙරි සරක්ගේ කබරලා තැන් සේ විය. පාත් ද නැමී එලෙන්ට වන. අතුත් ද වකැටී ගැසෙන්ට වන. නළල සමත් ද ගියේ ය. තෙරුන් වහන්සේ බල බලා වැඩ සිටි සේක්...." මේ සද්ධර්මරත්නාවලියේ එන ඉහත සඳහන් කථා වස්තුවෙන් උපුටා ගත් පාඨයකි.

භූමදානයක දී නම් වළ මත සිව් කොණෙහි කණු සිටුවා ගොක් කොළවලින් සැරසිල්ලක් කිරීමත් වළට උඩින් සුදු රෙද්දක් ඇදීමත් සිරිතකි.

ආදාහනයක දී නම් සෑය වටා සුදු රෙද්දක් ඇදීමත්, අවට සැරසිලි කිරීමත් සිරිත ය.

ලක්දිව භික්ෂූන් වහන්සේ කෙනකු අපවත් වූ විට දී පළමුවෙන් විහාර ඝණ්ඨාව නොකඩවා නාද කිරීමෙන් එය ගම්වැසියන්ට දැනුම් දෙනු ලැබේ. ගමේ පන්සලේ ඝණ්ඨාව එසේ නොකඩවා නාද කරවනු ලබන්නේ සාමාන්‍යයෙන් විපතක දී ය.

ගෝල පිරිස අපවත් වූ භික්ෂූන් වහන්සේගේ හිස් රැවුල් බා නාවා අලුත් සිවුරක් පොරවා, මලින් ගවසා මළ කඳ මනාව සැරසූ යහනක තබා ඉඩකඩ ඇති සරසන ලද ශාලාවක තබති. ශාලාවේ පොරි ඉස මළ සිරුර දෙපස ඇත් දත් ආදිය තබා ගෞරව සම්පන්න සැරසිලි කිරීම ද සිරිතකි. මළ සිරුරට දින කීපයකට සෑහෙන සේ බෙහෙත් ගැල්වීම ද කරනු ලැබේ. ආදාහනය තෙක් භික්ෂු දෙනමක් දිවා රෑ මාරුවෙන් මාරුවට එහි රැඳෙති.

දායකයන් විසින් සාකච්ඡා කොට අවසන් උත්සවයේ කටයුතු සංවිධානය කරනු ලැබේ. අපවත් වූ භික්ෂූන් වහන්සේ නැරඹීමට එන භික්ෂූන්ට ගිලන්පස හා දානය ආදිය සපයන්නේ දායකයන් විසින් ය. මළ සිරුර ආදාහනයට ගෙන යාමට කලින් ගෝල බාල භික්ෂූහු වැඳ සමාව ගනිති.

සොහොන් බිම දක්වා හේවිසි නාද සහිත පෙරහැරෙන් දේහය ගෙන යනු ලබන්නේ ගිහි දායක නෑදෑ හිත මිතුරන් විසිනි. මඟ දෙපස සැරසීම, සුදු වැලි හා පොරි ඉසීම, පාවාඩ එලීම ආදිය ද කෙරේ. භික්ෂූන් වහන්සේලා ද දේහය පිටිපස ශාන්තව ගමන් කරති. දරසෑය සහිත සොහොන් ගෙය අංලකාර ලෙස සරසනු ලැබේ. ආදාහන භූමියේ දී මතක වස්ත්‍ර පිදීම, පින්දීම හා ධර්ම දේශනා ඇතුළු ගුණ කථා පවත්වනු ලැබේ.

**පංසුකූල චාරිත්‍රය.**

බෞද්ධ ගිහියන්ගේ අවමඟුල් උත්සවවල දී සිරිත් පරිදි කෙරෙන ආගමික කටයුතු පංසුකූල චාරිත්‍රය නමින් හැඳින් වේ. සමහර පෙදෙස්-වල මේ පංසුකූල චාරිත්‍රය සොහොන් බිමේ දී කෙරෙන අතර තවත් සමහර පළාත්වල එය මළ තැනැත්තාගේ නිවසේ දී සිදු කෙරේ. පංසුකූලයට ගමේ පන්සලේ භික්ෂූන් වහන්සේට ආරාධනා කළ යුතු ය. උන් වහන්සේ අවශ්‍ය ගණනට අනෙක් භික්ෂූන් වහන්සේලාට ආරාධ-නය කරති. කෙනෙක් තුන් නිකායේ ම භික්ෂූන් වහන්සේලා මේ සඳහා වැඩමවා ගනිති.

අසුන් පනවා භික්ෂූන් වහන්සේලා පිළිගත් පසු මෘත කලේබරය රැගත් දෙණ භික්ෂූන් වහන්සේලා ඉදිරිපිට තබනු ලැබේ. ඉක්බිති භික්ෂූන් වහන්සේ නමක් විසින් පැමිණි සිටින නෑදෑ හිතවතුන් ඇතුළු පිරිස තිසරණ පන්සිල්හි පිහිටුවනු ලැබේ. ඉක්බිත් මියගිය තැනැත්තා වෙනුවෙන් මතක වස්ත්‍ර පූජා කෙරේ. මතක වස්ත්‍රයට සාමාන්‍යයෙන් පූජා කෙරෙන්නේ සුදු රෙදි යාර දහයකි. මතක වස්ත්‍රය භික්ෂූන් වහන්සේලා විසින් සිවුරු මසා ගැනීමට යොදා ගනු ලැබේ.

ඉක්බිති අනිත්‍ය, දුක්ඛ, අනාත්ම යන තිලකුණු මෙනෙහි කිරීම වස් සියලු ම භික්ෂූන් වහන්සේලා පහත සඳහන් ගාථාව සජ්ඣායනා කරනු ලැබේ.

''අනිච්චා වත සංඛාරා – උප්පාද වය ධම්මිනෝ
උප්පජ්ජිත්වා නිරුජ්ජන්ති – තෙසං වූප සමෝ සුඛෝ

දහම්සොඬ ජාතකයේ දැක්වෙන පරිදි ලොව දහම් නැතිව ගිය කාලයක දී දහම් පිපාසයෙන් දහම් සොයා වන ගත වූ දහම් සොඬ රජ්ජුරුවන්ට ශක්‍ර දේවේන්ද්‍රයා රාක්ෂස වෙසක් මවා ගෙන චිත් දේශනා කෙළේත් බුදු දහමේ පරම සත්‍යයක් ගැබ් වී ඇති මේ ගාථාවයි.

මෙයින් අනතුරු ව මිය ගිය තැනැත්තා ගේ ඥාතීහු මතක වස්ත්‍ර පූජාවෙන් හා අනිත්‍ය මෙනෙහි කිරීමෙන් ලද කුසලය මිය ගිය ඥාති වරයාට අනුමෝදන් කරවති. එය කරන්නේ බඳුනකට පැන් වත් කිරීමෙනි.

මේ අවස්ථාවේ දී භික්ෂූන් වහන්සේලා —.

''යථා වාරි වහා පූරා — පරි පූරෙන්ති සාගරං
ඒව මේව ඉතො දින්නං — පේතානං උපකප්පති.''

යන ගාථාව සජ්ඣායනා කරති.

''යම් සේ දියෙන් පිරී ගංගා ගලා ගොස් මහ මුහුද පුරවා ද, එසේ ම මෙහි දී පමුණුවන ලද පින් මිය ගිය ඥාතීනට ලැබේවා'' යනු මේ ගාථාවේ අදහස යි.

අනතුරුව භික්ෂූන් වහන්සේ නමක විසින් අනිත්‍ය සිහි කිරීම වස් මෙන් ම මළ තැනැත්තා ගේ ඥාතීන්ගේ ශෝකය තුනී කිරීම වස් ධර්ම දේශනයක් පවත්වනු ලැබේ. ත්‍රිවිධ නිකායේ ම භික්ෂූන් වහන්සේලා පෙනී සිටියහොත් සමහර විට තවත් භික්ෂූන් වහන්සේලා ධර්මානු ශාසනා පවත්වති. මෙයින් ආගමික කටයුතු අවසන් වේ. ඉක්බිති ගුණ කථන පැවැත්වීමට ගිහියන් බලාපොරොත්තු වෙතොත් එයට ඉඩ දෙනු ලැබේ.

මෘත දේහය නිවෙසින් ගෙන යාමට ප්‍රථම මළ ගිය තැනැත්තාගේ අඹු දරුවන් ඇතුළු ළඟ ම නෑයෝ මෘත දේහයට ආචාර කොට අවසර ගනිති.

ඉක්බිති සරසන ලද මාර්ගයෙන් ගරු බුහුමන් සහිතව පෙරහරින් දේහය සොහොන් බිමට ගෙන යනු ලැබේ. නෑදෑ හිතවතුන් සුදු වතින් සැරසී දේහය පිටුපසින් ගමන් කිරීම සිරිත ය.

ආදහනයක දී නම් දේහය රැගත් පිරිස චිතකය වටා තෙවරක් පැදකුණු කොට දේහය රැගත් පෙට්ටිය දර සෑයෙහි තබනු ලැබේ. වර්තමාන සිරිත එය වුවත් නිවැරදි සිරිත විය යුත්තේ දේහය තැන්පත් කළ පසු චිතකය තෙවරක් පැදකුණු කිරීම යි. සෑයට ගිනි දල්වනු ලබන්නේ මළ තැනැත්තා ගේ බෑණලා දෙදෙනෙකි. ඔවුන් එය කරන්නේත් පිටිපස්සට කරගත් ගිනි පන්දම් අතේ ඇතිව සෑය වටා තෙවරක් ගමන් කොට සොහොනට පිටුපස හරවා ගෙන ය.

භූමදානයක දී නම් මිනිය වළට බැස්ස වූ කෙනෙහි නෑ මිතුරන් විසින් වළට පස් පිඩ බැගින් දැමීම ද සිරිත ය.

සමහර විට ''පඨවි ආදී මහා භූතයන්ගෙන් සෑදුනු සිරුර නැවතත් ඒ තත්ත්වයට පත්වේ.'' යන බෞද්ධ අදහස එයින් සංකේතවත් කෙරේ යයි අදහස් කළ හැකි ය.

අවමඟුල් කටයුතු අවසන් වූ පසු නෑදෑයන් හා හිතවතුන් මළ තැනැත්තාගෙ ගෙදරට ගොස් ඔහුගෙ පවුලේ නෑයන්ගේ ශෝකය තුනී කිරීමට කථා බහ කිරීම ද සිරිත ය. ලංකාවේ සමහර පෙදෙස්වල අවමඟුල් කටයුතු අවසන් වූවායින් පසු රැස් වූ නෑදෑ හිතවතුන්ට එදිනම හවස පිළියෙල කරගත් ආහාර වේලක් සපයනු ලැබේ. මෙය ගොදානය නමින් හැඳින වෙ. සතියක් යන තුරු මළ ගෙදර ද රාත්‍රියට වෙස්සන්තර පාතකය ගායනය කිරීම ද මෙරට සමහර බෞද්ධ ගෙවල සිරිතකි.

අවමංගල උත්සවය අවසන් වූවායින් පසු වරින් වර ආගමික කටයුතු කොට මළ ගිය ඤාතීන්ට පිං පැමිණවීම සිංහල බෞද්ධයන්ගේ සිරිත ය. මරණය සිදු වී තෙදිනකට පසු, සත් දිනකට පසු, තෙමසකට පසු හා වර්ෂයකට පසු පිළිවෙළින් මහා සංඝයා විෂයයෙහි දානමය පිංකම් පවත්වා මළ ගය ඤාතියාට පිං පැමිණවීම බොහෝ බෞද්ධ නිවෙස්වල සිදු කරන අනිවාර්ය සිරිතක් ය. මෙම පිංකම්වලට නෑදෑ හිතවතුන්ට ආරාධනය කිරීම ද සිරිත ය.

**මතක බණ හා දන.**

මළවුන්ට පින්දීම සඳහා පවත්වනු ලබන ඉහත කී පිංකම්වල ධර්ම දේශනා මතක බණ නමින් ද, දන්දීම මතක දන නමින් ද හැඳින්

වේ. බෞද්ධයන්ගේ මතක පින්කම් හින්දූන්ගේ 'ශ්‍රාද්ධ' දනය සිහිපත් කරයි. සමහර අය මතක දන දෙන්නේ මළගිය නෑයන් ප්‍රේතයන් හෝ අමනුෂ්‍යයන් වී තමනට හිරිහැර කරති'යි යන බියෙනි. එහෙත් වැඩි දෙනෙක් මළවුන්ට පිං දෙනු පිණිස ම මේ පිංකම කරති. බෞද්ධ ඉගැන්වීම් අනුව පරදත්තුපජීවී, නිජ්ඣාමතන්හිත, ඛුප්පිපාසික, පාංශු පිශාචක, කාලකඤ්ජ අසුර යනුවෙන් ප්‍රේතයෝ පස් කොටසකි. එයින් අනුන් දෙන පිනකින් යැපෙන්නෝ පරදත්තුපජීවී නම් ප්‍රේතයෝ ය. සතියකින් දෙන දනයේ පින් අනුමෝදන්ව ඔවුන් ප්‍රේතාත්මයෙන් මිදෙනු ලැබෙන බව කියනු ලැබේ. මේ පිළිගැනීම නිසා බෞද්ධයෝ විශේෂ සැලකිල්ලකින් හත්වෙනි දින මතක පිංකම කරති. කොතරම් නැති බැරිකම් තිබුණත් මෙම පිංකම කෙසේ හෝ ඉටු කරන්නේ ද ඒ නිසා ය.

මෙම පින්කම සාමාන්‍යයෙන් ආරම්භ කරන්නේ මරණය සිදු වී දින හයක් ගතවන දින සන්ධ්‍යාවේ ය. භික්ෂූන් වහන්සේ නමක් නිවසට වැඩම කරවා පැයක් වත් ධර්ම දේශනාවක් එදින සන්ධ්‍යාවේ දී පවත්වා ගැනීම සාමාන්‍ය චාරිත්‍රයකි. ධර්ම දේශනාව අවසානයේ දී දහම් පඬුරු පිළිගන්වා මළ තැනැත්තාට පින් අනුමෝදන් කරවනු ලැබේ. පසු දින සංඝගත දක්ෂිණාවක් පැවැත්වීම මේ පිංකමෙ දෙවෙනි කොටස යි. මතක දන දුන් විට පින්දීම කරන්නේ පැන් වැඩීමෙනි.

"උන්නමෙ උදකං වට්ටං — යථා නින්නං පවත්තති
එව මෙව ඉතො දින්නං — පේතානං උපකප්පති"

යන ගාථාව පැන් වඩන විට භික්ෂූන් වහන්සේ සජ්ඣායනා කරති.

"උස් තැනෙහි වූ ජලය පතිතව පහත් තැන පවතී ද එසේම මෙයින් දෙන පින මළවුන් කරා එළඹෙයි" යනු මේ ගාථාවේ අදහස යි.

## වැඩිදුර කියවීම.

1. හිත්තටියේ ශ්‍රී විමලකීර්ති උදිත නායක ස්ථවිර,
   භාරතීය ධර්ම ශාස්ත්‍ර සහ සිංහල සිරිත් විරිත් (5 පරිච්ඡේදයේ සිට 13 වන පරිච්ඡේදය දක්වා.)

2. එම්. බී. ආරියපාල මයා.
   මධ්‍යම කාලීන ලංකා සමාජය (12 වන පරිච්ඡේදය හා 16 පරිච්ඡේදය.)

## 4. පාඩම

# ශාසනික කටයුතු හෙවත් පිංකම් පිළිබඳ සිරිත් විරිත්.

මේ පරිච්ඡේදයේ දී අපේ සැලකිල්ලට භාජන වන්නේ බෞද්ධයා විසින් ශාසනික කටයුතුවල දී හෙවත් පින් දහම් කටයුතුවල යෙදීමේ දී අනුගමනය කරනු ලබන චාරිත්‍ර වාරිත්‍ර යි. නිවන් අවබෝධය අවසාන පරමාර්ථය වශයෙන් තබා ගෙන, මෙලොව පරලොව ජීවිත වඩා සැපවත් කර ගැනීමේ ළඟ අරමුණක් ද ඇතිව ශ්‍රද්ධාවෙන් යුතුව යෙදෙන කටයුතු පින්කම් වශයෙන් සලකනු ලැබේ. නවත් අයුරකින් කියතොත් පුණ්‍යකර්මයක මූලික අරමුණ වන්නේ නිවන් අවබෝධයට මඟ සැලසෙන චිත්ත පාරිශුද්ධිය හා නික්ලේශී බව ක්‍රම ක්‍රමයෙන් ලබා ගැනීම යි. සිතේ පිරිසිදුකම හා නිකෙළෙස්බව ලබාගත හැක්කේ එම තත්ත්වයන්ට බාධක වූ ලෝභ, දෝස හා මෝහ යන බාධකයන් ඉවත් කිරීමෙනි. අකුසල් හා පව් වලට මූලික වන්නේ ලෝභ, දෝස හා මෝහයි. කුසල් හා පින්වලට මුල්වන්නේ අලෝභ, අදෝස හා අමෝහ යි.

ලෝභය යන්න සාමාන්‍ය ව්‍යවහාරයේ දී ලෝබකම හා තෘෂ්ණාව යන වචන වලින් ද හැඳින්වෙයි. ලෝබකමට හා තෘෂ්ණාවට විරුද්ධ යහපත් දෙය නම් පරිත්‍යාගශීලී භාවය යි. ලෝභය නැති කිරීමට හා පරිත්‍යාගශීලී භාවය වර්ධනය කිරීමට බලාපොරොත්තු වන බෞද්ධයා ප්‍රධාන වශයෙන් යෙදෙන පින්කම නම් දන් දීමයි. බොහෝ බෞද්ධයන් අතර ජනප්‍රිය පින්කම ද මෙය යි. සමාජය විසින් ධාර්මික නොවේ යයි පිළිගනු ලබන රැකියාවල යෙදෙන්නවුන් පවා වෙසක් පොහෝ දිනක අඩු තරමේ සිසිල් බීම දන්සැලක්වත් පැවැත්වීමට කරන උත්සාහ-යෙන් මේ බව පැහැදිලි වේ.

සාමාන්‍ය ව්‍යවහාරයේ දී ඉරිසියාව, වෛරය, ක්‍රෝධය යන වචන-වලින් හඳුන්වනු ලබන්නේ දෝසය යි. සිතේ මේ තත්ත්වය නැති කිරීම සඳහා වැඩි වශයෙන් බෞද්ධයන් යොදා ගන්නා පින්කම නම් ශීල සමාදනය යි. මෝහය යන්න මෝඩකම හා මුළාව යන වචනවලින් සාමාන්‍ය ව්‍යවහාරයේ දී හැඳින් වෙයි. මෝහය නැති කිරීමට මුල්වන පින්කම භාවනාව යි.

මෙසේ බෞද්ධයන් වැඩි වශයෙන් යෙදෙන ප්‍රධාන පිංකම් තුනක් නම් ත්‍රිවිධ පුණ්‍යක්‍රියා නමින් හැඳින්වෙන දානය, ශීලය හා භාවනාවයි. බෞද්ධයා මේ පින්කම්වල යෙදෙන්නේ ශ්‍රද්ධාව මුල් වූ ලෝභය, ඊර්ෂ්‍යාව වැනි පාප සිතුවිලි වලින් තොර වූ ප්‍රසන්න චිත්තයකිනි. හුදෙක් ශ්‍රද්ධාව වැඩි දියුණු කර ගැනීමේ අටියෙන් ම බෞද්ධයා බෝධි පූජා, වන්දනා ගමන් වැනි පින්කම් වලද යෙදෙයි. මෙහි දී අපගේ අවධාරණය යොමු වනුයේ දාන ශීලා දී පින්කම් ඇතුළු ශ්‍රද්ධාව දියුණු කර ගැනීමේ අටියෙන් බෞද්ධයන් නිරත වන පින්කම් කිපයක සිරිත් විරිත් කෙරෙහි ය.

## 4.1 සාංඝික දානය පිළිබඳ සිරිත්.

දානය යනු දීමයි. ආමිෂදාන, අභයදාන, ධර්මදාන, පත්තිදාන ආදී වශයෙන් දානය විවිධ යි. ආහාර පාන, ඇඳුම් පැළඳුම්, ගෙවල් දොරවල් ආදී ද්‍රව්‍යයන් වශයෙන් දෙනු ලබන ආමිෂ දානය වැඩි දෙනා සිත් ගත් ජනප්‍රිය දානය යි. මෙලොව පරලොව මහත්ඵල මහානිසංස ලැබෙන දානය නම් භික්ෂු සංඝයා විෂයයෙහි දෙනු ලබන සාංඝික දානය යි.

දාන වස්තුව භික්ෂූන් වහන්සේ වැඩ සිටින විහාරයට ගෙන ගොස් පැවරීමෙන් හෝ භික්ෂූන් වහන්සේ නිවසට වැඩමවා ගෙන පැවරීමෙන් හෝ සාංඝික දාන පින්කමක් කළ හැකි ය. තමන්ගේ නිවසට මහා සංඝයා වහන්සේ වැඩම කරවා දානයක් දීම මහත් ආශිර්වාදයක් ලෙස සලකනු ලබන බැවින් එසේ කිරීම වැඩියෙන් ම ක්‍රියාත්මක වන සිරිත යි.

සාංඝික දානයක් දීමට බලාපොරොත්තුවන දායකයා පළමුවෙන් ගමේ පන්සලේ හෝ දානයට කැඳවීමට බලාපොරොත්තු වන පන්සලේ භික්ෂූන් වහන්සේට දැහැත් වට්ටියක් පූජා කිරීම මගින්, සෑහෙන දින ගණනකට කලින් දානයට ආරාධනය කරයි. මෙහි දී දායකයා විසින් තමනට අවශ්‍ය භික්ෂූන් වහන්සේලාගේ ගණන ආරාධනය පිළිගන්නා භික්ෂූන් වහන්සේට දැන්විය යුතු ය. සාංඝික දානයක් පිළිගැන්වීම සඳහා අඩුම තරමින් උපසම්පදව ලද භික්ෂූන් වහන්සේලා හතර නමක්වත් සිටිය යුතු ය. ආරාධනය භාරගනු ලබන භික්ෂූන් වහන්සේ දායකයාට අවශ්‍ය භික්ෂූන් ගණන ස්වකීය පන්සලේ නොමැතිනම් අඩු ප්‍රමාණය පුරවා ගැනීමට වෙනත් පන්සල්වල භික්ෂූන් වහන්සේලාට තමන් වහන්සේ විසින් ම ආරාධනය කරන සේක.

දායකයා බොහෝ අවස්ථාවල දී මේ දානය දෙන්නේ භික්ෂූන් වහන්සේලාට පමණක් නොවේ. නියමිත දිනයේ දී දානමය පින්කමට සහභාගී වන ලෙස ඔහු සිය නෑයන්ට, හිතමිතුරන්ට හා අසල් වැසියන්ට ද ආරාධනය කරයි. මෙබඳු අවස්ථාවක් නෑදෑ හිතමිතුරන්ට සංග්‍රහ කිරීමට

යොදා ගැනීම ද බෞද්ධ සිරිතකි. මේ අනුව බලන විට මෙ බඳු සාංඝික දනයක් දීම සමාජ කටයුත්තකි.

දනයට ප්‍රථම ගෙදර දෙර විශේෂයෙන් පවිත්‍ර කොට අලංකාර කිරීම ද සිරිතකි. ගම්බද පෙදෙස්වල ගෙයි ඉදිරිපිට ආරක්කුවක් නමා අඩු තරමේ ගොක්කොළ සැරසිල්ලක්වත් කිරීම තවමත් පවතින සිරිතකි. ගෙදර ඇත්තෝ සැදැහැයෙන් දනයට අවශ්‍ය කැවිලි පෙවිලි ආදිය සූදනම් කරති. දනයට අවශ්‍ය ආහාර පාන ආදිය ද හඳුන්වන්නේ ගෞරවාන්විත වචන වලිනි. බත, දනය නමින් ද, මාලු පිනි, ව්‍යංජන නමින් ද, කැවිලි ආදිය අවුලුපත් නමින් ද, වතුර පැන් නමින් ද, හැඳින්වීම සාමාන්‍ය සිරිත ය. දනය සඳහා පිළියෙල කෙරෙන කෑම බීම ආදිය භික්ෂූන් වහන්සේලා වළඳන තුරු භාවිතයට නො ගැනීම බොහෝ බෞද්ධයන්ගේ සිරිත ය. පූජා කිරීමට ප්‍රථම ආහාර පාන ඉඳුල් නො කළ යුතුය'යි අදහන ගැමියන් ව්‍යංජන ආදිය පිළියෙල කරන්නේ ලුණු බැලීම් ආදියකින් ද තොරව ය. භික්ෂූන් වහන්සේලා වඩා හිඳුවන ස්ථානය උඩුවියන් බැඳ, බිම පැදුරු කොට්ට අතුරා ඒ මත පිරුවට එලා සකස් කිරීම ද සිරිතකි.

නියමිත දිනයේ පෙරවරුවේ කල්වේලා ඇතුව භික්ෂූන් වහන්සේලා විහාරයේ සිට වැඩමවා ගෙන එනු ලැබේ. ධාතු කරඬුවත් වැඩමවන්නේ නම් ගේඩිසි හොරණෑ සහිතව, පෙරහරින් ධාතු කරඬුව ප්‍රමුඛ භික්ෂූන් වහන්සේලා නිවසට වැඩම වීම නිතර දක්නට ලැබෙන සිරිත ය. ගෙතුළට වැඩම වීමට ප්‍රථම භික්ෂූන් වහන්සේලාගේ පය දෙවා, පියවිලි උඩින් උන් වහන්සේලා පනවන ලද අසුන් කරා වැඩම වීම ද සිරිත ය. ධාතූන් වහන්සේලා සහිත කරඬුව ඒ වෙනුවෙන් සරසා සකස් කළ උස් අසුනක තබනු ලැබේ. භික්ෂූන් වහන්සේලා පනවන ලද අසුන්වල සඟ මහලු පිළිවෙළට වැඩ හිඳිති. භික්ෂූන් වහන්සේලා ඉදිරියෙහි පැදුරු එළා ඒ මත සුදු රෙදි අතුරා පිරිකර සහිත දන වස්තුව තබනු ලැබේ.

දැන් දනය සාංඝික කොට පූජා කිරීමට සූදනම් ය. භික්ෂූන් වහන්සේ නමක් පළමුවෙන් රැස්ව සිටින පිරිස පංච ශීලයෙහි පිහිටුවයි. ඉක්බිති ධාතු කරඬුව වෙත බුද්ධ පූජාව පිළිගන්වනු ලැබේ. භික්ෂූන් වහන්සේ නමක් විසින් පිළිවෙළින්, පැන්, ආහාර, හා තාම්බුල (බුලත්) පූජා කිරීමේ පාලි ගාථා කියවනු ලැබේ. රැස්ව සිටින පිරිස ද භික්ෂූන් වහන්සේ අනුව පාලි ගාථා කියා බුද්ධ පූජාවේ යෙදෙති. බුද්ධ පූජාවෙන් අනතුරුව භික්ෂූන් වහන්සේ නමක විසින් සාංඝික දනයක් දීමේ අනුසස් පාදක කොට ගත් කෙටි අනුශාසනයක් කරනු ලැබේ. පිරිකර සහිත දන වස්තුව සාංඝික කොට පූජා කරන්නේ ඊළඟට ය. මේ සඳහා නැවත වරක් නමස්කාරය කියන ගිහි පිරිස භික්ෂූන් වහන්සේ විසින් කියවනු ලබන පහත සඳහන් පාලි පාඨය කියවති.

''ඉමං භික්ඛං සසූපභ්‍යඤ්ජනං සපරික්ඛාරං බුද්ධ පමුඛස්ස භික්ඛු සංඝස්ස දෙම''

(පිරිකර සහිත වූද, සූපව්‍යඤ්ජන සහිත වූ ද මෙම භික්ෂාව බුදුරජාණන් වහන්සේ ප්‍රමුඛ භික්ෂු සංඝයා වහන්සේට පූජා කරමු.)

මෙම වැකිය තෙවරක් කියවනු ලැබේ. ධාතු කරඬුව වැඩමවා නොතිබුණේ නම් ''බුද්ධපමුඛස්ස'' යන වචන ඉවත් කරනු ලැබේ. සාංඝික දානයේ දී භික්ෂු සංඝයා වශයෙන් සලකනු ලබන්නේ අතීතයේ වැඩ සිටි සැරියුත් මුගලන් පරම්පරාවෙන් පැමිණි සියලුම සංඝයා වහන්සේත්, වර්තමානයේ වැඩ සිටින සියලුම සංඝයා වහන්සේත්, අනාගතයේ දී පහළ වන්නා වූ සියලු ම සංඝයා වහන්සේලාත් ය. ඉක්බිති පැමිණ සිටින සියලුම භික්ෂූන් වහන්සේ ප්‍රාර්ථනා ඉටුවීම පිළිබඳ ආශීර්වාදත්මක පහත සඳහන් ගාථා සජ්ඣායනය කරති.

1. ''ඉච්ඡිතං පච්ඡිතං තුය්හං – ඛිප්පමේව සමිජ්ඣතු
   සබ්බේපූරන්තු චිත්ත සංකප්පා – මණි ජොති රසොයථා

2. ඉච්ඡිතං පච්ඡිතං තුය්හං – ඛිප්පමේව සමිජ්ඣතු
   සබ්බෙපූරන්තු, චිත්ත සංකප්පා – චන්දෙ පණ්ණ රසොයථා

(1) තොප විසින් සිතන පතන ලද සියල්ල වහා සපිරේවා; ජෝති රස මැණිකකින් මෙන් සියලු සිත් සපිරේවා!

(2) තොප විසින් සිතන පතන ලද සියල්ල වහා සපිරේවා! පසලොස්වක දින චන්ද්‍රයා මෙන් සියලු සිත් සපිරේවා! යනු ඒ ගාථාවල අදහස යි.

මේ ගාථා සජ්ඣායනයෙන් පසුව එක් භික්ෂූන් වහන්සේ නමක් සාම්ප්‍රදයික පින් අනුමෝදන් වීමක් කරයි. පින් අනුමෝදන් නොකර වැළඳීම භික්ෂූන් වහන්සේගේ සිරිත නොවේ.

ඉක්බිති භික්ෂූන් වහන්සේලා ආහාර පානවලින් සතපවනු ලැබේ. දනය වැළඳුවාට පසු එක් එක් භික්ෂූන් වහන්සේට පිරිකර වෙන් වෙන් වශයෙන් පූජා කරනු ලැබේ. ඊළඟට පැමිණෙන්නේ භුක්තානුමෝදනාව නමැති අවස්ථාව යි. භික්ෂූන් වහන්සේ නමක විසින් එම අවස්ථාවේ කරන ලද පුණ්‍ය කර්මයෙහි සතුටුවන ලෙස දයකයන් පොළඹවමින් දනානිශංස වර්ණනා කරමින් කරන අවවාදනුශාසනාව භුක්තානුමෝදනාවයි.

අනතුරුව දනමය පුණ්‍ය ක්‍රියාවෙන් ලබාගත් පින් දෙවියන්ටත්, භූතයින්ටත් සියලු සත්ත්වයින්ටත්, මිය පරලොව ගිය ඤාතීන්ටත් පැමිණ වීමෙන් පුණ්‍ය කර්මය අවසන් කරනු ලැබේ.

අවසාන වශයෙන් භික්ෂූන් වහන්සේලාට වැඳ නමස්කාර කරන දායකයින්ට උන් වහන්සේලා

"අභිවාදන සීලිස්ස – නිච්චං වඩ්ඩාපචායිනො
චත්තාරෝ ධම්මා වඩ්ඪන්ති – ආයු වණ්ණො සුඛං බලං"

යන ගාථාව සජ්ඣායනයෙන් ආයුෂ, වර්ණ, සැප බල වැඩේවා යි ප්‍රාර්ථනා කරති.

## 4.2 ධර්මදානය-දහම් දෙසීම හා ධර්ම ශ්‍රවණය පිළිබඳ සිරිත් විරිත්.

"සබ්බදානං ධම්මදානං ජිනාති" යනුවෙන් සියලු ම දානයන්ට වඩා ධර්ම දානය උසස් කොට සලකනු ලැබේ. තමන්ට ආමිස දානයෙන් සඞ්ග්‍රහ කරනු ලබන ගිහියාට ප්‍රත්‍යුපකාර වශයෙන් මේ ශ්‍රේෂ්ඨ වූ ධර්මදානයෙන් සඞ්ග්‍රහ කිරීමට භික්ෂූන් වහන්සේට නිතැතින් ම ඉඩ ලැබේ. පුරාණයේ සිට ම ධර්මදානය සඳහා යොදා ගත්තා ප්‍රධාන ක්‍රම තුනකි. එනම් ධර්මය දේශනා කිරීම, දහම් පොත් කියැවීම හා දහම් පොත පත ලිවීම යනු යි. මෙයිනුත් අති පුරාණ වනුයේ ධර්මය දේශනා කිරීමයි. ලේඛන ශිල්පය ප්‍රචලිත වූවාට පසු දහම් පොත පත ලිවීමත්, පිරිසක් ඉදිරියේ ඒ දහම් පොත පත කියවීමත් ආරම්භ විය.

විවිධ අරමුණු සඳහා ධර්ම දේශනා පැවැත්වීම පුරාණයේ සිට පැවත එන චාරිත්‍රයකි. මඟුල් බණ, අවමඟුල් බණ, කඨින බණ ආදී වශයෙන් ඒ ඒ අවස්ථා අනුව ධර්ම දේශනා හැඳින් වෙයි. මේවා පොදුවේ බණ පිංකම් නමින් ද ව්‍යවහාරයට වීත් ඇත්තේ බණ කීමත්, බණ ඇසීමත් පිං රැස්කර ගැනීමේ මාධ්‍යයක් වශයෙන් සැලකෙන බැවිනි. ධර්ම සාකච්ඡාවත් ධර්ම ශ්‍රවණයත් මංගල කරුණු වශයෙන් ද මහා මංගල සූත්‍රයේ සඳහන් වෙයි.

ධර්ම දේශනා හෙවත් බණ කීම උසස් කොට සලකනු ලබන්නේ හුදෙක් එය පිංකමක් නිසා ම නො වේ. ධර්ම දේශනය බෞද්ධයන්ගේ සන්නිවේදන ක්‍රමයකි. එසේ ම එය බෞද්ධයන්ගේ අධ්‍යාපන ක්‍රමය ද වෙයි. ධර්ම දේශනය, විශේෂයෙන් බෞද්ධයන්ගේ වැඩිහිටි අධ්‍යාපන ක්‍රමය මෙන් ම යාවජීව අධ්‍යාපන ක්‍රමය ද වෙයි. බෞද්ධ-යාට ඔහුගේ සාමාජික ජීවිතයේ දී මතුවෙන ආර්ථික, සාමාජික හා දේශ පාලන ගැටළුවලට මෙන් ම ආධ්‍යාත්මික ගැටළුවලට ද මුහුණ පෑමට අවශ්‍ය මඟ පෙන්වීම හා උපදෙස් ලැබෙන්නේ ධර්ම දේශනාව තුළිනි. වෙනත් විධියකින් කියතොත් ධර්ම දේශනාව අර්ථයෙන් ධර්මයෙන් අනුශාසනා කිරීමකි. ධර්ම දේශනාව ලෞකික අරමුණුවලට පමණක්

සීමාවන්තක් ද නො වේ. එහි අවසාන අරමුණ වන්නේ පුද්ගලයාට විමුක්තිය ලබාදීම වස් තුන්දෙර හැසිරවීමේ සිතුවිලි ක්‍රමයක් ලබා දීමයි.

පුරාණයේ දී බණ කීම මගින් ධර්මදානය දීමේ වරප්‍රසාදය වැඩිපුර ම ලැබුණේ භික්ෂූන් වහන්සේට යි. ධර්මදානය ආමිස දානයට වඩා ශ්‍රේෂ්ඨය යන බස ඇසූ දුටුගැමුණු රජතුමා ලෝවා මහා ප්‍රාසාදයේ දී මහා සඞ්ඝයා මැද මහා මඞ්ගල සූත්‍රය දේශනා කරන්නට සූදානම් වූ බව කියනු ලැබේ. එහෙත් සංඝයා කෙරෙහි රජතුමා ගේ ගෞරවය නිසා මේ උත්සාහය ව්‍යර්ථ වී ඇත. රජතුමා මේ ධර්ම දේශනාව කරන්නට අදහස් කරන්නට ඇත්තේ ධර්ම දේශනා කිරීමේ හැකියාව තමාට තිබෙන බැවින් ධර්මදානයක් දී පින් ලබා ගැනීමේ ආශාව තිබුණ නිසා විය යුතු ය. මේ උත්සාහය හරි නොගිය නිසා ධර්ම දේශකයන් වහන්සේලාට සත්කාර සංග්‍රහ කිරීමෙන් උන් වහන්සේලා ලවා රටපුරා ම ධර්ම දේශනා පැවැත්වීමට රජතුමා විසින් කටයුතු සංවිධානය කරන ලදී. පස්වැනි අග්බෝ රජතුමා ද රටවැසියාට ලොව්තුරා සැප ලබා දෙනු පිණිස තමා ම දහම් දෙසූ බව මහාවංශය කියයි.

**දහම් දෙසීම පිළිබඳ සිරිත්.**

ධර්මයට දක්වනු ලබන ගෞරවය අනිවාර්යයෙන් ම ධර්ම දේශකයන් වහන්සේට ලැබේ. මේ නිසා ශ්‍රාවකයන් වාඩිවී සිටිනවාට වඩා උස් අසුනක දේශකයන් වහන්සේ වාඩිවීම සිරිත ය. විශේෂයෙන් සකස් කළ ධර්මාසන පැරණි විහාරයන්හි තිබූ බව පෙනේ. නිවසක ධර්ම දේශනයකට භික්ෂූන් වහන්සේ කැඳ වූ විට සුදු වියනක් යට සුදු ඇතිරිලි අතුරන ලද ධර්මාසනයක් පැනවීම සාමාන්‍ය සිරිත ය. දහම් අසන්නන් සාමාන්‍යයෙන් වාඩිවෙන්නේ බිම අතුරන ලද පැදුරුවල ය.

ධර්මය දේශනා කරන භික්ෂූන් වහන්සේගේ හා බණ අසන්නන්ගේ ඉරියව්ව කෙබඳු විය යුතු ද යන්න පහත සඳහන්, සාමණේරයන් වහන්සේලා පුරුදු පුහුණු කළ යුතු සෙඛිය සික පද වලින් පැහැදිලි වෙයි.

''අසුනෙහි වාඩිවී සිටින්නාට බිම හිඳ දහම් නො දෙසමි. උස් අසුනක සිටින්නාට පහත් අසුනක හිඳ දහම් නො දෙසමි.

වාඩි වී සිටින්නාට හිට ගෙන දහම් නො දෙසමි.

එසේ ම මිරිවැඩි පයලා සිටි අයට, පාවහන් පය ලා සිටි අයට, රියක නැගී සිටින අයට යහනේ වැතිර සිටින අයට, හිස වසා සිටි අයට දහම් නො දෙසමි.

පසුපස යමින් සිට දහම් නොදෙසමි.''

ධර්මයට ගරු කිරීමක් වශයෙන් තමන් වාඩි විය යුතු අසුන හෝ සිටිය යුතු ඉරියව්ව ගැන දේශකයා සැලකිලිමත් විය යුතු වේ.

සත් හැවිරිදි නිග්‍රොධ සාමණේරයන් වහන්සේ අශෝක රජුට ධර්ම දේශනා කෙළේ රජුගේ සිංහාසනයේ වැඩ හිඳ ගෙන ය. සිංහාසනයට වඩා උසස් අසුනක් රජමාළිගයේ නොමැත.

ධර්ම දේශකයාණන් වහන්සේ විසින් ධර්ම දේශනා අවස්ථාවේ දී වටා පතක් දැරීම ද පුරාණයේ සිට ම එන චාරිත්‍රයකි.

**ධර්මදේශනයක් පැවැත්වීමේ චාරිත්‍රානුගත පිළිවෙළ.**

ධර්මාසනයෙහි වැඩ හිඳ ගත් දේශකයාණන් වහන්සේ ධර්මශ්‍රවණයට පැමිණ වාඩි ගෙන සිටින සියලු දෙනාට ම හඬ නගා සාධුකාරයක් දෙන ලෙස දැනුම් දෙයි. ඉක්බිති සාධුකාරයෙන් නිහඬ වූ ගිහියන් සියලු දෙනා ම තිසරණ ගත පංචශීලයෙහි පිහිටුවනු ලැබේ. ඉක්බිති දේශක යාණන් වහන්සේ සගමොක් සැප දෙන, ලොව්තුරා බුදුරජාණන් වහන්සේගේ ශ්‍රී සද්ධර්මය අසනු පිණිස සියලු සක්වල දෙවියන් කැඳවීම් වස් පහත සඳහන් දේවාරාධනයෙහි යෙදෙති.

සමන්තා චක්කවාලෙසු – අත්‍රාගච්ඡන්තු දෙවතා
සද්ධම්මං මුණිරාජස්ස – සුණන්තු සග්ග මොක්ඛදං

ඉක්බිති ප්‍රකාශ කරන්නේ පහත සඳහන් කාල ඝෝෂණය යි.

ධම්මස්සවණ කාලො අයං භදන්තා !

ධම්මස්සවණ කාලො අයං භදන්තා !!

ධම්මස්සවණ කාලො අයං භදන්තා !!!

මෙය අවසානයේ ශ්‍රාවක පිරිස සාධුකාර දෙති. ඉක්බිති නමස්කාර පාඨය තෙවරක් කියන දේශකයන් වහන්සේ ධර්මයේ මාතෘකා පාඨය ඉදිරිපත් කරන සේක. මෙම මාතෘකා පාඨය දේශනාවේ අරමුණට අදාළ වන ත්‍රිපිටකාගත පාලි ගාථාවක් හෝ පාලි ගද්‍ය පාඨයක් විය හැකි ය.

දේශනා පාඨය ඉදිරිපත් කිරීමෙන් පසුව එන්නේ ධර්ම ශ්‍රවණය සඳහා පැමිණි පිරිස මානසික වශයෙන් ඒ කාරිය සඳහා සූදානම් කිරීමේ අටියෙන් ඉදිරිපත් කෙරෙන පසුබිම් කථාවකි.

මෙහි දී ධර්ම දේශනාව පැවැත්වීමේ අරමුණත්, ප්‍රතිඵල ලබා ගැනීම් වස් සැදැහැවතුන් ධර්මය ශ්‍රවණය කළ යුතු අන්දමත් විස්තර කර

දෙනු ලැබේ. ධර්මදේශනා මාතෘකා පාඨයට පැමිණෙන්නේ ඊළඟට ය. මාතෘකා පාලි පාඨය නැවත වරක් ඉදිරිපත් කර එහි සාමාන්‍ය අදහස කියා දීම සාමාන්‍ය පිළිවෙළ යි. ඉන්බිති මාතෘකා පාලි පාඨයට පසුබිම් වූ නිධාන කථා ආදියත් ඇතොත් එය රසවත් ව ඉදිරිපත් කරනු ලැබේ. මෙයින් පසුව පාලි පාඨයේ අඩංගු ධර්මයන් පිළිබඳ විස්තර කථනයක් කරමින් එම ධර්ම කරුණු ජීවිතයට සම්බන්ධ කර ගන්නා ආකාරය පහදා දෙනු ලැබේ. කාරණයට අදාළ ව උදාහරණ වශයෙන් රසවත් කථාන්තර ද අතරින් පතර ඉදිරිපත් කිරීමට දේශකයාණෝ අමතක නො කරති. අන්තිමේ දී දේශනාවේ සියල්ල කැටි කොට මාතෘකා පාඨය කුළු ගන්වනු ලැබේ. මාතෘකාව හා සම්බන්ධ දේශනය අවසන් වූ විට දේශනාවේ අරමුණු හා සම්බන්ධ පුද්ගලයන්ට ද, පුණ්‍ය කර්මය සංවිධානය කළ අයට ද, ධර්ම ශ්‍රවණය කළ අය හා ඒ සියලු දෙනාගේ ම මළ ගිය නෑයින්ට ද, දෙවියන්ට ද පින් අනුමෝදන් කරවනු ලැබේ. මේ ධර්ම දේශනාවක චාරිත්‍රානුකූල අනුපිළිවෙළ යි.

**ධර්ම ශ්‍රවණය.**

ධර්ම දානය නැමති පින්කම සිදු වෙද්දී ඒ සමඟ ම අනිවාර්යයෙන් ම සිදුවන අනෙක් පින්කම නම් ධර්ම ශ්‍රවණය යි. ධර්ම දේශකයාට ධර්ම දානයේ පින ලැබෙද්දී ධර්ම ශ්‍රවණය කරන්නන්ට බණ ඇසීමේ පින ලැබේ යි. ලක්දිව බුදු සසුන ඇරඹුන ද පටන් ගිහි පැවිදි දෙපක්ෂය ම අඛණ්ඩව ම සහභාගී වෙන පින්කම් දෙකක් නම් ධර්ම දේශනය හා ධර්ම ශ්‍රවණය යි.

ධර්ම ශ්‍රවණය ඉගෙනීමේ ප්‍රධාන මාධ්‍යයක් වූයෙන් බුදු දහම ලක්දිව පැතිරී වැඩිකල් යන්නට ප්‍රථම එය බෞද්ධයන්ගේ ජීවිතයේ ප්‍රධාන අඞ්ගයක් වූ බව පෙනෙන්නට තිබේ. පස්වෙනි සියවසේ දී ලක්දිව මේ සිරිත කොයිතරම් ව්‍යාප්තව තිබුණේ ද යි යන්න පාහියන් ගේ පහත සඳහන් විස්තරයෙන් පැහැදිලි වේ.

"ප්‍රධාන වීථි සතරේ මුදුනෙහි ධර්මශාලා ඉදිකොට ඇත. මාසයේ අටවැනිද ත්, දස සතරවැනි දත්, පසලොස්වැනි දත් ඔවුහු මේ ශාලාවල පලස් අතුරා බණ අසුනක් පනවති. භික්ෂූහු ද ගිහි ජනයා ද බණ ඇසීමට සිව දිගින් එති."

භික්ෂූන් වහන්සේ නමක් ධර්ම දේශනා කරණ විට ධර්ම ශ්‍රවණය සඳහා සිවුවනක් පිරිස ම සහභාගී වූ බව ද මෙහි දී විශේෂයෙන් සිහිකට යුතු ය. බුදුරජාණන් වහන්සේ පවා ස්වකීය ශ්‍රාවකයන්ගේ ධර්මය හිට්වන ම සිට පහන්වන තුරු අසා ආදර්ශයක් ඉදිරිපත් කොට ඇති බැවින් ධර්මධර මහ තෙරුන් වහන්සේලා පවා ධර්මය ඇසීම සිරිතක්

කොට ගත්හ. පෙර කාන්තාවක් කියූ කවි බණක් ඇසූ භික්ෂූන් වහන්සේලා හැට නමක් රහත් වූ වග පහත සඳහන් ලෝවැඩ සඟරා කවියෙන් ප්‍රකාශ වෙයි.

"දහමට සරි කොට එළවෙන් පෙරකී
කවියට සිත පහද සිටැ නිසැකී
සිහිකොට කඳ පිළිවෙළ දෙස් නොයෙකී
නිවනට සපැමිණි සඟ සැට නමකී"

පැරණි රජ දරුවෝ ද ධර්ම ශ්‍රවණයට බෙහෙවින් කැමැත්ත දැක්වූහ. වරක් සද්ධාතිස්ස රජතුමා මිහින්තලේ සෑගිරියේ අටසිල් සමාදන් ව මිහින්තලේ කළුදිය පොකුණ අසල, කළු තිඹිරිගස යට සිට ගෙන, කාල බුද්ධරක්ඛිත ස්ථවිරයන්ගේ කාලකාරාම සූත්‍ර ධර්ම දේශනාවට මුළු රැය ම ඇහුම්කන් දෙමින් සිටි බව කියනු ලැබේ. දෙවන දළෝපතිස්ස (650 - 658) රජතුමා පොහෝ දිනවල සිල් සමාදන් ව බණ අසන්නට පුරුදු වී සිටි බව මහාවංශයේ සඳහන් ය.

ගිහියන්ට දේශනා කරන ධර්මය වැඩි වශයෙන් අරමුණු කර ගෙන ඇත්තේ මෝක්ෂ මාර්ගය නොව ස්වර්ග මාර්ගය යයි කියනු ලැබේ. ධර්මය "නම නම නැණ පමණින් දැනගත යුතු" වූ බැවින් ගිහි සැපයෙහි ඇලී ගැලී වෙසෙන ගිහියාට ගැඹුරු දහම් අවබෝධ කර ගැනීම දුෂ්කරය යනු සාමාන්‍ය හැඟීම විය.

පුරාණයේ දී ජනප්‍රිය ව තුබූ දහම් මාතෘකා කීපයක් නම් දක්ඛිණා විභඞ්ග සූත්‍රය, වෙස්සන්තර ජාතකය, දේවදූත සූත්‍රය හා පරාර්ථචරියාවට තුඩු දෙන ගිලාන සූත්‍රය හා කපි ජාතකය ආදිය යි. දක්ඛිණා විභඞ්ග සූත්‍රයෙන් විස්තර වන්නේ බුදුරජාණන් වහන්සේගේ පටන් තිරිසන් සතුන් දක්වා දිය හැකි විවිධ මට්ටමේ දන 14කි. මෙයින් තමන්ගේ පුළුවන් කමේ අන්දමට දිය හැකි දානයක් තෝරා ගැනීමට ගිහියාට හැකි වෙයි. වෙස්සන්තර ජාතකය මානුෂික හැඟීම් ප්‍රබෝධ කරන දුෂ්කර මට්ටමේ ආමිස දන ගැන කිය යි. දේවදූත සූත්‍රය පවකාරයින්-හට අපායේ විඳින්නට සිදුවන වද බන්ධන ඇස් ඉදිරියේ මවා පායි. එය මෙලොව වැරදි වැඩ කරන්නවුන් බිය ගැන්වීම අරමුණු කර සකස් වූවකි. මෙකල ද අතරින් පතර දේවදූත සූත්‍රය මාතෘකා කොට ගෙන බණ කියනු අසන්නට ලැබේ. ගැඹුරු වුවත් සතිපට්ඨාන සූත්‍ර ධර්ම දේශනාව ද පුරාණයේ සිට ජනප්‍රිය වූවකි. මේ සූත්‍ර දේශනාවේ ශබ්දය ඇසූ කිරි වවුලන් 500ක් සුගතියට පැමිණි බව කියන කථාව සාමාන්‍ය ජනයා විශ්වාස කළෝ ය. ධර්මය ඇසීම ම පිණක් බව අදහන ගමබද උපාසක උපාසිකාවෝ තේරුම් ගැනීමට දුෂ්කර වුවත් අදත් සතිපට්ඨාන දේශනාව ඇසීමට කැමැත්ත පළ කරති.



4. ර.මු.නි.ස. 090669

අනුරාධපුර යුගයේ දී ඉතා ජනප්‍රිය දේශනාවක් නම් අරියවංශ සූත්‍ර දේශනාව යි. මේ දේශනාව උත්සවයක් හා සම්බන්ධ වූවකි. මේ දේශනාව කොතරම් උසස් කොට සලකන ලද්දේ ද යත් ඒ දේශනාව හා සම්බන්ධ පුද සිරිත් පැවැත්වීමට රජදරුවන් ගම්බිම් පවා පූජා කොට දන්වැට පැවැත් වූ බව ශිලා ලේඛනවල සඳහන් වෙයි. ක්‍රි.ව. 4 සියවසට අයත් තෝනිගල සෙල් ලිපිය ද එවැන්නකි.

වෝහාරතිස්ස රජ (269 - 191) අරියවංශ දේශනා කළ හැම තැනක ම දන්වැට පිහිට වූ බව මහාවංශයේ සඳහන් ය. අරියවංශ දේශනාව ශ්‍රවණය කිරීමට භික්ෂූන් වහන්සේලාත් ගිහියෝත් බොහෝ දුර බැහැර ප්‍රදේශවලට ගිය බව පෙනේ. දීඝභාණක මහා අභය ස්ථවිරයන් පැවැත් වූ අරියවංශ දේශනාවක් අසන්නට එක්තරා ස්ත්‍රියක් තම ළදරුවාට කිරි පොවමින් පස් යොදුනක් ගිය බව අංගුත්තර අට්ඨකථාවෙහි සඳහන් ය. මෙතරම් ජනප්‍රියත්වයට පත් අරියවංශ දේශනයට ඇතුළත් වන්නේ භික්ෂුවකගේ පැවැත්ම පිළිබඳව ය. ලැබෙන සිවුරෙන්, පිණ්ඩපාතයෙන් සෙණසුනෙන් සතුටට පත්වීමත් තපෝ ගුණ ප්‍රකාශ නොකිරීමත් යහපත් භික්ෂුවක ගේ පැවැත්ම විය යුතු බව එහි සඳහන් ය. තමනට පිංකම් කිරීමට භික්ෂුව පින් කෙතක් විය යුතු බැවින් එබඳු භික්ෂූන් ලබා ගැනීම් වස් අරියවංශ දේශනාවේ පැවැත්ම පැරැන්නන් විසින් බෙහෙවින් අගයන්නට ඇත.

**ධර්මශ්‍රවණයේ දී පිළිපැදිය යුතු චාරිත්‍ර.**

ධර්මයට හා ධර්ම දේශකයාණන්ටත් ගරු බුහුමන් සහිතව ධර්ම ශ්‍රවණයට සූදානම් වීම බෞද්ධයන්ට හොඳින් හුරු පුරුදු දෙයකි. ධර්ම ශාලාවට ඇතුල් වන්නේ හිස් වැසුම් හා පාවහන් රහිතව ය. ධර්ම ශ්‍රවණයට සාමාන්‍යයෙන් වාඩිවෙන්නේ බිම එලන ලද පැදුරුවල ය. දේශකයාණන්ගේ අසුනට වඩා පහත් අසුනක වාඩි වී ධර්ම ශ්‍රවණය කිරීම වරදක් නො වේ. ධර්ම දේශකයා පිළිපැදිය යුතු ආකාරය පිළිබඳව මුලින් සඳහන් කරන ලදින් ඊට අනුකූල වන පරිද්දෙන් ධර්ම ශ්‍රවණය කරන ශ්‍රාවකයන්ගේ ඉරියව් පැවැත්විය යුතු වේ. ධර්ම ශ්‍රවණයේ දී නොසිටිය යුතු ඉරියව් දෙකක් ලෝවැඩ සඟරාවේ එන පහත සඳහන් කවියෙන් දැක්වේ.

"බිම ඉඳ සිට කී බණ නාසන්නේ
විමතිව උඩ ඉඳැ සිට නාසන්නේ
කැමතිව කීවොත් විමසාසන්නේ
එම වද සගමොක් සැප සාදන්නේ"

ධර්ම මණ්ඩපයක බාල තරුණ මහලු යන විවිධ මට්ටම්වල උවසු උවැසියෝ වෙති. එසේ ම සමාජයේ විවිධ සමාජ මට්ටම්වල අය

වෙති. මේ සියලු දෙනා ම තම තමන් ගේ උස් පහත් තත්ත්වයන් හෝ තරාතිරම් කිසිවක් නොසලකා එක ම මට්ටමේක ශ්‍රාවක පිරිසක් බවට පත් වෙති. මෙසේ ධර්ම මණ්ඩපයක එකට වාඩිවීමේ සිරිත බෞද්ධයන්ගේ සමානාත්මතා ගුණ ධර්මය වැඩීමට හේතු වෙයි.

පහසු ඉරියව්වකින් වාඩි වෙතොත් දෙ අත් ඔසවා වැඳ ගෙන බණ ඇසීම උසස් චාරිත්‍රයක් ලෙස සලකනු ලැබේ. ධර්ම දේශකයාණන් වහන්සේ බුදු කෙනෙකුන් ලෙස සලකා ගෙන ගෞරව සම්ප්‍රයුක්තව වචනයෙන් වචනය ආදරයෙන් යුතුව දහම් ඇසිය යුතු බව ලෝවැඩ සඟරාවේ පවසන්නේ මෙසේ ය.

දිවමන් මුනිඳුන් දුටුමෙන් තොයවා
බණ දන්නන් හට වැඳ අත් ඔසවා
පදයෙන් පදයට අදරින් අසවා
එපිනෙන් නිරයට යන මං වසවා

ධර්ම දේශකයන් වහන්සේ ළඟින් වාඩිගත් උවසුවකු උන්වහන්සේ ඉදිරිපත් කරන අදහස්වලට වරින් වර '' එහෙයි ස්වාමිනි '' හෝ ''එහෙයි හාමුදුරුවනේ'' යනුවෙන් ප්‍රතිඋත්තර දීමත් පෙර සිට එන එක් චාරිත්‍රයකි.

ධර්ම දේශනාව අවසානයේ දී දේශකයාණන් වහන්සේට දහම් පඬුරු පිළිගැන්වීම ද නිතර ක්‍රියාත්මක වන චාරිත්‍රයකි. මෙම දහම් පඬුරු බොහෝ අවස්ථාවල දී සැම දෙනාගේ ම සම්මාදමෙන් ලබා ගත්තකි. එය දේශකයාණන් වහන්සේට පූජා කිරීමට ප්‍රථම ධර්ම ශ්‍රවණය කළ සියලු ශ්‍රාවකයන් ලවා අත ගස්වා ගැනීම ද සිරිතකි.

## 4.3 කඨින දානය පිළිබඳ සිරිත්.

වාර්ෂික ව පැවැත්වෙන කඨින දානය සිංහල බෞද්ධයන්ගේ උසස් පිංකමකි. මේ පිංකමට ප්‍රධාන වශයෙන් ඇතුළත් වන්නේ භික්ෂූන් වහන්සේ වෙත පූජා කරනු ලබන ශ්‍රේෂ්ඨතම චීවර දානයකි. කඨින චීවරය යනු වස් අවසානයේ දී භික්ෂූන් වහන්සේ වෙත පූජා කරනු ලබන චීවරය යි. චිරාගත ව, දීර්ඝ කාලයක සිට පැවතීගෙන එන මෙම පුණ්‍යකර්මයේ ආරම්භය දැන ගැනීම ද ප්‍රයෝජනවත් වේ.

### වස් විසීමේ ආරම්භය.

බුද්ධ ශාසනය ආරම්භයේ සිට ම භික්ෂූන් වහන්සේලා වස් විසීමේ සිරිත පැවතුණේ නැත. මුල් කාලයේ දී වර්ෂා ඍතුවේ දී පවා භික්ෂූන් වහන්සේලා ධර්ම ප්‍රචාරක කටයුතු සඳහා චාරිකාවේ යෙදුණාහ. එහෙත් එකල සිටි ජෛන පැවිද්දෝ වර්ෂා කාලයේ දී පොළොවේ මතුවන

කුඩා සතුන් ආදීන් පයට පෑගී මැරෙන බැවින්, සංචාරයේ නොගොස් ඔවුන්ගේ ආරාමවලට වී කාලය ගත කළහ. එබැවින් බෞද්ධ භික්ෂූන් වහන්සේලා වර්ෂා කාලයේ චාරිකාවේ යෙදීම ගැන මහජනයා අප්‍රසාදය පළ කළහ මේ අවස්ථාවේ දී මහජන මතයට ගරු කිරීමක් වශයෙන් බුදුරජාණන් වහන්සේ වර්ෂාව පවත්නා තෙමස තුළ භික්ෂූන් වහන්සේලාටත්, ආරාමවල වාසය කිරීම අනුදැන වදාළහ. එසේ ම මේ කාලය භික්ෂූන් වහන්සේලාට බණ භාවනාවල යෙදීමෙන් ගුණ ධර්ම දියුණුකර ගැනීම-ටත්, ගිහියන්ට එම කාලය තුළ දී උන්වහන්සේලාට සිවුපසයෙන් උපස්ථාන කිරීමෙන් හා උන්වහන්සේලා ගෙන් බණ ඇසීමෙන් ස්වකීය ගුණ ධර්ම දියුණු කර ගැනීමටත් හැකි බව බුදුරජාණන් වහන්සේ පෙන්වා දුන්සේක.

මේ අනුව වස් තෙමස තුළ භික්ෂූන් වහන්සේලා බණ භාවනා පුරුදු කිරීමේ යෙදුන අතර ගිහියෝ උන් වහන්සේලාට සිවුපසයෙන් උපස්ථාන කිරීමෙන් ගිහි සාමීචිපටිපද ව සම්පූර්ණ කරගැනීමෙහි යෙදීම සිරිතක් කර ගත්හ. වස් තෙමස තුළ දිනපතා ම ගිහියෝ විහාරයට ගොස් භික්ෂූන් වහන්සේලාගේ අඩු පාඩු සොයා බලා සම්-පූර්ණ කර දුන්හ. භික්ෂූන් වහන්සේ ගිහියන්ට දහම් දෙසීමෙන් අනුග්‍රහ කළහ. මෙසේ වස් කාලය ගිහි - පැවිදි සම්බන්ධයක් ඇතිවීමට ද හේතු විය. වස්කාලය අවසන් වනුයේ කඨින චීවරය නමැති කාෂාය වස්ත්‍රයක් භික්ෂූන් වහන්සේට පූජා කිරීමේ උත්සවයකිනි. මේ චාරිත්‍රය අවුරුදු 2500ක පමණ කාලයක් අඛණ්ඩව පැවතගෙන ආ ශාසනික කටයුත්තක් ලෙස ද සලකනු ලැබේ.

**වස්කාලය**

සාමාන්‍යයෙන් අපේ රටේ වස් කාලය ක්‍රියාත්මක වන්නේ ජුලි - ඔක්තෝබර් මාස තුළ ය. අතීතයේ දී නම් මේ කාලය මුළු රට ම ආගම භක්තියෙන් උදම් වී ගිය කාල පරිච්ඡේදයකි. වර්ෂයක් තුළ දී කඨින චීවරයක් පූජා කිරීමට ඉඩ ලැබෙන්නේ එක් අවස්ථාවක් බැවින් මෙම මහඟු පින්කමට බෞද්ධයෝ බොහෝ ශ්‍රද්ධාවෙන් සහභාගී වෙති.

ආරාමයක භික්ෂූන් වහන්සේලාට වස් විසීමට ආරාධනය කරන්නේ දායකයන් විසිනි. සමහර අවස්ථාවල දී ගමේ පන්සලේ හාමුදුරුවන් වහන්සේ පමණක් නොව පිටතින් භික්ෂූන් වහන්සේලා ද කැඳවා වස් විසීමට ආරාධනය කරනු ලැබේ. වස් කාලය තුළ දී භික්ෂූන් වහන්සේලාට දිනපතා දානමානාදිය කිරීම සඳහා දායකයෝ වැඩ පිළි-වෙළක් සකස් කර ගනිති. බොහෝ විට තුන් මාසය තුළ දින වෙන් කරගෙන එක් එක් දායකයා එක් එක් දවසේ උදය හීල්දානය, දවල් දානය, හා සවස ගිලන්පස දානය සපයා වස් විසූ භික්ෂූන් වහන්සේලාට උවටැන් කිරීම සිරිතක් වශයෙන් කෙරේ. මේ දාන වස්දාන නමින් හැඳින්

වේ. වස්කාලය තුළ දී දිනපතා සවස පන්සල්වල බුද්ධ පූජා ආදිය පැවැත්වීමට ගිහියෝ පැමිණෙති. එසේ ම වස් තුන් මස අවසන් වනතුරු, අඩු තරමේ මාසේ සතර පෝය දිනවල වත් විශේෂ ධර්මදේශනා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ද සිරිතකි. කඨින සිවුර පූජා කරනු ලබන කඨින පින්කම පවත්වනු ලබන්නේ වස් තෙමස අවසාන දිනයේ ය. බොහෝ අවස්ථාවල දී මේ උත්සවයට සර්වරාත්‍රික පිරිත් සජ්ඣායනයක් හා පසුදින දවල් මහා සංඝයා විෂයයෙහි සාංඝික දානයක් පිරිනැමීම ද ඇතුළත් කරගනු ලැබේ.

**කඨින චීවරය සකස් කිරීම.**

කඨින චීවරය පූජා කරන දින අලුයම ඒ සඳහා වූ සුදු රෙද්ද විහාරස්ථානයට මහ පෙරහරින් වැඩම කරවීම ද චාරිත්‍රයකි. මේ සුදු රෙද්ද මිළ දී ගැනීම සඳහා දායකයන් සියලු දෙනා ම පාහේ සම්මාදන් කරවා ගැනීම සිරිතකි. එක් දායකයකුට මෙය පූජා කිරීමට හැකි වුවත් මේ මාහැඟි පූජාවට සියල්ල සහභාගී කරවා ගැනීම බෞද්ධ සම්ප්‍රදය යි. විහාරයට පෙරහරින් වඩමවන ලද කඨින වස්ත්‍රය මහා සංඝයාට පවරනු ලැබේ. වස් සමාදන් වූ භික්ෂූන් වහන්සේ නමකට එදිනම පොරවා ගැනීමට හැකිවන පරිද්දෙන් මේ රෙද්ද භික්ෂූන් වහන්සේලා විසින් ම කපා මසා පඩු ගසනු ලැබෙයි. කඨින චීවරය එක් භික්ෂුවක් විසින් පසුව පරිහරණය කරනු ලැබුවත් එය පූජා කරනු ලබන්නේ වස් සමාදන් වූ එක් භික්ෂුවකට නොවේ. එය පූජා කරනු ලබන්නේ මහා සංඝයා විෂයයෙහි සාංඝික වශයෙනි. කඨින සිවුර වස් සමාදන් වූ භික්ෂූන් වහන්සේලාගේ පොදු වස්තුවක් වුවත් එය කිනම් භික්ෂුවකට අයත් විය යුතු දැයි රැස්ව සිටින මහා සංඝයා තීරණය කරති. කඨින සිවුර ලැබෙන භික්ෂුව එම සිවුර පොරවාගෙන එදින රාත්‍රියෙහි ධර්ම දේශනාවක් කළ යුතු වෙයි. මෙම ධර්මදේශනාවේ මාතෘකාව වන්නේ 'කඨිනානිසංස' යි.

## 4.4 උපෝසථ ශීල සමාදනය පිළිබඳ සිරිත්.

ආමිස පූජා හා ප්‍රතිපත්ති පූජා යන දෙකෙන් වඩා වැදගත් වන්නේ ප්‍රතිපත්ති පූජාව ය. බෞද්ධ ගිහියකුට කළ හැකි උසස් ප්‍රතිපත්ති පූජාමය කුසලයක් නම් උපෝසථ අෂ්ටාංග ශීලය සමාදන් වීමයි. නිති පන්සිල් රකිමින් පොහෝ දින පෙහෙවස් සමාදන් වීම ප්‍රතිපත්ති ගරුක බෞද්ධයාගේ චාරිත්‍රය යි.

"රකින තම බිජු — වල්
කිරල සෙමරෙව් හැම — කල්
පොහො දවස අට — සිල්
රකී නිති පිරිසිදුව පන් — සිල්"

වැනි සාහිත්‍යයේ එන පදායයන්ගෙන් ද මෙය පැරැන්නන්ගේ චාරිත්‍රයක් වූ බව පෙනේ. වැඩි දෙනකු සිල් සමාදන් වන්නේ පසළොස්වක පොහෝ දිනවල ය.

සිල් සමාදන් වීමට පළමු දින හෝ එදිනම පාන්දර හෝ ස්නානය කොට පවිත්‍ර වීම සිල් සමාදන් වීමට බලාපොරොත්තු වන්නාගේ චාරිත්‍රය යි. ඔහු පොහෝ දින පාන්දරින් ම සුදු වතින් සැරසී තෙල් මල් ආදී පූජා භාණ්ඩ රැගෙන විහාරයට යයි. සිල් ඇඳුම ඉතා චාම් ය. පිරිමියකු සුදු රෙද්දකින් හා සුදු බැනියමකින් සැරසෙන අතර, කාන්තාවක සැරසෙන්නේ සුදු රෙද්දකින් හා චාම් සුදු හැට්ටයකින් ය. පිරිමි ගැහැණු කවුරුත් එක් උරයක් වැසෙන සේ උතුරු සළුවක් පෙරවීම ද චාරිත්‍රයකි. උතුරු සළුව ඔහු හෝ ඇය පෙහෙවස් සමාදන් වී ඇති බව පෙන්වන සංකේතයකි. සිල්වතකුගේ ඇඳුම් කට්ටලයට අයත් තවත් අංගයකි, පත්කඩය. පත්කඩය වන්දනා මාන කිරීමේදීත්, දන් වැළඳීමේ දී උකුල මතා එලා ගැනීමටත් භාවිතා කරනු ලබන සුදු රෙදි කැබැල්ලකි. සිල් සමාදන් වන ගැමියන් අතර භාවිතා වන තවත් දෙයක් නම් නවගුණවැල නමින් හැඳින්වෙන කී කිරිදිය වැනි කුඩා ගෙඩි 108ක් අමුණාගත් මාලයයි. මෙය දැන් අභාවයට යන්නකි.

විහාරයට යන උපාසක උපාසිකාවෝ උදෑසනින් ම භික්ෂූන් වහන්සේට ආරාධනය කොට උන් වහන්සේ ඉදිරිපිට තෙරුවන් සරණ ගොස් අෂ්ටාංග ශීලය සමාදන් වෙති. භික්ෂූන් වහන්සේ කෙනකුගෙන් සිල් ලබා ගැනීම චාරිත්‍රයකි. උපාසක උපාසිකා පිරිස ශීලයෙහි පිහිටුවීමෙන් පසු සිල් අනුසස් පිළිබඳවත්, දවස ගත කරන ආකාරය පිළිබඳ වත් කෙටි අනුශාසනාවක් කිරීම භික්ෂූන් වහන්සේගේ සිරිත ය.

පෙහෙවස් සමාදන් වූ තැනැත්තේ පන්සිල් රකින ගිහියාට වඩා වැඩිපුර සිල් පද හතරක් සමාදන් වෙයි.

"අබ්‍රහ්ම චර්යාවෙන් හෙවත් ගිහි කාමභෝගී ජීවිතයෙන් වෙන් වීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.

විකල් බොජුනෙන් වෙන්වීමේ ශික්ෂා පදය සමාදන් වෙමි.

නැටුම්, ගැයුම් හා විසුළු දැකුම්වලින් වෙන්වීමේ හා මල්ගඳ විළවුන් දැරීමෙන් වෙන්වීමේ ශික්ෂාපදය සමාදන් වෙමි.

උස් අසුන් භාවිතයෙන් වෙන්වීමේ ශික්ෂාපදය සමාදන් වෙමි."
යනු එසේ සමාදන් වන පොරොන්දු හතරයි.

මෙයින් ඉහත සඳහන් පළමුවන ශික්ෂාපදය පංචශීලයේ ඇතුළත් කාමයන්හි වරදවා හැසිරීමෙන් වෙන්වීමේ ශික්ෂාපදය තවත් දියුණු කිරීමකි. මේ අනුව අෂ්ටාංග ශීල සමාදානය තාවකාලික අභිනිෂ්ක්‍රමණ-

යකට සමාන ය. එය රහතන් වහන්සේ කෙනකු මෙන් හැසිරීමට කරන උත්සාහයකි.

මේ අනුව උපාසක උපාසිකාවෝ පෙහෙවස් සමාදන් වූ දින විශේෂ චාරිත්‍ර අනුගමනය කරති. ඔවුන් හීල් දනය වළඳන්නේ උදෑසන බුද්ධ පූජා පවත්වා මල්පහන් පූජා කිරීමෙන් පසුව ය. මෙදින පැදුරුවල හෝ පත්කඩ එලා බිම වාඩිවීම සාමාන්‍ය සිරිතකි. එහෙත් වාඩි වූ විට පා බිම තැවරෙන මට්ටමේ උස ඇති බංකුවක හෝ සාමාන්‍ය පුටුවක වාඩිවීම වරදක් නොවේ. බිම වාඩිවීමේ චාරිත්‍රය වැදගත් වන්නේ කුලය, සමාජ මට්ටම, තරාතිරම ආදිය නොසලකා සමානාත්මතා ගුණධර්මය ජීවිතයට පුහුණු කර ගැනීමට මෙයින් ඉඩ ලැබෙන හෙයිනි. විකල් බොජුනෙන් වළකින උවසු උවැසියෝ හිරු අවරට හැරෙන්නට පළමු දවල් දනය වළඳති. වාඩි වී මිසක් හිට ගෙන හෝ ඇවිදිමින් ආහාර පාන නොගැනීම සිල් සමාදන් වූවන්ගේ සිරිත ය. ආහාර ගැනීම, ඉඳීම, සිටීම, ගමන් කිරීම හා නිදගැනීම වෙනදට වඩා සංවරව පැවැත්වීම සිරිත යි. සාමාන්‍යයෙන් ආහාර වළඳනු ලබන්නේ පිළිගැන්වීමෙන් පසුව ය. සමහර උපාසක උපාසිකාවෝ භික්ෂූන් වහන්සේ මෙන් ප්‍රත්‍යවේක්ෂා කොට ආහාර වළඳති. ''මේ ආහාරය වළඳන්නේ රූව වැඩිවීම සඳහාවත්, ශක්තිය වැඩිවීම සඳහාවත්, නොව හුදෙක් දිවි පවත්වා ගැනීම සඳහා ය.'' යනුවෙන් සිතීම ආහාර ප්‍රත්‍යවේක්ෂා කිරීමේ ඉතා ම සරල ක්‍රමයකි,

ධර්ම ශ්‍රවණය, ධර්ම සාකච්ඡා කිරීම, දහම් පොත් කියැවීම, භාවනා කිරීම, පිරිත් සජ්ක්ධායනය හා වන්දනා කිරීම වැනි පිංකම්වල යෙදීමෙන් මෙදින දවස ගත කරනු ලැබේ.

ජාතක පොත, පූජාවලිය හා සද්ධර්ම රත්නාවලිය වැනි දහම් පොත් පෙහෙවස් නසමාදන් වූ දිනයන්හි උවසු උවැසියන් විසින් කියැවීම චාරිත්‍රයක් වන තරමට ජනප්‍රිය වී තිබේ.*

සන්ධ්‍යාවේ නැවත වරක් අෂ්ටාංග ශීලය සමාදන් වීම සිරිත යි. පසුවද උදේ පන්සිල් සමාදන් වීමෙන් පසු සිල් පවාරණය කරනු ලැබේ.

## 4.5 බෞද්ධ ශාන්ති කර්ම.

මෙලොව ජීවිතයේ දී ම යහපත් ප්‍රතිඵල බලාපොරොත්තුවෙන් සිදු කරනු ලබන එක්තරා ආගමික කටයුතු කොටසක් ශාන්ති කර්ම නමින් හැඳින් වෙයි. බුද්ධ කාලයට පෙර සිට ම ඉන්දියාව ලංකාව ආදී රටවල මිනිස්සු දෙවියන්ගේ ගුණ ගයනා කොට ස්තෝත්‍ර පැවැත්වීමෙන්

---

1. ජාතක පොත, පූජාවලිය හා සද්ධර්ම රත්නාවලිය පිළිබඳ තොරතුරු මෙම පොතේ 12 පරිච්ඡේදයේ ඇතුළත් ය.

ද පුද පූජා පැවැත්වීමෙන් ද දෙවියන් සතුටු කොට ස්වකීය ලෞකික ජීවිතයේ උවමනාවන් ඉෂ්ටකර ගැනීමට උත්සාහ කළහ. බුදුරජාණන් වහන්සේ ද,

> ''දිවා ච රත්තො ච හරන්ති යෙ බලිං
> තස්මාහි නෙ රක්ඛත අප්පමත්තා''

යනුවෙන් දිවා රෑ බලිපූජා පවත්වන මිනිසුන් අප්‍රමාදව ආරක්ෂා කරන්නැ'යි දෙවියන්ට ප්‍රකාශ කොට ඇති බව රතන සූත්‍රයේ සඳහන් ය. මේ නිසා බෞද්ධයන් ද ශාන්තිය පතා දෙවියන්ට පුද පූජා පැවැත්වීම සිරිතක් කර ගෙන ඇත. එසේ ම තෙරුවන් ගුණ ගයනා කොට, ඒ ගායනා බලයෙන් තමනටත්, තමන් කැමති වන වෙනත් අයටත් ශාන්තියක් ප්‍රාර්ථනා කරති. මෙ බඳු පින්කම් ශාන්තිකර්ම පින්කම් වශයෙන් සළකනු ලැබේ. ශාන්තිකර්ම පින්කමකට හොඳ ම උදාහරණය නම් පිරිත් දේශනය යි.

## (1) පිරිත් දේශනය හා සම්බන්ධ සිරිත්.

### පිරිත් දේශනයේ ආරම්භය.

පිරිත් දේශනය ආරම්භ වූයේ බුද්ධ කාලයේ දී ම ය. එතැන් පටන් මේ දක්වා ම බෞද්ධයන් විසින් පිරිත් දේශනාව නොකඩවා ම චාරිත්‍රයක් වශයෙන් පවත්වා ගෙන ඇවිත් ඇත. මේ කාලය තුළ දී පිරිත් දේශනය හා සම්බන්ධ චාරිත්‍ර ද වෙනස් වෙමින් ඇවිත් වර්තමානයේ පවත්නා තත්ත්වය බිහි වී ඇත.

බුදුරජාණන් වහන්සේ වැඩ සිටි කාලයේ දී ම වරක් විශාලා මහනුවරට රෝග භය, දුර්භික්ෂ භය, හා අමනුෂ්‍ය භය යන තුන් බියක් පැමිණ මහත් විනාශයක් ඇති විය. ලිච්ඡවි රජදරුවෝ රට රැක ගැනීමට බුදු රජුන්ගේ පිහිට සෙවූහ. අනඳ හිමියන් සමඟ විශාලා නුවරට වැඩි බුදුරජාණන් වහන්සේ පළමු කොට රතන සූත්‍රය අනඳ හිමියන්ට ඉගැන්වූ සේක. ඉක්බිති බුදු රජුන්ගේ උපදෙස් පරිදි අනඳ හිමියෝ ලිච්ඡවි කුමාරවරුන් සමඟ නගරය වටා යමින්, බුදු රජුන්ගේ පාත්‍රයෙන් පැන් ඉසිමින් රතන සූත්‍රය සජ්ඣායනය කළහ. තුන්බිය පහව ගියෙන් රට විපත්තියෙන් මිදිණ. මෙහි දී බුදු රදුන් වෙනුවෙන් මහත් උත්සවයක් පවත් වන ලදී. ඒ සඳහා ගඟෙහි පාරු එකට බැඳ ඒ මත විසිතුරු මණ්ඩපයක් සාදන ලද්දේ ය. විශාලා නුවරට වැඩි මේ සාර්ථක ගමනින් පසු බුදුරජාණන් වහන්සේ ගඟ දිගේ ම රජගහ නුවරට වැඩි සේක. එබැවින් මේ ගමන හා උත්සවය ''ගඞ්ගාරොහණ'' නමින් හැඳින්විණ. මහාවංශයේ රතන සූත්‍රය ද ගංගාරොහණ සූත්‍රය නමින් හැඳින් විණ.

විජය කුමරුන් සත්සියක් පිරිස සමග ලංකාවට ගොඩ බට අවස්ථාවෙහි සක් දෙවිඳුන්ගේ නියෝගයෙන් උපුල්වන් දෙව් තවුස් වෙසක් මවා ගෙන විත්, පිරිත් පැන් ඉස, පිරිත් නූල් බැඳ පිරිසට සෙත් පැතූ බව මහාවංශය කියයි.

**ගංගා රෝහණ පූජාව.**

උපතිස්ස රජ (365 – 406) ලක්දිවට දුර්භික්ෂයක් හා රෝග භයක් පැමිණි කල්හි මහා සංඝයාගේ උපදෙස් පරිදි ගංගා රෝහණ පූජාවක් කළ බැව් මහා වංශයේ සඳහන් ය. මෙම උත්සවයේ දී රජතුමා නගරය සරහා සිල් සමාදන් ව, මහජනයා ද සිල් සමාදන් කරවා මහදන් පැවැත්වූ බව කියනු ලැබේ. රනින් බුදු රුවක් සාද, බුදුන් වහන්සේගේ පාත්‍රා ධාතුවට පැන් පුරවා පාත්‍රය බුදුරුවේ දෝතේ තබා බුදුරුව මහා රථයක නංවා, වීථි සංචාරයට කටයුතු සූදානම් කරන ලද්දේ ය. රථය ඉදිරියෙන් ගමන් කරද්දී මහා සංඝයා වහන්සේ රතන සූත්‍රය දේශනා කරමින් පැන් ඉසිමින් රථය පිටුපස වඩිමින් මුළු රාත්‍රිය ම වීථි සංචාරයෙහි යෙදුණහ. රජතුමා ද වීථි පැදකුණු කරමින් භික්ෂුන් වහන්සේ සමග උත්සවයට සහභාගී වූහ.

පිරිත් දේශනාවෙන් පසු වැසි වැස දුර්භික්ෂ භය හා රෝග භය දුරු වූයෙන්, ''අනාගතයේ දී ද මෙබඳු භයක් ඇති වූ විට මෙසේ කරත්ව''යි රජතුමා විසින් නියෝග කළ බව ද සඳහන් වේ. දෙවන සේන (851 – 885) රජු සමයේ ද රට වසංගතයකින් පෙළුණු අවස්ථාවක දී මෙබඳු උත්සවයක් පැවැත් වූ බව පෙනේ. මෙම උත්සවයේ දී රථයෙහි වැඩම වන ලද්දේ අනඳ හිමියන් ගේ රුවකි. විශාලා මහනුවර ගංගා රෝහණ උත්සවයේ දී පිරිත් දේශනා කරමින් පැන් ඉසින ලද්දේ අනඳ හිමියන් බැවින් එය නිවැරදි ය. භික්ෂුන් වහන්සේලා රථය පිටුපස වඩිමින් පැන් ඉසිමින් පිරිත් සජ්ඣායනා කළහ. දෙවන සේන රජතුමා රතන සූත්‍රය රන්පත්වල ලියවූ බව ද මහා වංශයේ සඳහන් ය.

5වන කාශ්‍යප රජතුමා ද (913 – 923) රෝග භය හා දුර්භික්ෂ භය දුරු කිරීම සඳහා තුන් නිකායෙ භික්ෂුන් වහන්සේලා රැස් කරවා නුවර පිරිත් සජ්ඣායනයක් පැවැත්වූ බව කියනු ලැබේ. පෙර පරිද්දෙන් ප්‍රතිමාවක් නගර සංචාරයෙහි යෙදවූ බවක් නම් සඳහන් නො වේ ගංගා රෝහණ පූජාව කල්යත් ම වෙනස් මුහුණුවරක් ගත්තට ඇතැ යි සිතිය හැක. ''ගංගා රෝහණ පූජා'' යන නම ද අභාවයට ගිය බවක් පෙනේ. එහෙත් 19වන සියවසේ මැද භාගයේ දී මාතර තිල්වලා ගහේ ගංගා රෝහණ පූජාවක් පැවැත්වූ බව පෙනේ. තෝමස් මුහන්දිරම් විසින් ලියන ලද ගංගා රෝහණ වර්ණනාව නමැති සිංහල කාව්‍යයේ මෙම උත්සවය විස්තර වේ.

**පිරිත් දේශනාව පැවැත්වීමේ අරමුණු.**

පුරාණයේ දී ත්‍රිවිධ භය දුරු කිරීමට පිරිත් දේශනය පැවැත්වූවත් පසු කාලයේ දී විවිධ අරමුණු ඉටු කරගැනීම සඳහා පිරිත් දේශනය පවත්වනු ලබන බව පෙනේ. විහාර ආරාමවල වාර්ෂිකව පිරිත් පිංකම පවත්වනු ලබන්නේ පොදුවේ ගමටත්, රටටත්, වාසනාව උදාකිරීමේ අටියෙනි. සමහර විටෙක වෙනත් පිංකමක අංගයක් වශයෙන් ද පිරිත් දේශනය පවත්වනු ලැබේ. කඨින චීවර පූජා කිරීමේ උත්සවයේ දී සර්වරාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාවක් පැවැත්වීම උදාහරණයක් වශයෙන් දැක්විය හැකි ය.

ගෙදරක පිරිත් පිංකම් පවත්වනු ලබන්නේ විවිධ හේතූන් නිසා ය. ගෙයකට මුල්ගල තැබීමේ දී හා ගෙට ගෙවදීමේ දී බෞද්ධයෝ අනිවාර්යයෙන් ම වාගේ පිරිත් පිංකම් පවත්වති. එසේ ම ගෙදරකට හෝ පුද්ගලයකුට අමනුෂ්‍ය භයක් ඇති වූ විට අමනුෂ්‍යයන් පළවා හැරීමට බෞද්ධයන් වැඩිපුර යොදා ගන්නේ පිරිත් දේශනය යි. විවාහාභිමුඛ යුවළකට ත්‍රිවිධ රත්නයේ ආශිර්වාදය පැතීමට හෝ විදෙස් ගතවන්නකුට අනාගත ආරක්ෂාව ප්‍රාර්ථනා කිරීමට හෝ යොදා ගන්නේත් පිරිත් ධර්ම දේශනය යි. දීර්ඝ කාලීන අසනීපයක් ඇත්තකුට සුවය පතා හෝ ගැබගත් ළඳකගේ පහසු ප්‍රසූතිය පතා හෝ ද පිරිත් දේශන පැවැත්වීම සිරිති. එසේ ම මෙලොව පමණක් නොව පරලොව ආරක්ෂාව ද පිරිතෙන් ලැබෙතැයි බෞද්ධයෝ විශ්වාස කරති.

**පිරිතට අඩංගුවන්නේ කුමක්ද?**

බුදුරජාණන් වහන්සේ විශාලා මහනුවර දී ත්‍රිවිධ භය දුරු කිරීම සඳහා සජ්ඣායනයට තෝරා ගන්නා ලද්දේ රතන සූත්‍රය යි. අනුරාධපුර යුගයේ මුල් කාලයේ දී ගංගා රෝහණ පූජා සඳහා යොදා ගෙන ඇත්තේත් රතන සූත්‍රය පමණි. එහෙත් කල්යත් ම පිරිත් ගණයට වැටෙන සූත්‍ර ගණන වැඩි වී තිබේ. ''මිලින්ද ප්‍රශ්නය'' නමැති බෞද්ධ ධර්ම ග්‍රන්ථයයෙහි සඳහන් වැදගත් පිරිත් සූත්‍ර නම් රතන සුත්ත, ඛන්ධ පරිත්ත, මොරපරිත්ත, ධජග්ග පරිත්ත, ආටානාටිය පරිත්ත හා අංගුලිමාල පරිත්ත යි. මෙත්ත සුත්ත, ධජග්ග සුත්ත හා රතන සුත්ත දීඝනිකාය අට්ඨකථාවේ සඳහන් වැදගත් පිරිත් සූත්‍රයි. පසුකාලයේ දී පරිත්ත ධර්මය තව තවත් සූත්‍ර එකතු වීමෙන් සංවර්ධනය වී තිබේ. පිරුවාණා පොත් වහන්සේ නමින් ප්‍රසිද්ධ වී ඇති පිරිත් පොතට සරණාගමනය, දසසික්ඛාපද, සතර ප්‍රත්‍යවෙක්ෂණ හා ද්වත්තිංසාකාරය ඇතුළු බණවර සතරක් ද, තෝරාගත් සූත්‍ර ධර්ම දේශනා ගණනක් ද අතිරේක වශයෙන් සතර කමටහන්, සෙත් පිණිස භාවිතා කරනු ලබන පිරිත් දේශන ද දෙරකඩ අස්න හා අනුශාසනා ආදිය ද ඇතුළත් ය. සූත්‍ර දේශනා අතර ඇති මහා මඞ්ගල රතන හා කරණීය මෙත්ත යන

සූත්‍ර ධර්ම ''මහ පිරිත'' නමින් හැඳින් වෙයි. බුදුරජාණන් වහන්සේ විසින් පළමුවරට දේශනා කළ ධම්මචක්කප්පවත්තන සූත්‍රය ද පිරිත් දේශනයට ඇතුළත් ය.

පරිත්ත දේශනාවේ අරමුණ හා ඒ සඳහා යොදා ගන්නා කාලය අනුව පිරිතේ ස්වභාවය ද ඒ වෙනුවෙන් පවත්වන චාරිත්‍ර ද වෙනස් වෙයි. තිස්පැයේ පිරිත සර්වරාත්‍රික පිරිත් දේශනාව වශයෙන් ද, දින හතක් අඛණ්ඩව පවත්වනු ලබන පිරිත සති පිරිත නමින් ද හැඳින්වෙයි. මෙ හැරෙන්නට කෙටි කාලීනව පවත්වන පිරිත් දේශනා වරු පිරිත් නමින් හැඳින් වේ. වරු පිරිතක් බොහෝ විට තුන් සූත්‍රය සජ්ඣායනය කිරීමට පමණක් සීමා වෙයි. පිංකමක් වශයෙන් නොව ආශීර්වාදයක් වශයෙන් විශේෂ අවස්ථාවක දී පවත්වනු ලබන පිරිතක් සමහර විට විනාඩි 10ක් 15ක් වැනි කෙටි කාලයකට සීමා වෙයි. විශේෂ අරමුණු ඉටු කර ගැනීම සඳහා විශේෂ චාරිත්‍ර සහිතව තෝරා ගත් පිරිත් සූත්‍ර සජ්ඣායනය කිරීම ද පෙර සිට පැවති බව පෙනේ. ආටානාටිය සූත්‍ර දේශනාව එබන්දකි.

**ආටානාටිය සූත්‍ර දේශනාව.**

ආටානාටිය සූත්‍රය අමනුෂ්‍යයන් පළවා හැරීම සඳහා සජ්ඣායනය කරන පිරිත් සූත්‍රයකි. අමනුෂ්‍යයන් පළවා හැරීම සඳහා මෙම සූත්‍රය සජ්ඣායනය කිරීමේ දී පිළිපැදිය යුතු විශේෂ චාරිත්‍ර දීඝනිකාය අට්ඨ-කථාවේ සඳහන් ය. පළමුවෙන් ම මෙත්තසුත්ත, ධජග්ග සුත්ත හා රතන සුත්ත සත් දවසක් සජ්ඣායනා කළ යුතු ය. ආතුරයාගෙන් අමනුෂ්‍යයා මේ කාලය තුළදී පිටව නොගියහොත් ආටානාටිය සුත්ත දෙසිය යුත්තේ ය. මේ සූත්‍රය දේශනා කරන භික්ෂුව මස් මාංශ හා පිටියෙන් සෑදූ කැවිලි අනුභවයෙන් වැළකිය යුතු ය. අමනුෂ්‍යයන්ගෙන් බිය පැමිණිය හැකි බැවින් සොහොන් බිමක නොවිසිය යුතු ය. එසේම විහාරයේ සිට රෝගියා වෙතත්, රෝගියා ළඟ සිට විහාරයටත් භික්ෂූන් වහන්සේ කැඳවා ගෙන ඒමේ දී හා යාමේ දී අවි හා පළිස් ගත් පිරිස් උන්වහන්සේ පිරිවරා යා යුතු ය. එළිමහනක දී සූත්‍රය දේශනා නොකළ යුතු අතර, දොර කවුළු වසන ලද කාමරයක වැඩ හිඳිමින් මෛත්‍රී සිත පෙරටු කොට භික්ෂූන් වහන්සේ විසින් මෙම සූත්‍රය දේශනා කළ යුතු වේ. සූත්‍රය දේශනා කරද්දී ද අවිගත් මිනිසුන් භික්ෂූන් වහන්සේගේ ආරක්ෂාවට සිටිය යුතු ය. සූත්‍රය දේශනා කිරීම ආරම්භ කළ යුත්තේ ආතුරයා පන්සිල් ගැන්වීමෙනි. අමනුෂ්‍යයා පලා නොයන්නේ නම් ආතුරයා සෑ මළුවට ගෙන යා යුතු ය. සෑ මළුව ද අතු පතු ගා මල් පහන් පූජා කොට සුදනම් කළ යුතු වෙයි. ආතුරයා සෑ මළුවේ බාවා, දේවාරාධනය කොට දේවතා සන්නිපාතයක් ද කළ යුතු වෙයි. අසල විශාල වෘක්ෂයක් තිබේ නම් එහි සිටින දේවතාවට ද සංඝයා වහන්සේ නමින්

අස්නක් යවා ඔහු ද කැඳවිය යුතු වේ. යක්ෂයා ආවේශ වී සිටින ආතුරයාගෙන් යක්ෂයා ගේ නම අසා, ඉන්පසු යක්ෂයාගේ නමින් ම ඇමතිය යුතු වේ. ඉක්බිති දන් දී මල්පහන් පුද ලත් පින් ඔහුට අනුමෝදන් කොට ඇති බව පවසා සංඝයා කෙරෙහි ඇති ගෞරවයෙන් ආතුරයා වෙතින් ඉවත්ව යන ලෙස අමනුෂ්‍යයාට කිව යුතු ය. මෙසේ කළ කල්හිත් ඔහු නොයන්නේ නම්, දෙවියන් රැස් කරවා, යක්ෂයාගේ මුරණ්ඩුකම ගැන දෙවියන්ට දන්වා ''අමනුෂ්‍යයා අපේ බස පිළි නොගන්නා බැවින් අපි බුද්ධාඥාව ඉටු කරමු ය''යි පවසා ආටානාටිය සූත්‍රය සජ්ඣායනා කළ යුතු ය. උත්සවාකාරයෙන් පවත්වනු ලබන සර්වරාත්‍රික පිරිත්, සති පිරිත් ආදියේ දී භාවිත වන විශේෂ චාරිත්‍ර ද ඇත. පිරිත් මණ්ඩපයක් සකස් කිරීම මෙවායේ විශේෂ ලක්ෂණයකි.

**පිරිත් මණ්ඩපය.**

මෙය පිරිත් දේශනා කරන භික්ෂූන් වහන්සේලාට වාඩිවීම සඳහා සකස් කරන අටපට්ටම් හෝ සම සතරැස් කුඩුවකි. පිරිත් කොටුව විචිත්‍ර කලා කෘතියකි. පුරාණයේ දී පිරිත් කොටුව වැඩි වශයෙන් සරසන ලද්දේ ගොක්කොළ වලිනි. මේ කාලයේ දී කඩදාසි, රිජිපෝම් ආදී විවිධ මාධ්‍යයන්ගෙන් සැරසිලි කරන අතර, නොයෙක් විට වර්ණවත් විදුලි බුබුළුවලින් ආලෝකවත් කරනු ද ලැබේ.

කොටුව තුළ උඩුවියන් බැඳ, එම වියනේ නූල් ඇද වියනේ තා දලු, බුලත් කිනිති, සිවිය කොළ හා මල් එල්වා අලංකාර කිරීම ද සිරිතකි. මණ්ඩපයේ (පිරිත් කොටුවේ) දොරටුව තබන්නේ නැගෙනහිර දිසාවට හෝ දකුණු දිසාවට ය. කිසි විටෙකත් එහි දොරටුව බටහිරට තබනු නොලැබේ. දොරටුවට මුහුණ ලා මණ්ඩපය තුළ ඉන්ද්‍රඛීලය හෙවත් රාජගහ නමින් ගසක් සිටවනු ලැබේ. බොහෝ පළාත්වල රාජගහට යොදා ගන්නේ ළා බාල පුවක් ගසකි. මණ්ඩපයේ ආසන පනවන්නේ රවුමට ය. මුල් පුටු නමින් හැඳින්වෙන ප්‍රධාන ආසන දෙකට පිටුපසිනි ඉන්ද්‍රඛීලය පිහිටුවන්නේ. පිරිත් පිරීම ආදී වැදගත් කටයුතු කරන්නේ එතැන සිට ය. ආසනවල සුදු රෙදි අතුරනු ලැබේ. ධාතු කරඬුව හා පිරිත් කරනු ලබන පූජා ද්‍රව්‍ය තැබීමට වෙන ම ආසනයක් තබනු ලැබේ. පිරිත් කිරීම සඳහා ගොක්කොළ වලින් සරසන ලද අලුත් පැන් කළය අනිවාර්යයෙන් ම තබනු ලැබේ.

පිරිත් හුය අදින්නේ පිරිත් පොත ධාතු කරඬුව, පිරිත් පැන් කළය හා සංඝයා වහන්සේ සම්බන්ධ වන අයුරිනි. පිරිත් කරනු ලබන නූල පුවක්මල් කිනිත්තක ඔතනු ලැබේ. නූලේ එක් කළවරක් ධාතු කරඬු ආදියට සම්බන්ධව තිබෙද්දී පුවක් මල් කිනිත්ත සහිත නූල් පන්දුව පිරිත් ශ්‍රවණය කරන්නන් අතට දෙනු ලැබේ. පිරිත විශේෂ ආතුරයකු වැනි කෙනකු අරභයා නම් නූල් ඔතන ලද පුවක් මල්

කිනිත්ත ඔහු අතට යැවීම අනිවාර්යයෙන් ම කෙරෙන සිරිතකි. මණ්ඩපය වටා පිටතින් පොල් තෙල් පහන් දල්වනු වස් පුන්කළස් සතරක් ද තබනු ලැබේ. පිරිත ආරම්භ කරන්නට කලින් අඹ, විළඳ, සමන් කැකුළු, සුන්සහල් සහ ඊතණ යන ලද පස්මල් මණ්ඩපය තුළ විසිරවනු ලැබේ. චාරිත්‍ර අරඹන්නේ සඳුන් කිරි පැනින් අත් පවිත්‍ර කර ගැනීමෙන් පසුව ය.

**පිරිත් මණ්ඩපයේ අදහස.**

පිරිත් මණ්ඩපය ඇතුළු පිරිත් පිළිබඳ චාරිත්‍ර යම්කිසි ගැඹුරු අරුතක් පිළිබිඹු කරන බවක් පෙනේ. පිරිත් මණ්ඩපයේ සියලු ම අඩංග සැලකිල්ලට ගෙන සලකා බැලූ විට එය බුදුරජාණන් වහන්සේ බුද්ධත්වය ලැබූ අවස්ථාව නිරූපණය කරන්නේය යි සිතිය හැකි ය.

ඉන්ද්‍රඛීලය හෙවත් රාජගහත්, වියනේ එල්වන ලද තා දලු, බුලත්, මල් ආදියත් නිරූපණය කරන්නේ බුදුන් වහන්සේට බුද්ධත්වය ලැබීමට පිහිට වූ අතුපතර සහිත බෝධීන් වහන්සේ යි. විසුරුවන ලද ලදපස්මල් මූර්ති මත් කරන්නේ බුදුරජාණන් වහන්සේ වාඩි වූ කුසතණ ඇතිරිය යි. බුද්ධත්වය ලබන්නේ නැගෙනහිර බලා ය. පිරිත් මණ්ඩපයේ දොරටුව ඇත්තේ නැගෙනහිරට මුහුණ ලා ය. බුද්ධත්වය සඳහා සූදානම් වන්නේ සන්ධ්‍යාවේ සිට ය. රාත්‍රි තිස්පැයක් පටිච්ච සමුප්පාදය මෙනෙහි කොට බුද්ධත්වය ලබන්නේ උදෑසන ය. සවස ආරම්භ කරන ලද පිරිත කෙළවර වන්නේ පසු ද උදෑසන ය. පිරිත නම් බුදුරදුන්ගේ සිතේ ජනිත වී මුවින් පිට වූ වාග්මාලාව යි. භික්ෂූන් වහන්සේ ඒ පිරිත දේශනා කරන්නේ ධාතු කරඬුව හා පිරිත් පොත සම්බන්ධ වූ පිරිත් නූල අත ඇතිව ය. පිරිත් හුය පිරිත් කරනු ලබන දේවල් හා පිරිත් අසන්නන් ද සම්බන්ධ කරයි. පිරිතේ ධර්ම ශක්තිය කාවද්දන අයුරු නිරූපණය කරන සැටියි ඒ. මේ අයුරින් බැලූ විට පිරිත් දෙසීමේ චාරිත්‍රයේ අර්ථවත් පසුබිමක් ඇති බව පැහැදිළි වේ.

**පිරිත ආරම්භ කිරීම.**

පහත දැක්වෙන්නේ උත්සව සහිතව බහුල වශයෙන් පවත්වනු ලබන සර්ව රාත්‍රික පරිත්‍රාණ ධර්මදේශනයක් පවත්වනු ලබන ආකාරය යි. සන්ධ්‍යාවේ භික්ෂූන් වහන්සේලාගෙ වතාවත් ආදියත් ගිහියන්ගේ කෑමබීම කටයුතු ආදියත් අවසන් කොට සාමාන්‍යයෙන් පිරිතක් ආරම්භ කරන්නේ රාත්‍රි 9.00ට පමණ ය. පිරිත් මණ්ඩපය කරා ධාතු කරඬුවත්, පිරුවාණා පොත් වහන්සේලාත් භික්ෂූන් වහන්සේලාත් වැඩම කරවන්නේ හේවිසි හොරණෑ සහිත පෙරහැරෙනි. ධාතු කරඬුව හා පිරුවාණා පොත් වහන්සේ පෙරටු කොට භික්ෂූන් වහන්සේලා සඟ මහලු පිළිවෙළින් සැදැහැවතුන් විසින් ඔසවන ලද වියන් යටින්

වැඩම කරති. ශාලාවට ප්‍රවේශ වෙද්දී සැදැහැවතකු විසින් පා සෝදන ලදුව උන් වහන්සේලා සුදු පියවිලි පිටින් පිරිත් මණ්ඩපයට ගොස් අසුන් ගනිති. පිළියෙල කරන ලද විශේෂ උස් අසුනක හෝ මේසයක ධාතු කරඬුව තබා සමන් මලින් හෝ වෙනත් සුදු මල්වලින් හෝ පූජා කරනු ලැබේ. පිරුවාණා පොත් වහන්සේලා ප්‍රධාන ආසන දෙක (යුගාසන) ඉදිරිපිට පිළියෙල කරන ලද මේසය මත තබනු ලැබේ. දැන් බුද්ධ (ධාතු කරඬුව) ධම්ම (පිරුවාණා පොත් වහන්සේ) සංඝ (භික්ෂූන් වහන්සේලා) යන ත්‍රිවිධ රත්නයම පිරිත් මණ්ඩපයේ වැඩ සිටිති. පිරිත් කිරීම සඳහා පැන් කළය ද මණ්ඩපයට වැඩම කරනු ලබන්නේ හේවිසි සහිත පෙරහැරෙනි.

පිරිත ආරම්භ කිරීමට ප්‍රථම බුද්ධ (ධාතූන් වහන්සේලා) ප්‍රමුඛ සංඝයා වහන්සේට ගිලන්පස පූජා කිරීම සිරිත ය. මෙම ගිලන්පස පූජාවට චතුමධුර ද ඇතුළත් ය. පිරිත් දේශනා කරන කාලය තුළ දී භික්ෂූන් වහන්සේලාගේ කටහඬ හා උගුර මැනවින් පවත්වා ගැනීම සඳහා වරින් වර වැළඳීමට ඉඟුරු මිශ්‍ර සූකිරි පිරිසියක් ද තබනු ලැබේ.

ඉක්බිති පිරිත් මණ්ඩපය වටා හා ඒ වෙනුවත් පිටත සකස් කළ මල් පැලෙහි ද පහන් දල්වනු ලැබේ. මඟුල් බෙර වාදනයෙන් අනතුරුව භික්ෂූන් වහන්සේ නමක් ගිහි පිරිස පංචශීලයෙහි පිහිටුවා යි. පිරිත් උත්සවය සංවිධානය කිරීමේ නායකත්වය ගන්නා ගිහි දායකයකු විසින් මහා සංඝයා වහන්සේ වෙත දැහැත් වට්ටියක් පිළිගන්වා සර්වරාත්‍රික පරිත්‍රාණ ධර්ම දේශනාව පවත්වන ලෙස ආරාධනය කර සිටින්නේ ඊළඟට ය. අනතුරුව පරිත්‍රාණ ධර්ම දේශනාව පැවැත්වීමේ අරමුණ හා පරිත්‍රාණ ධර්ම දේශනාවේ අනුසස් ද ඇතුළත් කෙටි ධර්මානු-ශාසනයක් භික්ෂුවක් විසින් පැවැත්වීම සිරිත ය.

පිරිත් දේශනය ආරම්භ කරන්නේ පිරිත් ඇසීම සඳහා පැමිණ සිටින සියලු ම ගිහියන් ලවා පහත සඳහන් ගාථා කියවන්නට සැලැස්වීමෙනි.

විපත්ති පටිබාහාය – සබ්බ සම්පත්ති සිද්ධියා
සබ්බ දුක්ඛ විනාසාය – පරිත්තං බ්‍රෑත මඞ්ගලං.

මෙම ගාථාව ම පහත සඳහන් වෙනස්කම් සහිතව දෙවනුවටත්, තුන්වනුවටත්, කියවනු ලැබේ. දෙවෙනි වරට 'සබ්බ දුක්ඛ' යන්න වෙනුවට ''සබ්බ භය'' යන්නත් තුන්වෙනි වරට ''සබ්බ රෝග'' යන්නත් යොදා ගනු ලැබේ.

'උවදුරු වැළැක්වීම සඳහාත්, සෑම සම්පත්තියක් ම ළඟා කරගැනීම සඳහාත් සෑම දුකක් ම නැති කිරීම සඳහාත් මඞ්ගල සහිත වූ පරිත්‍රාණ ධර්ම දේශනාව දේශනා කරන සේක්වා' යනු මුල් ගාථාවේ අදහස යි. දෙවෙනි තුන්වෙනි ගාථාවල අදාළ තැන්හි ''සියලු භය දුරු කිරීම සඳ-

හාත්'' ''සියලු රෝග දුරු කිරීම සඳහාත්'' යනුවෙන් අදහස වෙනස් වෙයි.

**පිරිත් දේශනය.**

පිරිත් පේ කිරීම, මහ පිරිත දෙසීම, යුග කීම, සරණාගමනය කීම, සූත්‍ර දෙසීම. විහාර අස්න, දොරකඩ අස්න හා අනුශාසනා අස්න කීම, හමාර දෙසීම සහ සෙත් පිරිත් දෙසීම යනුවෙන් පිරිත් දේශනයක චාරිත්‍රානුකූල අංග දශයකි. මෙයින් විහාර අස්න, දොරකඩ අස්න හා අනුශාසනා අස්න කීම යන අංග තිස්පැයේ පිරිතට ඇතුළත් නො වේ. අඩග දසය ම ඇතුළත් වන්නේ සත්වරුවේ හෝ සත් දින පිරිතකට පමණි.

පිරිත් පේ කිරීමට, පිරිත් දේශනයට සිටින සියලු ම භික්ෂූන් වහන්සේලා සහභාගී වෙයි. පිරිත් දේශනයකට සහභාගී වන භික්ෂූන් වහන්සේලාගේ ගණන 8ත් 16ත් අතර ඉරටටේ සංඛ්‍යාවකි. යුග කීම, සරණාගමනය කීම හා සූත්‍ර දෙසීම කරන්නේ භික්ෂූන් වහන්සේලා දෙනම බැගිනි. හමාර දෙසීමට එක පොතකට දෙනම බැගින් පොත් දෙකට සිවුනමකි.

මහ පිරිත අවසානයේත්, ධම්ම චක්ක සූත්‍රය අවසානයේත් බෙර වැයීමෙන් ශබ්ද පූජා පැවැත්වීම ද සිරිත ය.

සම්පූර්ණ පිරිත ම දේශනා කරන්නේ එක ම විරිතකින් නොවේ. පිරිත් පේ කිරීම, යුග දෙසීම ආදියේ දී දේශන විරිත් මාරු කරනු ලැබේ. විශේෂයෙන් ආටානාටිය සූත්‍රය දේශනා කිරීමේ දී උච්ච ස්වරයකින් හා වෙගවත් බවකින් යුක්තව දේශනා කිරීම සිරිතකි.

**සත් වරුවේ පිරිත් හා සත් දිනයේ පිරිත්.**

සත් වරුවේ හා සත් දිනයේ පිරිතක දී තම පිරිත පේ කරායින් පසුව පිරිත් මණ්ඩපයේ සිව් දිගට පිරිත් පැන් ඉස දෙරටු වසා දේශකයන් වහන්සේලා බැහැර යති. නැවත පසුදින උදැසන දොරකඩ සඳහා පේවී සිටින අය ලවා පිරිත් දේශනාව සඳහා නැවත ආරාධනා ගාථා කියවා යුගාසනයේ භික්ෂූන් දෙනම බැගින් වාඩි ගනිමින් පිරිත් දේශනය පවත්වා ගෙන යනු ලැබේ. මෙසේ සවැනි දවසේ සවස් වනතුරු ම දෙනම බැගින් යුග කීමත් සෑම දිනක ම උදේ 6 සවස 3 හා රෑ 9ට සියලු ම දේශකයෝ එක් ව මහපිරිත් දෙසුමත් පවත්වා ගෙන යති. එදින සවස මහ පිරිතෙන් පසුව පිරිත් පොතේ මුල් බණවර දෙකින් පිටස්තර සූත්තර 7ක් විචිත්‍ර ශෛලියකින් දේශනා කරනු ලැබේ. ඉක්බිති අනුශාසනා සඳහා පේවී සිටීත භික්ෂූන් විසින් මිහිරි තාලයකින් විහාර අස්න දේශනා කරනු ලැබේ. විහාර අස්නෙන් කෙරෙන්නේ

එහි සඳහන් විහාර හා දේවාල ඇසුරෙන් දෙවියන්ට පිරිත් හමාර ඇසීමට එන ලෙස කරන ආරාධනයකි. මෙම පිරිතට දෙවියන්ට පණිවුඩ ගෙන යාම සඳහා දේවදූතයකු ද අවශ්‍ය වෙයි. දේවදූතයා වශයෙන් ක්‍රියාකරන්නේ හොඳ ගතිගුණ ඇති පිරිමි ළමයෙකි. පිරිතේ ඊළඟ කොටස වන්නේ දෙරකඩ අස්න හා අනුශාසනා අස්න දෙසීමයි. මෙහි දී සියලු ම භික්ෂූහු සහභාගී වී මංගල සූත්‍රය දේශනා කරති. ඉක්බිති දේවදූතයා හා අනුශාසනාව කිරීමට නියමිත භික්ෂූන් වහන්සේ අතර ඇති වන කෙටි සංවාදයකින් පසු ව දෙරකඩ අස්න හා අනුශාසනා අස්න දෙසීමෙන් දෙවියන්ට පින් පමුණුවන්නේ අනුශාසනා අස්න දෙසීමට නියමිත වියත් තෙරුන් වහන්සේ විසිනි. හැම පිරිතක් ම අවසන් වන්නේ සෙත් පිරිත් දේශනයකිනි.

**පිරිත් පැන් හා පිරිත් නූල්.**

හැම පිරිතක දී ම පිරිතේ බලය කවා පිරිත් කරන දේ නම් පිරිත් පැන් හා පිරිත් නූල ය. සති පිරිත දී නම් මෙයට අතිරේකව බෙහෙත් තෙල්, සුර, පංචායුධ හා පස් ආදිය ඒ ඒ ඒ අය පිරිත් මණ්ඩපයේ තබා පිරිත් කරවා ගනිති.

පිරිත් දේශනකය දී පිරිත් පොත මෙන් ම වැදගත් දෙයක් නම් පිරිත් හුය නමැති යත නූල යි. පිරිත් දේශනා කරන අවස්ථාවේ දී මෙම පිරිත් හුයෙන් පිරිත් පැන් කළය, ධාතු කරඬුව, හා පිරිත් පොත සම්බන්ධ කර හැම භික්ෂූන් වහන්සේ නමක් ම එය අතේ දරා ගනිති. පිරිත් හුයට සම්බන්ධ කර තිබූ සියලු ම දේවලට පිරිතේ බලය කාවැදී යන බැවින් ඒවා භාවිත කිරීමෙන් උවදුරු නසා සෙත් ශාන්තියක් ලැබෙන බව බෞද්ධයන්ගේ බලවත් විශ්වාසය යි. පිරිත අවසන් වූවායින් පසු භික්ෂූන් වහන්සේලා ආශීර්වාදාත්මක ගාථා ගයද්දී ගිහි පැවිදි කවුරුත් පිරිත් පැන් ස්වල්පය බැගින් පානය කරති. පිරිත් නූල් අත්වල හා ගෙළෙහි පැළඳ ගනිති.

පිරිත පිළිබඳ චාරිත්‍රයත් සංවර්ධනය වෙද්දී එයට දේශීය ශාන්තිකර්ම වල චාරිත්‍ර ද මුසු වී ඇති බව පෙනේ. නූල් භාවිතය, සාම්බ්‍රානි කපුරු ආදී දුම් ඇල්ලීම පිරිත් මණ්ඩපයේ කොළ අතු එල්ලීම ආදිය ශාන්තිකර්ම චාරිත්‍ර වලින් පිරිතට එක් වූ දේවල් කීපයකට උදහරණ යි.

ශබ්දය ගමන් කිරීමේ විද්‍යාත්මක ස්වරූපය ගැන සලකා බලන විට පිරිත් නූල් හා පිරිත් පැන්, ශබ්දය ගමන් කළ හැකි මාධ්‍යයක් ලෙස ද සලකනු ලැබේ. එබැවින් එම ද්‍රව්‍ය මගින් පිරිත් ශබ්දයේ බලය හා අනුහස ඒවා දරන්නන්ට ලැබේය යි ද විශ්වාස කරනු ලැබේ.

## 4.5 (2) බෝධි පූජාව හා ඒ සම්බන්ධ පිරිත්.

සාමාන්‍යයෙන් විහාරයක දී කරන ත්‍රිවිධ චෛත්‍ය වන්දනාවට බෝධීන් වහන්සේට කරන වන්දනාව ද ඇතුළත් වෙයි. එහෙත් මෙහි දී බෝධි පූජාව යන්නෙන් අදහස් කරනුයේ ශාන්ති කර්මයක් වශයෙන් බෝධීන් වහන්සේට කරන විශේෂ පූජාවකි. පිරිත් සජ්ඣායනයෙන් විශේෂ ආශීර්වාද බලාපොරොත්තු වන්නේ යම්සේ ද එසේ ම බෝධි පූජාවෙන් ද මෙලොව කටයුතු සාර්ථක කර ගැනීමට බෞද්ධයෝ විශේෂ ආශීර්වාද බලාපොරොත්තු වෙති. රෝගීන් සුවපත් කර ගැනීම, සුවදායක දරු ප්‍රසූතිය, නඩු හබ වලින් පය ගැනීම, විභාගවලින් සමර්ථවීම, අමනුෂ්‍ය උපද්‍රව දුරකර ගැනීම ආදී විවිධ ලෞකික අවශ්‍යතා සඳහා ශාන්තිය පතා බෞද්ධයෝ බෝධි පූජා පවත්වති.

බුදුරජාණන් වහන්සේ පිළිබඳ ශාරීරික, පාරිභෝගික, උද්දේසික යන ත්‍රිවිධ චෛත්‍යයන් අතුරින් බෝධීන් වහන්සේ පාරිභෝගික චෛත්‍යය වන සේක. ඒ බෝධීන් වහන්සේ බුද්ධත්වය ලබා ගැනීමට උන්වහන්සේට ප්‍රයෝජනය පිණිස වූ හෙයිනි. බුදුරජාණන්වහන්සේ විසිනුදු පූජා කරනු ලැබූ බෝධීන් වහන්සේ බුද්ධ පූජිත වන සේක.

**බෝධි පූජා ඉතිහාසය.**

බුදුරජාණන් වහන්සේ ජීවත්ව සිටියදීත් පිරිනිවන් පෑමෙන් පසුවත් තමන් වහන්සේ වෙනුවට පිදිය යුතු චෛත්‍යය බෝධීන් වහන්සේ බව වරක් බුදුරජාණන් වහන්සේ අනඳ තෙරුන්ට වදාළ සේක. ''එසේ නම් ශ්‍රී මහා බෝධීන් වහන්සේගෙන් බීජුවටක් දෙව්රම් වෙහෙර දොරටුයෙහි රෝපණය කරවමුද''යි ඇසූ අනඳ හිමියන්ට බුදුරජාණන් වහන්සේ වදාළේ ''යහපත ආනන්දයෙනි, රෝපණය කරව, එසේ කළ කල්හි ජේතවනයෙහි මාගේ නිරන්තර වාසයක් මෙන් වන්නේය'' යනුවෙනි. මෙහි ප්‍රතිඵලය වූයේ ජේතවනාරාමයේ ආනන්ද බෝධි රෝපණය සිදුවීමයි. මෙසේ බෝධීන් වහන්සේ බුදුරජුන් ජීවමානව සිටිද්දීම, ජීවමාන බුදුවරයකු ලෙසින් පුද පූජා ලද සේක. වර්තමාන-යේදී ද බෞද්ධයන්ට බෝධීන් වහන්සේ නියෝජනය කරන්නේ ජීවමාන බුදුරජාණන් වහන්සේ ය.

ඉතිහාසයේ දී මුලින් ම විශේෂ බෝධි පූජා, කළ තැනැත්තකු වශයෙන් අපට අශෝක අධිරාජයා හමුවේ. බුදු දහම වැළඳගත් අශෝක රජතුමා මුල්ම ධර්මයාත්‍රාව කෙළේ බුද්ධ ගයාවේ ශ්‍රී මහා බෝධීන් වහන්සේ වෙත ය. එහි දී කහවනු ලක්ෂයක් දන් දුන් රජතුමා බුද්ධ-ගයා චෛත්‍යය ද කරවීය. ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ රූපය සාංචි, භාරුත් ආදී ස්ථානයන්හි කැටයම් කරවන ලද්දේ ය. සුවඳ පැන් සොළොස් කළයකින් බෝධීන් වහන්සේ නහවනු ලැබූහ. බෝධීන් වහන්සේ සුවඳ පැනින් නැහැවීම අශෝක කාලයේ දී පවා බෝධි

පූජාවට අයත් චාරිත්‍රයක් වූ බව මෙයින් අපට පෙනේ. තව ද ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දක්ෂිණ ශාඛාව ලංකාවට වැඩම කරවීමට සූදානම් කරද්දී ස්වර්ණ සංඛ, රජත සංඛ හා දක්ෂිණාවෘත්ත සංඛ (හක්ගෙඩි) වලින් අනෝතත්ත විලෙන් ගෙනා දියෙන් බෝධීන් වහන්සේ අභිෂේක කර වූ බවක් ද සඳහන් වෙයි. බෝධීන් වහන්සේ ලංකාවට එවද්දී ඒ සමඟ, බෝධීන් වහන්සේ නැවීමට රන් කෙණ්ඩි අටක් හා රිදී කෙණ්ඩි අටක් ද එවූ බව ද කියනු ලැබේ.

බෝධීන් වහන්සේ ඒ වේලාවෙහි දක්වන ලද ප්‍රාතිහාර්යයෙන් අපමණ සතුටට හා ශ්‍රද්ධාවට පත් රජතුමා ''මම බෝධීන් වහන්සේ තෙවරක් රජයෙන් පිදූවෙමි. මගේ යහළු රජතෙමේ ද එසේ ම රජයෙන් පුද කෙරේවා''යි

(''අහංරජ්ජේන තික්ඛත්තුං - මහා බෝධි මපූජයි
එව මෙවහි පූජේතු - රාජා රජ්ජේන මේ සඛා'')

දෙවන පැතිස් රජුට හසුනක් දී සංඝමිත්තා මෙහෙණින් වහන්සේ අන බෝධීන් වහන්සේ පිටත් කොට එවී ය. මෙයින් අධිරාජයා බෝධීන් වහන්සේ සමඟ බෝධි පූජාව සඳහා උපදෙස් ද ලංකාවට එවූ බව පෙනේ.

ශ්‍රී මහා බෝධීන් වහන්සේ මහමෙව්නාවෙහි රෝපණය කිරීමෙන් පසුව ලක් පොළොව ද පූජාර්හ විය. දිවමන් බුදුන් දුටු සෙයින් ලක්දිව සැදැහැවත් බෞද්ධයෝ ද බෝධි පූජා පැවැත් වීමෙහි උත්සුක වූහ. රටට විපතක් හෝ සම්පතක් ඇතිවීමේ දී ශ්‍රී මහා බෝධීන් වහන්සේ එහි පෙරනිමිති පහළ කරන බව ද සිංහල බෞද්ධයන්ගේ විශ්වාසය යි. රට ජාතියේ අභිවෘද්ධිය සඳහා කරන වැඩ කටයුතුවල දී ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ආශීර්වාදය පතා රජවරු හා පාලකයෝ පුද පූජා පැවැත්වූහ. අදත් පවත්වති.

ශ්‍රී මහා බෝධීන් වහන්සේගෙන් ව්‍යාප්ත වූ බෝධීන් වහන්සේලා අද රට පුරා වැඩ හිඳිති. ඒ කවර බෝධීන් වහන්සේ කෙනෙක් වුවත් සිංහල බෞද්ධයනට එකසේ ගෞරවාර්හ වෙති.

**බෝධි පූජාවක චාරිත්‍ර.**

බෝධි පූජාවක විශේෂ චාරිත්‍රය වනුයේ බෝධි මූලය පැනින් නැහැවීම යි. කෙනෙක් සුවඳ පැනින් බෝධි මූලය නහවති. සමහරු පැන් වෙනුවට කිරි ද භාවිත කරති. සාමාන්‍යයෙන් පැන් කළ හතකින් නැවීම සිරිත යි. එහෙත් විවිධ අවස්ථාවල දී ශාන්තිකර්ම ගුරුන්ගෙන් ලැබෙන උපදෙස් අනුව පැන් කළ සොළොස, විසිඑක ආදී ගණන් වලින් නැහැවීම කෙරෙනු ලැබෙයි. බෝධීන් වහන්සේට මල් පහන්

පිළිම හැරුණු විට, මල්මාලා වලින් සැරසීම, ධජපතාකවලින් සැරසීම ආදිය ද බෝධි පූජාවල දී දක්නට ලැබේ. බෝධීන් වහන්සේගේ කඳවටා චීවරයක් දැවටීම ද තවත් චාරිත්‍රයකි. බෝධි පූජාවකට විශේෂ පද්‍ය ගායනා හා ගාථා සජ්ඣායනයක් ද ඇතුළත් වෙයි. පහත දැක්වෙන්නේ බෝධි පූජාවක් කෙරෙන සාමාන්‍ය අනුපිළිවෙළ යි.

1. බෝධීන් වහන්සේ අබියස සිට පිරිස පංච ශීලයෙහි පිහිටීම.

2. පහන්, සුවඳදුම්, මල්, මල්මාලා, කොඩිවැල් හා පැන් කළ රැගෙන බෝධි වන්දනා කවි කියමින් පිරිස බෝධීන් වහන්සේ ප්‍රදක්ෂිණා කිරීම.

3. බෝධීන් වහන්සේ වටා සිට විවිධ පූජා භාණ්ඩ පූජා කිරීම, කොඩි වැල් එල්ලීම හා පැන් කළවලින් බෝධි මූලය නැහැවීම, බෝධි පූජා ගාථා සජ්ඣායනය කිරීම.

4. බෝධීන් වහන්සේ දෙස බලාගෙන බුද්ධානුස්සති භාවනාව කිරීම, මේ සඳහා ඉතිපිසෝ පාඨයේ සඳහන් බුදුගුණ කඳු නවය වෙන් වෙන් වශයෙන් මෙනෙහි කිරීම එක් ක්‍රමයකි.

5. සෙත් පිරිත් සජ්ඣායනය.

6. පුණ්‍යානුමෝදනාව — දෙවියන්ට පිං පැමිණවීම.

7. ත්‍රිවිධ රත්නය සමාකර ගැනීම.

ඉහත සඳහන් අංකයන් යටතේ ප්‍රචලිත වශයෙන් ගායනා කරනු ලබන විශේෂ කවි, ගාථා ආදිය සඳහා උදහරණ පමණක් මීළඟට දක්වනු ලැබේ.

## බෝධි වන්දනා කවි

1. බුද්ධං බුද්ධං බුද්ධං වන්දේ
ධම්මං ධම්මං ධම්මං වන්දේ
සංඝං සංඝං සංඝං වන්දේ
බුද්ධං ධම්මං සංඝං වන්දේ

2. වන්දේ වන්දේ බුද්ධං වන්දේ
වන්දේ වන්දේ ධම්මං වන්දේ
වන්දේ වන්දේ සංඝං වන්දේ
වන්දේ වන්දේ බෝධිං වන්දේ

3. රන්වන් පාටින් දළලන බෝධිය
නිල්වන් පාටින් කොළ ලන බෝධිය
ගෞතම මුනිඳුන් පිටදුන් බෝධිය
අපිත් වඳිමු ජය සිරිමා බෝධිය

4. දඹදිව් තලයේ හටගත් බෝධිය
සිරි ලංකාවට වැඩමෙව් බෝධිය
ගෞතම මුනිඳුන් පිටදුන් බෝධිය
අපිත් වඳිමු ජයසිරි මා බෝධිය

5. දඹදිව් තලයේ හටගත් බෝධිය
සඟමිත් තෙරණින් වැඩමෙව් බෝධිය
ගෞතම මුනිඳුන් පිටදුන් බෝධිය
අපිත් වඳිමු ජයසිරි මා බෝධිය

6. දඹදිව් තලයේ හටගත් බෝධිය
මහමෙව්නාවේ රෝපිත බෝධිය
ලොව්තුරු මුනිඳුන් පුදකළ බෝධිය
අපිත් වඳිමු ජයසිරි මහා බෝධිය

## බෝධි වන්දනා ගාථා.

3 . 1 පඨමං බෝධි පල්ලංකං – දුතියං ච අනිමිසං
තතියං චංකමනං සෙට්ඨං – චතුත්ථං රතනාගරං
පඤ්චමං අජපාලං ච – මුචලින්දෙන ඡට්ඨමං
සත්තමං රාජයාතනං - වන්දේ තං මුනි සේවිතං

3 . 2 වන්දාමි චේතියං සබ්බං සබ්බඨානෙ සුපතිට්ඨිතං
ශාරීරික ධාතු මහා බෝධිං – බුද්ධ රූපං සකලං සදා

3 . 3 යස්ස මූලේ නිසින්නෝ ව – සබ්බාරි විජයං අකා
පත්තෝ සබ්බඤ්ඤුතං සත්ථා –
වන්දේ තං බෝධි පාදපං

3 . 4 අයං ඒසෝ මහා බෝධි – ලෝක නාථෙන පූජිතෝ
අහංපි තේ නමස්සාමි – බෝධි රාජා නමත්ථු තෙ

3 . 5 යස්ස මූලේ නිසීදිත්වා – සත්තාහං ලෝක නායකෝ
විමුක්ති සුඛ සංවේදී – වන්දේහං බෝධි මුත්තමං

3 . 6 යස්ස පූජේසි සම්බුද්ධෝ – සත්තාහං සක ලෝචනෝ
පූජිතං නර දේවේහි – වන්දේහං බෝධි මුත්තමං

3 . 7 ඉන්ද නීල වණ්ණ පත්ත සේත බන්ධ භාසුරං
සත්තු නෙත්ත පංකජාභි පූජිතග්ග සාදතං
අග්ග බෝධි නාම වාම දේව රුක්ඛ වණ්ණිතං
තං විසාල බෝධි පාද පං නමාමි සබ්බද

3 . 8 සේවිතං ධම්ම රාජේන – පත්තුං සම්බෝධි මුත්තමං
පූජෙමි බෝධි රාජානං – දීපේ නේත්තේන සාදරං
පූජෙමි බෝධි රාජානං – ධූපේ නේත්තේන සාදරං
..........................කුසුමේනේත්තේන සාදරං
..........................මාලා සේනා ය සාදරං
..........................ඔජේනේත්තේන සාදරං
..........................උදකේනේත්තේන සාදරං[1]

3 9 ඉමාය බෝධි පූජාය – කතාය සුද්ධ චේතසා
චිරං තිට්ඨතු සද්ධම්මෝ – ලෝකෝ හෝතු සුඛී සද

4.0 කරණීය මෙත්ත සූත්‍රය සජ්ඣායනා කිරීම.

5 . 1 මහා දයෝ මහා සත්තෝ – බෝධි මූලේ නිසිදිය
පඤ්ච මාරේ පරාජෙත්වා – පත්තෝ සම්බෝධි මුත්තමං
ඒතෙන සච්ච වජ්ජේන – සොත්ථි මේ හෝතු සබ්බද

ජයෝ මුනින්දස්ස සුබෝධි මූලේ
අහෝසි මාරස්ස පරාජයෝති
උග්ඝෝසයුං දේව ගණා පසන්නා
එතේන සච්චේන ජයස්සු මය්හං[2]

## 4. 6 ධර්මයාත්‍රා හෙවත් වන්දනා ගමන් පිළිබඳ සිරිත්.

'ධර්මයාත්‍රා' හා 'චෛතිය යාත්‍රා' යන නම්වලින් ද හැඳින්වෙන වන්දනා ගමන් යාම බෞද්ධයාගේ ජීවිතයේ වැදගත් අංගයක් මෙන් ම උසස් පිංකමක් ද වෙයි. ''මහණෙනි, බොහෝ දෙනාගේ හිත සුව පිණිස චාරිකාවේ හැසිරෙන්න.'' යනුවෙන් වදාළ බුදුරජාණන් වහන්සේ ද වස් තුන් මස හැර ඉතිරි කාලය ගම් නියම් ගම් රජදහන් සැරිසරමින් ලෝකයාට යහ මඟ පෙන්වමින් දහම් දෙසමින් හැසිරුණාහ. සිය ගණන් භික්ෂූන් වහන්සේ ද උන් වහන්සේ සමඟ හෝ වෙන් වෙන් වශයෙන් හෝ චාරිකාවේ යෙදුණු මේ ගමන් ''ධර්ම යාත්‍රා'' වෙ ආරම්භය ලෙස සැලකිය හැකි ය.

බුදුරජාණන් වහන්සේ උන් වහන්සේගේ ජීවිතයේ අග භාගයේ දී භික්ෂූන් මෙන් ම ගිහියන් සඳහා ද මේ චෛතිය යාත්‍රා හෙවත් වන්දනා ගමන් අනු දැන වදාළ බව මහා පරිනිබ්බාණ සූත්‍රයෙන් පැහැදිලි වේ.

1. 3.8 ගාථාවේ එන මුල්පද තුන එක් එක් ගාථාවේ හිස්තැනට යොදා ගත යුතුය.
2. 'දෙව ගණා' යන තැනට 'නාග ගණා' 'බ්‍රහ්ම ගණා' යන පද යොදා මේ ගාථාව නැවත නැවත කියනු ලැබේ.

"ආනන්දය, සැදැහැවත් කුල පුත්‍රයකු විසින් ප්‍රසාද සංවේගයෙන් යුතුව නැරඹිය යුතු ස්ථාන සතරෙකි. එනම් තථාගතයන් වහන්සේ බිහි වූ ස්ථානය, බුදු වූ ස්ථානය, දම්සක් පැවැත් වූ ස්ථානය, පිරිනිවන් පෑ ස්ථානය යනු යි. ආනන්දය, භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිවු වණක් පිරිස් අනාගතයේ දී මේ ස්ථාන කරා එළඹෙන්නෝ ය."

මේ බුදුරජාණන් වහන්සේගේ වචන යි. උන් වහන්සේ එසේ වදළේ තමන් වහන්සේ නිතර ඇසුරු කළ ආනන්ද හිමියන්ට ය. බුදුරජාණන් වහන්සේ වදළ ඒ උසස් පූජනීය ස්ථාන හතර පිළිවෙලින් ලුම්බිණිය, බුද්ධගයාව, ඉසිපතනය හා කුසිනාරාව යි. කල් යත් යත් ම බුදුරජාණන් වහන්සේ පිළිබඳව වැදගත් වූ සැවත් නුවර, රජගහ නුවර වැනි ස්ථාන පූජනීය ස්ථාන ලැයිස්තුවට එක් විය. බුද්ධ පරිනිර්වාණයෙන් පසුව උන් වහන්සේගේ ධාතු නිදන් කොට සෑදූ චෛත්‍යයන් ද, මහ රහතන් වහන්සේලාගේ ධාතු නිදන් කොට සෑදූ චෛත්‍යයන් ද, ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ ශාඛා රෝපණයෙන් ඇති වූ පූජනීය ස්ථානයන් ද වශයෙන් දඹදිව පමණක් නොව, බුද්ධ ධර්මය ව්‍යාප්ත වූ වෙනත් රටවල ද නව නවත් පූජනීය ස්ථාන ඇති විය.

බුද්ධ පරිනිර්වාණයෙන් වර්ෂ දෙසීයකට පමණ පසු ධර්මාශෝක බෞද්ධ අධිරාජයා බුදුරජාණන් වහන්සේ විසින් ප්‍රසාද සංවේගයෙන් නැරඹිය යුතු යයි වදළ ස්ථාන හතරට ම ගොස් වැඳ පුදගත් බවටත් එම ස්ථානයන්හි ශිලාස්ථම්භයන් පිහිටුවා මත්තෙහි එන්නන්ට එම ස්ථාන හඳුනාගන්නට සැලැස් වූ බවටත් එතුමාගේ ම සෙල් ලිපි සාක්ෂි දරයි.

ලක්දිවට බුදුදහම පැමිණීමෙන් පසු අශෝක චක්‍රවර්තීන් අනුගමනය කළ බෞද්ධ රජවරු ද වන්දනා ගමන් යාම හෙවත් ධර්ම යාත්‍රාවේ යෙදීමටත්, පූජනීය ස්ථාන නඩත්තු කිරීමටත්, වන්දනාවේ යන්නන්ට සැප පහසුකම් ඇති කිරීමටත්, අමතක නොකළහ. එබැවින් කල් නොගොසින් ම වන්දනා ගමන් යාම භික්ෂු, භික්ෂුණී, උපාසක, උපාසිකා යන සිවු පිරිසගේ ම ජනප්‍රිය පිංකමක් බවට පත් විය.

**වන්දනා ගමනක වැදගත් කම.**

ගිහියන් කෙසේ වෙතත් චිත්ත ඒකාග්‍රතාව ලබා ගැනීමෙන් වහා විමුක්ති සුවය අත්පත් කර ගැනීමට බණ භාවනාවේ යෙදෙන භික්ෂූන් වහන්සේලා පවා වන්දනා ගමනක යෙදීමට වැඩි කැමැත්තක් දක්වූයේ මන්දැයි සොයා බැලිය යුතු වේ. යමෙකු සිද්ධස්ථාන වැඳ පුද ගැනීමට යන ගමනේ අතර මගදී මරණයට පත් වුවහොත් ඔහු දෙව් ලොවක උපදින බව බුදුරජාණන් වහන්සේ අනඳ හිමියන්ට වදළ බව මහා පරිනිබ්බාන සූත්‍රයේ සඳහන් ය.

පරලොව සුගතිය පිළිබඳ ව සැහෙන විශ්වාසයක් ඇති කර ගත හැකි බැවින් ද, එකාකාරි පැවිදි ජීවිතයේ දී විවිධත්වයක් ලබා ගැනීමේ අටියෙන් ද, බුදුරජාණන් වහන්සේ අනු දන වදළ චාරිත්‍රයක යෙදීමෙන් ස්වකීය ශ්‍රද්ධාව වැඩි දියුණු කර ගන්නා පිණිස ද ලංකාවේ භික්ෂූන් වහන්සේලා ද මෙරට පමණක් නොව දඹදිව සිද්ධස්ථාන වැඳ පුද ගැනීමට වන්දනාවේ යාම සිරිතක් කොට ගත්තේය'යි සිතිය හැකි ය.

පුරාණයේ දී පවා වන්දනා ගමන් ගියේ තනි තනි ව නොව නඩයක් වශයෙනි. මෙසේ නඩයක් වශයෙන් යාමේ දී තනි තනි ව යාමේදීට වඩා සතුටක් හා ආරක්ෂාවක් ලැබුණේ ය. මේ නඩයට දහ පහළොස් දෙනකු හෝ සමහර විට හැට හැත්තෑවක් හෝ ඇතුළත් විය හැක.

භික්ෂූන් වහන්සේලා ගේ වන්දනා නඩවලට බොහෝ විට ගුරු ගෝල භික්ෂූන් වහන්සේලාත් අසල්වැසි භික්ෂූන් වහන්සේලාත් ඇතුළත් වූහ. සමහර විට මේවාට ගිහියන් ද ඇතුළත් නුවූයේ නොවේ. පුරාණයේ දී දඹදිව ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඳ පුද ගැනීමට ගිය ගමන්වලට ගැහැණු පිරිමින් ද ඇතුළත් වූ බව සඳහන් ය.

වන්දනා ගමන්වල දී අමුතු දේවල් දැකීමට ලැබීමත්, පෙර හමු නුවූ පුද්ගලයන් හමුවීමත් නිසා භික්ෂූන් වහන්සේලාට අලුත් අත්දැකීම ද ලැබුණි. විශේෂයෙන් උගත් හාමුදුරු කෙනකුගේ නායකත්වය යටතේ ගමන් කිරීමට ලැබීම ලොකු වාසියක් විය. ඒ අතරමඟ දී විවිධ සාකච්ඡාවලට ඉඩ ලැබුණ බැවිනි. තම තමන්ගේ ආරාමවලට ඇලී සිටි භික්ෂූන්ට පැරණි වන්දනා ගමන් ඇවිදින පාසලක් බඳු වූයේය යි කියනු ලැබේ. එසේ ම වන්දනා ගමන ආරාමයට තිබෙන ඇල්මෙන් ටික කලකට මිදීමට හේතු විය. පැරණි බුද්ධ ශ්‍රාවකයන් වහන්සේලා වන්දනා චාරිකාවේ යෙදෙන ගමන් ම අතර මඟදී නවාතැන් ගන්නා ස්ථාන ආදියේ දී හමුවූ ජනයාට දහම් දෙසමින් අවවාද අනුශාසනා ද කළහ. සාමාන්‍යයෙන් එකල වන්දනා ගමන් අතර මග දී විවේක ගනිමින් හෙමිහිට යන ගමන් විය.

පැවිද්දකුගේ මෙන් ම බෞද්ධ ගිහියාගේ ජීවිතයේ ද නිරන්තරයෙන් පිළිපැදිය යුතු අඩ්ගය ශීලය යි. නිති පන්සිල් රකින ශ්‍රද්ධාවත් බෞද්ධයා පොහොය අටසිල් රකියි. ඔහුගේ දිනපතා ජීවිතයේ වන්දනාව ද ඇතුළත් ය. මේ වන්දනා කෙරෙන්නේ ස්වකීය නිවසේ දී විය හැකි ය. නැතහොත් ළඟම පිහිටි ගමේ පන්සලේ දී විය හැකි ය. දින ගණනකට හෝ සති ගණනකට හෝ මාස ගණනකට හෝ නිවෙසින් බැහැරව ඈත සිද්ධස්ථානයකට ගියත් ඔහු අතින් වන්දනාව වශයෙන් සිදුවන්නේ දිනපතා ජීවිතයේ දී කෙරෙන හෝ කළ යුතු වැඩ කොටසකි. එසේ නම් ගිහියා ඈත වන්දනාවේ යෑමේ අරමුණ කුමක් ද?

ගෙදර සිටින ගිහියා චාරිත්‍රමය වශයෙන් නිතර වන්දනාවේ යෙදීමට ඉඩ සලසා ගත්තත් ඔහු ජීවත් වන්නේ ගිහි ජීවිතය පිළිබඳ ගැටළු රාශියකට පටලැවීමෙනි. පැවිද්දකු මෙන් නොව ඔහු සංසාර ගමනේ දී උසුලාගෙන යන පොදි බර වැඩි ය. දරුමල්ලන්ට, දෙමවුපියන්ට අසල් වැසියන්ට ඔහුගේ බැඳීම් වැඩි ය. ඔහුගේ උවමනාකම් ගණන වැඩි ය. දින ගණනකට, සති ගණනකට ගෙදරින් ඉවත් ව ඈත වන්දනා ගමනකට ඔහුට යෑමට ලැබෙන්නේ නම් තාවකාලිකව හෝ ඔහු උසුලාගෙන සිටින බර ස්වල්පයක් හෝ බිම තබන්නට හැකිවේ. අන්‍යයන් හා ඇති බැඳීම් ස්වල්ප කලකට හෝ නවත්වන්නට ඉඩ ලැබේ. උවමනාකම් ගණන ඉතා ම පහළ මට්ටමකට අඩු කොට අල්පේච්ඡ ජීවිතයක් ඉතා ම ටික කලකට හෝ ගත කිරීමට ඔහුට ඉඩ ලැබෙනු ඇත. වන්දනා ගමන එක්තරා තරමක සංචාරක තවුස් ජීවිතයක් බඳු වෙයි. පෙහෙවස් සමාදන් වීමද දිනකට හෝ ගිහියා කරන අභිනිෂ්ක්‍රමණයකි. එහෙත් සියලු ම ගිහියන් පෙහෙවස් සමාදන් වන බවක් නොපෙනේ. නමුත් පෙහෙවස් සමාදන් නොවන ගිහියා පවා වන්දනා ගමනකට කැමැත්තක් දක්වයි. වන්දනා ගමන, පෙහෙවස් සමාදන්වීම තරමට ගිහි ජීවිතයෙන් ඈත් වීමක් නොවූවත් එයද තාවකාලික ලෙස ගිහි ගෙයින් දුරස්ථ වීමක් ලෙස සැලකිය හැකි ය.

වන්දනා ගමන්වල යෙදෙන ගිහියෝ සමහර අවස්ථාවල දී ස්වකීය නඩයට භික්ෂූන් වහන්සේ නමක් හෝ කීපනමක් ද ඇතුළත් කර ගනිති. එසේ වූ කල ගමන තුළ දී උන් වහන්සේලාට උවටැන් කිරීමෙන් ද පින් රැස්කර ගත හැකි ය. අල්පේච්ඡතාව, පරාර්ථකාමීත්වය, ගිලානෝපස්ථානය වැනි උසස් බෞද්ධ ගුණධර්ම වර්ධනය කර ගැනීමට ද වන්දනා ගමනක දී ලැබෙන ඉඩකඩ බොහෝ ය.

**පොහොය හා වන්දනා සිද්ධස්ථාන.**

ගමේ පන්සලට යාම වන්දනා ගමනක් ලෙස සලකනු නො ලැබේ. කල්තියා සූදනම් වී, දිනක දී හෝ දින ගණනක දී ආපසු ඒමේ බලාපොරොත්තුවෙන් ගමෙන් පිට සිද්ධස්ථානයකට ගොස් වැඳුම් පිදුම් කිරීමේ බලාපොරොත්තුවෙන් යොදා ගන්නා ගමන වන්දනා ගමනක් ලෙස සලකනු ලැබේ. දිවයිනේ සමහර සිද්ධස්ථානවලට වන්දනාවේ යාම සඳහා සුදුසු යයි පිළිගත් කාල පරිච්ඡේද ජනප්‍රවාදයෙහි මෙන් ම සමහර ඓතිහාසික විස්තර වල ද ඇතුළත් වෙයි. මේ කාලපරිච්ඡේද බොහෝ විට පසළොස්වක් පොහොය දින හා සම්බන්ධ වෙයි. සම්මත පොහොය දිනයන් ඇසුරු කරගෙන වන්දනා ගමන් යාම සාමාන්‍ය චාරිත්‍රය යි.

බෞද්ධයන් වැඩි වශයෙන් පින්කම් යොදා ගන්නේ පොහෝ දිනවල ය. මෙකල පසළොස්වක පොහොය දිනය පමණක් රජයේ

නිවාඩු දිනය වුවත් සතර පොහොය ම ගැමියන්ට නිවාඩු දින වෙයි. බොහෝ අවස්ථාවල දී අදාළ පොහොය දිනයේ දී හෝ ඊට පෙර දිනයේ දී බලාපොරොත්තු වන සිද්ධස්ථානයට පැමිණීමට හැකි වන පරිද්දෙන් වන්දනා ගමන සංවිධානය කරගනු ලැබේ. වන්දනාවේ යන සමහර කෙනෙක් පොහොය දිනයේ දී එම විශේෂ සිද්ධස්ථානයේ දී අටසිල් සමාදන් වීමට ද බලාපොරොත්තු වෙති. එබැවින් එක් එක් පොහොයෙහි ඇති වැදගත්කමත් ඒ ඒ පොහොය හා සම්බන්ධ කොට සිරිතක් වශයෙන් වන්දනාවේ යනු ලබන ස්ද්ධස්ථානත් මෙහි දී විමසා බැලීම වටී.

**වෙසක් පෝය (අප්‍රේල්-මැයි)**

වෙසක් පෝය දින ලෝක බෞද්ධයන්ට ම අති ශ්‍රේෂ්ඨ දිනය යි. තථාගතයන් වහන්සේ පිළිබඳව ලුම්බිනියෙහි සිද්ධාර්ථ කුමාරෝත්පත්ති යත්, බුද්ධ ගයාවේ දී අභිසම්බෝධියත්, කුසිනාරාහිදී පරිනිර්වාණයත්, යන ත්‍රිවිධ මංගලයය සිදු වූයේ වෙසක් පොහෝ දිනයේ දී ය. එසේ ම සිද්ධාර්ථ ගෞතමයන් වහන්සේ කිඹුල්වත් නුවර දී නම පියාණන් ඇතුළු නෑදැයින්ට යමා මහ පෙළහර පෑවේත්, වෙසක් පොහෝ දිනයේදී ය'යි කියනු ලැබේ. බුද්ධත්වයෙන් අටවෙනි වර්ෂයේ දී වෙසක් පුරපසලොස්වක් දින බුදුන් වහන්සේ තුන්වෙනි වරට මෙම ශ්‍රී ලංකාද්වීපයට වැඩම කොට සමනල කන්ද (ශ්‍රීපාද ස්ථානය) හා කැළණිය පූජනීය ස්ථාන බවට පත් කිරීම ලාංකික බෞද්ධයින්ට වැදගත් වෙයි. අපේ වංශ කථා අනුව සිංහල ජාතිය ආරම්භ කළ විජය කුමාරයා ලක්දිවට ගොඩ බටුයේත් බුද්ධ පරිනිර්වාණය සිදු වූ වෙසක් පොහෝ දිනයේ දී ය යන්න පිළිගනිතොත් එය සිංහලයන්ට ජාතික වශයෙනුත් වැදගත් වෙයි.

වෙසක් පොහෝ දිනයෙහි සැදැහැවතුන් නොයෙක් සිද්ධස්ථාන කරා වන්දනා යතත්, වැඩි වශයෙන් ඔවුහු කැළණියට හා අනුරාධපුරයට ගොස් සිල් සමාදන් වීමට කැමති වෙති. බෞද්ධයින්ගේ ශ්‍රේෂ්ඨතම වන්දනාව වූ, සිරිපා වැඳුමෙහි යෙදෙන අවසාන පොහොය වන්නේත් වෙසක් පොහොය යි.

**පොසොන් පොහොය (මැයි-ජූනි)**

අනුබුදු මහින්ද මහ රහතන් වහන්සේ ප්‍රමුඛ ධර්මදූත කණ්ඩායම දඹදිවින් මිහින්තලයට වැඩ දෙවනපෑතිස් රජ ප්‍රධාන ලක්වැසියන් බෞද්ධෝපාසකයන් බවට පත් කෙළේ පොසොන් පසළොස්වක පොහෝ දිනදී ය. ලක්දිව බුදු සසුන් පිහිටුවා වදළ මහින්ද මහරහතන් වහන්සේ බොහෝ කලක් වැඩ සිටියාවූත්, පරිනිර්වාණයෙන් පසු උන් වහන්සේගේ ධාතු නිදන්කොට චෛත්‍ය කීපයක් ගොඩ නංවනු ලැබුවා-

වූත් මිහින්තලය සිංහල බෞද්ධ සංස්කෘතියේ කේන්ද්‍රස්ථානය යි. එසේ ම බුද්ධ ශාසනය පිහිටුවීමෙන් පසු ව ශිෂ්ට ලෝකයා මවිතයට පත් කරමින් පැන නැංගා වූ අනුරාධපුර ශ්‍රී විභූතිය විදහාපාන ස්මාරක අදත් එහි වෙයි. එබැවින් පොසොන් මස තුළ සැදැහැවත් බෞද්ධයන් ගේ වන්දනා ක්ෂේත්‍රය වනුයේ මිහින්තලය හා අනුරාධපුරය යි. අනුරාධපුරයේ වන්දනාවේ යෙදෙන්නකුට හමුවන වැදගත් සිද්ධස්ථාන කීපයක් මෙසේ ය. මේ ස්ථාන වැඳ පුද ගැනීම අනුරාධපුරයේ වන්දනාවේ යන්නන්ගේ සිරිතකි.

1. ථූපාරාමය

බුදුරදුන්ගේ අකු ධාතුව නිදන් කොට දෙවනපෑතිස් රජු විසින් කරවන ලද මෙය ලක්දිව ප්‍රථම ඓතිහාසික චෛත්‍යය යි

2. රුවන්වැලි සෑය

දුටුගැමුණු (ක්‍රි.පූර්ව 137 – 61) රජතුමන් විසින් ගොඩ නඟන ලද මෙහි නිදන්කොට ඇත්තේ පළමුවෙන් රාම ග්‍රාමයේ කෝලිය රජදරුවන් විසින් ගරු බුහුමන් කරනු ලැබූ සර්වඥ ධාතූන් වහන්සේලා ය. මෙය පැරණි මහා විහාරයේ ස්තූපය යි.

3. ශ්‍රී මහා බෝධීන් වහන්සේ

බුද්ධගයාවේ දී බුද්ධත්වය ලැබීමේ දී බුදුන් වහන්සේ පිටදුන් ශ්‍රී මහා බෝධීන් වහන්සේගේ දකුණු ශාඛාවක් වූ මෙය ලක්දිවට වැඩමවන ලද්දේ සංඝමිත්තා තෙරණින් වහන්සේ විසිනි. ලොව පැරණි ම වෘක්ෂයක් වූ මෙය මහා විහාරයට අයත් බෝධීන් වහන්සේ ය.

4. මිරිසවැටි දගැබ

සංඝයා වහන්සේලාට දන් නොදී කෑවා වූ මිරිස් ව්‍යඤ්ජනයක් සිහිවීමට දුටුගැමුණු රජතුමා විසින් කරවන ලද ස්තූපයකි.

5. අභයගිරිය

වළගම්බා (ක්‍රි. පූර්ව 89 – 77) රජතුමන් විසින් කරවන ලද මෙම ස්තූපය රුවන්වැලි සෑයට ද වඩා විශාල වෙයි. පැරණි අභයගිරි විහාරයේ ස්තූපය යි.

6. ජේතවනාරාමය

මහසෙන් (ක්‍රි.ව. 274 – 301) රජතුමන් විසින් කරවනු ලැබූ මෙය අනුරාධපුරයේ විශාලතම දගැබ යි. බුදුරදුන්ගේ පටිධාතුව හා කේස ධාතු මෙහි නිදන් කොට තිබේය'යි කියනු ලැබේ.

7. මිහින්තලේ සේල චෛත්‍යය

බුදුන් වහන්සේ ලක්දිව පැමිණි අවස්ථාවක දී පූජනීයත්වයට පත් කළ ස්ථානයක මේ දගැබ ගොඩනගා ඇත්තේ ය.

8. මිහින්තලේ අම්බස්ථල චෛත්‍යය

මහින්ද මහ රහතන් වහන්සේගේ ධාතු නිදන් කොට මහා දඨික මහා නාග (ක්‍රි.ව. 7 – 19) රජු විසින් කරවන ලද්දකි.

9. ලෝහ ප්‍රාසාදය

දුටුගැමුණු රජු විසින් ඉදි කරන ලද මහා විහාරයට අයත් උපෝස්ථාගාරය යි.

**ඇසළ පසළොස්වක පෝය (ජුනි-ජුලි)**

මෙය ආගමික උත්සවවලට කැප වූ වැදගත් ම පෝය යි. බුද්ධ චරිතයේ වැදගත් සිදුවීම් කීපයක් ම මේ දිනය හා සම්බන්ධ ය. එනම් සිදුහත් කුමරු මව් කුස පිළිසිඳ ගැනීම, මහාභිනිෂ්ක්‍රමණය කිරීම හා ධම්මචක්කප්පවත්තන සූත්‍රය දේශනා කිරීම යනු යි. වස් සමාදන් වීම ආරම්භවන්නේත් මේ මාසයේ ය. මහනුවර දළදා පෙරහර පවත්වන්නේ මේ මාසය තුළ ය. ඇසළ මාසය තුළ බෞද්ධයන් චාරිත්‍රයක් වශයෙන් වැඩිපුර වන්දනාවේ යන්නේ මහනුවර දළදා වහන්සේ වැඳ පුද ගැනීමට ය.

**නිකිණි පසළොස්වක පෝය (ජුලි – අගෝස්තු)**

රජගහ නුවර ප්‍රථම ධර්ම සඞගායනාව ආරම්භ වූයේ නිකිණි පුර පසළොස්වක දිනක දී ය. මෙම පෝයට සේරුවිල මංගල චෛත්‍යය වැඳීමට යාම වන්දනා කරුවන්ගේ සිරිතකි. බුදුරජාණන් වහන්සේගේ ලලාට ධාතුව හා කේස ධාතුව මෙහි නිදන් කර තිබේ ය යි කියනු ලැබේ.

**බිනර පසළොස්වක පෝය (අගෝස්තු – සැප්තැම්බර්)**

මෙය වන්දනා කරුවන් මහියඞගන චෛත්‍ය රාජයා වැඳීමට යන කාලය යි. මහියඞගනය බුදුරජුන්ගේ ප්‍රථම ලංකා ගමනින් පවිත්‍ර වූ ස්ථානයකි. බුදු රජුන්ගේ ප්‍රථම ගමනේ දී කේස ධාතු ලබාගත් සුමන දිව්‍ය රාජයා එම කේස ධාතු නිදන් කොට සත්රියන් උසැති චෛත්‍යයක් මෙහි කළ බව මහාවංශය කිය යි. ඉක්බිති සරභූ තෙරුන් වහන්සේ බුදුන් වහන්සේ ගේ උරහිස් ධාතුව නිධන් කොට මෙම චෛත්‍යය දෙළොස් රියන් කොට නැවත බැඳ වූ බවත්, දේවානම්පියතිස්ස රජුගේ සොහොවුරු උද්ද චූලාභය විසින් තිස් රියන් කොට නැවතත් බැඳ වූ බවත්, දුටුගැමුණු රජු විසින් එය අසූරියන් කොට තවත්

විශාල් කළ බවත් මහාවංශයේ සඳහන් ය. බිනර පුර පසළොස්වක දින මහියඞ්ගනයේ විශේෂ දර්ශනයක් නම් වැදි පෙරහැර යි.

**වප් පසළොස්වක පෝය (සැප්. – ඔක්තෝබර්)**

මෙම පෝය දිනය හා සම්බන්ධ වැදගත් සිද්ධියක් නම් ශ්‍රී මහා බෝධි ශාඛාවක් ඉල්ලා අරිට්ඨ කුමරු දඹදිව පිටත්ව යාමයි. මෙම පෝය දිවයිනේ විශේෂ සිද්ධස්ථානයක් හා සම්බන්ධ නුවූවත් දිවයිනේ බොහෝ පන්සල්වල වස් අවසානයේ කඨින චීවර පූජා ආරම්භවන බැවින් වැදගත් කොට සලකනු ලැබේ.

**ඉල් පසළොස්වක පෝය (ඔක්තෝබර් – නොවැම්බර්)**

මෙය සැරියුත් තෙරුන් පිරිනිවන් පෑ දිනය ලෙස සලකනු ලැබේ. දිවයිනේ වස් පිංකම් කෙරෙන කාලය යි. කඨින චීවරය පූජා කළ හැකි අන්තිම පෝය මෙය ලෙස සලකනු ලැබේ. විශේෂ වන්දනා ස්ථානයක් හා සම්බන්ධ බවක් නො පෙනේ.

**උඳුවප් පසළොස්වක පෝය (නොවැම්බර් – දෙසැම්බර්)**

සංඝමිත්තා තෙරණිය ශ්‍රී මහා බෝධීන් වහන්සේ රැගෙන ලක්දිව වැඩියේ මෙදින යි. ශ්‍රී මහා බෝධීන් වහන්සේ අනුරාධපුර මහමෙව්නා උයනේ රෝපණය කරන ලදුව අද දක්වා නිරුපද්‍රිතව වැඩ සිටින සේක. ලක්දිව මෙහෙණි සසුන පිහිටුවීම නිසා ද මෙම පෝය වැදගත් වෙයි. වන්දනාකරුවන් මෙම පෝයේ දී වැඩි වශයෙන් අනුරාධපුරයේ වන්දනාවේ යාම සිරිතකි.

**දුරුතු පසළොස්වක පෝය (දෙසැම්බර් – ජනවාරි)**

බුදුරජාණන් වහන්සේ ගේ ප්‍රථම ලංකා ගමනය සිදු වූයේ මෙදින ය. කැළණි රජමහා විහාරයේ වාර්ෂික පෙරහැර ආරම්භ කරන්නේ දුරුතු මාසයේ දී ය. බුදුන් වහන්සේගේ තුන්වෙනි ලංකා ගමනයෙන් පවිත්‍ර වූ කැළණිය සොළොස්මස්ථාන වලින් එකකි. බුදුරදුන්ට චූලෝදර – මහෝදර නා රජුන් පරිත්‍යාග කළ මැණික් පුටුව කැළණි චෛත්‍යයේ නිදන් කොට තිබේ යයි කියනු ලැබේ. වන්දනාකරුවන් කැළණිය කොයිතරම උසස් කොට සලකන ලද්දේ ද යන්න,

"උපන් ද සිට කරපු පව් නැත වරක් වැන්දෙත් කැළණියේ" යන ජන කවියෙන් පැහැදිලි වේ.

සිරිපා වන්දනා ගමන් ආරම්භ වන්නේත් දුරුතු පසළොස්වක පොහොයෙන් පසුවයි. දුරුතු සිට වෙසක් දක්වා සිරිපා වන්දනා සමයයි.

**නවම් පසළොස්වක් පෝය (ජනවාරි - පෙබරවාරි)**

බුදුරජාණන් වහන්සේ විසින් අග්‍රශ්‍රාවකයන් දෙනම පත්කර ගන්නා ලද්දේ මෙම පෝය දිනයේ දී ය. විශේෂ වන්දනා ස්ථානයක් හා මෙම පෝය සම්බන්ධ නොවේ.

**මැදින් පසළොස්වක් (පෙබරවාරි - මාර්තු) පෝය**

බුද්ධත්වයෙන් පසු බුදුන් වහන්සේ පළමු වරට ස්වකීය නෑයන් බැලීම සඳහා කිඹුල්වත් පුරට වැඩියේ මේ දිනයේ දී ය. මෙ ගමනට ආරාධනය කළ කාලුදායී තෙරුන් විසින් කළ ගමන් විස්තර වර්ණනයක් ථේරගාථාවල එයි. වන්දනාකරුවන් සිරිපා වැඳුමට වැඩියෙන් ම යන්නේ මේ මාසය තුළ දී ය.

**බක් පසළොස්වක් (මාර්තු - අප්‍රේල්) පෝය**

දෙවන වර ලක්දිවට වැඩි බුදුරජාණන් වහන්සේ මෙදින දී නාග-දීපයට වැඩි සේක. සොළොස්මස්ථානයන්ගෙන් එකක් වූ නාගදීප චෛත්‍යය මේ ගමන සිහිකරයි. යාපන අර්ධද්වීපයෙන් එහා සාගරය මැද දූපතක පිහිටි මේ චෛත්‍යය වැඳීමට යාමට මේ කාලය සුදුසු වන්නේ මුහුද නිශ්චල වන බැවිනි. සමුද්‍ර තරණයක් ද කිරීමට සිදුවන මේ වන්දනා ගමනට වන්දනාකරුවන් මේ මාසයේ දී සම්බන්ධ වන්නේ අලුත් අත්දැකීමක් ද ලබාගන්නා බලවත් සතුටකිනි.

**වන්දනා ගමනට සූදානම්වීම හා සම්බන්ධ චාරිත්‍ර.**

ඈත වන්දනා ගමනක් යාමේ දී වන්දනා කරුවා කල්තියා සූදානම් වෙයි. ගමන යන දිනයේ උදයේ හෝ ඊට පෙර දිනයේ ජලස්නානය කොට පවිත්‍ර වීම ඉතා වැදගත් කොට සලකනු ලැබේ. ගමේ පන්සලේ වන්දනාවට ගියත්, නිවසේ බුදු ගෙයට වැඳීමට ගියත් පළමුකොට අඩු තරමේ මුහුණ කට සෝදා පවිත්‍ර වීම බෞද්ධයාගේ සිරිත ය.

ඈත වන්දනා ගමනක් යන විට පළමු දිනයේ ගමේ පන්සලට ගොස් මල් පහන් පුදා, සමහර විට දෙවියන්ට පඬුරක් ද බැඳ වන්දනා ගමන ගොස් නිරුපද්‍රිතව ආපසු ඒමට ලැබේවා යන ප්‍රාර්ථනය කිරීම ද අපේ පැරණි වන්දනාකරුවන්ගේ සිරිත ය.

වන්දනා ගමනේ දී තමාගේ පෞද්ගලික පරිහරණයට අවශ්‍ය ඇඳුමක් දෙකක් ද, පිඟානක්, කෝප්පයක් වැනි අත්‍යාවශ්‍ය දේ ද බෑගය-කට හෝ මල්ලකට සූදානම් කරගැනීම සිරිත ය. කණ්ඩායමක් යන විට දී මහදී ආහාර පිස ගැනීමට අවශ්‍ය වළං, හාල්, එළවළු ආදිය පොදුවේ රැස්කර ගෙන වාහනයේ තැන්පත් කර- ගනු ලැබේ. මස් හා බිත්තර වන්දනා ගමන්වල දී පාවිච්චි නොකිරීම සාමාන්‍ය සිරිත ය.

එහෙත් කරවල පාවිච්චි කිරීමට බාධාවක් නොමැත. දිනක, දෙකක වන්දනා ගමනකට නම් පිළියෙල කරගත් ආහාර මුළක්ද, රසකැවිලි ආදියද එක් එක් නිවෙසින් ගමනට සහභාගී වන අයට සෑහෙන සේ පිළියෙල කරගනු ලැබේ. කණ්ඩායමක් වශයෙන් දින ගණනක් ගත වන වන්දනා ගමනක දී අතරමග දී නම් පාවිච්චි කිරීමට එක් එක්කෙනා විසින් මුළු කණ්ඩායමට ම සෑහෙන පරිද්දෙන් අග්ගලා, අලුවා, තල-කැරලි, දෝසි ආදී කල්තබා ගත හැකි රසකැවිලි පාර්සලයක් ද සකස් කර ගැනීම සිරිතකි. වන්දනා ගමනක දී, බෙද හද ගෙන කෑමට කවුරුත් ඉතා කැමැත්තක් දක්වති.

වන්දනාවට අවශ්‍ය තෙල්, මල්, සුවඳ කූරු, කපුරු පහන්වැටි ආදිය රැගෙන යාමට අමතක නොකරති. එසේ ම බුද්ධ පූජා ආදියට අවශ්‍ය කැවිලි, පළතුරු ආදිය වෙන ම තැන්පත් කර ගනු ලැබේ. කහදියරෙන් සෝද පවිත්‍ර කරන ලද හෝ දෙහි කැබැල්ලක අතුල්ලන ලද හෝ කාසි සුදු රෙදි කැබැල්ලක ගැටගසා සිද්ධස්ථානවලට පූජා කිරීමට ගෙන යාම ගැමියන්ගේ සිරිත ය. බොහෝ විට මේවා පූජා කරනු ලබන්නේ සිද්ධස්ථානවල පිහිටි දේවාලවලට ය. වන්දනා ගමන් වල දී මත්පැන් පාවිච්චි නොකිරීමට කවුරුත් වග බලා ගනිති. හදිසි අසනීපයක දී අවශ්‍ය වන තෙල් බෙහෙත් ගුලි ආදී යමක් රැගෙන යාමට ද අමතක කරනු නො ලැබේ. මූලික අවශ්‍යතා පමණක් සපුරා-ගෙන, ඉතා චාම් ජීවිතයක් ගතකිරීම වන්දනා කාලය තුළ දී බලා-පොරොත්තු වන බැවින් හැකිතරම් දුරට තමන්ගේ ගමන් මල්ලේ බර අඩුකර ගැනීමට වන්දනාකරුවෝ මතක තබාගනිති. වන්දනාවේ යන භික්ෂූන් වහන්සේ නමක් ගෙනයන දේවලට ඇතුළත් වූයේ තුන් සිවුර, පාත්‍රය, පෙරහන්කඩ, තෙල් පාත්‍රයක්, සෙරප්පු කුට්ටමක්, සෙරෙප්පු පාවිච්චි නොකරනවිට දැමීම සඳහා උරයක්, වටාපතක් හා ඇතැම්විට කුඩයක් හා හැරමිටියක් ද බව විසුද්ධි මග්ගයේ සඳහන් වේ. මේ හැරෙන්නට ගෙන ගිය තවත් කුඩා උපකරණ නම් ගිනි ඇවිලීමේ උපකරණ, අල්පෙනෙත්ති කටු, කතුරක්, නිය කැපීමට පිහියක් හා ඉඳිකටු නූල් ය. පුරාණයේ දී වන්දනා ගමන් ගියේ පයින් බැවින් ඈත වන්දනා ගමනකට මාස ගණනක් ගතවෙන බැවින් භික්ෂු-වකගේ ජීවිතයේ දී පාවිච්චි කරන සාමාන්‍ය දේවල් ගමනට ද ගෙන යාමට සිදු වූ බව මෙයින් පෙනේ.

**ගමනාරම්භය.**

වන්දනා ගමන ආරම්භයේ දී සියලු දෙනා ම එකතු වී පන්සිල් සමාදන් වී දෙවියනට පින් දී වාහනයට නැඟීම සිරිත ය. වාහනයේ ඉදිරිපස පුවක් මලක් බැඳීම හෝ බෞද්ධ කොඩියක් බැඳීම ද සිරිතකි. වන්දනාවේ යන සැදැහැවත් බෞද්ධයෝ වාහනයේ වාඩිවී සාමූහික ව

තුන්සරණයේ කවි කියති. (තුන් සරණය ගැන විස්තරයක් මෙම පොතේ පරිච්ඡේද 12 . 6 යටතේ එයි.)

ගමන් පහසුකම් මෙතරම් හොඳින් නොතිබුණු කාලයේ දී, එනම් මීට වසර හැට හැත්තෑවකට ඉහත දී මිනිසුන් ඈත වන්දනාවේ ගියේ ගොන් බැඳි ගැල් වලිනි. ගමන් බඩු සියල්ල ගැලේ පටවා ගෙන ගැල ඉදිරියෙන් ගමන් කරද්දී වන්දනා කණ්ඩායම තුන්සරණය කියමින් ගැල පසු පස ගමන් කරති. ගෙල වටා ගෙජ්ජි බැඳි ගොනා කිංකිණි හඬ නංවමින් සන්සුන් තාලයකට ගමන් කරද්දී ඔහු පිටු පස ඇදෙන යුවක් මලින් සැරසුණු කරත්තය ද පැද්දෙමින් එයින් නික්මෙන රෝද හඬට කරත්තයේ එල්වන ලද මිණි ගෙඩි හඬ එකතු කරයි. තුන්සරණය කියමින් ද, වරින් වර සාදුකාර දෙමින් ද එක් එක් කරත්තය පිටිපස ගමන් කරන වන්දනා කණ්ඩායම් සහිත කරත්ත පෙළවල් මීට අඩසිය වසකට පමණ පෙර අනුරාධපුර පොසොන් වන්දනා සමයේ දී දක්නට ලැබෙන සුලභ දර්ශනයන් ය.

හිරු නැග මධ්‍යාහ්නය ළඟා වෙද්දී ජල පහසුකම් ඇති, සෙවන ඇති තැනක ගැල් නවතා දිවා ආහාරය පිළියෙල කර, කවුරුත් ජල-ස්නානය කොට දිවා ආහාරය ගෙන, විවේකයකින් පසුව, හිරු රශ්මිය අඩු වූ විට නැවත ගමන් ඇරඹීම එකල සිරිත විය. මේ වන්දනා ජීවිතයේ දී දයාව, කරුණාව, පරාර්ථකාමිත්වය, සමානාත්මතාව වැනි මහගු බෞද්ධ ගුණධර්ම වන්දනාකරුවන් අතර කැපී පෙණිනි. ගැල අදින ගොනා පවා හොඳින් නාවා, කවා පොවා, ඌට විවේක දී සැලකුම් කිරීමට මෙහි දී ගැල්කරුවෝ අමතක නොකළහ. නියම සත්ව කරුණාව ප්‍රායෝගිකව මෙහි දී ක්‍රියාවට නැගුණි.

මෙකල වන්දනා කරුවන්ට ලැඟුම් ගැනීමට ප්‍රසිද්ධ ස්ථානවල විශ්‍රාම ශාලා පිහිටුවා ඇත. වන්දනා කාලවල දී විශ්‍රාම ශාලා ජනාකීර්ණ වුව ද, තමන් නාඳුනන අය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට තරම් බෞද්ධ වන්දනා කරුවෝ ඉවසිලිවන්ත වෙති.

**සිරිපා වන්දනා ගමන පිළිබඳ විශේෂ චාරිත්‍ර.**

ඉතා පුරාණයේ පටන් සිරිපා වැඳීමට සමනළ කඳු නැගීම සිංහල බෞද්ධයන්ගේ සිරිතක් ව පැවතිණ. 11 වන සියවසේ දී 1 විජයබා රජ සිරිපා කඳු මුදුනට නඟින මාර්ගය ප්‍රතිසංස්කරණය කළ බවත්, වන්දනා කරුවන්ට පහසුකම් සැලසූ වගත් වංශකථා වලින් හා ශෙල්-ලිපි වලින් ප්‍රකාශ වෙයි. මහ පැරකුම්බා නිශ්ශංක මල්ල හා කීර්ති ශ්‍රී රාජසිංහ යන රජවරුන්ගේ සිරිපා වන්දනා ගමන් පිළිබඳවද චූල-වංශයේ සඳහන් වෙයි.

සිරිපා වන්දනා ගමන කොතරම් දුෂ්කර වූයේ ද යත් මේ ශත වර්ෂයේ මුල් කාර්තුවේ දී පවා සමහරුන් මෙම වන්දනා ගමනට සහභාගී වූයේ තමන්ගේ අන්තිම කැමති පත්‍ර ලියා තැබ්මෙන් පසුව බව කියනු ලැබේ. සාමාන්‍යයෙන් මෙම වන්දනා ගමනේ යෙදෙන්නේ ලොකු කණ්ඩායම් වශයෙනි. වන්දනා කණ්ඩායම හෙවත් නඩයේ නායකයා වනුයේ පළපුරුදු වන්දනා කරුවෙකි. කෝඩුකාරයන් නමින් හඳුන්වනු ලබන මුල් වරට මෙම වන්දනා ගමනෙහි යෙදෙන්නන්, නඩේ ගුරාගේ විශේෂ ආරක්ෂාවට හා පාලනයට යටත් විය යුතුවෙයි.

වන්දනාවේ යාමට පෙර දින වන්දනාකරුවන් ගමේ පන්සලට ගොස් වන්දනා මානකොට ශ්‍රී පාදයට වන්දනාවේ ගොස් ආපසු කරදරයක් නොමැතිව නිවෙස් කරා පැමිණීමට ප්‍රාර්ථනා කිරීම සාමාන්‍ය සිරිතකි. සමහරු පැමිණි පසු ඔප්පු කිරීමට සුමන සමන් දෙවියන්ට බාරයක් ද වෙති.

ගමන ආරම්භ කරන්නේ රාත්‍රි කාලයේ දී කන්ද නැග අලුයම් කාලයේ කඳු මුදුනට නැගීමට හැකිවන පරිද්දෙන් ගමන සැලසුම් කර ගෙනයි. කට වරද්ද නොගැනීමට කවුරුත් උත්සාහ කිරීම විශේෂ ලක්ෂණයකි. එබැවින් සිරිතක් වශයෙන් ම අනවශ්‍ය ප්‍රශ්න නොනැගීමටත්, නඩේ ගුරුගේ උපදෙස් පිළිපැදීමටත් අඩු තරමේ අනවශ්‍ය විහිලු තහලු නොකිරීමටත් කවුරුත් වග බලාගනිති. කට වරද්ද ගැනීමට හා අසංවරකමට දෙවියන්ගෙන් බරපතල දඬුවම් ලැබේ යනු බොහෝ දෙනෙකුගේ විශ්වාසය යි.

කඳු නගින වන්දනා කරුවෝ ඉතා කරුණාවන්ත වෙති. එසේ ම ඉවසනසුළු වෙති. කොයිතරම් මාර්ගය තද බද වුවත් කිසිවෙකුටත් ගැහැටක් නො වන සේ වග බලා ගනිති. හැම දෙනකුගේ ම කටේ රැඳෙන්නේ 'කරුණාවයි,' 'කරුණාවයි' යන වචනය යි.

සීත ගඟුල නම් ස්ථානයේ දී කවුරුත් ස්නානය කොට, පිරුවට (අළුත් ඇඳුම්) ඇඳ, පඬුරු බැඳ සීඝ්‍ර බැවුම සහිත කන්ද නැගීම ආරම්භ කරති. තුන් සරණය, හිමගත වර්ණනාව, සමන් දෙවි වරුණ වැනි පොත් වලින් පද්‍ය ගායන කරමින් ගමන් කිරීම ද සිරිත ය. මේ කවි ගයන්නේ නඩයේ හොඳින් ගායනා කළ හැකි උවසුවකුගේ හෝ උවැසියකගේ ගායනය අනුකරණය කිරීමෙනි. ඉහළ නගින කණ්ඩායම් වලට පහළ බසින කණ්ඩායම් ද හමුවේ. මෙබඳු අවස්ථාවල දී ''වඩින්ට යන මේ නඩේට සුමන සමන් දෙවි පිහිටයි'' යනුවෙන් පහළ බසින්නෝ ආශීර්වාද කරති. එවිට ''නැගල බහින මේ නඩේට සුමන සමන් දෙවි පිහිටයි'' යනුවෙන් ඉහළ නගින කණ්ඩායම් පිළිතුරු සපයති.

බුදුරජාණන් වහන්සේ තම සිවුරු මැසූ ස්ථානය යයි ජනප්‍රවාදයේ එන කථාව අනුව ගෙත්තම් පාත නමින් හැඳින්වෙන ස්ථානයේ දී ඉඳිකටු නූල් පූජා කිරීම ද චාරිත්‍රයකි. කඳු මුදුනට නඟිද්දී සීතලය අධික වෙයි. එසේ වුවත් වන්දනා කරුවන්ගේ මුවින් පිටවන සාධු නාදයේ නම් කිසිම අඩුවක් නො වෙයි.

කඳුමුදුනට පැමිණෙන සැදැහැවත්තු නිරුපද්‍රිතව එහි පැමිණීම ලොකු ජයග්‍රහණයකැ'යි සිතමින් සිරිපා පද්මය සිත් සේ වැඳ පුද ගනිති. ඉන්පසු ඔවුහු ඉර සේවය හෙවත් හිරු උදාවීම නැරඹීමට ඉවසිල්ලෙන් බලා සිටිති. මෙය ඉතාමත් අසිරිමත් දර්ශනයකි. සමහරු මෙම දර්ශනය බුදුරජාණන් වහන්සේගේ සිරිපා පද්මයට හිරු දෙවියන් ගේ ප්‍රණාමය යයි විශ්වාස කරති.

සිරිපා වැඳීමට පැමිණි වාර ගණන අනුව එහි ඇති ඝණ්ඨාව නාද කිරීම ද සමහරුන් ගේ සිරිතකි. හිරු සේවය නැරඹූ වන්දනා කරුවෝ තුටු සිතින් පහළට බැසීම ආරම්භ කරති.

**බෞද්ධ සිද්ධස්ථානයක දී වන්දනාවේ දී අනුගමනය කරන චාරිත්‍ර.**

ඒ ඒ සිද්ධස්ථානවලට පැමිණි පසු වන්දනා කරුවෝ චාරිත්‍රානුකූලව විසිසේ වන්දනා කටයුතුවල යෙදෙති. සමහරු ශ්‍රී මහා බෝධීන් වහන්සේ, රුවන්වැලි සෑය, දළඳා මාලිගාව වැනි විශිෂ්ට පූජනීය ස්ථානවල දී පෙහෙවස් සමාදන් වීමෙන් දවසක් ගත කිරීමට කැමති වෙති. සාමාන්‍ය වශයෙන් සිද්ධස්ථානයක දී අනුගමනය කරන වන්දනා පිළිවෙළ පහත දැක්වේ.

බෞද්ධ සිද්ධස්ථානයකට ඇතුල් වන්නේ හිස් වැසුම් හා පාවහන් ගලවා ඉතා සන්සුන්ව ය. ගෙනෙන ලද මල් පහන් ඇතුළු පූජා ද්‍රව්‍ය ඒවා සකස් කිරීමට පිළියෙල කොට ඇති ස්ථානවල තබා ජලය තබා ඇති ස්ථානයට ගොස් සුදුසු පරිදි අත් පා ධෝවනය කර ගනු ලැබේ. පැන් ඉස මල්වට්ටි හා වෙනත් පූජා ද්‍රව්‍ය හා පහන් ආදිය සකස් කොට තබා පළමු කොට විහාරස්ථානයේ භික්ෂූන් වහන්සේ හමුව වන්දනාකරුවන් පංචශීලයේ පිහිටුවීමට ආරාධනය කරනු ලැබේ. භික්ෂූන් වහන්සේ විසින් උවසු උවැසියන් තිසරණ සහිත පංචශීලයේ පිහිට වූ පසුය, වන්දනාව ආරම්භ කරනුයේ.

විහාරයක දී වන්දනාවට භාජන කළ යුතු දාගැබ, පිළිම ආදී අඞ්ග කීපයකි. නමුත් මේවා වන්දනා කළ යුතු චාරිත්‍රානුකූල පිළිවෙළකි. සැළලිහිණි සන්දේශයේ පහත දැක්වෙන කවෙන් කියවෙන්නේ මේ අනුපිළිවෙළයි.



5. ර.මු.නී.ස. 090669

සොඳ මුනිරද පිදූ කළ යස මෙරද සම
පුද කළ ඔහු නෙත් නිල් කැලුමෙ'ව් බැරම
සඳ යුරු සඳ වෙලෙන් රැඳි රුසිරු මනරම
වඳනෙහි' තෝ දගැප් මහ බෝ පිළිම

''බුදුරජාණන් වහන්සේගේ කීර්ති රශ්මිය එක් ගොඩකට ගැසුවාක් මෙන් පෙනෙන දගැබද, උන්වහන්සේ විසින් ඇසිපිය නොහෙළා පූජා කළා වූ දෙඇසෙහි අධික නීලකාන්තිය වැනි වූ ශ්‍රී මහා බෝධීන් වහන්සේ ද සැන්දෑ වළා මුදුනෙහි පෙනෙන සඳ මඬල බඳු රූපශ්‍රීන් යුක්ත පිළිම වහන්සේ ද තෝ වඳුව'' යනු ඒ කවේ සාමාන්‍ය අර්ථය යි.

මේ අනුව පළමු ව දගැබත්, දෙවනු ව බෝධීන් වහන්සේත්, තෙවනු ව බුදු පිළිම වහන්සේත් වන්දනා කිරීම සිරිත යි.

වන්දනාවේ දී පූජා භාණ්ඩ පූජා කළ යුතු අනු පිළිවෙළක් ද ඇත. පළමුවෙන් ම පූජා කරන්නේ පහන් ය. පහන් පිදීමෙන් ස්ථානයට ආලෝකය ලැබීමෙන් ඉතිරි කටයුතුවලට පහසුවක් ද ලැබෙයි. ඉක්බිතිව සුවඳ දුම් හා මල් පූජා කරනු ලැබෙයි. සුදුසු වේලාවක ආහාර හෝ ගිලන් පස පූජාවකුත් කෙරේ නම් පැන්, ආහාර හෝ ගිලන් පස හා දැහැත් එක්වර ම හෝ අනු පිළිවෙළින් හෝ පූජා කිරීම සිරිත ය.

මෙසේ පූජා පැවැත්වීමෙන් පසුව දීර්ඝව වන්දනා කිරීමේ අභිරුචියක් දක්වන සැදැහැවත් බෞද්ධයා සෑමලුවේ හෝ බෝමලුවේ හෝ බුදු පිළිම වහන්සේ ඉදිරිපිට හෝ විවේකව කැමති ඉරියව්වකින් හිඳ ගාථා කියමින් වන්දනාවේ යෙදෙයි.

කණ්ඩායමක් සිටින්නේ නම් භික්ෂූන් වහන්සේ කෙනකුගේ හෝ ප්‍රවීණ උපාසකයකුගේ මාර්ගෝපදේශකත්වයෙන් එක්වර වන්දනාවේ යෙදීම ද සිරිතකි.

සැදැහැවන්ත බෞද්ධයා වන්දනා කිරීමේ දී පහත සඳහන් ඉරියව්වකින් එකක් අනුගමනය කිරීම ද චාරිත්‍රයකි.

1. අංජලී නමස්කාරය — ඇඳිලි බැඳ අත් හිසේ තබාගෙන කරන නමස්කාරය යි.

2. පංචාංග පතිට්ඨාපිත නමස්කාරය — දෙදණ වැළමට හා නළල යන ශරීරයේ ස්ථාන පහක් බිම ස්පර්ශකරවා කරන නමස්කාරය හෙවත් පසඟ පිහිටුවා වැඳීමයි.

3. උක්කුටික නමස්කාරය — ඇඳිලි බැඳී අත් නළලේ තබා අඩ දණින් වැටී සිට කරන නමස්කාරය යි.

4. දණ්ඩ නමස්කාරය — බිම දිග ඇදී, මුහුණ බිමට හරවා ඇඳිලි බැඳි දෙ අත් තළලේ තබා කරන නමස්කාරය යි.

**වන්දනා ගාථා අනුපිළිවෙළ.**

අනුපිළිවෙළකට වන්දනා ගාථා කීම ද චාරිත්‍රයකි. ප්‍රාදේශීය වශයෙන් මේ අනුපිළිවෙළෙහි වෙනස්කම් දක්නට ඇත.

පහත දැක්වෙන්නේ වඩා ප්‍රචලිත අනුපිළිවෙළකි.

1. මුල දී පංචශීලයේ පිහිටා නොමැති නම් පංචශීලයේ පිහිටීම.

2. තෙරුවන් ගුණ සිහිකිරීමේ පාලි පාඨ කියවීම.

 (i) ඉති පි සෝ භගවා අරහං. . . . ආදී ගාථා පාඨය

 (ii) ස්වාක්ඛාතෝ භගවතා ධම්මො . . . . ආදී ගාථා පාඨය.

 (iii) සුපටිපන්නෝ භගවතෝ . . . . ආදී ගාථා පාඨය

3. සොළොස්මස්ථාන වන්දනාව.
මහියංගනං නාගදීපං . . . . . යනාදී ගාථාව

4. සියලු චෛත්‍ය වන්දනාව
වන්දාමි චේතියං සබ්බං . . . . . යනාදී ගාථාව

5. බෝධීන් වහන්සේ වැඳීම
 (i) යස්සමූලේ නිසින්නෝව. . . . යනාදී ගාථාව

 (ii) ඉන්ද නීල වණ්ණපත්ත . . . . යනාදී ගාථාව

6. විශේෂ ස්ථානයක නම් ඒ ස්ථානය වැඳීම සඳහා ඇති විශේෂ ගාථාව

7. පහන් පූජා කිරීමේ ගාථාව
සද්ධාය සම්පදිත්තේන . . . . . යනාදී ගාථාව

8. සුවඳ පූජාව
ගන්ධසම්භාර යුත්තේන. . . . . යනාදී ගාථාව

9. මල් පූජාව
 (i) වණ්ණගන්ධ ගුණොපේතං. . . . යනාදී ගාථාව
 (ii) පූජෙමි බුද්ධං කුසුමෙන නේන. . . . යනාදී ගාථාව

10. ආහාර හෝ ගිලන්පස පූජා කරන අවස්ථාවක දී නම්

 (i) පැන් පූජාව
පසන්නං සීතලං සුද්ධං . . . . යනාදී ගාථාව

(ii) ආහාර පූජාව

ඔජවන්තං රසවන්තං – පණීතං භෝජනං ඉමං . . . . .

යන ගාථාව හෝ

ගිලන්පස පූජාවක් නම්

ඔජවන්තං රසවන්තං – ගිලාන පච්චයං ඉමං. . . . යනාදී ගාථාව

(iii) දුහැත් පූජාව

නාගවල්ලි දලූපේතං. . . . යනාදී ගාථාව

(iv) සියල්ල ම

(අ) සබ්බ පාප විසුද්ධස්ස. . . . යනා දී ගාථාව

(ආ) ඉමාය බුද්ධ පූජයා . . . . යනා දී ගාථාව

11. භාවනාව – මිනිත්තු කීපයක් මෛත්‍රී භාවනාව, බුද්ධානුස්සති භාවනාව වැනි භාවනාවක් වැඩීම.

12. දෙවියන්ට පින්දීම.

(i) ආකාසට්ඨා ච භුම්මට්ඨා . . . . . යනා දී ගාථාව

(ii) එත්තාවතා ච අම්හෙහි . . . . යනා දී ගාථාව

මෙම ගාථාව සබ්බෙ දේවානු ! සබ්බෙ භූතානු ! සබ්බෙ සත්තානු මෝදන්තු යනුවෙන් තෙවරක් කියනු ලැබේ.

13. ප්‍රාර්ථනා ගාථා

(i) දුක්ඛප්පත්තා ද නිද්දුක්ඛා . . . . යනා දී ගාථාව

(ii) දේවෝ වස්සතු කාලේන. . . . යනා දී ගාථාව

(iii) ඉමිනා පුඤ්ඤකම්මේන . . . . යනා දී ගාථාව

(iv) ඉදං මේ පුඤ්ඤං ආසවක්ඛයා වහං හෝතු . . . . යන ගාථාව

14. දෙමව්පියන් වැඳීම.

(i) දසමාසේ උරේකත්වා . . . . යන මවට වැඳීමේ ගාථාව

(ii) වුද්ධිකාරෝ අලිංගිත්වා . . . . යන පියාට වැඳීමේ ගාථාව

15. ත්‍රිවිධ රත්නය සමාකර ගැනීම

කා යේන වාචා චිත්තේන . . . . යනා දී ගාථාව

මෙයින් වන්දනාව අවසන් වෙයි.

**ස්ථානය නැරඹීම.**

මෙසේ ස්වකීය වන්දනාව අවසන් කරන සැදැහැවත් වන්දනා කරුවා සිද්ධස්ථානයේ ඇති විවිධ ඓතිහාසික හා ආගමික වැදගත්කමක් ඇති දේවල් නැරඹීමට ද අමතක නොකරයි. විශේෂයෙන් පිළිමගෙයි ඇති බිතු සිතුවම් ඔහුගේ අවධානයට ලක් වෙයි. මේවා නැරඹීමෙන් බුද්ධ චරිතය, ජාතක කථා හා ශාසන ඉතිහාසය පිළිබඳ ඔහු තමාගේ පරණ දැනීම අලුත් කර ගනියි. කලින් නොදත් දේ පිළිබඳව අලුත් දැනීම එකතු කර ගනියි. පහන් සංවේගය ඇති කර ගනියි. ශ්‍රද්ධාව දියුණු කර ගනියි. එමතු ද නොව විශාල ආශ්වාදයක් ද ලබයි.

වන්දනාවක අවසානයේ දී පැමිණ සිටින දෙමව්පියන් හා වැඩිහිටි නෑදැයින්ට වැඳ සමාකර ගැනීම ද බෞද්ධයන්ගේ සිරිතකි. ඈත වන්දනාවක ගොස් ආපසු ගෙවල්වලට ගිය පසු ද නෑදෑ හිතවතුන්ට වන්දනා ගමනේ තොරතුරු කියා ලබා ගත් පිං ඔවුන්ට පැමිණවීමත් පැරණි බෞද්ධ ගැමියන්ගේ සිරිතකි.

**වැඩිදුර කියවීමට.**

1. වල්පොල රාහුල හිමි – පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය — 9 පරිච්ඡේදය.

2. ඊ. ඩබ්ලිව්. අදිකාරම් මයා — පැරණි ලක්දිව බෞද්ධ ඉතිහාසය- 9 පරිච්ඡේදය.

## 5. පාඩම

# උත්සව හා සම්බන්ධ සිරිත් විරිත්

## 5. 1 සිංහල අලුත් අවුරුද්ද පිළිබඳ සිරිත් විරිත්.

බක්මහ උළෙල හෙවත් සිංහල අලුත් අවුරුද්ද බෞද්ධ හා අබෞද්ධ යන දෙපක්ෂයේ ම සිංහලයන්ගේ වාර්ෂික උත්සව අතර වැදගත් තැනක් ගන්නකි. මෙම උත්සවය හින්දු අලුත් අවුරුද්ද හා සම්බන්ධ වන අතර, සිංහල අලුත් අවුරුදු චාරිත්‍ර රාශියක් ම හින්දු අලුත් අවුරුදු චාරිත්‍ර මත පදනම් වී ඇති බව පෙනෙයි. එසේ වුව ද බෞද්ධයන් අගය කරන චාරිත්‍ර ධර්ම රාශියක් මේ සිරිත් අතර දක්නට ලැබේ.

ගොයම් කපා අස්වනු ගෙවලට රැස්කර ගත්තායින් පසුව පැමිණෙන බක්මහ ගොවි ජනතාවට විශේෂයෙන් විවේක කාලයකි. තව ද ලක්දිවට සූර්යයා මුදුන් වී පායන මේ කාලය උණුසුම් කාලගුණයකින් ද යුක්ත වෙයි. මේ හේතු නිසාද ලක්වැසි ගොවි ජනතාවට කෙළි දෙලෙන් ගතකිරීමට මේ උත්සව සමය යෝග්‍ය වෙයි.

සිංහල අවුරුද්ද පිළිබඳ බොහෝ චාරිත්‍ර නැකැත් හෙවත් ශුභ මුහුර්තයන් හා සම්බන්ධ වෙයි. අලුත් අවුරුද්ද සඳහා ස්නානය කිරීම, වැඩ අත්හැරීම, ගිනි මෙළවීම, කෑම පිසීම හා ආහාර අනුභවය, වැඩ ඇල්ලීම, ගනුදෙනු කිරීම, ඉස තෙල් ගෑම හා නව වසරේ රැකියාවලට යාම අලුත් අවුරුද්ද හා සම්බන්ධ නැකතට කෙරෙන කටයුතු කීපයකි. සිංහල අවුරුදු උත්සවයට ජනතාව සූදානම් වන්නේ සති ගණනකට කලින් ය. ගම්බදව පැහැදිලි ව දක්නට ලැබෙන දෙයක් නම් ගෙවල් දෙරවල් අලුත්වැඩියා කොට පවිත්‍ර කර ගැනීම යි. වහළ සෙවිළි කර, බිත්ති සුදු හුණු ගා ගෙබිම ගොම මැටි ගා පවිත්‍ර කර ගැනීම දුප්පත් ගම්වැසියන්ගේ වුවද චාරිත්‍රය යි.

සිංහල අවුරුද්ද නිමිති කර ගෙන ගෙවල් දෙරවල් ශුද්ධ පවිත්‍ර කර ගැනීම කෙරෙහි අවධානය යොමු වීම මෙම උත්සවයේ විශේෂ ප්‍රයෝජනයක් සේ සැලකිය හැකි ය.

සිංහල අවුරුද්ද ඇරඹෙන්නේ නව වර්ෂයට ඉස් සෝද නෑමේ චාරිත්‍රයෙනි. පැරැන්නන් අතර මෙය හැඳින්වෙන්නේ නානුමුර මංගල්‍යය නමිනි. මේ සඳහා ඇති ශුභ මුහුර්තය හෙවත් නැකත යෙදෙන්නේ අලුත් අවුරුද්ද උදාවීමට දින දෙක තුනකට කලිනි. ස්නානයට ප්‍රථම,

දෙහි ඇඹුල් සඳුන් සුණු ආදියෙන් යුත් මිශ්‍රණයක් යොදා හිස් සේදීම මෙහි දී කෙරෙන විශේෂ චාරිත්‍රය යි. දික් කේශ කලාපයක් ඇති කාන්තාවන් මෙයට වැඩි රුචියක් දක්වන්නේ ස්වකීය කේශ කලාපයන් මැනවින් රැක ගැනීමට මෙසිරිත හේතුවන බැවිනි. බෞද්ධ විහාරවල බුදු පිළිම වහන්සේලා පවා නානුමුර මංගල්‍යයට සහභාගී කරවීම සමහර පෙදෙස්වල දක්නට ලැබෙන සිරිතකි. බුදු පිළිම වහන්සේ ස්නානය කරවනු ලබන්නේ කැඩපතකට වැටෙන පිළිම හිසේ ඡායාව පරිස්සමින් නැවීමෙනි.

පරණ අවුරුද්දේ වැඩ අත්හැරීම කෙරෙන්නේ ද නැකතට ය. වැඩ අත්හැරීමෙන් පසුව එන කාලය පුණ්‍ය කාලය ලෙස සලකනු ලැබේ. පුණ්‍ය කාලය තුළ දී රැකී රක්ෂා කටයුතු කිසිවක නො යෙදී වෙහෙර විහාරවලට ගොස් මල් පහන් පුද පින් දහම්වල යෙදීම සිරිතයි. සංක්‍රාන්තිය හෙවත් නව අවුරුද්ද ලැබීම උත්සවයේ වැදගත් ම අවස්ථාවකි. වෙඩි හා රතිඤ්ඤා පිපිරවීමෙන් අලුත් අවුරුද්ද සතුටින් භාර ගැනීම බොහෝ දෙනෙකුගේ සිරිතයි.

සංක්‍රාන්තිය සිදු වෙද්දී විහාරවල ඝණ්ඨාව නාද කිරීම ද ලක්දිව බොහෝ ප්‍රදේශවල කෙරෙන සිරිතකි. දැන් නව වසර උදාවී අවසානය. සියල්ලෝ ම අලුත් ඇඳුම් වලින් සැරසී අවුරුද්දේ ඉතිරි වැඩ කටයුතු වල යෙදෙති. ජ්‍යොතිශාස්ත්‍රඥයින් විසින් පෙන්වා දී ඇති අයුරු වර්ෂයට නියමිත ශුභ වර්ණයෙන් ම ඇයදුම් සකස් කර ගැනීම බොහෝ දෙනකුගේ සිරිතකි.

ගෘහිණියෝ අලුත් ලිප් බැඳ නැකැත්තන් විසින් යෝජිත දිසාව බලා ශුභ මුහුර්තයෙන් ගිනි දල්වති. අවුරුදු භෝජනයට ගිතෙල් මිශ්‍ර කිරිබතක් පිසිති. සුදු පිළියක් අතුරන ලද මේසයට කිරිබත්, කැවුම්, කොකිස්, කෙසෙල් ගෙඩි ආදී කැවිලි ඇර, මධ්‍යයෙහි පහනක් දැල්වීම ද සිරිත ය. පවුලේ වැඩිමහලු, බාල සියලු දෙනම මෙදින ශුභ මොහොතින් එකවර කෑම ගන්නේ ඉතා සන්තෝෂයෙනි. වැඩ ඇල්ලීමට නියමිත වේලාවේ දී තමන්ගේ රැකියාව හා සම්බන්ධ හෝ වෙනත් හුරු පුරුදු කාරියක හෝ කවුරුත් යෙදෙන්නේ උදාවූ වර්ෂයේ දී තම තමන්ගේ රැකියා හා සම්බන්ධ වැඩ කටයුතු සර්වප්‍රකාරයෙන් සාර්ථක වේවා යන ප්‍රාර්ථනාවෙනි. පාසල් ළමයි නැකතට පොත් පාඩම් කරති, අකුරු ලියති, ගණන් සාදති, අවි ආයුධ වලින් වැඩ කරන අය තමන් නිතර භාවිත කරන කැති උදලු ආදියෙන් නැකැත් වේලාවට මහත් අභිරුචියකින් වැඩ කරන්නේ එසේ කළහොත් ලැබූ නව වසරේ දී අවි ආයුධ ආදියෙන් තමනට කිසි ආපදාවක් නො වේ ය යන විශ්වාසයෙනි.

අලුත් අවුරුද්දේ ගනු දෙනු කිරීමත් විශේෂ චාරිත්‍රයකි. යමකිසි මුදලක් බුලත් කොළයක දවටා තව කෙනකුට දුන් විට එය ලැබූ තැනැත්තා බුලත් කොළයේ ඇතුළත තිබූ මුදලට තව මුදලක් එකතු කොට අකුලා ආපසු දීම ගනු දෙනු කිරීමේ ක්‍රමය යි.

සදචාරාත්මක අතින් ඉතා වටිනා අවුරුදු සිරිතක් නම් බාලයන් විසින් බුලත් හුරුලු දී දෙමව්පිය ආදී වැඩිහිටියන් තැමැද සමාකර ගැනීම යි. කොතරම් දුර බැහැරක සිටියත් අලුත් අවුරුද්දේ දී දෙමව්-පියන් සිටින තැනකට ගොස් ඔවුනට තැගි බෝග දී වැඳ සමාකර ගැනීම බොහෝ සිංහල බෞද්ධයන් අමතක නොකරන සිරිතකි. ''මාතා පිතු උපට්ඨානං, ඤාතකානංච සඞ්ගහෝ, පුත්ත දරස්ස සඞ්ගහෝ'' වැනි මංගල කරුණු අවුරුදු උත්සවය හා බෙහෙවින් සම්බන්ධ ය. අසල්වැසියන්ගේ හා නෑදැයන්ගෙ ගෙවලට කිරිබත් සහිත කැවිලි පිඟානක් සුදකින් වසා යැවීම ද අවුරුදු චාරිත්‍රයකි. මෙයට පිළිතුරු වශයෙන් තැගි ලබන්නෝ ද එලෙසින් ම ප්‍රතිසඞ්ග්‍රහ කරති. පවුල් අතර යමකිසි අමනාපකම් ආදියක් තිබුණේ වී නම් ඒවා මගහැරී නැවත මිත්‍රත්වය තහවුරු වීමට මෙසිරිත ඉවහල් වෙයි. අසල්වැසි හිතවතුන් නෑදැයින් නිවසට කැඳවා සඞ්ග්‍රහ කිරීම ද කෙනකුගේ අවුරුදු සිරිතේ අඞ්ගයකි.

ගම්බද වැඩිහිටි ගැහැණු පිරිමි පවා ක්‍රීඩාවල යෙදෙන්නේ අවුරුදු සමයේ ය. රබන් ගැසීම, ඔළිඳ කෙළිය, පංච් දැමීම හා ඔංචිලි පැදීම කාන්තාවන් වැඩි වශයෙන් අවුරුදු සමයේ දී නිරත වන ක්‍රීඩාවන් ය. කතුරු ඔංචිල්ලා පැදීම, අං ඇදීම, පොරපොල් ගැසීම වැනි පිරිමින් බහුලව යෙදුණු අවුරුදු ක්‍රීඩා දැන් අභාවයට යනු පෙනේ. මෙම ක්‍රීඩා. ''පත්තිනි දෙවගන පිදීම'' හා සම්බන්ධ බැවින් ඒවාට අදාළ විශේෂ චාරිත්‍ර ද ඇත්තේ ය. ගොක් කොළ සැරසිල්ලෙන් මල් පැලක් තනා පත්තිනි දෙවගන වෙනුවෙන් පහනක් දල්වා ඇගේ ආශීර්වාදය පතා යාතිකාවක් කොට මෙම ක්‍රීඩා ආරම්භ කිරීම සිරිතකි.

අලුත් අවුරුද්ද වෙනුවෙන් කෙරෙන තවත් වැදගත් චාරිත්‍රයක් නම් නැකතට ඉසතෙල් ගෑම යි. මේ සඳහා අවුරුදු නැකැත්වල විස්තර කර ඇති පරිදි විශේෂ බෙහෙත් තෙලක් පිළියෙල කර ගනු ලැබේ. සමහර ගම්බද පංසල්වල ගම්වැසියන් වෙනුවෙන් මේ තෙල පිළියෙල කරනු ලැබේ. හිසට හා පයට ඖෂධීය කොළ විශේෂයක් ඇතිව ශුභ මුහුර්තයෙන් හිසෙහි තෙල් ගල්වනු ලබන්නේ පවුලේ වැඩිහිටියකු විසිනි. ''භවතු සබ්බ මඞ්ගලම්....'' වැනි ආශීර්වාදාත්මක ගාථාවක් සජ්ඣායනය කරමින් ය, හිස තෙල් ගැල්වීම කරන්නේ. අලුත් අවුරුද්-දට ස්නානය කරන්නේ හිසතෙල් ගෑමේ උත්සවයෙන් පසුව ය. අවුරුදු චාරිත්‍ර හා සම්බන්ධ අන්තිම නැකත නම් රැකී රක්ෂා ආදියට පිටත් වී යාමට නියම කර ඇති වේලාවයි.

බිඳ වැටී ගිය සමාජ සම්බන්ධකම් නැවත ගොඩ නැඟීම, පෑදු හිතමිතුරු සම්බන්ධකම් තව තවත් වැඩි දියුණු කිරීම, වැඩිහිටියන්ට සැලකීම හා වේලාවකට වැඩ කිරීමට පුරුදු වීම වැනි සදචාරාත්මක වටිනාකම් අවුරුදු සිරිත්වල ගැබ් වී ඇති බව පෙනේ.

## 5.2 වෙසක් උත්සවය පිළිබඳ සිරිත් විරිත්.

බුදුරජාණන් වහන්සේගේ උත්පත්තිය, බුද්ධත්වය හා පරිනිර්වාණය යන ත්‍රිවිධ මඞ්ගල්‍යය සැමරීම වස් පවත්වනු ලබන වෙසක් උත්සවය දීර්ඝ ඉතිහාසයක් ඇත්තකි. පුරාණ ඉන්දියාවේ ද වෙසක් උත්සව පවත්වා ඇති බවට සාධක තිබේ. ක්‍රි:ව. 5 සියවසේ දී ඉන්දියාවේ දී දුටු වෙසක් උත්සවයක් ගැන පාහියන් ඔහුගේ ගමන් විස්තරයේ සඳහන් කරයි.

මේ උත්සවයේ දී රෝද හතරක් සහිත රථවල උණ දඬු ආදියෙන් පස් මහල් මණ්ඩප සාද ඒවායේ කුඩුවල සතර පැත්තට බුද්ධ රූප, බෝධි සත්ව රූප වඩා හිඳුවන බව පාහියන් කිය යි. අලංකාර ලෙස සරසන ලද මෙබඳු රථ විස්සක් තිබුණත් එකක් අනිකට වඩා වෙනස් බවද පාහියන් පවසයි. සමහර විට මේ රථ වෙසක් දින වීදි සංචාරය කරන්නට ඇත. මෙම උත්සව පවත්වන ලද්දේ දෙවෙනි මාසයේ බව චීන වන්දනා කාරයා වැඩිදුරටත් කියයි. ඉන්දියානු ලිතේ දෙවෙනි මාසය වෙසක් මාසය. යි.

බුදු සමය ලක්දිවට පැමිණියායින් පසුව ලක්දිව ද වෙසක් උත්සව පවත්වන්නට ඇත. මහා වංශයේ වෙසක් උත්සව ගැන මුල් වරට සඳහන් වන්නේ දුටු ගැමුණු (ක්‍රි.පූ. 161 – 137) රජු කල ය. දුටුගැමුණු රජතුමා වෙසක් උත්සව 24ක් පැවැත් වූ බව සඳහන් ය. දුටුගැමුණු රජතුමාගේ රාජ්‍ය කාලය 24 අවුරුද්දක් වූ බැවින් සැම වර්ෂයක ම වෙසක් උත්සවය එතුමා විසින් පවත්වා ඇති බව මෙයින් සිතාගත හැකි ය. භාතිය රජ (ක්‍රි.ව. 38 – 67) වෙසක් මඟුල් 28ක් ද, වසභ රජ (ක්‍රි.ව. 67 – 111) වෙසක් මඟුල් 24ක් ද පැවැත් වූ බව කියනු ලැබේ. මේ අනුව පසුකාලීන බෞද්ධ රජවරු අඛණ්ඩ ව වෙසක් උත්සව පවත්වා ඇති බව පෙනේ. 2 වන සේන රජ (ක්‍රි.ව. 851 – 885) වැසියන් හා එකතු වී වෙසක් උත්සව පවත්වමින් වැසියන්ට රිසි පරිදි ආහාර පාන හා වස්ත්‍ර ද බෙද දුන් බව කියනු ලැබේ.

මෙකල ද දිවයිනේ ඉතා උද්යෝගයෙන් බෞද්ධයන් විසින් පවත්වනු ලබන උත්සවය වෙසක් උත්සවය යි. බෞද්ධයෝ ඊට සඳහා කල්තියාම සූදානම් වෙති. වෙසක් තොරණ ආදිය සඳහා සති ගණනකට, මාස ගණනකට කලින් වැඩ ආරම්භ කරනු ලැබේ.

මෙදින සෑම බෞද්ධ නිවසක ම බෞද්ධ කොඩිය නැංවීම සිරිත යි. ගොක් රැහැණින් හා කොඩි වැල් ආදියෙන් නිවෙස් හා මාර්ග ද සරසනු ලැබේ. විහාර ආරාම ද ගොක් සැරසිලි, කොඩි වැල්, බෞද්ධ කොඩි ආදියෙන් මැනවින් සරසනු ලැබීම ද සිරිතකි.

වෙසක් දින විවිධ පිංකම්වල යෙදීම බොහෝ බෞද්ධයන්ගේ සිරිත යි. ප්‍රතිපත්ති ගරුක බෞද්ධයෝ වෙසක් දින පෙහෙවස් සමාදන්වීමෙන් ගත කිරීමට අමතක නොකරති. නිතර සිල් සමාදන් වීමට නොහැකි කෙනෙක් වෙසක් පොහෝ දිනවත් පෙහෙවස් රැකීමෙන් ගත කිරීමට උනන්දු වෙති. සමහර බෞද්ධ දෙමාපියෝ තම පවුලේ සියලු දෙනාම සමඟ වෙසක් දින සිල් සමාදන් වීමට කටයුතු යොද ගනිති. මෙදින විහාර ආරාම බුදු බැතියෙන් පිරීගිය හදවත් ඇති, සුදුවතින් සැරසුණු උවසු, උවැසියන්ගෙන් පිරියයි. සමහර කෙනෙක් අනුරාධපුරය, මිහින්තලය, කැළණිය වැනි ස්ථානයකට ගොස් වෙසක් දින පෙහෙවස් රැකීමෙන් ගත කිරීම චාරිත්‍රයක් කර ගෙන සිටිති. එසේ ප්‍රතිපත්ති පූජාවේ යෙදෙන්නට නොහැකි අය විහාර ආරාමවලට ගොස් මල්පහන් පුද ආමිස පූජාවල යෙදෙති.

දන්සැල් පැවැත්වීම වෙසක් දින කැපී පෙනෙන චාරිත්‍රයකි. පැරණි බොහෝ බෞද්ධ රජදරුවෝ ද වෙසක් දින මහජනයාට ආහාර පාන, ඇඳුම් පැළඳුම් බෙද දී දන්සැල් පැවැත් වූහ. ගම්බද දුප්පත් තරුණයන් පවා කීප දෙනකු එකතු ව සිසිල්බීම දන්සැලක් වත් පැවැත්වීමට කටයුතු කරනු බොහෝ විට දක්නට ලැබේ. බෞද්ධයන්ගේ ජනප්‍රිය පිංකම දන් දීම යි. ප්‍රසිද්ධ සිද්ධස්ථාන කරා වන්දනාකරුවන් වැඩි වශයෙන් යන එන මාර්ගවල දන්සැල් පැවැත්වීම වැඩි වශයෙන් කෙරෙන සිරිත යි. නැති බැරි අයට ම දන්දීම දන්සැලක සිරිත නොවේ. වෙසක් දන්සැල් පවත්වන්නේ පැමිණෙන ඕනෑම මට්ටමක ප්‍රතිග්‍රාහකයන් සඳහා ය.

සමහර සැදැහැවත්තු ආරෝග්‍යශාලාවල ඉන්නා රෝගීන්ට, ළමා නිවාස, වැඩිහිටි නිවාස ආදියේ ඉන්නා අසරණයන්ට විශේෂ දන මේ දිනයේ යොද ගනිති.

වෙසක් තොරණ මඟින් බුදු සිරිත හා ජාතක කථා චිත්‍රයට නංවා ප්‍රදර්ශනය කිරීම වෙසක් සතියේ දක්නට ලැබෙන විශේෂ උත්සව අංගයකි. ජාතක කතා චිත්‍ර ප්‍රදර්ශන පැවැත්වීම පුරාතනයේ සිට පැවත එන චාරිත්‍රයකි. තොරණ නැරඹීමෙන් ජාතක කථා ආදිය ඉගෙන ගැනීමටත් ඒවායෙන් වටිනා ගුණ ධර්ම හඳුනා ගැනීමටත්, නරඹන්නන්ට ඉඩ ලැබේ. කලා කරුවනට සිය දස්කම් පෙන්වීමට ඉඩ ලැබෙන වෙසක් තොරණ ඉතා හොඳ සන්නිවේදන මාධ්‍යයක් වශයෙන් ද අගය කළ හැකි ය.

භක්ති ගීත ගායනය ද වෙසක් උත්සවයේ තවත් අංගයකි. පුහුණු කරනු ලැබූ ගීත කණ්ඩායම් ප්‍රසිද්ධ ස්ථානවල රැඳී හෝ සංචාරය කර මින් කරන බුදු ගුණ ගැයුම් ජනතාව තුළ ශ්‍රද්ධාව ජනිත කරවයි.

ආලෝක පූජාව වෙසක් උත්සවයේ තවත් අංගයකි. බෞද්ධ වෙහෙර විහාර පමණක් නොව සෑම බෞද්ධ නිවසක් ම වෙසක් රාත්‍රිය බුදු හිමියන් වෙනුවෙන් ආලෝක පූජාවේ යෙදෙයි. පොල්තෙල් පහන් දල්වීමෙන් හෝ වෙසක් කූඩු නමින් හැඳින්වෙන අලංකාර එළිය පෙට්ටි දැල්වීමෙන් මේ ආලෝක පූජාව පවත්වනු ලැබේ. වෙසක් පහන් සෑදීමත්, දැල්වීමත් බෞද්ධ දරුවන්ගේත් තරුණ තරුණියන්ගේත් ජනප්‍රිය පූජාවකි.

''දෙමාපිය, ගුරුවර, නෑදෑ හිතවතුන්ට වෙසක් ආසිරිපත් යැවීමෙන් ත්‍රිවිධ රත්නයේ ආශීර්වාදය ඒ අය වෙත පැතීම වෙසක් උත්සවයේ තවත් නවීන අංගයකි. වෙසක් උත්සවය සම්බන්ධ විවිධ චාරිත්‍ර බෞද්ධ කලා ශිල්පවල දියුණුවට හේතු වී ඇති බව ද කිව යුතු ය.

## 5.3 පෙරහැර පැවැත්වීම පිළිබඳ සිරිත් විරිත්.

සිංහලයන්ගේ ජාතික ආගමික කටයුතුවලට සම්බන්ධ උත්සවවල වැදගත් අංගයක් වන්නේ පෙරහැර පැවැත්වීම යි. යම්කිසි පූජනීය වස්තුවකට පූජෝපහාර දක්වීම සඳහාත්, ආගමික නායකයන් සිහි කිරීම සඳහාත්, බෞද්ධයෝ අතීතයේ සිට ම පෙරහැර පවත්වා ගෙන එති. මේ හැරුණු විට දිවයිනේ ඒ ඒ සිද්ධස්ථානවල වාර්ෂිකව පෙරහැරක් පැවැත්වීම ද සිරිතකි. සාංඝික දාන, පිරිත් පිංකම්, ධාතු නිදානෝත්සව, බෝධි පූජා හා කඨින පූජා ආදී වෙනත් පිංකම්වල උපාංගයක් වශයෙන් ද පෙරහැර පවත්වනු ලැබේ. බෞද්ධයන්ගේ මේ පෙරහැරවලට ආවේණික වූ විශේෂ ලක්ෂණ හා චාරිත්‍ර ද ඇත්තේ ය.

**මහනුවර ඇසළ පෙරහැර.**

ඇසළ මාසයේ දී මහනුවර පවත්වනු ලබන ඇසළ පෙරහැර ශ්‍රී ලංකාවේ පමණක් නොව ලෝකයේ ම ප්‍රසිද්ධ වූ පෙරහැරක් මෙන් ම සංස්කෘතික සංදර්ශනයකි. ඇසළ උත්සවය ආදිකාලීන උත්සවයකි. සිදුහත් බෝධිසත්වයන් වහන්සේ මහාමායා දේවියගේ කුසයෙහි පිළිසිඳ ගත්තා සමයේ දී ඉන්දියාවේ ද ඇසළ උත්සවයක් තිබූ බව පෙනේ. ''ඇසළ මිස දිටිමි යනවා දෙව් කෙළියේ'' යන ජන කවි පදය අනුව ඇසළ උත්සව දෙවියන් සඳහා පැවැත් වූ බව සිතා ගත හැකි ය. ඇසළ පෙරහැරම් අයත් කප් සිටුවීම දිය කැපීම වැනි චාරිත්‍ර අනුව සිතා ගත හැක්කේ ඇසළ උත්සවය අතීතයේ දී වැසි ලබාගැනීම හා සශ්‍රීකත්වය ඇති කිරීම සඳහා පවත්වන ලද එකක් බව ය.

ලක්රජවරු දළඳ හිමියන් රැක ගනු පිණිස දළඳ මාළිගය සිය මාළිගය අසල ම ගොඩ නැඟූ හ. එසේ කොට රාජධානිය පිහිටි නගරයේ ම දළඳ පූජා හා දළඳ පෙරහර පැවැත්වූහ. මෙසේ රාජධානිය පිළිවෙළින් අනුරාධපුරයෙන් පොළොන්නරුවට, දඹදෙණියට, යාපහුවට, කුරුණෑගලට, ගම්පොලට, කෝට්ටෙට, සීතාවකට හා මහනුවරට මාරුවෙද්දී දළඳ මාලිගාවල් ද අලුතෙන් එම නගරවල ඉදි කරනු ලැබිණ. ඒ හැම නගරයක ම දළඳ උත්සව හා පෙරහැර පැවැත්වුණු බව පෙනේ.

කුරුණෑගල රජ වූ IV පැරකුම්බා රජුකල (ක්‍රි.ව. 1302 – 1326) ලියැවුණු දළඳ සිරිත, දළඳ පූජාවලිය යන ග්‍රන්ථවල එකල දළඳ හිමියන් සඳහා පැවැත් වූ පූජා පෙරහැර හා දළඳ හිමිට පැවැත් වූ විශේෂ චාරිත්‍ර පිළිබඳ තොරතුරු ඇතුළත් ය. දළඳ සිරිතෙහි සඳහන් පරිදි දළඳ පූජාවක් හා පෙරහැරක් පැවැත් වූ ආකාරය මෙසේය.

මනා නැකතකින් දළඳ ගෙය පිරිසිදු කර, වියන් බැඳ නොයෙක් පට පිළියෙන් සරසනු ලැබේ. රජ, අන්තඃපුර කාන්තාවෝ, ඇමතියෝ හා නගර වැසියෝ සත් දවසක් මුළුල්ලේ මහ පෙරහැරින් බත් මල් පහන් ආදිය ගෙනවුත් දළඳ හිමි පුදති. සත්වන දවස සවස නගරය සරසා උතුරු මූළ මහතෙරුන් හා ගණවැසි මහතෙරුන් සමඟ ධාතු කරඬුව ගඳ කිළියෙන් ඉවතට වැඩමවා සරහන ලද රථයක මාහැඟි ආසනයක උතුරු මූළ මහතෙරුන් හා ගණවැසි මහතෙරුන් සමඟ ධාතු කරඬුව වඩා හිඳුවනු ලැබේ. මේ රථය වීදි සංචාරය සඳහා ඇද ගෙන යන්නේ සුබ ලකුණින් හෙබි සරසන ලද මහා ඇතකු විසිනි. රථයෙහි බඳින ලද පිරිත් නූල අතට ගෙන මහා සංඝයා වහන්සේ පිරිත් බෙණෙමින් රථය පිටුපස වඩින සේක. දෙරනා වැසි කුලයේ කෙනකු විසින් මේ යන ගමනේ දී රිදී කටාරයෙන් පිරිත් පැන් නුවර පුරා ඉසිනු ලැබේ. රථය දෙපසින් චාමර සලන්නෝ හා සේසත් දරන්නෝ ගමන් කරති. දළඳ ගෙයි නිලධාරි සහ විද්වත්හු රථය ඉදිරියෙන් ගමන් කරති. රජගෙදරට අයත් තූර්යවාදන කණ්ඩායම තූර්යවාදනය සපයති. ඇමති ගණය සිවුරඟ සෙනඟ සමඟ ආරක්ෂා සපයමින් අනතුරුව ගමන් කරති.

මේ අන්දමින් පෙරහැර නුවර පැදකුණු කොට ආපසු දළඳ මාළිගාවට වන් විට රජතුමා උත්තරමූළ, ගණවැසි හා දළඳගෙයි තෙරවරුන් සමඟ එකතුව ධාතු කරඬුවේ මුද්‍රා ලිහා දන්ත ධාතූන් වහන්සේ එළියට වැඩම වනු ලැබේ. ඉක්බිති උතුරු මූළ තෙරිඳුන් ලවා මහා සංඝයා වහන්සේට දන්ත ධාතූන් වහන්සේ ප්‍රදර්ශනය කරවනු ලැබේ. ඉක්බිති සේසත් චාමර බුහුමන් සහිතව දළඳ හිමියන් පිළිගත්තා රජතුමා උස් තැනක ඇමතිගණයා පිරිවරා සිට දළඳ වහන්සේ මහජනයාට ප්‍රදර්ශනය කරයි. අවසානයේ දළඳ වහන්සේ දළඳ ගෙයට වැඩමවා කරඬුවේ වඩා හිඳුවා අදාළ නිලධාරීන් මධ්‍යයේ මුද්‍රා තබනු ලැබේ.

මේ පවත්වන ලද චාරිත්‍ර මත්තට එන රජවරුන්ටත් පිළිපදින ලෙස IV පැරකුම්බා රජ විසින් ව්‍යවස්ථා ගත කරනු ලැබී ය.

II රාජසිංහ (1635 – 1670) රජු සමයේ මහනුවර විසූ රොබට නොක්ස් දුටු මහනුවර පෙරහැර පිළිබඳ විස්තරය ඔහු විසින් ලියන ලද ලංකාව පිළිබඳ ග්‍රන්ථයේ ඇතුළත් වෙයි. මේ පෙරහැරේ ඔහු දළදා වහන්සේ ගැන කිසිවක් නොකියයි. ඔහු විස්තර කරන්නේ එය අලුත්නුවර දෙවි, කතරගම දෙවි, පත්තිනි දෙවි, ආදීන් සඳහා පවත්වන දෙව් පෙරහැරක් වශයෙනි. සරසන ලද අලි ඇතුන් හතළිස් ගණනක් ඇති මේ පෙරහැරේ වංශාධිපති ස්ත්‍රී පුරුෂයන් ද අත් අල්ලා ගෙන මහේශාක්‍ය ලීලාවෙන් ගමන් ගත් බව නොක්ස් කිය යි. තව ද රජු ද සෙනෙවියන් සමඟ අශ්වාරෝහක ව පෙර මේ පෙරහැරේ ගමන් කළත් දැන් ඒ සඳහා වැඩි කැමැත්තක් නොදක්වන බවත් හේ පවසයි.

කෙසේ හෝ මහනුවර යුගය උදවන විට ලක්දිව ද්‍රවිඩ බලය වැඩි වූ නිසාදෝ පෙරහැර ක්‍රමයෙන් බෞද්ධ මුහුණුවරින් ඉවත් වූ බවක් පෙනේ. කීර්ති ශ්‍රී රාජසිංහ රජු (1747 – 1782) කල ලක්දිවට උපසම්පදාව රැගෙන, සියමෙන් පැමිණි උපාලි තෙරුන්ගේ ඉල්ලීම පිට මහනුවර පෙරහැර දළදා හිමිට ගෞරව පිණිස නැවතත් ආරම්භ කරන ලද බව කියනු ලැබේ. 1817 – 1818 උඩරට කැරැල්ලෙන් අවලංගු කරන ලද ඇසළ පෙරහැර නැවත ආරම්භ කරන ලද්දේ 1828 දී ය.

වර්තමානයේ මහනුවර පැවැත්වෙන ඇසළ පෙරහැර, දළදා පෙරහැර සමඟ නාථ, විෂ්ණු, කතරගම හා පත්තිනි යන දේවාල පෙරහැර ඒකාබද්ධ වූවකි. දිවයිනේ ඉහත සඳහන් දෙවිවරුන් සඳහා වෙනත් ස්ථානවල පෙරහැර පැවැත්වෙතත්, ඒ කිසි ම පෙරහැරක් මහනුවර ඇසළ පෙරහැර තරම් කලාත්මක හෝ සංස්කෘතික අතින් වැදගත් හෝ නොවේ.

මේ පෙරහැර ඇරඹෙන්නේ කප් හිටවීම නමැති මඞ්ගල්‍යයෙනි. කප් හිටවීම සඳහා අවශ්‍ය ලී ලබාගන්නේ ගෙඩි නොපලගත් කොස් ගසක් කැපීමෙනි. කොස් ගස කපන්නේත් ගසෙහි රුක් දෙවියාට මල් පහන් සහිත පූජාවක් පැවැත්වීමෙන් පසුව ය. විෂ්ණු දේවාලයේ ගස් කපන්නා පිරුවට හැඳ ගස කපා හෙළා කැපූ ගසේ කඳෙන් කොටස බැගින් එක් එක් දේවාලයට දෙයි. එයින් සකස් කර ගත් කප අලුත් හඳ ඇති දවසක, නැකැත් වේලාවක, කොළ මල් ගෙඩි වලින් සරසනු ලැබූ තාවකාලික වහලක් යට සිටවනු ලැබේ. මෙයින් පසු දළදා මාලිගාව හා දේවාලවල වෙන් වෙන් වශයෙන් පෙරහැර අරඹනු ලැබේ. පෙරහැර පවත්වන්නේ රාත්‍රියේ ය. කුඹල් පෙරහැර නමින් හැඳින්වෙන මුල් දින පහේ පෙරහැර පවත්වනු ලබන්නේ කප වටා ගමන් කිරීමෙනි. හයවන දවසේ සිට දළදා මාලිගාවෙන් දේවාල හතරේත් සියලු පෙරහැර

එක් වී දිනපතා මහමලුව වටේ ගමන් කරනු ලැබේ. දිනපතා නැටවුවන් වැඩි වී, අලි ඇතුන් වැඩි වී පෙරහැර ක්‍රමයෙන් සංවර්ධනය වෙයි. පෙරහැරේ තුන්වන අවස්ථාව රන්දෝලි පෙරහැරයි. එය එකොළොස්වන දවසේ සිට පසළොස්වන දවස දක්වා දිනපතා රාත්‍රියට වීථි සංචාරය කරයි. රන්දෝලි පෙරහැර අඞග සම්පූර්ණ ය. රන්දෝලි යනු දෙවියන්ගේ බිසෝවරුන් ය. රන්දෝලි පෙරහැරේ දෙවියන්ගේ බිසෝවරුන් නිරූපණය කිරීමට චිත්‍ර වස්ත්‍රයෙන් ආවරණය කරන ලද පල්ලැක්කි ඔසවාගෙන යනු ලැබේ. දවසින් දවස යම් යම් අඞගවලින් (නැටවුවන්ගෙන්, අලි ඇතුන් ගණනින්) පෙරහැර වැඩි දියුණු වෙයි. පසළොස්වන දින රාත්‍රිය පෙරහැරේ උත්කර්ෂවත් රාත්‍රිය යි. පෙරහැරේ මුලින් ගමන් කරන්නේ දළදා පෙරහැරයි. ඊළඟට පිළිවෙළින් නාථ, විෂ්ණු කතරගම හා පත්තිනි දේවාලවල පෙරහැර ගමන් කරයි.

පෙරහැර පිටත්වන්නේ නැකැත් වේලාවකට ය. වෙඩි ශබ්දයකින් පෙරහැර පිටත්වන වේලාව දැනුම් දෙනු ලැබේ. පෙරහැර පිටත්වන්නේ දළදා මාළිගාවෙනි. දේවාල පෙරහැරත් සූදානම් වී දළදා මාලිගාවට පැමිණෙයි.

දළදා පෙරහැරේ මුලින් ම ගමන් කරන්නේ කස පුපුරවන්නෝ ය. ඊළඟට ගිනිබෝල කරකවන්නන් සහ පන්දම් කාරයෝ ගමන් කරති. මේ නිසා දෙපස නරඹන්නන් ඈත් වී පෙරහැර ගමන් කරන මාර්ගයේ ඉඩකඩ සකස් වෙයි. ඉක්බිති ගමන් කරන්නේ හේවිසි ගසන්නන් හා හොරණෑ පිඹින්නන් ය.

පුරාණයේ දී ප්‍රාදේශීය අධිපතීහු තම තමන්ගේ ප්‍රාදේශීය කොඩි සහිතව ඇතුන් පිටින් පෙරහැරේ අනුපිළිවෙළට ගමන් කළහ. ඒ ගමන් කළ අනුපිළිවෙළ මෙසේ ය.

1. ලේකම් මිටිය සහ පන්හිඳ සහිත මහලේකම් මහත්මයා
2. හස්තියා මහා කොඩිය සහිත ගජනායක නිලමේ.
3. කොඩිතුවක්කු මහ කොඩිය සහිත කොඩිතුවක්කු නිලමේ.
4. ඉරහඳ මහ කොඩිය සහිත හතර කෝරළේ දිසාව.
5. සිංහයා මහ කොඩිය සහිත සත් කෝරළේ දිසාව.
6. හංසයා මහ කොඩිය සහිත ඌව දිසාව.
7. සූදු මහ කොඩිය සහිත මාතලේ දිසාව.
8. පටරෙදි (කහපට) මහ කොඩිය සහිත සබරගමුවේ දිසාව.

9. ගෙරුණ්ඩ පක්ෂි මහ කොඩිය සහිත කෝරළ තුනේ දිසාව.

10. මයුර මහ කොඩිය සහිත වලපනේ දිසාව.

11. නෙලුම් මල් මහ කොඩිය සහිත, උඩ පළාතේ දිසාව.

12. ගජසිංහ මහ කොඩිය සහිත නුවර කලාවිය දිසාව.

13. කොටියා මහ කොඩිය සහිත වෙල්ලස්සේ දිසාව.

14. ගිරවා මහ කොඩිය සහිත බින්තැන්නේ දිසාව.

15. වලහා මහ කොඩිය සහිත තමන්කඩුවේ දිසාව.

16. ඇතුන් හා මාලිගාවේ ආවතේවකාරයින් විසින් පිරිවරන ලද දළදා කරඬුව රැගත් දළදා මාලිගාවේ හස්තිරාජයා.

මෙකල පැරණි මහ දිසාපතිවරුන් නොමැති වුවත් එම ප්‍රාදේශීය කොඩි පෙරහැරේ ගෙන යනු ලැබේ.

පෙරහැරේ ඉතා අලංකාර දර්ශනයක් වන්නේ රන් වැඩ දැමූ අගනා ඇඳුම් හා ආයිත්තම් වලින් සැරසුණු, ගෙල බැඳි මිණි හඬ නංවමින් ගමන් කරන අලි ඇතුන්ගේ විලාශයයි.

සාමාන්‍යයෙන් එක් පෙළකට අලි, ඇත්තු තිදෙන බැගින් ගමන් කරති. අලි ඇතුන් දෙපළක් අතර රඟ දෙන නැටුම් කණ්ඩායමකි. වෙස්, පන්තේරු, උඩැක්කි, ලී කෙළි, කඩු හරඹ, කළ නැටුම්, කුළු නැටුම් ආදී විවිධ නැටුම් කණ්ඩායම් වෙන් වෙන් වශයෙන් නටමින් යෙති. විලක්කු කර තබා ගත් අය දෙදෙනා බැගින් ආලෝකය සපයමින් දෙපසින් ගමන් කරති.

ඒ අතර විවිධ කොඩි, සේසත්, හා මුර ආයුධ දරන්නෝ පෙරහැරට ගාම්භීර බවක් දෙති. දළදා මාලිගාවේ මඞ්ගල හස්ති රාජයා මා හැඟි වස්ත්‍රාභරණයෙන් දිලිහි දිලිහී විදුලි බුබුළින් අලංකාර වූ ධාතු කරඬුව පිටින් ගෙන, සුදු වියන් යටින් හා සුදු පියවිලි උඩින් ගෙළ බැඳි මිණි කිංකිණි හඬවමින්, රිද්මයකට ගමන් කරන්නේ තමා සතු වගකීම මැනවින් අවබෝධ කොට ගෙන ඉතා සංසුන්ව නමුත් තේජාන්විත විලාශයකිනි. ඒ පිටිපසින් රජ ඇඳුමින් සැරසුණු දළදා මාලිගාවේ දියවඩන නිලමේ තුමා ඔසවන ලද සුදු කුඩ, සේසත් මුරායුධ ගත් පරිවාර ජනයා සමඟ ඇත් ගමනින් ගමන් කරන්නේ මහත් උදර ලීලාවෙනි.

දළදා මාලිගාවේ පෙරහැර අවසන් වූ පසු පිළිවෙළින් එක් එක් දේවාල පෙරහැර ගමන් කරයි. දේවාල පෙරහැර ද බොහෝ දුරට

දළඳ පෙරහැරේ ඇති අඞගයන්ගෙන් ම යුක්ත වෙයි. ඒවායේ විශේෂ අඞග ද නැත්තේ නොවෙයි. කතරගම දේවාල පෙරහැරේ ගමන් කරන කාවාඩි නැටුම එබඳු විශේෂාඞගයකි. එක් එක් දේවාල පෙරහැර අවසානයේ අදළ දෙවියන්ගේ ආභරණ රන්සිවි ගෙයක තැන්පත් කොට ඇතු පිටින් වැඩම කරනු ලැබේ. දේවාලවල බස්නායක නිලමෙවරු ද උඩරට නිලමේ ඇඳුමින් සැරසී තම තමන්ගේ පෙරහැර අවසානයේ ගමන් කරති.

පෙරහැරේ අවසාන ම අඞගය වන්නේ දෙවියන්ගේ රන්දෝලි (පල්ලැක්කි) රන් කලස්, කඩු හා ආභරණ සහිතව උසුලාගෙන යාමය. මේ සමඟ දේවාලවලට අයත් ස්ත්‍රීන් පමණක් නොව රදළවරුන්ගේ කුමාරිහාමිලා සහ දූවරු ද පිරිවර සහිතව එකල ගිය බව රොබට් නොක්ස් කිය යි.

දිය කැපීමේ ප්‍රධාන චාරිත්‍රයෙන් පෙරහැර අවසන් වෙයි. මහනුවර ඇසළ පෙරහැරේ දිය කැපීම සිදුවන්නේ මහවැලි ගඟේ ගැටඹේ තොටේ දී ය. අවසන් දින රාත්‍රියේ පෙරහැර දිය කැපුම් තොටට පැමිණිවිට කපුරාළලා සරසන රුද ඔරුවකින් ගඟ මැදට ගොස් අලුයම් වේලෙහි රන් කඩුවකින් දිය කපති. මේ අවස්ථාවේ දී ඉහත අවුරුද්දේ පිර වූ රන්කෙණ්ඩියෙහි ජලය හිස් කොට, එය කඩුවෙන් කපනු ලැබූ ජලයෙන් පුරවනු ලැබේ. මෙයින් ඉක්බිති කපුරාළලා අෂ්ටකයක් හා පිරිත් පොතින් ජයමඞගල ගාථා ද කියා දේවාභරණ සහ පැන් කෙණ්ඩිය ආපසු දේවාලය කරා ගෙන එති. පැන් කෙණ්ඩිය ඊළඟ අවුරුද්ද දක්වා සුරක්ෂිතව තබා ගනු ලැබේ. මෙතෙක් කළ විස්තර අනුව මහනුවර ඇසළ පෙරහැර බෞද්ධ හා හින්දු චාරිත්‍ර මිශ්‍ර වූවක් බව පෙනෙයි.

## 5. 3 (2) මිහිඳු උත්සවය/මිහිඳු පෙරහැර පිළිබඳ සිරිත්.

ලක්වැසි බෞද්ධයන් විසින් අනුබුදු හිමියන් ලෙසින් සලකනු ලබන මහින්ද මහ රහතන් වහන්සේ සිහිකර උපහාර දක්වීම වස් පවත්වනු ලබන මිහිඳු උළෙල ද බොහෝ ඈත කාලයක සිට ලක්දිව පවත්වාගෙන යනු ලබන්නකි. මහාවංශය අනුව මෙම උත්සවය ආරම්භ කොට ඇත්තේ කිත්සිරි මෙවන් රජු (301 – 328) කාලයේ ය. රජතුමා මිහිඳු හිමියන්ගේ ශරීර ප්‍රමාණයට ම රනින් පිළිරුවක් තනවා වප්මස පුර සතවක්ද එය මිහින්තලාවේ අඹතලා වෙහෙරට වැඩම කරවිය. මේ උත්සවයේ දී මහ දන් පැවැත් වූ බව ද කියනු ලැබේ. ඉක්බිති රජතුමා මිහින්තලාවේ සිට අනුරාධපුරය දක්වා මහ මඟ සරසවා, තමා විසින් ම අනුරාධපුර නැගෙනහිර පැත්තෙහි සාදවන ලද සොත්ථියාකර විහාරයට මිහිඳු පිළිමය වැඩමවන ලද්දේ ගිහි පැවිදි පිරිස් සහිත



6. ර.මු.නී.ස. 090669

මහ පෙරහැරකිනි. සොත්ථියාකර විහාරයේ තෙදිනක් වඩා හිඳුවන ලද ප්‍රතිමා වහන්සේ නැවත දෙළොස්වන දින අනුරාධපුර නුවර සරසන ලද මහ වීථි මැදින් මහා විහාරයට වැඩමවන ලදී. ඉක්බිති මහජන ප්‍රදර්ශනය සඳහා මිහිඳු ප්‍රතිමාව සිරි මහ බෝ මලුවෙහි තෙමසක් වඩා හිඳුවන ලද්දේ ය. අන්තිමේ දී රජතුමා නුවර ගිනිකොණ විශේෂ මන්දිරයක් සාදවා මිහිඳු ප්‍රතිමා වහන්සේ එහි වඩා හිඳුවා, මිහිඳු හිමියන් සමග පැමිණි අනෙක් පිරිසගේ ද පිළිරූ කරවා එහි තැබ්බවීය. ඉක්බිති ප්‍රතිමාවහන්සේලාගේ ආරක්ෂාවට හා පූජාවට වැටුප් ද තබා මතු එන රජවරුන් ද මෙ උළෙල මෙසේ පැවැත්විය යුතු යැයි රජතුමා විසින් නියෝගයක් ද කරන ලද්දේ ය.

පසුව රජ පැමිණි රජවරු මිහිඳු උළෙල වාර්ෂිකව පැවැත්වූ බව පෙනේ. චූලවංශය රචනා කළ ධර්ම කීර්ති හිමියෝ එය ලියනු ලැබූ 13වන සියවසේ දී ද මිහිඳු පෙරහැර පවත්වනු ලැබූ බව කියති.

මෙකල මිහිඳු උත්සවය පවත්වනු ලබන්නේ මිහිඳු මා හිමියන් ලක්දිවට වැඩි පොසොන් පුර පසළොස්වක දින ය. මිහින්තලේ, අනුරාධපුරය වැනි නගරවල පමණක් නොව දිවයිනේ විවිධ විහාර ආරාම ආශ්‍රිතව මිහිඳු උත්සවය පවත්වනු ලැබේ. උත්සවයේ ප්‍රධාන අංගය වනුයේ මිහිඳු ප්‍රතිමා වහන්සේ නමක් අලංකාර ලෙස සරසන ලද රථයක තබා පෙරහැරින් වීථි සංචාරය කරවීමයි. මහින්දගමනයේ විවිධ සිද්ධීන් නිරූපනය කරන චිත්‍ර වස්තුයෙන් රථය අලංකාර කිරීම ද බොහෝ විට දක්නට ලැබේ. සමහර පෙදෙස්වල මිහිඳු පෙරහැර අලි ඇතුන් සහිත නැටුම් කණ්ඩායම් වලින් යුක්තව ඉතා දර්ශනීය තත්ව-යක් උසුලයි. කොඩි, මල් අතු, සේසත්, ගත් ළමයින් පෙරහැරේ ඉදිරියෙන් ගමන් කරද්දී, සුදු වතින් සැරසුණු උවැසියෝ අතින් ගත් මල්වට්ටි හා පූජා භාණ්ඩ සහිතව සාධුකාර දෙමින් ප්‍රතිමා වහන්සේ වැඩමවනු ලබන රථය පිටුපසින් ගමන් කරති. මෙම පෙරහැර වැඩි වශයෙන් පවත්වනු ලබන්නේ සන්ධ්‍යා භාගයේ ය.

මිහිඳු උත්සවය සම්බන්ධ ව බුද්ධ පූජා, පහන් පූජා හා ධර්ම දේශනා ආදිය ද පවත්වනු ලැබේ. මෙදින රාත්‍රියේ පවත්වනු ලබන ධර්මදේශනාවක මාතෘකාව වනුයේ මිහිඳු මා හිමියන් තිස්ස රජ්ජුරු-වන්ට මුලින් ම දේශනා කළ ''චූල්ලහත්ථිපදෝපම සූත්‍රය''යි.

බෞද්ධ සැදැහැවතුන් අනුරාධපුරයට හා මිහින්තලාවට වන්දනාවේ යාමත්, පොසොන් පුර පසළොස්වක් දින එකී ස්ථානයන්හි පෙහෙවස් සමාදන් වීමත් සිරිතක් වශයෙන් කෙරේ. සැදැහැවත් බෞද්ධයන් විසින් විදුලි බුබුලින් අලංකාර කරනු ලබන මිස්සක පව්ව හා එහි ගොඩනැගිලි පොසොන් පොහෝ දින රාත්‍රියේ ඉතාමත් සිත් ගන්නා දර්ශනයක් වෙයි. මිහින්තලේ සිදු කෙරෙන ධර්ම දේශනා ආදී ආගමික වැඩ

සටහන් ගුවන් විදුලිය හා රූපවාහිනිය මගින් විකාශනය කිරීමට ද දූන් කටයුතු කරනු ලැබේ.

**සංඝමිත්තා පෙරහැර.**

උඳුවප් පුර පසළොස්වක් පොහොය දින පවත්වනු ලබන සංඝමිත්තා පෙරහැර ද මිහිඳු පෙරහැර වැන්නකි. ලක්දිවට ශ්‍රී මහා බෝධීන් වහන්සේ වැඩම වීමත් මෙහෙණි සස්න පිහිටුවීමත් සිහිපත් කර සංඝමිත්තා රහත් මෙහෙණින් වහන්සේට උපහාර දක්වීම සංඝමිත්තා පෙරහැරේ අරමුණයි. පාත්‍රයක වඩා හිඳුවන ලද බෝධි අංකුරයක් අතැතිව සංඝමිත්තා මෙහෙණින් වහන්සේ ගේ පිළිරුවක් රථයක වඩා හිඳුවා පෙරහැරින් වීථි සංචාරය කරවීමෙන් මෙම උත්සවය පවත්වනු ලැබේ. මිහිඳු පෙරහැර මෙන් ම සංඝමිත්තා පෙරහැර ද දිවයිනේ බොහොයෙක් ප්‍රදේශවල පවත්වනු ලැබේ.

**වෙනත් පෙරහැර සහ පෙරහැර පිළිබඳ පොදු චාරිත්‍ර.**

මිහිඳු පෙරහැර, සංඝමිත්තා පෙරහැර හැරුණු විට වෙනත් ආගමික ජාතික වීරවරයන් සිහිකිරීම සඳහා ද, විශේෂ අවස්ථාවල දී පෙරහැර පවත්වනු ලැබේ. බොහෝ විට ඒ උතුමන්ගේ උපත් දිනයන් හෝ අභාවප්‍රාප්ත දිනයන් සම්බන්ධව යෙදෙන සාංවත්සරික දිනයන් මේ සඳහා යොදා ගනු ලැබේ. මෙබඳු පෙරහැරවල දී අදාළ පුද්ගලයාගේ ප්‍රතිමා හෝ ඡායාරූප හෝ පින්තූර පෙරහැරේ ගෙනයනු ලැබේ.

විවිධ ආගමික කටයුතුවල අංගයක් වශයෙන් ද බෞද්ධ පෙරහැර යොදා ගැනීමට සිදුවේ. එබැවින් බෞද්ධ පෙරහැරක තිබිය යුතු මූලික ලක්ෂණ හඳුනා ගත යුතු ය. බෞද්ධ පෙරහැරකින් නරඹන්නන් තුළ ශ්‍රද්ධාව ජනිත විය යුතු වේ. එබැවින් හාස්‍යයට හේතුවන බහුරූ කෝලම් එයින් ඉවත් විය යුතු ය.

පෙරහැරක් ගමන් කරන මාර්ගය ද ගොක් රැහැන් ආදිය ඇදීමෙන් සැරසීම ද සිරිතකි. පෙරහැර ආරම්භ කිරීමට පළමු සියලු දෙනා ම පන්සිල් සමාදන් විය යුතු ය. අපිරිසිදු ඇඳුම් ඇඳ පෙරහැරවල ගමන් කරනු නොලැබේ. බෞද්ධ පෙරහැරක ගමන් කරන ගැහැණු පිරිමි කාටත් ගැළපෙන්නේ චාම් ඇඳුම ය. බෞද්ධ කොඩි, ජාතික කොඩි හා සේසත් ආදිය පෙරහැරේ ඉදිරියෙන් පිළිවෙළකට රැගෙන යා යුතු ය. බෙර වයන්නන් හා හොරණෑ පිඹින්නන් ඊළඟට ගමන් කිරීම සාමාන්‍ය සිරිත ය. සුදු කොඩි, සහ කොඩි, මල් වට්ටි හා වෙනත් පූජා භාණ්ඩ රැගෙන යන්නන් ශාන්තව ඊළඟට ගමන් කරනු ලැබේ. ධාතු කරඬු, පිළිම, පිරිත් පොත් ආදිය වැඩම වනු ලබන්නේ වියන් යටිනි. එබඳු අවස්ථාවක දී සාදුකාර දීම ද සිරිත වේ. සංඝයා වහන්සේලා වුව ද

හැකි සෑම අවස්ථාවල දී වියත් යටින් වැඩම වන්නේ නම් මැනවි. සංඝයා වහන්සේලා පෙරටු කොට ගිහි උපාසක උපාසිකාවන් පෙළ සැදී, කොඩි, මල් ආදිය රැගෙන සාදුකාර දෙමින් ගමන් කරන්නේ නම් ඉතා අලංකාර ය. කුඩා වුවත් ත්‍රිවිධ රත්නය ම වැඩම කරවනු ලබන්නේ නම් එය අඩංග සම්පූර්ණ බෞද්ධ පෙරහැරක් ලෙස සලකනු ලැබේ. පෙරහැරේ අරමුණ අනුව සුදුසු සංස්කෘතික අඩංග එකතු කිරීම වරදක් නොවේ.

## 5. 4 නේත්‍ර ප්‍රතිෂ්ඨාපන මංගල්‍යය හා සම්බන්ධ චාරිත්‍ර.

මෙය විහාර කර්මාන්තය පිළිබඳ ව වැදගත් උත්සවයකි. අලුතෙන් නිර්මාණය කරන ලද බුදු පිළිම වහන්සේ නමකට හෝ ජරාවාස වූ පිළිම වහන්සේ නමක් පිළිසකර කිරීමෙන් පසු හෝ පවත්වන්නා වූ පිළිමයට නෙත් තැබීමේ උළෙල නේත්‍ර ප්‍රතිෂ්ඨාපන මංගල්‍යය ලෙස හැඳින්වේ. නේත්‍ර මංගල්‍යයේ ආරම්භය දෙස බැලීමෙන් පෙනෙනුයේ එය දෙවිවරුන්ට නෙත් තැබීම සඳහා පිළියෙල කරගත් හින්දු සිරිතක් බව ය. පසු කාලයේ දී බුදු පිළිම වලට නෙත් තැබීමටත්, හින්දු චාරිත්‍ර ම යොදා ගෙන ඇති බව පෙනේ. නේත්‍ර තැබීමෙන් කෙරෙන්නේ පිළිමයෙන් නිරූපිත දෙවියා හෝ උත්තමයා පණ ගැන්වීම ය. ථෙරවාද බුදු දහම අනුව බුදුරජාණන් වහන්සේ මෙකල ජීවමාන නොනැත්තකු නොවන බැවින් මෙසේ පණ ගැන්වීමක් අවශ්‍ය නොකෙරේ. බුදු පිළිම වහන්සේට හෝ දේව ප්‍රතිමා වලට ගරු බුහුමන් පුද සත්කාර පැවැත්-වීම ආරම්භ කරන්නේ නේත්‍ර ප්‍රතිෂ්ඨාපනයෙන් පසුව ය. ප්‍රතිමා ශිල්පියා "ඇස්වහ" වැනි වස් දෙස් වලින් ඉවත්කර ගැනීම ද මෙම උත්සවයේ එක් අදහසකි.

**උත්සවයට සූදානම.**

නේත්‍ර මංගල්‍යය සඳහා මුලින් ම කරනු ලබන්නේ ශුභ දවසක් හා නැකතක් යොදා ගැනීමයි. බුදුරජාණන් වහන්සේ බුද්ධත්වය ලැබූ වේලාව වන අලුයම 5ට ආසන්නව යෙදෙන ශුභ නැකතක් මේ සඳහා අවශ්‍ය ය. එබඳු නැකතක් ලැබෙන තුරු උත්සවය කල්දැමීම සාමාන්‍ය සිරිත ය.

උත්සවයට පෙර දින සවස 6ට පමණ කෝසල බිම්බ වර්ණනාවේ කවි කීමෙන් උත්සවය ආරම්භ වේ. කෝසල බිම්බ වර්ණනාවේ ඇතුළත් වන්නේ බුද්ධ කාලයේ දී කොසොල් රජතුමා රන් සඳුනෙන් බුදු පිළිමයක් සාදා වැඳුම් පිදුම් කළ බව කියැවෙන කථා පුවතකි. රාත්‍රී අටට නවයට පමණ "කළස්ථාපනය" හෙවත් කළ පිහිටුවීම කරනු ලැබේ. පසු දින පාන්දර 3ට පමණ "මල්පැල" වෙත පිදේනි දෙනු ලැබේ. නේත්‍ර සිත්තම් කරනු ලබන්නේ පාන්දර 5ට පමණ

නැකැත් වේලාවට ය. මෙ වන විට කල් තියා සූදානම් කර ගත් යුතු වැඩ කටයුතු රැසකි. විහාරයෙන් පිටත අට කොණෙහි ඉන්ද්‍ර, වරුණ, ආදී දිසා අධිපති දෙවිවරුන් වෙනුවෙන් පූජාසන අටක් ඉදි කරනු ලැබේ. තවද දෙරකඩ දෙපස ද්වාර පාලක දෙවිවරුන් සඳහා පූජාසන දෙකක් ද, දෙරකඩ ඉදිරිපිට ඉඩම භාර ක්ෂේත්‍රපාල දෙවියන්ට තවත් පූජාසනයක් ද පන්සල් ඉඩමෙන් බාහිර ව "බඩගපාල" දෙවියන්ට පූජාසනයක් ද පිළියෙල කිරීම සිරිතක් වශයෙන් කෙරේ. "කළස්ථානය" හෙවත් කළ පිහිටුවීම සඳහා හාල්, පොල්, හකුරු හා මුදල් දමූ මුට්ටු අසුවක් සකස් කිරීම තවත් සිරිතකි.

කළ පිහිටුවීම කරන්නේ මෙසේ ය. බිම හාල් අතුරා එහි ඇඟිල්ලෙන් අටමඟල අඳිනු ලැබේ. අටමඟල යනු— බෙරය, වෘෂභයා, නාගයා, විජිනිපත සිංහයා, මකරා, පුරුෂ කොඩිය සහ පහන යන මඞ්ගල වස්තු අට සම්බන්ධ කොට අඳිනු ලබන යන්ත්‍රයකි. අටමඟල මත පැදුරු එලා ඒ මත වී පස්වර්ගයක් තුනියට අතුරා පොල් කොළ තීරුවලින් ඒ ප්‍රදේශය අටකට බෙදනු ලැබේ. ඉක්බිති එක් කොටසකට කළ 40ක් වන සේ කළ කොටස් දෙකකට බෙද ඒ මත තබනු ලැබේ. එක් කළ කොටසක් බ්‍රහ්ම ගර්භය නමින් ද, අනෙක් කළ කොටස විෂ්ණු ගර්භය නමින් ද හැඳින්වෙයි. රන්, රිදී මුතු හා නව රුවන් සහිත බ්‍රහ්ම කළය නමින් හැඳින්වෙන විශේෂ මුට්ටියක් බ්‍රහ්ම ගර්භය මධ්‍යයෙහි ද, විෂ්ණු කළය නමින් හැඳින්වෙන සහල් සහිත මුට්ටියක් විෂ්ණු ගර්භය මධ්‍යයෙහි ද තැන්පත් කරනු ලැබේ. මෙ ප්‍රධාන මුට්ටි සේරක්කාල නමින් හැඳින්වෙන පුවරු මත තබන බැවින් අනෙක් මුට්ටිවලට වඩා ඉහළින් පිහිටයි. එක් එක් මුට්ටිය ලේන්සුවකින් වසනු ලැබෙයි. ඉක්බිති කන්‍යාතූල නමින් හැඳින් වෙන නූලක් ඒ සියලු ම මුට්ටි වටා ඇද, පංචවර්ණ රෙද්දකින් සියලු ම මුට්ටි වසනු ලැබේ.

විහාරය ඇතුළත ගණ දෙවියන් සඳහා ආසනයක් ද ඉන්ද්‍රකීලයක් ද පිළියෙල කරනු ලැබේ. රුක් අත්තන කෝටුවක් වටා කඩමාලු එතීමෙන් සාද ගත් රූපයකි ඉන්ද්‍රකීලය. නවරත්න, රන්, හාල් ආදිය යෙදූ කළ ගෙඩියක ඉන්ද්‍රකීලය සිටුවනු ලැබේ. ඉන්ද්‍රකීලය සහිත කළය තබන්නේ බුදු පිළිම වහන්සේ ඉදිරිපිට විහාර බිමෙහි ඇතුළත හාල්මත අඳින ලද අටමඟලක් මධ්‍යයෙහි ය. ඉහත සඳහන් මෙ සියල්ල පිළියෙල කරනු ලබන්නේ ධෝතිය, සාලුව, තිස්වැස්ම, කඩුක්කන් හා පූනනූල යන බ්‍රාහ්මණ ඇඳුම් පැළඳුමින් සැරසුණු ශිල්පීන් කිප දෙනකුන් විසිනි. ඉක්බිති කුප්පොට්ටිය, හැට්ටය, ලේන්සුව, උස් ජගලත් තොප්පිය යන රතු පාට ඇඳුම් කට්ටලයකින් සැරසුනු නව කෙනෙක් කඩුවක් දරා, දුම් කබලක් හා කොතලයක් ගෙන, සංස්කෘත

ශ්ලෝක ගායනය කරමින් සියලු ම පූජාභාන්ඩ කරා ගොස් සුවඳ හා පැන් පූජා කරයි. ඉක්බිති හෙතෙම විහාරය දස වරක් පැදකුණු කොට, බෙර හොරණෑ සහිත පෙරහැරකින් බඩගපාල පූජාසනය වෙත ගොස් පූජා පවත්වා ආපසු විහාරයට පැමිණෙයි. බෙර හඬින් අදහස් කරන්නේ පුද ලබන්නවුන්ගේ අවධානය යොමු කිරීම යි.

**නේත්‍ර තැබීම.**

උත්සවයේ වැදගත් කොටස ඇත්තේ ඊළඟටයි. රජතුමා වෙනුවට පෙනී සිටින ප්‍රධාන ශිල්පියා තුප්පොට්ටිය, හැට්ටය, තොප්පිය, කබාය හා ආභරණ සහිත රජ ඇඳුමින් සැරසී වහන්තරාව නමැති අගනා රෙද්දකින් ද හිස වසා ගෙන පැමිණෙයි. වහන්තරාවකින් හිස වසා ගත් දෙවැන්නෙක් ද කැඩපතක්, තෙලිකූරු, සහ කළු සායම් රැගෙන ඔහුට සහායට එකතුවෙයි. ස්තෝත්‍ර කීමට බ්‍රාහ්මණයෙක් ද මේ දෙදෙනාට එකතුවෙයි. විහාර දොර විවෘත කළ පසු එළන ලද පියවිලි උඩින් ප්‍රධාන ශිල්පියාත්, දෙවැන්නාත් බ්‍රාහ්මණයාත් විහාරයට ඇතුල් වෙති. දෙවැන්නා ඉන්ද්‍රකීලය අබියස ඇති පිළිමය වෙත ගොස් කැඩපත ඇල්ලූ විට පළමුවැන්නා නෙත් සිත්තම් කරයි. මෙසේ කරන විට දෙවැන්නා හා බ්‍රාහ්මණයා මන්ත්‍ර ජප කරති. කැඩපත ඇල්ලීමේ අදහස පිළිමයේ බැල්ම ලබා ගැනීම යි. කුඹුරට එන කුරුල්ලන් හය වද්දනු පිණිස නොව බැල්ම ලැබීමෙන් ඇස්වහ දෙස් දුරු කිරීම, කෙතක බැඳි පඹයකුගෙන් බලාපොරොත්තු වූවා සේ ඉන්ද්‍රකීලයෙන් බලාපොරොත්තු වූ එක් කාරණයක් නම් වස් දෙස් දුරු කිරීම ය.

නේත්‍ර සිත්තම් කිරීම අවසන් කළ ප්‍රධාන ශිල්පියා හෝ සිත්තරා ඇස් වැසෙන සේ වහන්තරාව ඇඳ ගනී. ඉක්බිති කලින් පිළියෙල කළ දිය බඳුනක් වෙත ඔහු කැඳවා ගෙන යනු ලැබේ. ශිල්පියා මෙහි දී අෂ්ටක කියමින් හිස දෙවා ගනී.

මෙම අෂ්ටක (ස්තෝත්‍ර) මගින් කෙරෙන්නේ ගංගා, යමුනා, ගෝදාවරී, සරස්වතී, නර්මදා, සින්ධු හා කාවේරී යන ශුද්ධ වූ සප්ත ගංගා ජලයෙන් උත්සවය පවිත්‍ර කිරීමට කරන ඉල්ලීමකි. අෂ්ටක කියා, කඩුවෙන් දිය කපා, පසුව බඳුන සුණු විසුණු කරනු ලැබේ. මෙයින් පසු විහාරයේ දොරවල් විවෘත කරවා ප්‍රධාන ශිල්පී තෙමේ ප්‍රධාන විහාර දොරටුව වෙත පැමිණෙයි. එහි දී ඔහුට තෑගි පිරිනමනු ලැබේ. හේ තෑගි ශිෂ්‍යයකුට දී දිය මතුරා පිරිසට ඉසියි. මෙවැනි පුද පූජා සියල්ල අවසන් වූ විට පිළිම වහන්සේ ඉදිරිපිට ඇති තිරය ඉවත් කෙරෙයි.

ඉහත සඳහන් චාරිත්‍රවල යම් යම් ප්‍රාදේශීය වෙනස්කම් තිබිය හැකි ය. මේවායේ බෞද්ධ ලක්ෂණ ඉතා ම විරළ බව පෙනේ.

එහෙත් නේත්‍ර මංගල්‍යය පිංකමක් වශයෙන් යොදා ගත්තා බෞද්ධයෝ මේ සිරිත් වලට අතිරේකව පිරිත් දේශනා හා සාංඝික දාන ආදිය යොදා ගැනීමෙන් මෙම උත්සවයට බෞද්ධ මුහුණුවරක් දෙති.

**වැඩිදුර කියවීමට.**

1. ආනන්ද කුමාරස්වාමි — මධ්‍ය කාලීන සිංහල කලා ශිල්ප.

   2 පරිච්ඡේදය

   3 පරිච්ඡේදයේ උපග්‍රන්ථය, 2 නේත්‍ර මංගල්‍ය ය.

## 6. පාඩම

# බෞද්ධ පාලකයන්ගේ සිරිත් විරිත්

### 6. 1 ආදි බෞද්ධ පාලකයින්ගේ සිරිත්.

රජ පදවිය දේව නිර්මාණයක් ලෙස හින්දු ග්‍රන්ථවල සඳහන් වෙයි. එහෙත් බෞද්ධ ග්‍රන්ථ අනුව මුල් ම රජතුමා තෝරා ගනු ලැබුවේ මහජනයාගේ කැමැත්තෙනි. දීඝ නිකායේ අග්ගඤ්ඤ සූත්‍රයේ සඳහන් වන පරිදි, මිනිසුන් සොරකම් කිරීම, මිනී මැරීම වැනි සමාජ විරෝධී වැරදි වැඩ කරන කාලයක දී එබඳු වැරදි වැඩ කරන්නන් මර්දනය කිරීමට නායකයකුගේ අවශ්‍යතාවය මහජනයාට පෙනී ගියේ ය. මේ අවස්ථාවේදී සාකච්ඡා කොට 'මහා සම්මත' නමින් රජකු පත්කර ගත් බව පෙනේ.

මේ රජතුමාට පැවරුණු කාර්යය වූයේ වැරදි කරන්නවුන්ගේ දෙස් පෙන්වා ඔවුනට නින්දා කටයුතු නම් නින්දා කිරීම හෝ නෙරපා හැරිය යුතුනම් නෙරපා හැරීම හෝ සුදුසු දඬුවම් පැමිණ වීම ය. කොටින් ම රජුගේ කාර්යය වූයේ ධර්මය ආරක්ෂා කිරීම ය. රජුගේ මේ කාර්යය සඳහා රජුට වැටුපක් වශයෙන් ධාන්‍ය කොටසක් දීමට මිනිස්සු පොරොන්දු වූහ. රජ අධර්මය දුරන් කොට ධර්මය පවත්වා ගනිමින් මහජනයාගේ සිත් අලවන්නේ ය හෙවත් රංජනය කරන්නේ ය යන අදහසින් රජ යන නාමය භාවිත වන්නට විය. මේ අනුව අපට පැහැදිලි විය යුතු එක් කරුණක් නම් මහජන වැටුපෙන් රැකෙන රජකුගේ සියලු සිරිත් විරිත් හෝ චර්යාවන් මහජනයාගේ හිත සුව පිණිස හෙවත් රැකවරණ ධර්මය රැකීම පිණිස විය යුතු බව ය.

**සක්විති රජ සිරිත්.**

බුදුරජාණන් වහන්සේ නොයෙක් අවස්ථාවල දී "ධම්මිකො ධම්මරාජා" නමින් හඳුන්වන ලද රජතුමා රටවැසියා නොපෙළන්නෙකි. අවි බල-යෙන් ජනතාව යටපත් නොකරන්නෙකි. අයුක්තිය අසාධාරණය පිටුදක යුක්තිය හා සාධාරණය මත ක්‍රියා කරන්නෙකි. තිරිසනුන්ගේ පවා ආරක්ෂණය සලස්වන මේ ධාර්මික රජතුමා බෞද්ධ පොත්පත්වල සඳහන් වන්නේ චක්‍රවර්ති රජ (සක්විති රජ) නමිනි. ඔහු සාධාරණ ධාර්මික පාලකයකු වී සතර දිසාව ජයගෙන, ජනපද ආදිය තහවුරු කර ගෙන, අවි ආයුධ පාවිච්චි නොකොට දැහැමෙන් සෙමෙන් පොළොව ජයගෙන වෙසෙන්නෙකි.

සක්විති රජකු විසින් ඉටු කරන සිරිත් දහයක් "දස සක්විති වත්" නමින් චක්කවත්ති සීහනාද සූත්‍රයේ විස්තර වෙයි. ඒවා මෙසේ ය.

සක්විති රජතුමා,

1. දස කුසල්හි හැසිරෙමින්, ධර්මය ම ඇසුරු කොට අඹුදරුවන් ආදී ඇතුළත ජනයාට ධාර්මිකව ආරක්ෂණය සපයයි.
2. ධර්මය ම ඇසුරු කොට බල සෙනඟ ද ධර්මයෙහි පිහිටුවා ඔවුනට ආරක්ෂණය සපයයි.
3. එසේ ම අනුයුක්ත ක්ෂත්‍රියයන් (යටත් පාලකයන්) ද ධර්ම-යෙහි පිහිටුවා ඔවුනට ආරක්ෂණය සපයයි.
4. එසේ ම බ්‍රාහ්මණ ගෘහපතියන් ද ධර්මයෙහි පිහිටුවා ආරක්ෂණය සපය යි.
5. එසේ ම නියම් ගම් හා ජනපද වාසීන් ද ධර්මයෙහි පිහිටුවා ආරක්ෂණය සපය යි.
6. එසේ ම මහණ බමුණන්ට ද ධාර්මික ආරක්ෂණය සපය යි.
7. එසේ ම මෘග පක්ෂීන්ට ද ධාර්මික රක්ෂාවරණය සංවිධානය කරයි.
8. රටේ අධර්ම ක්‍රියා නොපවත්නා ලෙස කටයුතු සලසයි.
9. කර්මාන්ත ආදිය සඳහා ධනය නොමැත්තන්ට ධනය බෙදා දෙයි.
10. ධාර්මික සිල්වතුන් කරා ගොස් අකුසල් හා අවැඩ බැහැර කරලීමට උපදෙස් ගනියි.

ඉහත සඳහන් දස සක්විති වත් සම්පිණ්ඩනය කළ විට මෙසේ ය.

සක්විති රජතුමා,

1. දැහැමෙන් සෙමෙන් රට පාලනය කරයි.

2. තිරිසනුන් ඇතුළු මිනිසුන්ගේ ජීවිත ආරක්ෂාව සහතික කරයි.

3. ආර්ථික සුරක්ෂිතතාවය තහවුරු කරයි.

4. ප්‍රවීණයන්ගෙන් නිතර නිතර උපදෙස් ලබා ගනියි.

**දස රාජ ධර්ම.**

දස සක්විති වත් හැරුණු විට, බෞද්ධ රජකු විසින් පිරිය යුතු තවත් චාරිත්‍ර දහයක් දස රාජධර්ම නමින් බෞද්ධ පොත පතේ එයි.

ඒවා මෙසේ ය.

1. දානය

කර්මාන්ත ආදිය ආරම්භ කිරීමට මූලධනය නොමැති රටවැසියා වෙත ධනය බෙදා දීම ඔහුගේ සිරිත ය.

2. ශීලය

ඔහු ස්ථාවර ප්‍රතිපත්ති රකින්නෙකි.

3. පරිත්‍යාගය

රටවැසියාගේ දියුණුව පතා හෙතෙම තම ධනය, ශ්‍රමය, කාලය හා සුවපහසුව පරිත්‍යාග කරයි.

4. ඍජු බව

හෙතෙම ජනතා ප්‍රශ්නවලදී යුක්තියට අනුව, පක්ෂ භජනයෙන් තොරව සාධාරණ තීරණ ගනියි.

5. මෘදු බව

ඔහු සෘජු පුද්ගලයකු මෙන් ම දරුණු පාලන ක්‍රම ආදිය භාවිත නොකරන මෘදු ගති ඇත්තෙකි.

6. තපස් බව

ඉඳුරන් හික්ම වූ හේ අහංකාර පරවශ නොවෙයි.

7. ක්‍රෝධ නොකිරීම

සියලු රටවැසියා මාගේ දරුවෝය යන ආකල්පයෙන් යුතුව රට වැසියා වෙත මෛත්‍රී සහගත සිතුවිල්ලෙන් කටයුතු කරන්නෝකි.

8. හිංසා නොකිරීම

පාලන කටයුතුවල දී හිංසා කිරීමෙන් රටවැසියා නොපෙළයි.

9. ඉවසීම

මෙ ක්ෂණික තීරණ ගැනීමෙන් වළකියි. ධනය, ශක්තිය හා තරුණකම ආදියෙන් උද්දමයට පත් නොවී ආචාරශීලීව, බුද්ධිය මෙහෙයවා කලබල නොවී සාධාරණව කටයුතු කරයි.

10. විරුද්ධ නොවීම

පුද්ගලයන්ගේ අදහස් උදහස් රුචි අරුචිකම් ආදිය සමග නොගැටී ජනතාව පොළඹවා ගැනීමට සමත්වෙයි.

බුදුරදුන් විසින් ද අනුමත කළ මේ දසරාජ ධර්ම පසුකාලීන බෞද්ධ සිංහල රජවරුන් විසින් ද සිරිත් වශයෙන් අනුගමනය කළ බව පෙනේ.

**සතර අගති හා සතර සංග්‍රහ වස්තු.**

බෞද්ධ පාලකයකුගේ කාර්යය ජනතා සුබසිද්ධිය සැලසීම ය. මේ සඳහා අනුගමනය කළ යුතු තවත් සීල පද්ධති දෙකක් බෞද්ධ පොත් පත්වල එයි. සතර අගති නමින් හැඳින්වෙන එක් පද්ධතියක් අයහපත් කල්කිරියාවෙන් වැළකීම පිළිබඳ වූ චාරිත්‍ර ශීලයට අයත් වෙයි. සංග්‍රහ කිරීමේ ක්‍රම හතරක් වූ සිව්සහරාවත පිරිය යුතු ධර්ම හෙවත් වාරිත්‍ර ශීලයට ඇතුළත් වෙයි.

ඡන්ද, දෝස, භය, මෝහ යනු හතර අගතිය යි. යුක්තිය, සාධාරණත්වය නොසලකා තමාගේ ඕනෑ එපාකම් පරිදි ස්වකීය අභිමතයට අනුව කටයුතු කිරීම ඡන්දයෙන් අගතියට යාම යි. සුදුස්සන්ට සුදුසු තනතුර නොදී හිතවත්කම, නෑදෑකම හෝ තමාට ලැබිය හැකි වාසි සලකා නුසුදුස්සන්ට තනතුරු පවරීම ද ඡන්දයෙන් අගතියට යාමකි. දෝස යනු තරහ හෙවත් ද්වේෂය යි. ද්වේෂයෙන් යුක්ත වූ විට මධ්‍යස්ථ සාධාරණ තීරණ ගත නොහැකි වෙයි. තමන් අතින් සාධාරණය ඉටු නොවන කල එබඳු පාලකයන්ගේ බිය වැඩි වෙයි. බියට පත් පාලකයා අන්‍යයන් කෙරෙහි සැක පහළ කොට කල්තියා ම ඔවුන් විනාශ කිරීමට උත්සාහ කරයි. මේ බිය නිසා අගතියට යන අයුරු ය. මෝහය යනු මෝඩකම යි. බොහෝ අකුසලයනට මෝහය ද මුල්

වෙයි. යුක්තිය අයුක්තිය තෝරා බේරා ගැනීමට නොහැකිවීම නිසා සමහර පාලකයෝ අගතියට වැටෙති.

මෙසේ අගතියට නොගොස් රජ කරන රජුන්ගේ කීර්තිය පුර පක්ෂයේ සඳ මෙන් වැඩෙන බව දීඝ නිකායේ පාඨයකින් දක්වෙයි.

(''ඡන්ද දෙසා භයා මොහා – යො ධම්මං නාතිවයතති
වඩ්ඪති තස්ස යසො – සුක්ඛ පක්ඛෙව චන්දිමා'')

සාමය හා ආරක්ෂාව පතන රජකෙනකු මහජනයාට සංග්‍රහ කළ යුතු වෙයි. දානය, ප්‍රියවචය, අර්ථචර්යාව හා සමානාත්මතාව ඒ සංග්‍රහ කළ යුතු ආකාරය යි. අවශ්‍ය අයට මූල ධනය වශයෙන් මුදල් හදල්, බීජ ආදිය දීම දානය යි. ස්වකීය නිලධාරීන් හා වැසියන් සඳහා ළගන්නා සිත් නොරිදෙන වචන භාවිත කිරීම ප්‍රියවචනය යි. අර්ථචර්යාව නම් ලෝවැඩ පිණිස හෙවත් පරාර්ථය සඳහා කටයුතු කිරීම යි. සමානාත්මතාව නම් කුල, ආගම් දේශපාලන හේතු ආදිය මුල් කර ගෙන මිනිසුන් නොබෙද මිනිස්කම, බුද්ධිය, උගත්කම තනතුරු ආදිය සැලකිල්ලට ගෙන ඒවාට අනුරූප වන පරිද්දෙන් ජනතාවට සැලකීම යි. මේ අයුරින් සංග්‍රහ කිරීම බෞද්ධ පාලකයකුගේ සිරිත යි.

**සප්ත අපරිහාණිය ධර්ම**.

බුද්ධ කාලීන වජ්ජි රාජ්‍යයේ රජදරුවන් විසින් අනුගමනය කළ, බුදුරදුන් ද ප්‍රශංසාවට ලක් කළ චාරිත්‍ර පද්ධතියක් ''සප්ත අපරිහාණිය ධර්ම'' හෙවත් ''නොපිරිහෙන ධර්ම හතක්'' වශයෙන් බෞද්ධ සාහිත්‍ය පොත්වල එයි. ජනසම්මතවාදී පාලන ක්‍රමයක සාර්ථකත්වයට අතිශයින් හේතුවන වජ්ජි රජවරුන්ගේ සිරිත් කෙටියෙන් මෙසේ ය.

1. ඔවුහු නිතර නිතර රැස්ව ප්‍රශ්න සාකච්ඡා කරති.
2. සමඟියෙන් රැස් වී, සමඟිව කටයුතු කොට සමඟිව විසිර යති.
3. කලින් නොපණවා තිබූ නීති නොපණවති. පණවා ඇති නීති නොකඩවා අනුගමනය කරති.
4. වැඩිහිටියන්ට ගරු බුහුමන් කරති. ඔවුන්ගේ අවවාද පිළිගනිති.
5. විවාහක, අවිවාහක කාන්තාවන්ට කරදර නොකරති. බලහත්කාරකම් නොකරති.
6. රාජ්‍යය ඇතුළත, පිටත පිහිටි පූජනීය ස්ථානවලට ගරු කරති. ඒවා ආරක්ෂා කරති.

7. ආගමික පූජකවරුන්ට ගරු සැලකිලි දක්වති. පහසුකම් සපයති. රාජ්‍යයට නොපැමිණි පූජකවරුන් ගෙන්වා ගනිති.

මේවා විශාලා මහනුවර ලිච්ඡවි රජදරුවන්ගේ සිරිත් ය.

## 6.2 අශෝක රජ සිරිත්.

බෞද්ධ පොත් පත්වල සඳහන් සක්විති වත්, දස රාජදම්, සිව් සඟරාවත් ආදිය හුදෙක් සාහිත්‍යයට ම සීමා වූ ඒවා නොවේ. බුදු දහම ව්‍යාප්ත වීමෙන් පසු මෙ සිරිත් බෞද්ධ රජවරු අනුගමනය කළහ. සක්විති රජ සිරිත් අනුගමනය කිරීමෙන් චක්‍රවර්ති රාජ්‍ය සංකල්පය ක්‍රියාත්මක කළ ප්‍රථම ඓතිහාසික රජතුමා ධර්මාශෝක අධිරාජයා බව ඉතිහාසඥයෝ කල්පනා කරති.

අශෝක සිරිත් අපට එතුමාගේ සෙල්ලිපි වලින් හඳුනා ගත හැක්කේ ය. ලක්ෂ සංඛ්‍යාත මිනිස් ඝාතනයක් සිදු වූ කාලිඞ්ග යුද්ධයෙන් පසු එතුමා පසුතැවිල්ලට පත්විය. එබැවින් දික්විජය ප්‍රතිපත්ති අත් හළ එතුමා ධර්ම විජය ප්‍රතිපත්තිය අනුගමනය කෙළේ ය.

"ධර්ම විජය යන නමක් වෙයි නම් එය දෙවියන්ට ප්‍රිය වූ රජුගේ ප්‍රධාන විජය වෙයි. . . . . මාගේ පුත්‍රයෝ ද මුණුබුරෝ ද අසත්වා; අලුත් ජීවිතයක් දිනීමට නොසිත වූ. . . . ධර්ම විජය ම විජය ලෙස සලකත්වා. . . . . " (13 ගිරි ලිපිය)

තමා බෞද්ධ පාලකයකු වූ පසු එතුමා මිනිස් ඝාතනය පමණක් නොව සත්ව ඝාතනය ද ක්‍රමයෙන් අත්හළේ ය.

". . . . පෙර දෙවියන්ට ප්‍රිය වූ ප්‍රියදස්සි රජුගේ මුළුතැන් ගෙයි නොයෙක් දහස් ගණන් සත්තු සූප සඳහා මරනු ලැබූහ. තමුත් මෙම ධර්ම ලිපිය ලියවූ දින සිට ප්‍රාණිහු තුන් දෙනෙක් පමණක් මරනු ලැබෙති. මොණරු දෙදෙනෙක් හා මුවෙක් ද යන තිදෙනා ය. ඒ මුවා ද හැම දින ම මරනු නොලැබේ. මේ සතුන් තිදෙනා මත්තෙහි නොමරණු ලබන්නා හ. . . . . (1 ගිරි ලිපිය)

"දෙවියන්ට ප්‍රිය වූ රජතෙම සියලු සතුන්ගේ පීඩා රහිත බව ද" සංයමය ද සමචර්යාව ද. සතුටින් විසීම ද කැමති වෙයි. . . . . . . . . (13 ගිරි ලිපිය)

අශෝක රජතුමා මිනිසුනට පමණක් නොව තිරිසන් සතුනට ද ආරෝග්‍යශාලා කෙළේ ය; බෙහෙත් සඳහා ගස් වැව් ය; තැන් තැන්වල ජලාශ ඉදිකොට මිනිසුන්ට හා සතුන්ට සෙවන සඳහා මාර්ගවල ගස් රෝපණය කරවී ය. මහජන ශුභසිද්ධිය සඳහා වැඩ කිරීමෙන් එතුමා සෑහීමට පත් නොවී ය.

"සියලු ලෝකයාගේ යහපතට වැඩ කිරීම තරම් ශ්‍රේෂ්ඨ කාර්ය යක් මට නොමැත. මා කුමන කාර්යයක් කළත් ඒ කරන්නේ සියලු සත්වයන් වෙත ඇති ණයෙන් මිදීමට ය. පරලොව දී ඔවුන්ට ස්වර්ගය ලබාදීමට ය."

අශෝක රජතුමා දසරාජ ධර්ම, සතර සංග්‍රහ වස්තු, සිවු බඹ විහරණ යන බෞද්ධ දේශපාලන මූලධර්ම පැහැදිලිව අනුගමනය කළ බව පෙනේ. පහත සඳහන් ශිලා ලේඛන ප්‍රකාශ ඒ සඳහා නිදසුන් ය.

"දාසයන් හා සේවකයන් කෙරෙහි මනාව පිළිපැදීම ද, මවපියන්ට සේවය කිරීම ද, මිතුරන්ට, ඇසුරු කළවුන්ට, නෑදෑයන්ට, මහණ බමුණන්ට දන්දීම ද, සතුන් නොමැරීම ද කළ යුතුයි. . . . . (ගිරි ලිපි 11)

"යමෙක් දෙව්ප්‍රිය රජුනට කොතරම් අවමාන කළත් ඒ සියල්ල ඉවසමින් අවමානය කරන්නාට හැකිතාක් සමාව දෙන්නේ ය" (ගිරි ලිපි 13)

"ම විසින් යටත් නොකරන ලද ප්‍රත්‍යන්ත දේශ වාසී ස්වාධීනයෝ මා කෙරෙහි විශ්වාසය තබා භය රහිත වෙත්වා! දුකක් නොලබත්වා!"

බුදුරජාණන් වහන්සේ විසින් අනුදැන වදළා වූත්, සප්ත අපරිහාණිය ධර්මවලට ඇතුළත් වූත් ආගමික සහනශීලි ප්‍රතිපත්තිය ප්‍රායෝගික වම අශෝක රජතුමා විසින් ක්‍රියාත්මක කළ බව පහත සඳහන් ශිලා ලේඛන පාඨයන් ගෙන් පැහැදිලි වේ.

"රජතුමා ශියලු තන්හි දී ම සියලු ම අන්‍යාගමිකයෝ වෙසෙත්වා'යි කැමති වෙයි. ඒ සියල්ලෙහි ම සංයමය හා ආධ්‍යාත්මික ශුද්ධිය, කෘතඥතාව, දෘඪභක්ති යන මේවා ශ්‍රේෂ්ඨ යයි සලකයි" (ගිරි ලිපි – 7)

"තමන්ගේ ආගමට පමණක් ගරු කරමින් අන්‍ය ආගම්වලට නිග්‍රහ නොකළ යුතු ය. යම් යම් හේතු නිසා අන්‍ය භක්තිකයන්ට ද පූජා කටයුතු වේ. එයින් දෙපක්ෂයේ ම යහපත සිදු වේ. එසේ නොකළ හොත් තමන්ගේ ආගමට පාඩු ද අන්‍ය ආගමිකයන්ට අපකාර ද සිදු වේ. ඉදින් යම්කිසිවෙක් තම ආගමික නිකායට ආදරය හා ගෞරවය පිණිස තම නිකායට පූජා කරමින් අන්‍ය ආගම්වලට නිග්‍රහ කෙරේ නම් හෙතෙම එයින් තම නිකායට හානි පමුණුවයි. එබැවින් සමගිය ම උතුම් වේ. සියල්ලෝ ම ඔවුනොවුන්ගේ ආගම ධර්මයන් දැන ගෙන ශ්‍රවණය කරත්වා! අනුන් අදහන ධර්මය ඇසීමට රුචි උපදවත්වා! (ගිරි ලිපි 12)

"සියලු ම නිකායෝ ම විසින් පුදනු ලැබෙති." (ටැම් ලිපිය – 6)

## 6.3 සිංහල බෞද්ධ රජ සිරිත් සමහරක්.

### රාජාභිෂේකය.

බුදු දහම පමණක් නොව මෞර්‍ය අභිෂේකය ද අශෝක රජතුමා විසින් තිස්ස රජු වෙත එවන ලදී. අභිෂේක මංගල්‍යයක් මුල් වරට පැවැත්වූයේ තිස්ස රජු වෙනුවෙන් යයි ද කියනු ලැබේ. එබැවින් අභිෂේකය පිළිබඳ චාරිත්‍ර ද ලංකාවට ලැබුණේ ඉන්දියාවෙන් බව පිළිගත යුතු ය. ක්ෂත්‍රිය කන්‍යාවක විසින් දක්ෂිණාවර්ත වූ හක්ගෙඩියකින් අනවතප්ත විලෙන් ගෙනෙන ලද ජලය රජුගේ හිසමත නැවීමෙන් අභිෂේකය කළ බව කියනු ලැබේ. අභිෂේකයට අවශ්‍ය සියලු දේවල් අශෝක රජතුමා විසින් ලක් රජු වෙත එවන ලදී. මහාවංශයේ සඳහන් මෙම ලැයිස්තුවට "වාලවිජනිය, මඟුල් කඩුව, ශ්වේත ඡත්‍රය, මිරිවැඩි සඟල, මෞලි පට්ටය (හිස්වෙළුම) පාමහය, කෙණ්ඩිය, රන්වන් සඳුන්, නොදෙවිනා කෙළක් පිළිය, මහානර්ඝ වූ අත් පිසිනා පිළිකඩය, නාගයන් විසින් ගෙන එන ලද අඳුන්ය. අරුණුවන් මැටිය, අනොතත් විලින් ගෙනා ජලය, ගඩ්ගා නම් ගඟ දිය ය, දක්ෂිණාවෘත්ත සඩ්ඛය, කන්‍යාවර්තය, වර්ධමානකය, ශරීරාලංකාරය පිණිස ගල්වන සුණුය, කුමාරිකාය, රන් බඳුන් බඩුය, මාහැඟි සිවිකාය, මාහැඟි අරළුය, නෙල්ලි ය, අමා ඔසු ය, පක්ෂීන් විසින් ගෙන එන ලද සැටදහසක් අමුණු හැල් සහල, හා අභිෂේකෝපකරණයන් ද ඇතුළත් ය.

මුලින් ම කරන ලද අභිෂේක උත්සවයට වඩා පසුව පැමිණි රජ වරුන්ගේ අභිෂේක උත්සව යම් යම් වෙනස්කම් සහිතව කෙරෙන්නට ඇත. පැරණි ලංකාවේ සාමාන්‍ය රාජාභිෂේකයන් සිදු වූ ආකාරය මෙසේ ය:

"අභිෂේකලාභී තැනැත්තා විසින් හක්ගෙඩි 3ක් ද, ගංගානම් ගඟේ වතුර ද ක්ෂත්‍රිය කන්‍යාවක ද සොයා ගත යුතු ය. අභිෂේකවන්නා වංශවත් ක්ෂත්‍රියයකු විය යුතු ය. විශේෂයෙන් සරසන ලද ශාලාවක උදුම්බර ලීයෙන් කළ මණ්ඩපයක, උදුම්බර ලීයෙන් කරන ලද පුටුවක රජතුමා වාඩිවෙයි. පළමුකොට ක්ෂත්‍රිය කන්‍යාව දක්ෂිණාවර්ත වූ හක්ගෙඩියකින් ගංගානම් ගඟේ ජලය ගෙන රජුගේ හිස මත අභිෂේක කරමින් මෙසේ කිය යි. "මහරජ, මේ අභිෂේක මංගල්‍යයෙන් ක්ෂත්‍රිය වංශික සියලු දෙනා ඔවුන්ගේ ආරක්ෂාව සඳහා ඔබ ඔවුන්ගේ මහරජ හැටියට පිළිගනිත්. ඔබවහන්සේ දසරාජ ධර්මයන් උල්ලංඝනය නොකොට දැහැමින් රාජ්‍යය කරත්වා! ක්ෂත්‍රියයන් කෙරෙහි ඇල්මක් සහ සැලකිල්ලක් ඔබ සිත තුළ පවත්වා! ඔවුන් ද ඔබ ආදරයෙන් රැක බලා ගන්නවා ඇත." මීළඟට පිළිවෙළින් පුරෝහිතයා ද, සිටුවරයෙක් ද, ගෘහපතියෙක් ද මෙකී අන්දමට බ්‍රාහ්මණයින්, සිටුවරයින් සහ ගෘහපතීන් ද රැක බලා ගන්නා ලෙස අයදිත්.

මේ අභිෂේකයක වැදගත් බෞද්ධ ලක්ෂණය ලෙස පිළිගත හැක්කේ, දසරාජ ධර්මයෙන් රජ කරන ලෙස රජුගෙන් කරන ඉල්ලීමයි. මුල් රාජාභිෂේකවල දී ඔටුනු පැළඳවීමක් ගැන නො කියවේ. පසු කාලයේ දී අභිෂේකයට වඩා වැදගත් තැනක් දී ඇත්තේ ඔටුනු පැළඳවීමට ය.

බුදු දහම වැළඳ ගැනීමෙන් පසු දේවානම්පියතිස්ස රජ්ජුරුවෝ සක්විති රජ සිරිත් ක්‍රියාත්මක කළ දේවානම් පියදස්සී රාජයා අනුගමනය කරමින් දිවයින තුළ ධර්ම විජය ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළහ. සංඝමිත්තා තෙරණිය අත ශ්‍රී මහා බෝධීන් වහන්සේ මෙරටට වැඩම කළ විට එය පිළිගැනීමට තිස්ස රජ්ජුරුවෝ දඹකොළ පටුනට (යාපනයට) ගියහ. මෙය වන්දනා ගමනක් බඳු ය. බෝධි ප්‍රතිෂ්ඨාපන උත්සවයට නිවත්තගම තිවක්ක බ්‍රාහ්මණයා ද කතරගම ක්ෂත්‍රියයෝ ද, චන්දනගම ක්ෂත්‍රියෝ ද තවත් ප්‍රාදේශීය අධිපතීහු ද පැමිණ සිටියහ. මෙය දේවානම් පියතිස්ස රජුගේ ධර්ම ප්‍රතිපත්තිය පිළිගැනීමක් ලෙස සැලකිය හැකි ය. තව ද තිස්ස රජු විසින් බෝධි අංකුර කතරගම, චන්දනගම, දඹකොළපටුන ආදී ඈත ප්‍රදේශවලටත්, දිවයිනේ නොයෙක් ප්‍රදේශවලටත් රෝපණය කිරීම සඳහා යවන ලදී.

මේ බෝධි අංකුර බෙදා හැරීම ද අශෝක චක්‍රවර්තීන් අනුගමනය කිරීමක් ලෙස සැලකිය හැකි ය. අශෝක රජ ශ්‍රී ලංකාවට ශ්‍රී මහා බෝධි ශාඛාව එවූ අතර ධර්ම මහා මාත්‍රයන් අත බෙහෙත් පැළෑටි ආදිය ද ඈත ප්‍රදේශවලට යැවී ය. අශෝක රජුගේ ධර්ම විජය ග්‍රහණයට හසු වූ දේවානම් පියතිස්ස රජතුමා විසින් තම දිවයිනේ උතුර සහ දකුණ එක්සත් කිරීම ද ධර්ම විජයග්‍රහණයක් ලෙස සැලකිය හැකි ය

දේවානම්පියතිස්ස රජ බෞද්ධෝපාසකයකු වී නොබෝ දිනකින් ම ස්වකීය ඥාතීන් පිරිසක් සසුන්ගත කිරීමට කටයුතු කෙළේ ය. රජුගේ සොහොයුරකු වූ මත්තාභය ද බෑණා වූ අරිට්ඨ සහ ඔහුගේ සොහොයුරන් පණස් දෙනෙකු ද අනුලා බිසව ද මෙසේ රජ පවුලෙන් සසුන් ගත වූ ටික දෙනාට ඇතුළත් ය. මෙය ද ස්වකීය ඥාතීන් (දුවත්, පුතත්) සසුන් ගත කළ අශෝක රජ අනුගමනය කිරීමක් ලෙස සැලකිය හැකි ය. ලක්දිව පසුකාලීන රජවරුන් ද ස්වකීය ඥාතීන් සසුන්ගත කිරීමෙන් මෙ සිරිත රැකි බව පෙනේ.

තිස්ස රජුගේ බෑණා වූත් කලින් ඇමතියකු ව සිටියා වූත් අරිට්ඨ තෙරණුවෝ ධර්මය ආරක්ෂා කිරීමේ තනතුර ද භාරගත්හ. ඉන්පසු විනය පිටකය පවත්වා ගෙන ගියේ අරිට්ඨ- තෙරණුවන් ගේ ශෝල පරපුර ය. මේ අයුරින් බුදු දහම ආරක්ෂා කිරීමේ කාරිය රජ පවුලට පැවරීමෙන් කල්යාමේ දී එය පෞද්ගලික අයිතියක් බවට පත් වූවාක් ද පෙනේ.

සිංහල රජවරුන්ගේ කාර්යයන් අතර ප්‍රධානතම කාර්යය වූයේ බුද්ධ ශාසනයේ චිරස්ථිතිය සඳහා මෙන් ම එහි ආරක්ෂාව සඳහා ද කටයුතු කිරීම ය. රජ කෙනකු ශ්‍රේෂ්ඨ වූ කිරුළ දරාගන්නේ බුද්ධ ශාසනයේ ආරක්ෂාව සඳහා බව වෙලැයික්කාර සන්නස කිය යි. රජ දෙමළපියන් මෙන් ම මුළු ලෝකයත් ශාසනයත් රක්ෂා කළ යුතු ය යනු රටේ පිළිගැනීම විය.

ඇතැම් රජවරු අවංකව ම ආධ්‍යාත්මික ශුභ සාධනය අපේක්ෂා කළහ. බුදු දහම කෙරෙහි ඔවුන් දැක්වූ ශ්‍රද්ධා භක්තිය අසීමිත ය. සද්ධාතිස්ස (ක්‍රි.පූ.137 – 119), භාතිකාභය (143 – 167), සිරිසඟබෝ (247 – 249) එබඳු රජවරුන්ගෙන් කීප දෙනකි. භික්ෂූන් වහන්සේ ඇසුරෙහි හැදුණු වැඩුණු සිරිසඟබෝ රජතුමා වචනයේ පරිසමාප්ත අර්ථයෙන් ම ධාර්මික රජෙකි. නෛෂ්ක්‍රම්‍යය හා ආත්ම පරිත්‍යාගය ඔහුගෙන් මූර්තිමත් විය. අධිකරණයේ දී හිංසාවෙන් ඔහු සම්පූර්ණයෙන් ම වැළකුණේ ය. මරණීය දණ්ඩනයට නියම වූවන්ට ඔහු අභය දානය දී ඒ වෙනුවට රහසින් අමු සොහොනින් මළ මිනී ගෙන්වා මහජනයාට පෙනෙන්නට ඒ මළ මිනීවලට (පිළිස්සීම ආදී) දඬුවම් දුන්නේ යයි කියනු ලැබේ. එළු අත්තනගලු වංශයේ විස්තරවන පරිදි ගෝඨාභය කුමරු සිහසුන පැහැර ගන්නට යන්නේ ය යි දැනගත් සිරිසඟබෝ රජතුමා ඔහුට සිහසුන ලබා ගැනීමට ඉඩ හැර වනගත වී තවුස් දම් රැක්කේ ය. අන්තිමේ දී තමාට ලැබුණ ආහාර වේලකට කෘතගුණ සැලකීම් වශ් ඔහු හිස දන් දුන්නේ ය යි ද කියනු ලැබේ. ශ්‍රී සඞ්ඝබෝධි (සිරිසඟබෝ) යන ඔහුගේ සංඥා නාමය තමන්ගේ උපාධිනාමය වශයෙන් යොද ගැනීම පසුකාලීන රජවරු සිරිතක් කරගත්හ.

සද්ධාතිස්ස රජ තවත් ශ්‍රද්ධාවත් රජෙකි. ඔහුගේ නමට මුලින් ඇති සද්ධා යන විශේෂණ පදයෙන් ම මෙය පැහැදිලි වේ. රුවන්වැලි සෑය, ලෝවා මහා ප්‍රාසාදය, වැනි ප්‍රසිද්ධ කර්මාන්තයන් සම්පූර්ණ කිරීමේ ගෞරවයත් දීඝවාපිය ඇතුළු වෙහෙර විහාර රාශියක් කිරීමේ ගෞරවයත් සද්ධාතිස්සට හිමි වේ.

මජ්ඣිම නිකායට්ඨ කථාවට අනුව සද්ධාතිස්ස රජු කාල බුද්ධරක්ඛිත තෙරුන්ගේ ධර්ම දේශනාවක් හිටිවන ම සිට අසමින් රෑ තුන් යම ගෙවූ බව පෙනේ. රජ ධර්ම දේශනාවට කොතරම් පැහැදුනේ ද යත් ධර්ම කථික හිමියන්ට ලංකා රාජ්‍යය පිදී ය. මේ රජ උගත් සිල්වත් භික්ෂූන් වහන්සේ වෙත නිතර ගොස් දහම් උපදෙස් ලබා ගැනීම සිරිතක් කර ගත්තේ ය.

මහන්සියෙන් උපයාගත් ධනයෙන් දෙන දානය මහානිශංස වන බව ඇසූ රජතුමා තමා ම කුඹුරක වැඩ කොට උපයාගත් ධනයෙන්

දන් දුන්නේ ය යි කියනු ලැබේ. තමන්ගේ බෑණනුවන් ද සසුන් ගත කළ රජතුමා උපෝසථ දිනයන්හි දී මිහින්තලේ පෙහෙවස් සමාදන් වීම සිරිතක් වශයෙන් කර ගෙන ගියේ ය.

තමන්ට වටුමස් කෑමට ආශාවක් තිබුණේ වී නමුත් සත්ව ඝාතනයට අකමැති වූ රජතුමා අවුරුදු තුනක් ම මේ ආශාව යටපත් කර ගෙන සිටිය බව මනෝරථ පූරණියෙහි සඳහන් වේ.

භාතිකාභය රජු ද ඔහුගේ නමට ගැළපෙන පරිදි (භක්තිමත් අභය) ශ්‍රද්ධා භක්තියෙන් යුක්තව මහා ථූපයට විවිධාකාර පුද පූජා පවත්වමින් රටපුරා දන්සැල් විවෘත කර, භික්ෂු සංඝයාට දන් දෙමින් කළ ශාසන සේවය මහා වංශයේ විස්තර වේ. මෙ රජ ඔහුගේ රාජ්‍ය කාලය තුළ දී උත්කර්ෂවත් වෙසක් උත්සව විසි අටක් පැවැත් වූ බව පෙනේ.

කල්යත් ම සිංහල බෞද්ධ රජවරු බෝධිසත්ත්ව චර්යාවන් ප්‍රකට කිරීමට ද උත්සාහ කළ බව පෙනේ. සෞභාග්‍යයෙන් හෙබි ලංකාවේ රාජ්‍ය පද ප්‍රාප්ත විය යුත්තේ බෝධිසත්ව වරයන් ම යයි iv මහින්දගේ ජේතවනාරාම ටැම් ලිපිය කිය යි. දඹදෙණියේ රජ කළ රජකු අපේ වංශකථා හා සාහිත්‍ය ග්‍රන්ථයන්හි සඳහන් වන්නේ බෝසත් විජයබාහු (1270 – 1272) නමිනි. නිශ්ශංක මල්ල රජ ''අපක්ෂපාත රජකු රාජ්‍යයට පත්වීම, බුදු කෙනකු ලොව පහළ වූවා සේ පිළිගත යුතුයැ යි ද මැදහත් රජුන් ලැබීම බුදුන් ලැබීම් සේ සැලකිය යුතුය''යි ද ඔහුගේ ශිලා ලේඛනවල සඳහන් කරයි.

චක්‍රවර්ති රජ සිරිත්, දස රාජ ධර්ම ආදිය අනුගමනය කළ අශෝක චක්‍රවර්තීන් මෙන් ම ලක්දිව රජවරු ද මෙසේ එ සිරිත් අනුගමනය කිරීමට උත්සාහ කළ බව පෙනේ. විජයබාහු රජ දසරාජ ධර්මයෙන් අවුරුදු පණස් පහක් සතුටින් රජය කළ බව වෙලයික්කාර ටැම් ලිපියේ සඳහන් වේ. ලීලාවතී රැජින ද දශ රාජ ධර්මයෙන් රජකළ බව ඇගේ ශිලා ලිපිවල සඳහන් වේ. නිශ්ශංක මල්ල රජ දසරාජ ධර්ම පමණක් නොව, සතර සංග්‍රහ වස්තු හා දස පින් කිරියවත් ද පිරිමෙන් මහජනයා සතුටු කොට විසූ බව ගල්පොත ශිලා ලිපිය කිය යි. බුද්ධදාස රජ ගුණ නැණ දෙකින් හා කරුණා භරිත හදයෙන් යුක්ත වූයේ සතර අගතියෙන් තොර ව සතර සංග්‍රහ වස්තුවෙන් ජනරංජනය කරමින් රාජ්‍ය පාලනයේ නිරත වූ බව චූල වංශය කිය යි.

දෙවැනි මුගලන් රජ ද සතර සංග්‍රහ වස්තුවෙන් මහජනයා සිත් ගත්තේ ය. කීර්ති ශ්‍රී රාජසිංහ රජ ද මහා පැරකුම්බා ආදී පැරණි රජුන් ක්‍රියා කළ පරිදි අසා රාජ ධර්මයන් ඉගෙන ඒ පිළිබඳ ව ගෞරව සම්ප්‍රයුක්ත විය; සතර අගතියෙන් වියුක්ත විය; සතර සංග්‍රහ වස්තුවෙන් ජන රංජනය කළේ ය.

සිංහල රජ කෙනකු විසින් ගත කළ යුතු ආදර්ශමත් ජීවිතය හෙවත් පිරිය යුතු සිරිත් හා වැරිය යුතු විරිත් සද්ධර්මාලංකාරයේ කාවන්තිස්ස රජුට ඇමතිවරුන් දෙන අවවාදයේ ඇතුළත් වෙයි.

". . . . එසේ හෙයින් මහරජ, රාජධර්මය නම්, සියලු සතුන් රැකීම ය, ඥාන වෘද්ධ වයෝවෘද්ධයන් භජනය කිරීම ය, ලෝක චාරිත්‍ර දැක්ම ය, මෙලෝ පරලෝ දෙකින් වන අපවාදයෙන් ගැළ වී දවස් යැවීම ය, තමා රැක්ම ය, දැහැමෙන් සෙමෙන් රාජ්‍යය රැකීම ය, මිත්‍රයන් කෙරෙහි නොබිඳෙන බව ය, සත් පුරුෂ වූ ශ්‍රමණ බ්‍රාහ්මණයන් කෙරේ ක්ෂමා කරවීම ය. යන මේ රජදරුවන්ට ආභරණ නම් වෙයි. . . අනර්ථයන් කළ සතුරකු වුවත් දුප්පත් ව තමා ළඟට පැමිණි කල්හි. . . . . ඔහු කෙරේ අනුකම්පා උපදවා සැපත් දී අනුග්‍රහ කෙරේ ද එසේ වූ රජ තෙම ඒකාන්තයෙන් රජ නම් වෙයි, තව ද පෙර රජ-දරුවෝ දැහැමෙන් ප්‍රජා පාලනය කිරීම ය, ධාර්මික ශ්‍රමණ බ්‍රාහ්මණ-යන්ට රක්ෂා සංවිධානය කිරීම ය. දුගී මගී දිළිඳු යාචකයන්ට කැමති වස්තු දීම ය යනා දී වූ සුචරිත ධර්මය පුරා දෙව්ලොව ගිය. එසේ හෙයින් මහරජ. . . . ."

රජුන් කෙබඳු චරිත ඇත්තන් විය යුතු දැයි රටවැසියන් සිතූ පරිදි දැනගැනීමට මේ යෑහේ.

රටේ සෞභාග්‍යයට වගකිව යුත්තා රජු මෙන් ම රටේ දුර්භාග්‍යය හා ස්වභාව ධර්මයේ සමහර සිදුවීම් ද රජුගේ වැරැද්ද නිසා සිදුවන දේ වශයෙන් පිළිගැනීමක් ඈත කාලයේ සිට ම තිබූ බව පෙනේ. සද්ධර්ම රත්නාවලියේ ථූලතිස්ස වස්තුවේ එන නාරද හා දේවල තවුසන් පිළිබඳ කථාවේ එන සිද්ධියක් මෙයට උදහරණ වශයෙන් දැක්විය හැකි ය.

"තුඹ වහන්සේ රජකමට පටන් ගෙන මෙතෙක් දවස් නැගෙනහිර අද මෙතෙක් වේලා වන තෙක් නො නැගෙයි. රට තොටවලින් හවුරුදු නො ඉක්මවා බද්ද නංවන්නා සේ ම අදත් දවස ඉකුත් නොකර හිර නැඟුව මැනවයි කිවූ ය."

රජතුමා නොවරදවා බදු අයකරන්නා සේ ම මහජනයා ද ආරක්ෂා කර ගනිතියි විශ්වාසයක් මිනිසුන් තුළ තිබූ බව මෙයින් හැඟේ. චෝරනාග රජ වෙහෙර විහාර විනාශ කිරීම නිසා දොළොස් හවුරුද්දක නියං සායක් පැමිණි බව රාජාවලියේ සඳහන් ය. "රජුන්ගේ ධර්ම සමාදනය ලොවට වැඩ වන හෙයිනුත් අධර්ම සමාදනය ලොවට අවැඩ වන හෙයිනුත් දේවතාවෝ කලකිරී කලට වැසි නොවස්වත්" යනුවෙන් පූජාවලියේ එන ප්‍රකාශයෙන් රජුගේ පාලනයත් වැස්සත් අතර සම්බන්ධයක් කියැවෙයි.

රජු ධාර්මික නම්, යුක්තිය ඉෂ්ට කරයි නම් සත්‍ය ක්‍රියා කොට වැස්ස ලබාදීමට ඔහුට හැකි ය යන විශ්වාසයක් මහජනයා තුළ පැවතිණ. සිරිසඟබෝ රජු කල ඇති වූ නියඟයක දී රජතුමා "වැස්ස ලැබෙන තුර නොනැගිටින්නෙමි"යි මහා ථූපය ඉදිරියේ සත්‍ය ක්‍රියා කොට වැදහොත් බව මහාවංශයේ සඳහන් ය. මේ සත්‍ය ක්‍රියා මාර්ගයෙන් ඔහු රටට වැසි ලබා දී රට සුබිත මුදිත කළ බව කියනු ලැබේ. මේ අයුරින් රට සුබිත මුදිත වීමට නම් පාලකයන්ගේ හැසිරීම ධාර්මික විය යුතු බව වැසියන්ට මෙන් ම පාලකයන්ට ද පිළිගැනීමට සිදු වූ බව පෙනේ.

රාජ්‍යය සෑම විට ම වාගේ උරුමය අනුව හිමි වූවත් එයට මහජන අනුමතිය ද අවශ්‍ය වූ බවක් පෙනේ. උරුමක්කාරයා වෙනත් හේතූන් වලින් නුසුදුස්සකු වූයේ නම් ඔහුට රජකම නොලැබෙන්නට ඉඩ තිබුණි. රජකමට පුද්ගලයන් තෝරා පත්කර ගත් අවස්ථාවක් වංශකථාවල ඇතුළත් ය. ජුලත්ථන රජකමට තෝරා පත්කර ගත් සැටි මහාවංශයේ සඳහන් ය. "සැදැහැතිස් මහ රජු මළ කල සියලු ඇමතියෝ ථූපාරාම විහාරයේ රැස්ව සියලු භික්ෂු සංඝයා ද රැස්කොට, සංඝයාගේ ද අනුමතිය ලබාගෙන ජුලත්ථන කුමරු අභිෂේක කළහ." මේ වැඩිමහල් පුත් ලඤ්ජිතිස්ස කුමරු රජකමට නුසුදුසු යයි ඇමතියන් හා මහා සංඝයා විසින් සලකන ලද අවස්ථාවකි.

ක්‍රි. ව. 1114 දි ජයබාහු රජු රාජ්‍යයට තෝරා ගත්තේ ද ඇමතිවරුන් හා මහා සංඝයා විසිනි. "ශ්‍රේෂ්ඨ ඇමතිවරු සහ භික්ෂු සංඝයා රැස්වී රුහුණු ජනපදයෙහි වාසය කළ ආදී පාදයන්ට රජුගේ මරණය නොදන්වා ම ඔවුනොවුන් කථා බස් කොට යුව රාජයන් සිංහාසනාරූඪ කිරීමට තීරණය කර ගත්හ."

13 වන සියවසෙහි දී 2 වන පරාක්‍රමබාහු රජුගේ ඇවැමෙන් අභිෂේක ලද විජයබාහු කුමාරයා ද මහා සංඝයා වහන්සේ විසින් තෝරා පත්කළ කෙනෙකි. එය චූලවංශයේ සඳහන් වන්නේ පහත සඳහන් අයුරිනි.

"ඉන්පසු මහා සංඝයා වහන්සේ රැස් කරවා මාගේ සොහොයුරියගේ පුත්‍රයා හා මාගේ ම පුතුන් අතරින් කවරකු රාජ්‍යය ලැබීමට සුදුසු වන්නේදැ යි රජු ඔවුන්ගෙන් විචාළ කල්හි "මහරජ, ඔබගේ පුත් කුමරුවනුත් බෑණනුවනුත් යන මේ හැම දෙනා ම දක්ෂ උගත් අය වෙති. ඒ සියලු දෙනා ම සටනෙහිත් දක්ෂයහ. සතුරන් මර්දනය කිරීමටත්, ගිහි පැවිදි දෙපක්ෂය ම ආරක්ෂා කිරීමටත් සමත් වෙති. එහෙත් ඔබගේ පුත්‍ර විජයබාහු කුමාරයා. . . . . ." ආදී වශයෙනි. රජතුමා බුද්ධ ශාසනයේ එක ම ආරක්ෂකයා වශයෙන් සලකනු ලැබූ හෙයින් දෝ රජ කෙනකු තෝරා ගැනීමේ වගකීම ප්‍රධාන වශයෙන් සංඝයා පිට පැවරුණු බව සිතිය හැකි ය.

පොළොන්නරු කාලය වන විට දන්ත ධාතූන් වහන්සේ හා පාත්‍රා ධාතුව අයත් කර ගැනීම රාජ්‍යය ලබා ගැනීමට සුදුසුකමක් ලෙස සැලකූ බව ද පෙනේ. කල්යත් ම දළදා වහන්සේ හිමි කර ගෙන පුද සත්කාර පැවැත්වීම රජකමට උරුම කියන්නන්ගේ සිරිතක් බවට පත්විය.

වර්තමානයේ දී ද අපරට පාලකයන් දේශපාලන බලතල ලබා ගැනීමේ දී ද. රට අර්බුදකාරි තත්ත්වයකට මුහුණ පා සිටින අවස්ථා-වල දී ද දළදා හිමියන්ගේ ආශිර්වාදය ලබා ගැනීම සිරිත ය. පක්ෂ නායකයන් දේශපාලන බලය ලබා ගැනීම සඳහා මහජන රැස්වීම් ආදී ඡන්ද කටයුතු ආරම්භ කරන්නේ දළදා වහන්සේට හෝ ශ්‍රී මහා බෝධීන් වහන්සේට පූජෝපහාර පැවැත්වීමෙන් පසුව ය. මහජන ඡන්ද-යෙන් බලයට පත් බෞද්ධ නායකයන් රාජ්‍ය පාලන කටයුතු ආරම්භ කරන්නේ පළමුවෙන් දළදා මාලිගාවට ගොස් පුද පූජා පවත්වා මහා සංඝරත්නයේ ආශිර්වාදය ලබා ගැනීමෙන් පසුව ය. එසේ ම පැරණි රජවරුන් සෙයින් දළදා මාලිගාවේ පත්තිරිප්පුවේ සිට ප්‍රථම වරට මහ-ජනයා ඇමතීම රාජ්‍ය පාලන බලය ලබාගත් බෞද්ධ නායකයන් මෙකල ද අනුගමනය කරන සිරිතකි.

**වැඩිදුර කියවීමට.**

1. චන්ද්‍රිම විජේබණ්ඩාර සහ එච්. එම්. මොරටුවගම —
   බෞද්ධ ශිෂ්ටාචාරයේ මූල ධර්ම – 2 පරිච්ඡේදය.

2. එම්. බී. ආරියපාල —

   මධ්‍ය කාලීන ලංකා සමාජය — 2 පරිච්ඡේදය.